

The Reader's Place Novel

අරුණ දිලෝක

The Reader's Place Novel

01

ඉතාලියේ රෝම අගනුවර ටර්මිනියේ උමං දුම්රියකට පැන ජීවිතයෙන් සමුගැනීම මගේ අරමුණ විය. ශ්‍රී ලාංකික තරුණියක වන අංශු මන්තිකා පතිරණ උමං දුම්රිය මාර්ගයේ කැබලිවලට සුනු විසුනුව ගොස් ඇති අයුරු රූපවාහිනී නාලිකාවල ප්‍රදර්ශනය කරන අයුරු හා පුවත්පත්වල ඡායාරූප පළ කරන අයුරුත් මම මනස්රූපවල දුටිමි. එවන් අනතුරක දී වරද කාගේ වුණත් යූරෝවලින් විශාල වන්දියක්, අනතුරට පත් වූ පුද්ගලයා වෙනුවෙන් ගෙවනු ලැබේ. මා වෙනුවෙන් වන්දි ලබාගන්නට අම්මා ඉදිරිපත් වනු ඇත්ද...? නැත්නම් තාත්තා ඉදිරිපත් වනු ඇත්ද...? මා මිය ගොසින් අහවර ය. වන්දියක් වුණත් ඒ විශාල මුදලක් නිසා එය බෙදාගන්නට අම්මා හා තාත්තා පොර නොකා සිටිනු ඇත්ද...? ඔවුන්ට කවදත් මට වඩා වැදගත් වූයේ මුදල් ය. නැත්නම් උනුන්ගේ සතුට ය. අංශු වූ කලී ඔවුන්ට ජීවිතයේ අංශු මාත්‍රයක් තරම්වත් වටිනා ප්‍රාණියෙක් වූයේ නැත.

ටර්මිනියේ උමං දුම්රිය අධිවේගයෙන් විත් මගේ ඇගේ හැපෙන්නට මොහොතකට පෙර මාව උමඟේ පැත්තකට ඇදී යනවා විතරක් මට මතක තියේ. යලි මා සිහිය ලබන විට සිටියේ රෝහල් ඇඳක් මත වැතිරගෙන ය.

'මොකද්ද ගෑනියෙ මේ කර ගන්න හදල තියෙන්නෙ...? තමුසෙ හිතං ඉන්නෙ මේ ලංකාව කියල ද...? මෙට්ටො එකට හැප්පුණානං තමුසෙගෙ කෑලිවත් හොයාගන්න හම්බවෙයි කියල

සංජුල - ව්‍යාජ විවාහ සහතිකයට අනුව මගේ නීත්‍යානුකූල සහකරු - මගේ මූණට උඩින් දත්මිටි කමින් සිටියේ ය. මට ඔහුව සිහිවූයේ පමා වී ය. එසේ නම් මා වෙනුවෙන් ඉතාලි රජයෙන් ගෙවන වන්දිය ලබාගන්නට අම්මාටවත් තාත්තාටවත් නොහැකි වන්නේ ය. මේ රජයට වලංගු ලියකියවිලිවලට අනුව මගේ වන්දියට නීත්‍යානුකූල හිමිකරුවෙක් සිටි. ඒ සංජුල මල්ලවාරච්චි ය.

'කොහොම ද... කොහොම ද... මං බේරුණේ...?'

මම අමාරුවෙන් වචන ගැටගසාගෙන පළමු ප්‍රශ්නය ඇසුවෙමි.

'බේරුණේ ද...? ඉතාලිකාරයෙක් තමුසෙ මෙලෝ සිහියක් නැතුව ටර්මිනි එසේ යනවා දැකලා ඇදල අරං. එතකොටමයි මෙට්‍රෝ එක ගිහිං තියන්නෙ.'

මගේ සිරුරේ තැන් තැන්වලට බෙහෙත් දමා ඇති අයුරු මට දැනේ. මුළු ඇඟම තැලී ගියා වත් රිදුමක් ද දැනෙන්නට පටන් ගෙන තියේ. මරණයක් එක්ක යන්නට ලැබුණානම් මේ රිදුම් සිසිල් ඉකිරි වන්නේ නෑ නොවේ ද...? වේදනා අයිති ජීවිතයට ය. මරණය සැනසිල්ලකි. වේදනාත්මක අත්දැකීම් එක්ක ජීවත් වෙන අවාසනාවන්තියකට කොහොමටත් මරණය සැනසිල්ලකි. නමුත් මට සැනසිල්ලේ ජීවත් වෙන්නවත්, සැනසිල්ලේ මිය යන්නවත් හිමිකමක් නෑ නොවේ ද...?

'තමුසෙට මෙහෙ ඉන්න බැරිනං ලංකාවට ඵුක වෙනවා. මාව අමාරුවෙ නොදා. මට කියන්න තියෙන්නෙ එච්චරයි.'

මාව දවා හළු කරන බැල්මකින් යුතුව සංජුල ගිලන් යහන අසලින් නික්ම ගියේ ය. මට මහත් අසරණකමක් දැනිණ. තවමත් මට ඉතාලි භාෂාව ඒ තරම් හොඳින් තේරෙන්නේ නැත. සංජුල කියා දුන් වචන දෙක තුනක් අමාරුවෙන් ගැටගසා ගන්නවා මිස, පිළිසඳරක යෙදෙන්නට හෝ ඉතාලි ජාතිකයෙකු පවසන දෙයක් හොඳින් තේරුම් ගන්නට පොහොසත්කමක් මට නැත.

'බොන්ජෝර්නෝ...'

වසා උන් තෙතු පියන් හරිත්දීම, සිරුර සිටි කඳුළු දෙපෙළක් ඇසිපිල්ලකින් රුරා ගියේ ය. මම බොඳ වූ පිරිමි රුවක් දුටිමි. නමුත් ඒ කවුද කියා මට මතකයක් නැත. අනිත් අතට තවම නැම ඉතාලි පිරිමියෙක්ම මට පෙනෙන්නේ එකම ආකාරයකට ය. ලංකාවේ පිරිමින් වගේ ඔවුන්ව වෙන් කර හඳුනා ගැනීම පහසු නැත.

ඔහු බෙහෙවින් උස් වූ හා උසට සරිලන මනත දේහ ධාරියෙකි. ලාබාල කොළුගැටයෙකු නොව අඩු තරමින් නතලිනේ දශකයවත් පසු කර ඇතිවා සේ පෙනිණ. ප්‍රසන්න සිනහවකින් යුතුව හෙතෙම නොනැවතිල්ලේ කියවාගෙන ගියත්, ඉන් වැඩිහරියක් මට තේරුණ් නැත. කොහොම වුණත් මෙට්‍රෝ එකට හැපෙන්නට නොදී මගේ ජීවිතය ගලවා ගත් ගැලවුම්කාරයා ඔහු බව එහෙන් මෙහෙන් මම තේරුම් ගනිමි.

'මැරෙන්නට පැතූ කෙනෙක්ව මරණයෙන් ගලවාගැනීම ස්තුති පූර්වකවීමට හේතුවක් නොවුණත්, එසේ ස්තුති නොකිරීම මනුස්සකමට පටහැනි ය. ඊටත් වඩා අධිවේගී මෙට්‍රෝවක හැපෙන්නට යන විදේශික යුවතියක, සිය දිවි පරදුවට තබා බේරා ගැනීම ඔහුගේ පැත්තෙන් මහ වීරකමකි. ඒ වීරකම අගයනු වස් මම ඔහුට ස්තුති කළෙමි.

'ග්‍රාසියේ'

''ප්‍රේගෝ ප්‍රේගෝ'

හඬනගා හිනැහෙමින් කඩවසම් දේහධාරියා උස් හඬින් මොන මොනවා ද කීවේය. ඔහු කී සියල්ල අතරින් 'ඉක්මනට සුවවෙන්න. සුවවෙලා හමුවෙමු.' යන අදහස මම පෙරා ගනිමි.

ඒ ශීත ඍතුව ය. එහෙම කීවාට ඒ සීතලේ තරම ඔබට කිරා - මැන ගත නොහැකි බව මම දනිමි. ඒ තරම් දරුණු සීතලක් මිහිමත තියෙන්නට හැකි බව ඉතාලියට පයගසන තුරු මම ද දැන නොසිටියෙමි. හරිහමන් උණුසුම් ඇඳුම් නොමැතිව, රෝහලෙන් සපයන ලද රෙදිපිළිවලින් ශීතල පිරිමසා ගැනීම පහසු අත්දැකීමක් වූයේ නැත. ශීතල උහුලාගන්නට බැරිව මට සහලවා උණ ගැනිණ. ගෙවී ගිය කාලය ගැන නිනව්වක් මට නොවේ. කෙසේ වතුද, යළි

The Reader's Place Novel

වරක්වත් සංජුල මා බලන්නට නොපැමිණි බව නම් මට හොඳටම සහතික ය.

නන්නාඳුනන රටක කාත් කවුරුවත් නැතිව මෙහෙම ගිලන්වීම සිතට කොයිතරම් අසරණකමක් දනවනවාද කියා තේරෙන්නේ එහෙම අත්දැකීමක් විඳගන්නට වූ කෙනෙක්ටම පමණි. එක අතකට රට වෙනස් වූවාට මේ අසරණකම මට නුහුරු වූවක් නොවේ. මට වයස අවුරුදු දහය පිරෙන විට අම්මා රට ගිය පසු, පුරා දශකයකටත් වැඩි කාලයක් තිස්සේ මම ජීවිතය මැද හුදෙකලා වූයෙමි. උණක් හෙම්බිරිස්සාවක් හැදුනත්, කොත්තමල්ලි ටිකක් තම්බා දෙන්නවත් කෙනෙක් වූයේ නැත. යුවතියක ලෙස, අම්මා කෙනෙක් අත්‍යවශ්‍ය අවස්ථාවකදීවත් අම්මා කියන්නට කෙනෙක් මට වූයේ නැත.

'මං යන්නෙ සල්ලි ටිකක් හොයං එන්නනෙ පුතේ.'

අම්මාට රට යන්න එපා කියමින් මා හඬන විට ඇ මා සැනසුවේ එසේය.

'මං ගිහිං එනකොට පුතාලට ලස්සන සෙල්ලම් බඩුයි පාට පාට ඇඳුනුයි අරං එනවනෙ. අපි ඉක්මනටම ලොකු ලස්සන ගෙයක් හදමු. හොඳේ...'

අම්මා හීනයක් දැක්කා ය. ඇත්තටම කාලයක් තිස්සේම ඇ ඒ හීනය දකිමින් සිටි බව බොරුවක් නොවේ. අම්මා ගිය පසු අප ඒ හීනයේ අතරමං විය.

''උඹලගෙ අම්මා මං කොච්චර එපා කිව්වත් ඇහුවෙ නෑ. ඒ ගැනිට මට වඩා සල්ලි ලොකු වුණා.''

කවදාවත් නැතිව හවසට හවසට බීමත්ව ගෙදර එන්නට පුරුදු වූ තාත්තා වෙනස් වෙන්නට ඒ තරම් කාලයක් ගියේ නැත. සමහර රාත්‍රීන්වල දී තාත්තා ගෙදර නැවිත් ඇරියේ ය.

'හෙට අනිද්දාට ගෙට වෙන්න කෙල්ලෙක් ඉන්නවා කියලවත් මුන්ට වගක් නැනෙ යකෝ.'

මහ රැයක් වෙනතුරුත් තාත්තා එනතෙක් ඉස්තෝප්පුවේ

පඩිය උඩට වී බලා හිඳ - ඔහු නේන තැන අපත් එක්ක ගෙයි දොර වසාගන්නා ආච්චිඅම්මා දොස් තැබුවේ අම්මාටත් තාත්තාටත් පොදුවේ ය.

'විලිසංගෙ නැති එව්වො. ගැනි දේස දීපංකරේ ගියේ කීයක්හරි හොයං ඇවිත් පොඩි එව්වොගෙ කල දවස හොඳ කරන්න මිස වෙන මිනිහෙක් හොයාගෙනයැ.'

එක දවසක් ආච්චිඅම්මා රෙදි පට උස්සාගෙන අපේ නතරමායිම පැන්නේ යක්ෂාවේෂයෙනි.

'අන්න උඹලගෙ මහ එකා අම්මා නැති අඩුපාඩුව පිරිමහගන්න බඩුකැල්ලක් හොයාගෙනයි කියන්නෙ.'

'මගේ ළමා මනසට හෝ ඉලන්දාරිකමේ එළිපත්ත මත සිටි අයියාට හෝ ආච්චිඅම්මා කියන දෙය කොහොම බලපාවිද කියා වගක් ඇයට නොවිණ.

'අම්මා නැතුවට උන්දෑ උඹලට කුඩම්මෙක් දෙනත් දෙයි. තුඃ නොදකිං මේ නාඩගං.'

අයියාට කොහොම දැනුණා ද කියන්නට නොදනිමි. නමුත් තාත්තා තවත් අම්මා කෙනෙකුට ළං වී යැයි ඇසීම මට නම් වේදනාවක් දැනවූයේ නැත. සමහරවිට එහි බරපතලකම තේරුම් ගන්නට තරම් මගේ මනස මෝරා වැඩී නොතිබෙන්නට ඇත. ආච්චම්මා කී ලෙසට තාත්තා අපේ ගෙදරට කුඩම්මා කෙනෙක් ගෙනාවේ නැත. නමුත් සැමියා හැර ගිය සිව්දරු මවකගේ ගෙදරට ඔහු යන එන බව, යමක් කමක් වැටහෙන්න ගත්දී අපට රහසක් නම් නොවී ය. අම්මා අපෙන් දුරස් වූවා ය. තාත්තාගේ රැකවරණයත් අපට අහිමි විය.

ආච්චම්මා පදිංචි වී සිටියේ අපේ ගමේම ජීවත් වුණ මාමා එක්ක ය. මාමාත් දරු පවුල්කාරයෙකි. අම්මා රට යත්දී ආච්චම්මාව අපේ තනි නොතනිය සඳහා අපේ ගෙදර නතර කරන්නට හිතුවත්, මාමාගේ බිරිඳ එතකොටත් ගැබ්බර ය. ගැබෙන් නිදහස් වෙන්නට තව තුන් මසක් පමණ තිබිණ. ඊට වැඩිමල් දැරිය ඒ වෙත්දීත් අත දරුවෙකි. ඊට වැඩිමල් එකාට වයස අවුරුදු තුනක් පිරුණා පමණි.

The Reader's Place Novel

අවුරුදු හතර හමාරක දැරිය පවුලේ වැඩිමලා වූවා ය. ඔය යන පිළිවෙලට නැන්දා තව කී අවුරුද්දකින් කිරි වරනු ඇත්ද කියා විශ්වාස කළ නොහැකියැයි ආච්චම්මා කීවා ය.

'අත දරුවව බිම තියන්නත් ඉස්සරිං මේකි ආයෙ බඩදරු වෙච්චි. ඉනිං බං මං මෙහෙ නතරවෙලා කොහොමෙයි...? ඔය බඩේ ඉන්න එකත් වැදුවහම එතන කිරිසප්පයොම හතරක් නොවැ. අරකි තනියම කොහොම ඒ සුමේ කොරන්න ද...? අනිත් එක මට මය ආනන්දගෙ වැඩ පිළිවෙල එච්චර අල්ලන්නෑ.' ආච්චම්මා ආනන්ද කියා හැඳින්වූයේ අපේ තාත්තාව ය. ඒ නැන්දම්මාට බෑනා රිස්සුවේම නැත. බෑනාත් නැන්දම්මාව පිච්චියකට මායිම් කළේ නැත. බෑනා එක්කට වඩා ලේලින් එක්ක හොඳින් ඉන්නට නැන්දම්මාට පිළිවන් විය.

'එහෙනං අම්මා පුළුපුළුවන් වෙලාවටවත් ඇවිත් මුන් දෙන්නව බලලා යන්න. රෑටනං ආනන්ද ඉන්නවනෙ.'

අම්මා හිත හදාගත්තේ එහෙම ය. ජාතක කළ දරු දෙදෙනාව ගෙදර තනි කොට ආනන්ද අනුන්ගේ දරු පවුලකට තනි රකින්නට යාවියි අම්මා සිහිනෙනුදු නොසිතන්නට ඇත. කොහොම වුණත් අම්මා විදෙස්ගත වී දෙවසරක් යන්නට පෙර තාත්තා රංජනීගේ ගෙදර බින්න බැස්සේ ය. එය වළක්වන්නට සමත් කෙනෙක් සිටියේ නැත.

'දෙයියනේ කියලා දැං උඹලා දෙන්නට යමක් තේරෙනවනෙ. ඉදපල්ලකො දෑවුරුද්ද සම්පූර්ණ වෙද්දි අම්ම එයිනෙ.'

පෙරළණ පිට හොඳයි කියන්න වාගේ ආච්චම්මා අම්මා එනතෙක් පෙරමඟ බැලුවා ය. ඇත්තටම ඒ වයසක උන්දෑට අප වෙනුවෙන් යමක් කරන්නට හැකියාවක් වූයේම නැත. නැන්දා ආයේමත් පස්වෙනි දරුවාව කුසේ දරාගෙන සිටි බැවිනි.

ආච්චම්මාගේත් අපේත් පැතුම් ඉටුකරමින් අම්මා යළි ආවා ය. නමුත් අප සිතූ සේ ඇය දිගටම ලංකාවේ රැඳෙන්නට බලාපොරොත්තු වූයේ නැත.

'ආනන්ද කරපු වැඩෙං මට හැමදේම එපා වුණා. දැං ඉතිං

මගෙ බලාපොරොත්තුව මේ දරුවො දෙන්නා වෙනුවෙං කියක්හරි ඉතුරු කරගන්න එක විතරයි.'

අම්මා රට රස්සාවටම යට වූයේ එසේ ය. මුලින් මැද පෙරදිග රටවල ගෘහ සේවිකාවක වූ ඇය පසුව සයිප්‍රසයට ගියා ය. අම්මා මුදල් පසුපස හඹා යාම නවතාගන්නට මට හැකි වූයේ නැත. අයියාට එසේ කිරීමේ උවමනාවක් වූයේත් නැත.

'කෝමේ ස්ථායී...?'

කියාගෙන දවසක් - මට ඔහුව අමතකව යමින් පැවතිය දී මගේ ගැලවුම්කාරයා යළි පැමිණියේ ය. ඇත්තටම ඔහු යළි එතැයි මම නොසිතුවෙමි.

'කෝමේ ස්ථායී...?'

ඔහු නැවතත් මගේ සුවදුක් විමසුවේ ය.

'බේනෙ...'

මම ඉතාමත් කෙටියෙන් - තේරෙන විදිහට 'හොඳයි' කීවෙමි.

'කොමී තී කියාමි...?'

ඕනෑම ඉතාලිකාරයෙක් මුලින්ම ඇසිය හැකි ප්‍රශ්න තිසාවෙන්, ඉතාලියට පැමිණි අලුතම සංජුල මට ඒ ප්‍රශ්න කියා දී තිබුණේ ය.

'අංශූ මත්තිකා පතිරණ.'

'දි දෝවේ සෙයි...?'

ඔහු අසන්නේ මා කොහෙත් පැමිණියෙක් ද කියා බව මට නොතේරුණා නොවේ. නමුත් මේ විදේශිකයා සමග මොකට වැඩිදුර කතාවට යම්දැයි මම සිතුවෙමි. කතාව දුරදිග ගියහොත් ඔහු මා මෙට්‍රෝ එකට පනින්නට උත්සාහ කිරීමට හේතුව කුමක් ද කියාත් විමසනු ඇත. මා ඊට කොහොම පිළිතුරු දෙන්න ද...? එක අතකට එවැනි සංකීර්ණ සිදුවීම් ජාලයක් විස්තර කිරීමට මා දන්නා ඉතාලියානු වචන ටික ප්‍රමාණවත් නොවේ. අනිත් අතට ඒ දේවල් විදේශිකයෙකුට පැවසුවාය කියා මට අත් වෙන සෙතක් ද නැත.

The Reader's Place Novel

'දි කුවාලෙ පයේසෙ සේයි...?'

ඔහු නැවතත් මා කුමන රටෙන් පැමිණියෙක්දැයි දැනගන්නට උත්සාහ කළේ ය. නමුත් මම නොතේරෙන සෙයින්ම සිටියෙමි. ඔහු 'කන්ට්‍රි' කියන ඉංග්‍රීසි වචනය පාවිච්චි නොකළේ මගේ වාසනාවකට ය. එවැන්නක් විණි නම් නොතේරෙන ගානට ඉඳ ගුණමකු කෙල්ලක වන්නට මගේ හෘද සාක්ෂිය මට ඉඩ නොදෙනු ඇත.

'දැන් මං යන්න ඕනෙ. උදව්වක් ඕන වුණොත් ඉල්ලන්න.' කියමින් සිය දුරකතන අංකය ඔහු මගේ අතේ තැබුවේ ය.

'ග්‍රාසියෙ'

මම හදවතින්ම ඔහුට ස්තුතිවන්ත වීමි. මට වැඩිපුරම හමු වී තියෙන්නේ වන සිව්පාවුන් වගේ මිනිසුන් ය. ඒ අතරේ දෙවි දේවතාවුන් වගේ මිනිසුන් ද සිටිතැයි සමහර විට විශ්වාස කළ නොහැකි තරම ය. මේ මිනිසා මාව මරණයෙන් ගලවා ගත්තේ ය. ලක්ෂ ගණනක මුදල් ලබාගෙන මාව ලංකාවෙන් ඉතාලියට ගෙන්වාගෙන මගේ ජීවිතය අමු අපායක් කළ සංජුල පවා මා බලන්නට පැමිණියේ එක වරකි. ඒ ද ඔහුව අමාරුවේ නොදමන ලෙස මට තර්ජනය කර යන්නට ය. නමුත් මේ ඉතාලි ජාතිකයා දැනට දෙවරක්ම රෝහලට පැමිණියේ ය. කෙසේවතුදු තවත් වරක් අප හමු නොවිය යුතුයැයි මගේ යටිහිත මට තදින්ම කියා සිටියේ ය. නෙතෙම හොඳ මිනිසෙකු වන්නට පුළුවන. නමුත් මා ඉතාම හොඳ මිනිසුන් යැයි අදහාගෙන සිටි අයත් තිරිසන් වෙස් ගත් මිනිසුන් අතරේදීත් මුලා වූ මා කොහොම විදේශික පුරුෂයෙකු විශ්වාස කොට ඔහු හා පයුරුපාසානම් පවත්වන්න ද...?

උණ රෝගය තරමක් සුව අතට හැරෙමින් තිබිණ. රෝහලෙන් මාව පොලිසියට යොමු කරාවි ද කියන බිය දැඩිව මා තුළ වැඩෙන්නට වූයේ ය. සමහරවිට අර ඉතාලිකාරයා මා බලන්නට වීත් තොරතුරු හාරාවුස්සන්නේ ද...? කිසියම් ඉවක් ඔස්සේ විය නොහැකි ද...? සංජුල මල්ලවාරච්චි වූ කලී මගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා නොවේ. මා ඉතාලියට ගෙන්වාගනු පිණිස ඔහු

ව්‍යාජ විවාහ සහතිකයක් ඇතුලුව ලියකියවිලි සැකසුවේ ය. මා භාෂාව හරියට දන්නේත් නැත. කවුරුන්වත් මාව බලන්නට එන්නේත් නැත. පොලිසිය විසින් මාව අත්අඩංගුවට ගනු ලබාවියි මම දැඩි භීතියට පත් වීමි. ජීවිතය ඒ වගේ තර්ජනයකට මුණ දෙන්දී ශරීරය ඇඩ්‍රිනලින් හෝමෝනය නිදහස් කරන බව මම පාසලේ දී උගෙන ඇත්තෙමි. එම හෝමෝනය නිසා සටන් කිරීමේ හෝ පලායාමේ ප්‍රතිචාරයක් අප තුළ ඇති වේ. මේ වෙලාවේ මා තුළ උපන්නේ පලා යාමේ ප්‍රතිචාරයකි. මම රෝහලෙන් පැන ගියෙමි.

කබලෙන් ලිපට වැටුණා කියා මට වැටහුණේ පසුව ය. අත වූයේ මෙරට රැඳීම සඳහා නිකුත් කළ අවසර පත්‍රය හා මගේ ජංගම දුරකතනයත් යූරෝ දෙකක මුදලකුත් පමණකි. යූරෝ දෙක ඉතිරි වූයේ, මෙට්‍රෝවට පනින්නට ගත් තීරණයට පෙර ඉපයූ යූරෝ පහක මුදලිනි. එදා, ආසන්නයේ පිහිටි පාපන්දු පිටියක සෙල්ලම් කරන තරුණයන් පිරිසකගේ නිල ඇඳුම් ටික සෝදා දෙන්නට මට අවස්ථාව ලැබිණ. යූරෝ පහ ලැබුණේ එසේ ය. එදා කෑමට යූරෝ දෙකක් වැය විය. තව එකකින් බස් ටිකට්පතක් ලබා ගතිමි. කොරනේලියා සිට ටර්මිනිය දක්වා පැමිණියේ එම ටිකට්පතිනි.

මේ යූරෝ දෙක අතේ තියාගෙන, නන්නාඳුනන රටක තට්ට තනියම මොනවා කරන්න ද...? නමුත් මගේ හිතෙහි කිසියම් සැහැල්ලුවක් දැවිය. ඒ, දැන් සිටින්නේ මා පමණක් වන නිසාවෙනි. පසුගිය දෙසතිය පුරාම මගේ හදවත මත පැටවී තිබුණ බර, කුස ඔත් කළලය නිසාවෙනි. මා මෙට්‍රෝවට පැන දිවි තොර කරගන්නට ගියේත් එහෙම බරක් තනිව දරාගන්නට තරම් හයියක් කොහෙත්ම මට නොතිබූ නිසාවෙනි. මෙට්‍රෝවෙහි නොහැපුනත්, එම අවස්ථාවේ සිදු වූ බිම වැටීම හා කම්පනය නිසා කළලය ගබ්සා වී තිබිණ. රෝහලේ දී මගේ කුස සෝදා පිරිසිදු කොට ඇති බව මා දැනගත්තේ හෙදියකගෙනි. දැන් ඉතින් යළිත් මා පමණකි.

වෙන යන්නට තැනක් නැතිකමට මම යළිත් සංජුලගේ කාමරයටම පැමිණියෙමි.

The Reader's Place Novel

'කෙළින්නෙම පිස්සුනෙ. මොන කෙහෙල්මලකට මෙට්‍රොවලට පනින්න ගියා ද...? මං කිව්වනෙ ඔය ළමයව ඉස්පිරිතාලෙට ගිහිං නැති කරල දාන්න කියල.'

පෙරදා ඔහු ඔය කතාව කියත් දී මගේ කොපුල් තලා දිග කඳුළු දෙපෙළක් ගලා ගියේ ය. නමුත් දැන් කඳුළු නැත. පපුවෙහි සිහින් රිදුමක් වුවත් ඒ රිදුම පිටතට පෙනෙන්නේ නැත.

'ලංකාව වගේ නෙවෙයි මෙහෙ. තමං කැමතිනං ඕන වෙලාවක හොස්පිට්ල් එකට ගිහිං ඇබෝෂන් එකක් කරගන්න පුළුවං. ප්‍රශ්නයක් මතුවෙන්නෙ මාස තුන පැනලනං විතරයි.'

සංජුල කතා කළේ ඒ විෂය සම්බන්ධයෙන් බොහෝ ඇසූ පිරූතැන් ඇති පුද්ගලයෙක් වාගේ ය. ඇතැම්විට එය එසේ වීමටත් පිළිවන.

'මට හරියට ඇඟට අමාරුයි. මං හොස්පිට්ල් එකෙං පැනලා ආවෙ.'

සංජුලගේ ඇස් උඩ ගියේ ය.

'පැනල ආව...? ඒ මොකද...?'

දෙන්නට නිශ්චිත පිළිතුරක් මට වූයේ නැත.

'ඇත්තමයි මමනං පුදුම කුණුගොඩක් කරේ දාගත්තෙ. දෙයියංගෙ නාමෙට මාවත් අමාරුවෙ නොදා ඉන්නව ද...?'

ඔහු සැමවෙලේම හිතන්නේ තමං අමාරුවේ නොවැටී සිටීම ගැන පමණකි. අනිත් කවුරුන් අමාරුවේ වැටුණත් ඔහුට වගක් නැත.

'මං ඉක්මනටම රස්සාවක් සොයාගෙන මෙහෙං යනව. ඒ වෙනකල් විතරක් මට ඉන්න දෙන්න.'

ඒ වෙලාවේත් හිස කැරකෙනවා වාගේ මට දැනෙමින් තිබිණ.

'පාස්තා හදපුවා ඇති. කාල ඉන්නව. මං යනව.'

සංජුල නික්ම ගිය එකත් හොඳයි කියා මට සිතිණ. පාස්තා ටිකක් බෙදා ගත්තත් කන්නට පිරියක් වූයේ නැත. ඇඟේ වූ පණ

නැති ගතිය නිසා මම අමාරුවෙන් වුණත් ටිකක් කෑවෙමි. ඊළඟට සංජුලගේ ඇඳට වැටී ගුලි වුණෙමි.

ලංකාවේ හිටියානම් හොඳයි කියා මට නොසිතුනා නොවේ. නමුත් එහිදීත් මට වළඳන්නට තිබුණේම දුක ය.

රංජනීගේ ගෙදරට වූවාට පස්සේ තාත්තා අප ගැන බැලුවේම නැත. අම්මා සල්ලි එව්වා ය. ඉඳහිට ගෙදර ඇවිත් එයින් ද කීයක් හෝ කඩාගෙන යාමට තරම් තාත්තා නොමිතිසෙක් වූයේ ය.

'සල්ලි නෑ තාත්තෙ...'

මම කොතෙකුත් එහෙම කීවෙමි.

''නිකං බොරුව නොදා හිටපං අංශු. අම්මා සල්ලි එවන්නෙ මටත් එක්කම. කීයක්හරි දුන්නෙ නැත්තං මං ගෙදර තියෙන දෙයක් අරං ගිහිං විකුණ ගන්නවා.'

ඔහු ඒ තරම් දෙයක් වුව කරන්නට බැරි නැති නිර්ලජ්ජිත පුද්ගලයෙකි. කිහිප විටක් ඔහු එසේ කොට ද ඇත. කීප වරක් නෑ කියමින් සිට වුවද මා කීයක් හෝ තාත්තාට දෙන්නේ ඒක ය.

මුල දී දෙවසරකට වරක් ලංකාවට පැමිණි අම්මා, ක්‍රමයෙන් තුන් හතර වසරකටවත් දැකගත නොහැකි විය. නමුත් ඇය නොවරදවාම ගෙදර වියදම එව්වා ය. මුදල්වලින් දෙමාපියන්ගේ ආදරය මිල දී ගන්නට දරුවන්ට නොහැකි වග අම්මා නොදැන සිටින්නට ඇත.

යන්තම් වයස දහ නවය පිරුණ ගමන්ම අයියා කසාදයක් කර ගත්තේ ය. කසාදයක් කීවාට ඔහු මඟුලක් කෑවේ නැත. නිකංම කෙල්ලක ගෙදරට ගෙන ආවේ ය. රෙජිස්ට්‍රාර් ළඟ කසාද බැන්දායි තනූජා මට කීවාට, මම කිසිදිනෙක ඔවුන්ගේ විවාහ සහතිකයක් නොදුටිමි.

අපේ ගෙදරට ආ මුල් දවස්වල තනූජා පෙන්වූයේ අහිංසක මූණකි. ඇගේ ඒ වෙස් මූන ගැලවෙන්නට ඒ තරම් කල දවසක් ගියේ නැත.

The Reader's Place Novels

'අංශුට සල්ලි එවලා හරියන්නෙ නැනෙ. අම්මා දැනගත්ත ඕනෙ දැන් ඔයාගෙ නමට සල්ලි එවන්න. ඔයා කසාද බැඳපු මිනිහෙක්. අංශු ඉන්නෙත් ඔයා ළඟනෙ.'' තනූජා දවසක් මා ඉදිරිපිටදීම අයියාට කීවා ය.

'හරි හරි ඉතිං. අම්මා කාගෙ නමට සල්ලි එව්වත් ඒවා වියදං වෙන්නෙ මේ ගෙදර උවමනා එපාකම් වලටනෙ.'

අයියා හිස කසමින්, යටැසින් මදෙස බැලුවේ ය.

'ඒ වුණාට... එතකොට නිකං අපි නංගිට යටවෙලා ඉන්නව වගේනෙ.'

තනූජා ඒ තරම් සටකපටකම් දන්නා එකියකැයි මුල දී මම නොසිතුවෙමි. ඇය දකුණේ උගුරුබොක්ක නමැති ඉතා පිටිසර ගමකින් කොළඹ පැමිණ, ගාමන්ට් එකක අත් උදව්කාරියක ලෙස රැකියාව කරමින් සිටි තරුණියකි. ඇය මටත් වඩා වසරකට පමණ බාල වූවා ය. ඒ වුණත් ඇය සිතුවේ නගරයේ ඉපිද හැදී වැඩුන මට වඩා බෙහෙවින් කෙරාටික ලෙස ය.

'මේ ගේ තියෙන්නෙ අම්මගෙ නමටනං අම්මා ඊළඟ සැරේ ලංකාවට ආවහම ඔයාගෙ නමට ලියාගන්න. කොයි දේකත් පිළිවෙලක් තියෙන්න ඕනනෙ.' ඇය වතාවක් අයියාට කීවා ය.

'අම්මා කොහොමටත් මේක මගෙයි නංගිගෙයි නමට ලියයි.'

'දෙකට බෙදන්නතරං දෙයක් තියෙනව ද අනේ පර්චස් විස්සක. අංශු ඉතිං කසාදයක් බැඳල එයාගෙ මනුස්සය ඉන්න තැනකට යන එකනෙ. ඒ යද්දි අම්මා රටිං ගෙනාපු බඩු ටිකක් දෑවැද්දට දෙන එකනෙ තියෙන්නෙ.'

ඇය ආවේත් දෑවැද්දක් අරගෙනදැයි අසන්නට මගේ දිව නළියාවේ ය. නමුත් එහෙම දෙයකින් අයියාගේ හා මගේ එක බඩවැල කඩාගෙන උපන් සහෝදරකම් බිඳේවියි මම බිය වුණෙමි.

'මං බැංකුවෙ එකවුන්ට් එකක් ඇරියා. වියදං සල්ලි ටික ඒකට දාන්න කියලා අම්මට කියහං නංගි. නංගිගෙ වියදමට මං ඒකෙං දෙන්නංකො.'

දවසක් අයියා හරි අමාරුවෙන් මට එහෙම කීවේ ය. මට ඔහු පව් කියා සිතිණ. මොනවා වුණත් අයියා දැන් පවුල්කාරයෙකි. තනූජා ගැබ්ගෙන ද සිටියා ය. අපේ දෙමව්පියන්ට දිගටම සතුටින් එක වහලක් යට ජීවත් වෙන්නට බැරි විය. එහෙම එකේ අයියාගේ පවුල් ජීවිතයවත් යහපත් වෙනවානම් මොකද කියා මම සිතුවෙමි. පවුල් ජීවිතයක් ගෙවත්දී බිරිඳට අවනත වෙන්නට සැමියාට සිදු වීම මහ අරුමයක් නොවේ.

අවුරුදු ගණනක් තිස්සේ අම්මා, ආච්චිඅම්මා නමට මට දෙන්නට එවූ වියදම් තනූජා අතට ගත්තේ එසේ ය. මගේ කොටස අතට දෙන්නම් කීවාට අයියාට එසේ කළ හැකි වූයේ දෙතුන් වාරයක් පමණි.

'කන්න අඳින්න හැමදේම දෙනවනං ආයෙ අංශුට වෙනමම සල්ලි මොකට ද...? මාසෙ වියදමට මේක ගෑවෙන්නත් මදිනෙ.'

තනූජා නිදහසට කාරණා කීවා ය. මට අයියා එක්ක කේන්තිත් ආවේ ය. ගෑනියෙක් ගෙනාවා නම් ඇයට කන්නට අඳින්නට දීම මිනිහාගේ වගකීම බව ඇත්ත ය. නමුත් කටේ කිරි සුවඳ යන්නටත් පෙර ගෑනු ගත් අයියාට තවම රස්සාවක් කියා දෙයක් ඇත්තේ නැත. ඔවුන් දිගටම ජීවත් වන්නට හදන්නේ අම්මා ලවා හරිහම්බ කරවා ගෙන ද...?

'අම්මා කෝල් කරපු වෙලාවෙ කිව්වා අයියට ඒජන්සි එකකින් රට යන්නවත් බලන්න කියලා. හරියට ඉගෙන ගත්තෙ නැති නිසා ලංකාවෙ රස්සාවක් හොයා ගන්න එක ලේසි නැනෙ.'

මම තනූජාට කීවෙමි.

'ඔය රට රාජ්ජවල යන්න වියදං කරන්න සල්ලි කොහෙද තියන්නෙ.'

ඇය දරු ගැබ අතින් පිරිමදිමින් කීවා ය.

'අම්මා කොහොමහරි ඒකටත් සල්ලි දෙයිනෙ.'

මා කීවේ ඇනුම්පදයක් නොවේ. නමුත් තනූජා උදහස් වූවා ය.

The Reader's Place Novel

ලීවාට ඒ ගැන කිසිම විශ්වාසයක් මා තුළ නොවිණ. මා විභාගය කළේ විවාහ වූ ගැහැනියක තරම් වැඩ කොටසක් ගෙදර ඉටු කරමිනි. ළමයින් බලාගන්නට තිබුණ නිසා පාඩම් කරන්නට කියා කාලයක් වූයේම නැත. තටු ලැබ හෝ මේ ගෙදරින් ඉගිල යන දැඩි නොසන්සුන්කමක් මා තුළ පොරබදන්නට ගත්තේ ය.

'ගාමන්ට් එකකහරි මං රස්සාවක් හොයං යනව. මට මේ ඉදිල්ල ඇතිවෙලා.' මා අම්මාට ගතු කීවේත් නොරිස්සුමෙනි. ඇත්තටම ඒ නොරිස්සුම කවුරුන් නිසා කවුරුන් අරබයා උපන්නක් ද කියා මා ම දැන සිටියේ නැත.

'මං මේ දේස දීපංකරේ ඇවිත් පවුලුත් කඩා ගත්තෙ ඔයාව ගාමන්ට් රස්සාවකට යවන්න ද පුතේ...? ආයෙ විභාගෙ කරන්න බැරිනං කෝස් එකක් හරි කරන්න. මං සල්ලි එවන්නං. ඊට පස්සෙ ටිකක්වත් හොඳ ජොබ් එකක් හොයා ගන්න පුළුවන්නෙ.'

තටු ආවා සේ මට දැනිණ. ඇත්තම ඇත්ත නම් ගෙදර ජීවිතය මට එපා වී තිබුනේ ය. මට උවමනා වූයේ එතැනින් ඉගිල යන්නට ය. අනාගතය ගැන සැලසුමක්වත් ඉදිරියේ දී කරන්නට නියමිත රැකියාවක් නැග හැඟීමක්වත් මා තුළ නොවූ වග සහතික ය. කාලයක් තිස්සේ ආත්මයට වද දෙමින් තිබුණ හිස්කමක් තෘප්ත කර ගැනීමේ අවශ්‍යතාවයක් ද ලොකුවට දැනෙමින් තිබිණ.

මගේ පාසල් මිතුරියක තෝරාගත් පරිගණක පාඨමාලාවක් සඳහා මා මුදල් ගෙවූයේ අරමුණකින් තොරවම ය.

''ඔයනං ඉතිං ඉගෙන ගන්න උවමනාවට කරපු වැඩක් නෙවෙයි. දැං ඉතිං ඒගොල්ලො නෝනලා වගේ ගෙදරිං දොට්ට බැහැලා යයි. මං මේ ගෙදර වැඩකාරි වෙන්න වෙයි.'

තනූජා ඊර්ෂ්‍යා සහගතව කනිපිත්දම් කීවා ය. ඇගේ ඊර්ෂ්‍යාව සාධාරණය. සම වයසේ වීත් ඇයට මට මෙන් නිදහසක් නැත. ළමයින් තිදෙනෙක් අතින් කටින් එල්ලාගෙන ඉන්නට සිදුව තිබේ. ඒ නිසාම ඇගේ ඊර්ෂ්‍යාව ගැන මම තරහ නොගතිමි.

මගේ ජීවිතය වෙනස් මගකට හැරවූ කල්ප ලොකුගේ මට හමු වූයේ ඒ පරිගනක පාඨමාලාව නිසාවෙනි.

'ඔයා කතා කරන්නෙ හරියට මටත් එක්ක වියදං කරන්න වෙලා අම්මට කරදර වෙලා වගේනෙ.'

'මේ... මේ... මං එහෙම දෙයක් කිව්වෙ නෑ. ඔයා නිකං වල්ගෙ පාගගන්නෙ නැතුව ඉන්න.'

ඉවසා ගන්නට බැරි තැන මමත් නැගී සිටියෙමි. කටහැකර තනූජා ඒ කටින් මාව බය කරගන්නට හොඳටම දැන සිටියා ය.

'අංශු මේ, රට රස්සාවලට ගිහිං ඔයාගෙ අම්මටයි තාත්තටයි වෙච්ච දේ දැක්කනෙ. අම්මලගෙ පවුල කැඩුනත් ඕගොල්ලන්ට ගානක් නෑ. රට සල්ලි එනවනෙ. හැබැයි මට ඕනෙ නෑ මිනිහව රට යවලා මගෙ පවුල කඩාගන්න.'

සත්තකින් මට දැනුණේ මා උස්සා පොළොවේ ගැහුවා සේ ය. ඇයට කිසිත් පහදා දෙන්නවත්, ඇයත් එක්ක වචන හරඹ කරන්නවත් මම පොහොසත් නොවෙමි. එහෙම එකේ ඔවුන්ට ඕනෑ හැටියට ඔවුන්ගේ දේවල් කරගන්නට හැර මගේ පාඩුවේ ඉන්නෙමැයි අන්තිමට මම තීරණය කළෙමි.

තනූජාත් අපේ මාමාගේ බිරිඳ සේම ය. මගේ නෑනා වී ආ දවසේ පටන් හැමදාමත් ඈ ගැබ්බර ය. රෑ එලන පැදුරෙහි පහුව දා හවස වන තුරුම ඈ වැහිර සිටින දවස් විය. සමහර කාලවල දී නොනැවතී ඔක්කාරය හා වමනය කළා ය. ඒ කාලයට ඇගේ විතරක් නොව අනෙක් දරු පැටුවන්ගේත් ආවතේව කළ යුතු වූයේ මවිසිනි. පව් කියා සිතුන වෙලාවල් තිබිණි ද මට ඉක්මනින්ම මේ දිනචර්යාව එපා වී ගියේ ය. නමුත් කරන්නට වෙන දෙයක් තිබුණේ ද නැත.

'අපේ එකාට පිස්සු ද ඔහොම ළමයි හදන්නෙ...? ඇයි යකෝ උං තව ටිකක් ලොකු වෙනකොට කොහොම නඩත්තු කරන්න ද...? පඩි පෙළ වගේ ළමයිනෙ. අම්මා දුරකතනයෙන් කතා කළ වෙලාවක කීවා ය. මට කීවාට අයියාට ඇය කිසිවක් නොකියන බව මම දනිමි. කාගෙ කාගෙත් කෙරුවාවල් නිසා අන්තිමට අසරණ වී සිටින්නේ මාය යන හැඟීම මේ කාලයේ දී දැඩිව මා තුළ ලියලමින් තිබිණ. එක අතකට එය නොරිස්සුමකි. උසස් පෙළට

The Reader's Place Novel

02

කල්ප ලොකුගේ වූ කලී ජේත්තුකාරයෙකි. අපේ පරිගණක පන්තිය තිබුණ පාරේ කමියුනිකේෂන් සෙන්ටර් එකක් තිබිණ.එතැන හැම වෙලේම කොල්ලෝ කුරුට්ටෝ පිරී සිටියහ. පන්තියට යන එන ගෑනු ළමයින්ට විහිළු තහළු කරමින් සිනහ වීම ඔවුන්ගේ පුරුද්ද විය. ඔවුන් එයින් සතුටක් ලබන්නටත් ඇත. ජේත්තුකාරයාත් නිතරම එහි සිටිනවා දැකිය හැකි විය. ඔහු වැඩිපුර සිටියේ මෝටර් බයිසිකලයක් මත ඉඳගෙන ය. ඒ නිසා ඒ මෝටර් බයිසිකලය ඔහුගේ යැයි අපි - මා හා අපේ නඩයේ කෙල්ලන් කිහිප දෙනා උපකල්පනය කළෙමු.

'අරූ මාර හැන්ඩියා නේ...?'

පන්තිවාර කිහිපයකදීම දැක පුරුදු වීමෙන් පස්සේ, අපේ කෙල්ලන් එහෙම කීවා මට මතකය.

'කවුද...?'

'අර බයික්කාරයා බං.'

'හැබැයි ඌ කුකුළා වගේ.'

අපි හැමෝම හඬනගා සිනහ වීමු. බයික්කාරයා හා ඔහුගේ සගයන් කිහිපදෙනා උද්‍යෝගිමත් සිනහවකින් යුතුව උනුන් මොනවා ද මිමිනූහ.

මුල් දිනයේ පටන් ඔහු මගේ සේම අනිත් කෙල්ලන්ගේත් අවධානයට ලක් ව ඇති බව එදා මට සිතාගත හැකි විය. ඔහු

කෙල්ලන් සමග කතාවට වැටුණේ කොහොම ද කියානම් මට හරියටම මතක නැත. ඔහුගේ නම කල්ප කියා අප දැනගත්තේ කෙසේ ද කියාත් මම නොදනිමි.

'මං ඔයත් එක්ක තනියම කතා කරන්න චාන්ස් එකක් හොය හොයා හිටියෙ.'

දවසක් උදේ මා පන්ති යන මග රැක උන් ඔහු කීවේ ය. ඔහුගේ ඇස්වල ගැටුණ මගේ දෙනෙතින් ඇරඹී ස්වාංගයම වෙව්ලා ගියා සේ මට දැනිණ.

'කොහෙද... ඔයාගෙ අර කටහැකර යාළුවොත් එක්ක ඔයාට කතා කරන්න විදිහක් නැනෙ.'

ඔහුගේ ඇස් හරියට විදුලි කොටුවා සේ ය. මට ඒවා දෙස කෙලින් බැලිය නොහැකි තරම් වූයේ ය. ඒ දෑස් මා විනිවිද බලන්නට ඇත.

'ඇත්තටම මට කියන්න ඕන වෙලා තිබුණෙ... මං ඔයාට ආදරෙයි කියල.'

හදවත 'දඩස්' ගා හෙළවිණ. ඒ මා එවන් අත්විඳීමකට මුණ දුන් කුළුඳුල් අවස්ථාව ය. අම්මා කෙනෙක් ගෙදර නොහිටියත්, තාත්තා කෙනෙක්ගේ රැකවල නොලැබුණත්, එතෙක් මා එවැනි දෑසකින් පිටස්තර පිරිමියෙක් දෙස බලා නොමැති බව දිවුරා පැවසිය හැක. අයියා හා අයියාගේ මිතුරන්ව ද කුඩා කල සිටම ළඟින් ඇසුරු කරන්නට ලැබුණ නිසාම ද මන්දා පිරිමින් විෂයේ මට විශේෂත්වයක් නොදැනුණ තරම ය. අපේ පාසල ද මිශ්‍ර එකකි. එහිදී ගැහැනු හා පිරිමි ළමයින්ට සමීපව ඇසුරු කළ හැකි වේ. ඇටෙන් පොත්තෙන් එළියට ආ ගමන් පාසල තුළින්ම පෙම්වතුන් - පෙම්වතියන් සොයා ගැනීම ද මිශ්‍ර පාසල්වල සුලබ ලක්ෂණයකි. මගේ පන්තියේ මිතුරු මිතුරියන් ද එසේ පෙම්වත්හු වූහ. නමුත් පාසල් ජීවිතය තුළ දී මම කිසිදා පෙම්වතියක නොවීමි. එවැනි අවශ්‍යතාවයක් මට නොදැනුණ බවත් සහතික ඇත්තකි.

The Reader's Place Novel

The Reader's Place Novel

'මොකද කොල්ලො බොරුවට අඬන්නෙ... එන්න, අපි එළියට යං. මං පුතාට මලක් කඩලා දෙන්නං.'

'නැන්දෙ මටත් ඕනෙ මල්.'

'මටත් ඕනෙ. මට තමයි වැඩියෙංම ඕනෙ.'

ලොකු ළමයි දෙන්නා ද මගේ පස්සෙන් දිව ආහ.

'අනේ මේ නාක නලවන්නනං මට බෑ.'

මා එහෙම කීවේ තරහකට නොව බොරුවට ය.

'පොඩි උන්ට මල් කඩන්න තමයි බැරි. එයාගෙ මල් කැඩිල්ල නොතේරෙන්න අපි පොඩි උන් නෙවෙයිනෙ.'

කුටු කුටු ගාමින් වුව තනූජා කී දේ මට පැහැදිලිවම ඇසිණ. හිතට කේන්තියක් ආවත් මම නොඇසුණා සේ ළමයින් ටිකත් එක්ක පාර පැත්තට ගියෙමි.

හැමතිස්සේම මට කල්ප සිහිවූයේ ය. එක විනාඩි පහකට වුව ඔහුත් සමග හීන ලෝකයකට ගියොත් මාව ඒ හීනයෙන් ඇහැරවන්නට තරම් තනූජා කුරිරු වූවා ය.

'හරි විකාරයක්නෙ අප්පා මේක. ඕන වෙලාවක තනියම හිනාවෙවී වෙන ලෝකෙක. මෙහෙම ගිහිං මෙයා මොකක්හරි නස්පැත්තියක් කරගත්තොත් එහෙම ඒකටත් අපිටයි වගකියන්න වෙන්නෙ.'

'අයියෝ තනූජා... මොකද්ද ඔයා මේ හැමතිස්සෙම කියෝන එකේ තේරුම...? ඔයාට මාත් එක්ක පැටලෙන්නැතුව ඉන්න බැරි ද...?'

මා කට ඇරියේ තවත් නිහඬව ඉන්නට බැරිම තැන ය.

'මටනං පැටලෙන්න උවමනාවක් නෑ. හැබැයි ඕගොල්ලංගෙ මහ ඇයො දවසක අපෙන් අහයි අපි ඇස් කන් පියාගෙන ද හිටියෙ කියලා.'

'හරි හරි. මගෙ ගැන මං බලා ගන්නං. ඔයා කාටවත් වග

'ආ... එහෙම ද...? එහෙනං එහෙමම යමුකො.'

ඒ සිදුවීම එසේ කෙළවර වෙතැයි මම සිතුවෙමි. නමුත් තනූජා අයියාට ද රෑම ගතු කියා තිබිණ. ඈ හඬමින් දොඩමින් කියවත්දී අයියාට මට වඩා තමන්ගේ බිරිඳ ලොකු වෙන්නට ඇත.

'නංගී...'

අයියා මගේ කාමරයට ආවේ යකෙක් සේ ය.

'දැං උඹට හොඳක් කියන්නවත් අපිට බැරි ද...?'

මම මුනිවතින් ඇදෙන් බැස්සෙමි.

'අම්මා කෙනෙක්වත් ගෙදර නැති එකේ තනූජා උඹට අවවාදයක් දුන්නහම ඒක ඔයතරං පුප්පන්න දෙයක් ද...?'

'මං පිප්පුවෙ නෑ.'

'පිප්..පුවෙ... නෑ. උඩ පැනගෙන ගිහිං පස්ස බිම ඇතගෙන වරෙංකො මෙතන.''

අයියා යන්නට ගියේ ය. මගේ ඇස්වලට කඳුළු පුරා ආ තරම්. කියන්නට දේවල් ඔනතරම් මගේ මුවඟට ආවේ ය. ඔවුන්ට ඕන දෙයක් කරගන්නට පුළුවන් විය. මගේ වයසේදී තනූජාට ළමයි තුන් දෙනෙක් ද සිටිති. ඔවුන් බිය වී සිටින්නේ මා ගැන ය. 'මං ගැන කරදර නොවුණට කමක් නෑ. ඕගොල්ලො තමං ගැන බලාගන්න' කියා කියන්නටත් මට සිතිණ. නමුත් මම සියල්ල හද පතුලේම සඟවා ඉවසාගතිමි.

මා තීරණයක් ගත්තේ ඒ මොහොතේ ම ය. මම කල්පට කැමැත්ත දෙමි. ඔහුව කසාද බැඳගෙන ඉක්මනින්ම මේ ගෙදරින් පිටව යමි. එතකොට අඩු තරමින් මට නිදහසේ ඉන්නටවත් පිළිවන් වනු ඇත. මේ ගෙදර කනක් ඇසී සිටිය නොහැකි වීම දරාගන්නටම බැරි දෙයයි.

ඊළඟ සතියේ මම උදෙන්ම ගෙදරින් පිට වුණෙමි. ඒ, අතරමඟ දී පන්තියේ මිතුරියක හමුවීම වැළැක්වීමට ය. මට අවශ්‍ය වූ පරිදිම කල්ප යතුරුපැදියේ නැගී තනිවම විත් මා මුණගැසිණ.

The Reader's Place Novel

මගේ වත මලක් සේ පිපෙන්නට ඇත.

'මට සුභදායක උත්තරයක් ලැබෙයි වගේ.'

'ලැබෙයි ලැබෙයි.'

'අදනං ඔයා මේ පාන්දරම පිපිච්ච මලක් වගේ.'

'ගෑනු ළමයිංව රවට්ටගන්න පුළුවං විදිහෙ වචන සෙට් එකක් හොයාගත්තෙ කොහොම ද කියල කියන්න...'

කල්ප හඬනගා හිනැහුණේ ය. මම නෙතුපිය නොසලා ඒ සිනහව පපුව පිරෙන්නට විඳගතිමි.

'ගෑනු ළමයි කියල පොදුවේ කියන්න එපා. මට ඕනෙ මේ මං ඉස්සරහා ඉන්න ගෑනු ළමයව විතරයි.'

ඇත්තම ඇත්ත නම් මාත් හෙව්වේ එහෙම පිරිමියෙකි. මල අම්මලාගේ පවුල් ජීවිතය දැක ඇත්තෙමි. එහි කිසිම කිසි සතුටක් වූයේ නැත. සමහර විට මිල මුදල් හිඟවීම නිසා ඔවුන්ට එහෙම තත්ත්වයක් උදා වූවා වන්නට ඇත. ඒවා දකිත්දී - පුංචි කාලේ සිටම මා පැතුවේ ආදරණීය පවුලකි. සෙනෙහෙබර පුරුෂයෙකුගේ රැකවරණය, යමක් කමක් තේරෙන තව යෞවනියක සන්දියේ සිටම මගේ අතිමහත් ප්‍රාර්ථනයක් විය. සමහර විට මිශ්‍ර පාසලක ඉගෙන ගෙනත් මේ වනතුරුම මා පෙම්වතියක වී නොසිටියේ හදවතේ වූ උවමනාව සපුරාලිය හැකි විදියේ විරුද්ධ ලිංගිකයෙකු ඒ වෙන්දිත් මට හමු නොවූ නිසා විය හැක.

'දෙවැනි ආදරේකට මගෙ හිතේ ඉඩක් ඇති කියල මං හිතන්නෑ කල්ප. ඒක නිසා කවදාවත් මාව එහෙම අසරණ තත්ත්වෙකටනං දාලා යන්න එපා.'

මා කීවේ හදවතින් ය. උගුර යටින් ය. ඒ මගේ ආත්මීය ප්‍රාර්ථනයකි. ප්‍රාර්ථනීය ආදරයකි. කල්ප මගේ දෝතින්ම අල්වාගත්තේ ය.

'ප්‍රොමිස් අංශු. ඔයා වගේ කෙල්ලෙක්ව නැති කරගනියි ද මං

මගේ කඳුළක්, ඔහුගේත් මගේත් අත් මතට වැටී - ඉහිරී ගියේ ය.

'ඔයා දවල්ට ක්ලාස් ඇරිලා යද්දි අපි කොහෙට හරි ගිහිං කතා කරමු. හැබැයි දැංම මේ ගැන යාළුවන්ටනං කියන්නෙපා.'

කොන්දේසි විරහිතව මම එකඟ වුණෙමි. ඔහු වගේ ප්‍රේමණීය පිරිමියෙක් එක්ක ජීවිතය බෙදාහදා ගැනීමේ දොළක් කාලයක සිටම මා පෙළයි. ඒ හින්දා මේ අවස්ථාව අහිමි කරගන්නට මට ඕන වුණේ නැත. යෙහෙළියන්ගෙන් සියල්ල සඟවා මම කල්පගේ මෝටර් බයිසිකලයට නැගුණෙමි.

'ඇත්තටම මේකනං හීනයක් වගෙයි අංශු.'

හුළං පහර කපාගෙන බසියිකලය ඉදිරියට ඇදී යද්දී කල්පගේ උස්හඬ සිහින් මිමිණුමක් වාගේ මට ඇසිණ.

'ඇයි...?'

'මං හිතුවෙ නෑ ඔයා වගේ ලස්සන කෙල්ලෙක් එකපාරටම මට කැමති වෙයි කියලා.'

'නැත්තං දෙපාරකට තුන්පාරකට කැමති වෙන්නයැ.'

අපි දෙදෙනාම සිනාසුණෙමු. මා සිටියේ ඒ පවන තරම් සැහැල්ලුවකිනි. ඉක්මනටම අම්මාට කල්ප ගැන කියා සියලු කටයුතු පිළිවෙලක් කරගන්නටත් ඒ අතරේ මම සිතින් සැලසුම් කළෙමි.

කල්ප මාව කැටිව ගියේ මූදු වෙරළට ය. මගේ අත මෘදු ලෙස අල්වාගෙන වෙරළේ ඇවිදින ගමන් ඔහු හුගක් දේවල් කීවේ ය. ඒ සියල්ල මගේ හිත මාලිගය තවතවත් වර්ණවත් කළා කියා මම සිතමි.

'අපේ අම්මානං ඔයාට අකමැති වෙන එකක් නෑ. ඒක නිසා මං අද හෙටම අම්මට ඔයා ගැන කියනවා.'

'එච්චර කලබල වෙන්නත් එපා.'

ඔහු සන්සුන්ව කීවේ ය.

'ඔයා තව ටික දවසක් මාව ආශ්‍රය කරලා බලන්න.

The Reader's Place Novel

ඉස්සෙල්ලාම ඔයා මාව ගැලපෙනව ද කියලා කල්පනා කරලා බලන්නෙපැයි... නේද...? ඔයාගෙ හිතේ මං ගැන විශ්වාසයක් ඇතිවෙන්න එපැයි.'

'ඒක කරන්නනං ඔයාට පුළුවං.'

'එහෙනං හෙමිහිට අම්මට කියන්නකෝ.'

මගේ බරින් එහෙමපිටන්ම මා නිදහස් වුවා සේය මට දැනුණේ. ඇත්තටම ඒ පුදුම සැහැල්ලුවකි. හිත එහෙම සැහැල්ලු වෙත්දී සියල්ල සතුටෙන් බාර ගන්නට පුළුවන. තනූජාගේ කංකරච්චලය පවා මාව කේන්ති ගැස්වූයේ නැත.

'අංශු මොකක්හරි පටලෝගෙන ද ඉන්නෙ දැං...?'

දවසක් කොස් කපන ගමන් තනූජා මගෙන් ඇසුවා ය.

'පටලෝගෙන... මොකද්ද...?'

මම ගානකට නැතුව - නොතේරෙන බවක් ඇඟවීමි.

'මං අහන්නෙ කොල්ලෙක් ඉන්නව ද කියලා...?'

'පිස්සු ද අනේ...'

ඈ හොඳින් මගේ මූණ දෙස බැලුවා ය. මම වෙනසක් නොපෙන්වා කොස් මදුලු ගැලවීමි.

'කොල්ලෙක් එක්ක යාළු වෙනවනං ඉන්න හිටින්න තැනක් තියෙන එකෙක් බලල තමයි යාළුවෙන්න ඕනෙ.'

මගේ මුවඟට සිනාවක් ආවේ ය. ඇයත් කරන්න ඇත්තේ ඒක ය. විවාහ වී ඇවිත් ටික දිනක් ගිය විට ඇය මේ ගේ අයියාගේ නමට ලියාගන්න කියා කියනු මගේ කනටම ඇසිණ. තවමත් එය සිදු වූයේ නැත. මේ වතාවේ අම්මා ලංකාවට පැමිණි පසු එය නොකර සිටීම ද නොහැකි වනු ඇත.

'මොකද අංශුලගෙ අම්මලට තියෙන්නෙ දෙන්නෙක්ට දෙකට බෙදලා දෙන්න තරං ලොකු ඉඩමක් නෙවෙයිනෙ.'

'අනේ මං අම්මගෙං මේවා ඉල්ලන්නෑ.'

'ඉල්ලනවට නෙවෙයි මං කියන්නෙ... කොහොමටත් ඉතිං මහ ගේ අයිති වෙන්නෙ පිරිමි ළමයින්ටනෙ.'

ඈ නොකියා කීවේ මේ ගේ ගැන අයිතිවාසිකම් කියන්නට මට සුදුසුකමක් නැති බව නොවේ ද...? හිත යටින් සිනාසුනා මිස මම ඒ ගැන වුව උරණ වෙන්නට නොගියෙමි. කොහොමටත් කල්පගේ ආදරය ජීවත් වෙන්නට මට ප්‍රමාණවත් බව මම දන සිටියෙමි. අම්මා මා ගැන නොබලා සිටින්නේ ද නැත. අනාගතයක් ගොඩනගා ගන්නට අපට බැරි වන්නේ නැත. ඒ දේවල් ගැන වුව ඕනෑවට වඩා නොසිතුවමනායැයි මම සිතුවෙමි. සමහර විට කල්පගේ ප්‍රේමයෙන් මා දෑස් අද කරගෙන සිටියා විය යුතු ය.

මම නිදහස සොයාගෙන ගියෙමි. ආදරය හා ජීවිතයට උණුසුම සොයා ගෙන ගියෙමි. ඒ මට නොලැබුණ දේ ය. පුංචි කාලේදීම මට අම්මාගේ හා තාත්තාගේ ආදරය අහිමි විය. ළමයෙක් වුණත් වැඩිහිටි ගැහැනියක සේ ගෙදරක වැඩපළ කරන්නට සිදු වූයෙන් ළමා වියක් ද මට අහිමි වූවා යැයි මම සිතමි. මට පවුලක් ද නොතිබිණි. ඒ සියල්ල ඕනෑම කෙනෙකුට උවමනා ය. අයියා ද ඉක්මනින්ම බිරිඳක ගෙදරට ගෙන එන්න ඇත්තේ එනිසා යැයි දැන් මට සිතේ.

'කටේ කිරි සුවඳ යන්න ඉස්සෙල්ලා ඌ ගැනියෙකුත් ගෙනවා ද...?'

තනූජා අපේ ගෙදරට ආ බව මා අම්මාට කී වේලේ, ඕ ඇසුවා ය. නමුත් කිසිදාක ඇය, 'පුතේ උඹලට ආදරයක් ලැබුණෙම නෑ නේද' කියා අපෙන් අසා නැත. එහෙම අසන්නට ඇයට අමතක වෙන්නටත් ඇත.

'ඉන්නකෝ, අපි ඉක්මනට මැරි කරනව. ඊට පස්සෙ ඔයා මං ළඟ. ඊට පස්සෙ ලෝකෙ තියෙන තරං ආදරයත් ඔයා ළඟ.'

කල්ප මගේ දෙසවනට මීපැණි වත්කරනවා වැනිව කියයි. මම එහෙම දවසක් පතාගෙන සිටියෙමි.

'යාළුවෙක්ගෙ ඇනෙක්ස් එකක් තියෙනව. මං ඒක ගන්න කියල ඉන්නෙ අපිට මැරි කරල නවතින්න.'

The Reader's Place Novel

දවසක් ඔහු එහෙම කීවේ ය. ඒ වෙත්දී මා ඔහු ගැන අම්මාටවත් කියා නැත. මට ඒ ගැන කියන්නට බැරි කමක් තිබුණාම නොවේ. කල්ප ඒ තරම් ඉක්මනක් නොපෙන්වීම නිසා මමත් ටිකක් පසුබෑවෙමි.

'ඔන්න ඒ ඇනෙක්ස් එක එහෙම බලලා... ඔයා කැමතිතං... මං ගැන අම්මටත් කියන්න...'

මම සතුටෙන් පිනා ගියෙමි.

'ඔය ඇත්තම ද කල්ප...?'

'මං ඔයාට බොරුවක් කියලා තියෙනව ද...? ම්...?'

'අපි එහෙනං අදම යං ඒ ගේ බලන්න.'

'මේ කෙල්ලට තියෙන හදිස්සියක්...'

'අනේ කල්ප...'

ඔහු මාව එහි එක්ක ගියේ ය. ඇනෙක්ස් එකේ තබා ප්‍රධාන නිවසේවත් කිසිවෙක් පදිංචිව සිටින බවක් නොපෙනිණ.

'මගෙ යාළුවගෙ අම්මයි තාත්තයි මේ දවස්වල එයාගෙ අක්කලගෙ ගෙදර නතර වෙලාලු. අක්කට බබෙක් හම්බ වෙලා.'

මිතුරා කල්පට ඇනෙක්ස් එකේ යතුරු දී තිබිණ. එය හරිත්දී මහත් පාළු මූසල පුසුඹක් පාව ආවේ ය. මම නැහැය හකුළා ගතිමි.

'වහලම දාලා තිබිලා පුස් ගඳ. ඔයා ආවහම බැරියැ සුද්ද කරලා සුවඳ කරලා ගන්න.'

'ෂෝක් ගේ කෑල්ල කල්ප. මේ බඩුමුට්ටුත් එක්ක ද අපට දෙන්නෙ...?'

'ම්... සමහරවිට එහෙම වෙන්නැති. ඒකනං මං හරියටම දන්නෑ.'

මම ගේ පුරා ඇවිද බැලුවෙමි. මගේ ඉරණම විසඳෙන්නට නියමිතව තිබුණේ ඒ මූසල පාළුගඳ ගහන ඇනෙක්සිය තුළ දී යැයි සත්තකින්ම මා දැන සිටියේ නැත.

'කොහොමත් අපි බැඳලා මෙහෙට එන්න හිටපු එකනෙ.'

පොඩි වී ගිය යහන දෙස බලමින් කල්ප මඳ සිනාවක් නගා ගත්තේ ය.

'ඒ වුණාට... අපි මෝඩ වුණා කල්ප... මෙහෙම දෙයක් නොවෙන්නයි තිබුණෙ.'

'හරි... හරි... කමක් නෑ ඉතිං. මොනවා වුණත් අපිට අපි නැති වෙන්නෑනෙ.'

'ඒ වුණාට...'

අප නොහිතන දේවල් - අප නොපතන දේවල් - අප නොකැමති දේවල් සිදු වෙන අවස්ථා ජීවිතවලට උදා වන්නේ ය. ඒත් එහෙම මොහොතකි. කෙසේ වෙතත් මම මටම දොස් පවරා ගත්තෙමි. යුවතියක ලෙස මා ඊට වඩා කල්පනාකාරී විය යුතුව තිබිණ. දැන් ඉතින් ගිය නුවණ ඇතුන් ලවාවත් ඇද්දවිය නොහැකි ය.

'මං කැමති කෙනෙක් ඉන්නව අම්මෙ. එයා මාව බඳින්න කැමතියි.'

මා අම්මාට කල්ප ගැන කීවේ ඔහු හෑමා ගිය නොගිය යුතු වූ ගමන ගැන නොකියා ය.

'ඒක හොඳයි. එහෙනං ඊළඟ සැරේ මං ආවහම අපි පොඩියට වෙඩින් එකක් අරගෙන ඒක ඉවරයක් කරලා දාමු. ඊට පස්සෙ මගෙ හිතටත් නිවනයි.'

අම්මා කීවේ හැම මොහොතකම මා ගැන හිතමින්ම ඇ කරදර වූ විලාසයකිනි. කෙසේ වෙතත් මම ඇගේ හිත රිදෙන යමක් නොකීවෙමි.

'අංශුව මං හිස් අතින් යවන්නෑ. ඕගොල්ලොන්ට හොඳ ජීවිතයක් පටන්ගන්න පුළුවන් වෙයි.'

මගේ කසාදය කෙසේ වෙතත් - අම්මා ආ ගමන් තනූජාට උවමනා කළේ ගේ හා ඉඩම අයියාගේ නමින් ලියවාගන්නට ය.

The Reader's Place Novel

'මේක මං දවසක දෙන්නටම දෙන්න හිතං හිටපු ගේ. ඒත් දැං උඹලට මේක ඕනම කියන නිසා ලියලා දෙන්නං.'

ඔප්පු තිරප්පුවල කටයුතු පිළිවෙලක් වන තෙක් කල්පව ගෙදරට කැඳවන්නට තනූජා කැමති වූයේ නැත. කොහොම වුණත් ඔප්පු ලියූ ගමන් අම්මා රුපියල් ලක්ෂ පහළොවක මුදලක් මගේ නමින් බැංකු ගිණුමේ බැර කළා ය.

'අංශුගෙ වෙඩින් එකේ වැඩවලටයි දැවැද්දටයි මං අධිං කරගත්ත සල්ලි ටික.'

'ඔච්චර ගාණක් අංශුගෙ පොතේ දාපු එකේ... අම්මට තිබුණා මේ ගේ තව ටිකක් පිළිවෙලට හදලා දෙන්න. අපි නෙවෙයි පුංචි එවුන් තුන්දෙනා ගැනවත් හිතලා.'

තනූජා ඊටත් ආඩපාලි කීවා ය. කොහොමටත් ඇය කිසිම දේකිං සෑහීමකට පත් වන ගැහැනියක නොවේ.

'මං මේ ගමන ආවෙ අංශු වෙනුවෙං. ඒකිව පිළිවෙලක් කරන්න. උඹල උදව් වෙනවනං ඒක කරපල්ල. නැත්නං මගෙ මුළුව පිස්සු වට්ටන්නෙ නැතුව ඉඳපල්ලා.'

අම්මා උදහස් වූවා ය. තනූජා කට වහගත්තේ එවිට ය. නමුත් විටින් විට ඇය ඇගේත් දරුවන්ගේත් අසරණකම ගැන කංකෙදිරි ගාමින් සිටිනු දැකිය හැකි විය.

'අංශු අර ළමයට ඇවිත් මාව හම්බවෙන්න කියන්න. අපිට වැඩි කාලයක් නැනෙ. ඒකනිසා අපි පහසු විදිහට වෙඩින් එක ලෑස්ති කරගමු.'

මම අම්මාගේ පණිවිඩය දුරකථනයෙන් කතා කොට කල්පට කිවෙමි. ඔහු එවේලේම දුවගෙන එනු ඇතැයි මා බලාපොරොත්තු වුණත් එවැන්නක් සිදු වූයේ නැත. ඊළඟ දවසේ පන්තියෙන් පසු ඔහු නමුවීමේ බලාපොරොත්තුවෙන් මම ඉවසා සිටියෙමි. ඊට පෙර හැම පන්ති දවසකදීම උදේ පාන්දර මට පෙරමග සුභ ලකුණු වූ කල්ප ලොකුගේ එදා දැකිය නොහැකි විය. දවාලේත් ඔහු ආවේ නැත. ඔහුගේ ජංගම දුරකථනය ද ක්‍රියා විරහිතව තිබුණෙන් මම කමියුනිකේෂන් සෙන්ටර් එකට ගියෙමි.

'ආ... නංගී...'

එහි හිමිකරු යැයි කල්ප මට කියා තිබූ රන්දික මා පිළිගත්තේ ය.

'කෝ අයියෙ කල්ප...?'

මගේ ප්‍රශ්නයෙන් රන්දික තිගැස්සුණ බවක් පෙනිණ.

'ඇයි නංගි කල්පව හොයන්නෙ...?'

'කල්පට අසනීපයක් ද අයියෙ...? ඇයි එයා අද නැත්තෙ...?'

'කල්ප ගමේ යනවා කිව්ව. මං හිතන්නෙ, ආයෙ එන එකක් නෑ. උගෙ වයිෆ්ට දෙවෙනි බබා හම්බවෙන්නත් ළඟයි මගෙ හිතේ. මෙහෙ ඔය පොඩි පොඩි ජොබ් කටුවලට සෙට් වුණාට අතට හරිහමං ගාණක් ආවෙත් නෑ කියලා චුරු චුරු ගගා හිටියෙ. ගමේ මොනවාහරි කරයි.'

මට දැනුණේ මා කේන්ද්‍ර කරගෙන මුළු ලෝකයම භ්‍රමණය වෙනවා සේ ය. ඉක්මනට මම එහි වූ ෂෝකේස් එකක් අල්වා ගතිමි.

'ඇයි නංගි... මොකක් හරි අවුලක් ද...?'

'අයියෙ ම්... මේ... කල්ප... කල්පයි මායි අතරෙ... සම්බන්ධයක් තිබුණා. එයා මාව බඳින්න පොරොන්දු වෙලයි හිටියෙ.'

'යකෝ මූ මාර පොරක්නෙ. ඕගොල්ලොත් හැංගි හැංගි වෙස්මූණු බැඳලා අන්තිමටනෙ මෙතනට ඇවිත් නටන්නෙ.'

මා ගෙදර ආවේ පිස්සුවෙන් වාගේ ය. අම්මා දුම්මල වරම අතට ගත් හනුමා සේ මාත් කැටිව කමියුනිකේෂන් සෙන්ටර් එකට ගියා ය.

'කොහෙද ඒකාගෙ ගම...? මං ගිහිං හොඳවයිං දෙකක් කතා කරන්නං උඹට...'

'අපි හරියට ගෙයක් දොරක් දන්නෙනං නෑ ආන්ටි. මේ පැත්තෙ බෝඩ්වෙලා හිටියෙ. කොල්ලො ඉතිං මෙතන සෙට් වෙනවනෙ. ඒ මිසක් අපි වැඩිය විස්තර දන්නෙ නෑ.'

The Reader's Place Novel

රන්දික කියන්නට ඇත්තේ ඇත්ත විය යුතු ය. කල්ප අපේ සම්බන්ධය හැම කෙනෙක්ගෙන්ම වසංගන්නා ලෙස මට පුනපුනා කීවේ ඇයි කියා තේරෙන්නේ දැන් ය. ඔහු ලස්සනට කපටි ලෙස සියල්ල සැලසුම් කළේ ය. මම නූගත් - මෝඩ - අනුවණ කෙල්ලක ලෙස ඔහුගේ උගුලේ හසු වීමි.

'මට එයා කියලා තිබුණෙ බිස්නස් කරනව කියල.'

'මෙන්න මෙහෙ වරෙං යන්න. බිස්නස්.'

අම්මා මාවත් ඇදගෙන යළි ගෙදර ආවා ය. සියල්ල විනාශව ගොස් තිබිණ. කල්ප නිසා මගේ ජීවිතයේ සියලු වටිනාකම් මවිසිත් අහිමි කරගන්නා ලද බව මා කිසිවෙකුට කීවේ නැත. ඒ බව හෙළි කළාය කියා යළි කිසිවක් වෙනස් කළ නොහැකි වග ද මම දැන සිටියෙමි.

'මං ඕව කලිංම කිව්ව. කොහෙද ඉතිං... අපි ඊරිසියාවට කියනව කියලනෙ හිතුවෙ.'

තනූජා කතා කළේ මා ගැන අනුකම්පාවෙන් නොව මට වූ දේ ගැන අවඥාවෙනි. වචනයක්වත් කතා නොකර නිහඬ වන්නැ මට සිදු විය. අම්මා යළි විදේශගත වූ පසු තත්ත්වය වඩාත් නරක් වූයේ ය. තනූජා උඩ පැන පැන මාව තලන්නට පටන් ගත්තා ය. ගෙදර ජීවත්වීම මට එපාම වී ගියේ ය.

'ඉතාලි යවන්න කෙල්ලෙක් එහෙම ඉන්නවනං කියපං අංශු නංගි. මං දන්න කොල්ලෙක් එහෙ ඉන්නවා... සල්ලි ටිකක් අරං බොරු කසාද සහතිකයක් එහෙම හදලා දීලා එහෙට ගන්නව. ලක්ෂ දහතුනක් විතර වියදං වුණාට මොකද බං එහෙ ගිහිං මාස පහෙං ඒක හොයාගන්න බැරි යැ.'

ඉතාලියේ සිට පැමිණි අපේ අසල්වැසි කාන්තාවක වූ ශිරාති අක්කා මට එහෙම කීවේ කල්පගේ සිදුවීම නිසා නෙතින් නොහැඟුවත් මා සිතින් බරපතල ලෙස ඔත්පතලව සිටි කාලයේ ය. ගෙදර හිඳීමත් එපා වී සිටි මම දෙවරක් නොසිතා ඉතාලි ගමනට කැමති වුණෙමි.

03

අපේ පැත්තේ මිනිසුන් ඉතාලිය ගැන කතා කළේ ඒ සුරපුරයක් ගානට දමා ය.

'පිටරට යනවනං කොහොමහරි පැනගන්න ඕන ඉතාලියට. ගියොත් ඉතිං ගොඩ තමයි.'

බොහෝ විට තරුණයන් එසේ කියනු මම අසා ඇත්තෙමි. බෝට්ටුවලින් ඉතාලියට පැන ගැනීම වෙනුවෙන් නියෝජිතවරුන්ට ලක්ෂ ගණන් ගෙවූ පුවතුත්, එසේ බෝට්ටුවලින් ගොස් හසු වී යළි හිස් අතින්ම ලංකාවට පැමිණි කතාත් මා අසා ඇත. අපේ ගමේ පමණක් නොව ලංකාවේ හැම ප්‍රදේශයකම වගේ මිනිසුන් ඉතාලිය ගැන සිතන්නේ එසේ ය. ලංකාවේ පමණක් නොව නොදියුණු හා දියුණු වෙමින් පවතින තව බොහෝ රටවල ජනයා ඉතාලිය ගැන සිතන්නේ එසේයි, එහි ගොස් ටික දිනකදීම මම දැනගතිමි.

ඉතාලිය වූ කලී දියුණු බටහිර රටකි. එය බහු ආගමික හා බහු ජාතික ජනයාගෙන් පිරී පවතින්නේ ය. නමුත් ඉතාලිය තුළ දී ඔවුන් සියලුදෙන ඉතාලිකරුවන් ය. 'ඉතාලියට ආවොත් ඉතාලිකාරයෙකු ලෙස ජීවත් වන්න' යැයි කතාවක් තිබේ. එය සහතික ඇත්තකි. එහිදී හැම ජාතිකයෙක්ම කතා කළ යුතු වූයේ ඉතාලි භාෂාවෙනි. අන්තර්ජාතික භාෂාව වන ඉංග්‍රීසියටවත් එහි තැනක් නැත. හැම කෙනෙක්ම සැරසෙනු ලැබුවේ ඉතාලි ජාතිකයන් ලෙසටම ය. එම නිසා සැබවින්ම එය පොදු සම්මතයකට එළඹී බහු වාර්ගික ජනාවාසයකි.

The Reader's Place Novel

කෙසේ වෙතත් ඉතාලි යාමට පෙර මමත් එය ගැන ලස්සන චිත්‍රයක් මවාගෙන සිටියෙමි. හිමෙන් වැසුණු කඳු, සුන්දර තණ බිම්, දියුණු - දර්ශනීය මාර්ග පද්ධති, එකම සැලැස්මකට ගොඩනංවන ලද නිවාස පද්ධති, දැවැන්ත රෝමානුකතෝලික පල්ලි...

එහි ගිය ගමන් ඇස් දෙකට ඇති වෙනකල් ඉතාලියේ සිරි විදින්නට ඉඩ සලසන්නෙමැයි මම සිතාගතිමි. වතිකානුව, කොලෝසියම වැනි වැදගත් හා ඓතිහාසික ස්ථානවලින් ගහත රෝම නගරය පිළිබඳ ලියැවුණු සංචාරක ග්‍රන්ථ කිහිපයක් ද මම මිලදී ගතිමි. මයිකල් ආන්ජලෝ වැනි දක්ෂ චිත්‍ර හා මූර්ති ශිල්පීන් ගැන සාමාන්‍ය පෙළ චිත්‍ර කලාවට මා හදාරා තිබේ. අදහාගත නොහැකි එම නිර්මාණ මගේ පියවි දෑසින් දකින්නට ලැබෙන අවස්ථාව පිළිබඳව මම දැඩි ප්‍රීතියකින් පසු වීමි.

සත්තකින්ම මේ පළායාමකි. අහිමි වී ගිය මගේ ප්‍රේමයත්, ප්‍රේමයට බිලි දුන් මගේ ආත්මයත් හදවත ළඟ හොල්මන් කිරීම නිසා බියපත් මම රටින් ද පැන යාමට සූදානම් වීමි. ඒ පැන යාම ඉතාලියට වීම මට මහත් සැනසිල්ලක්ම විය.

'වෙනිසිය බලන්න මට ආසයි ශිරානි අක්කෙ. ඒක තනිකරම වතුරෙ උඩ හදපු නගරයක් කියල මං අහල තියෙනව.'

මම ශිරානි අක්කා සමඟින් මගේ උනන්දුව ගැන හෙළි කළෙමි.

'රස්සාව කරනව මිසක් මන්නං ඔය මොන මකබාවකවත් ගිහිං නෑ අංශුවො. පලයංකො පලයංකො උඹ ගිහිං බලපංකො.'

ඇය නොසැලකිලිමත් ලෙස කීවා ය.

'ඉතාලි ගියාට පස්සෙ නැන්දට අපිව අමතකම වෙලා යයි ද දන්නෑ. නේද පැටියො...?'

තනූජා පොඩි එකාට කියනවා සේ කීවේ ඇගේ හදවතේ අවංකව නැගුණ ප්‍රකාශයක් බව මම දනිමි. ආයේ කිසිදාක මම ලංකාවට නොඑන්නෙමැයි හදවත කොනක හැඟුමක් විය.

එපමණටම මට ලංකාවේ වුයේ අහිමිවීම් ය. ආදරයෙන් ළඟට දිව එන්නට මාපිය දෙදෙනෙක් මට එහි නොවූහ. මගේය කියා නිවසක් හෝ පෙම්වතෙක් හෝ සැමියෙක් හෝ දරුවෙක් වූයේත් නැත. ඒ සියල්ල මට ලංකාවේදී අහිමි වූ දේ ය. ඒ නිසා ඒ අහිමිවීම් ගැන සිතමන් - දකිමින් තවත් කම්පා වනවාට වඩා මතු කිසි දිනෙක ලංකාවට පය නොතබම් යන සිතිවිල්ල මට සැනසිල්ලක් වූයේ ය.

'මට මේ පොඩි එවුවෙ අමතක වෙන එකක් නෑ තනූජා පුළු පුළුවං වෙලාවට මං උන්ට මොනාහරි එවන්නංකො.'

'අවුරුද්දකට දෙකකට සැරයක්වත් අංශු අපිව බලන්න ඇවිත් යන්න.'

මා සුසුමක් හෙළුවා පමණ ය. මගේ අනාගතය කෙසේ සැකසෙනු ඇත්ද කියා නිශ්චිත විශ්වාසයක් මට වූයේනැත. කෙසේ වෙතත් මම වෙන දේකට මූණ දෙන්නට හිත හදාගෙන සිටියෙමි.

'ගියා කියලවත් මට කෝල් එකක් දීපං තංගි.'

ගුවන් තොටුපොළේ දී අයියා කීවේ ය. ඔහු දුකින් සිටියේ ය. නමුත් මගේ හිතේ නම් කිසිම දුකක් වත් සතුටක්වත් නොවිණ. සැබැවින් ම එය හැඟීම්වලින් හිස්ව තිබුණා සේ ය. හැර යන්නට බැරි දෙයක් ලංකාවේ නොමැතිවා සේ මට දැනිණ.

ඒ ගුවන් යානයක මගේ ප්‍රථම අත්දැකීමය. ඉතාලි භාෂාවෙන් කතා කරන මිලාන් හා රෝම නගරවල ගුවන් තොටුපළවල්වත් මට කිසි බියක් නොදැනිණි. ගුවන් යානය ගොඩබිමට සමීප වෙද්දී දුටු හිම මිදුන සීතල සුදු කඳු සේම මාත් ගල් වී සිටියාදැයි නොදනිමි. කෙසේ වතුදු මා හැසිරුණේ හැඟීම් දැනීම් ඇති යුවතියක ලෙස නොව අසංවේදී රොබෝවරියක ලෙස කියා නම් මට නොදැටම දැනිණ.

මට පහසුවෙන් හැඳිනගත හැකි වනු පිණිස සංජුල ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වැනි ටී-ෂර්ට් එකක් හැඳ නිල් කැප් තොප්පියක් පැළඳ රෝමයේ ගුවන් තොටුපළ වෙත පැමිණ සිටියේ ය.

Reader's Place Novel

'මං හිතන්නෙ අංශු වෙන්නැති.'

අඩමාන බැල්මකින් මා ට්‍රොලිය තල්ලු කරගෙන ඔහු වෙත යත්දී සංජුල සිනහවකින් ඉදිරියට ආවේ ය.

'ඔව්. සංජුල ද...?'

'එළියෙ සීතල වැඩියි. ආ... මං ඔයාටත් එක්ක ජැකට් එකක් අරං ආවා.'

ඔහු මට ජැකට් එක දාගැනීමට උදව් කළේ ය. ට්‍රොලියත් තමන් වෙත පවරා ගත් සංජුල කඩිනමින් ගුවන් තොටුපළ පිටවීමේ දොරටුව වෙත ගමන් කළේ ය.

'එන්න අංශු. මං ටැක්සි එකකිං ආවෙ.'

ඔහු මගේ ගමන් මළු ටැක්සියේ ඩිකියට පටවා මට පිටුපස දොර හැර දුන්නේ ය. ඊළඟට අනිත් පසින් වින් මා ළඟින්ම හිඳගත්තේ ය.

'පියස්සෙ කොරනේලියා.'

සංජුල රියදුරාට කී දේ එවෙලේ මට තේරුණේ නැත. කොරනේලියා හන්දියට යා යුතු බව ඔහු පැවසී යැයි මා තේරුම් ගත්තේ පසුව ය.

මා තුළ වූයේ වෙනත් ග්‍රහලෝකයකට පිවිසියා වන් අමුතු සතුටකි. රිය වේගයෙන් පැදවිණි. මම එහි වීදුරු ජනේලයෙන් පෙනෙන දර්ශන මා තුළට උරාගන්නට මෙන් දෑස් විකසිත කොට බලාගෙනම සිටියෙමි. ඒ වෙලාවේ මගේ හදමඬල තුළ පොරබදමින් තිබී හැඟීම් ඒ ලෙසින්ම ඔබට පහදා කියන්නට කවර කලෙකදීවත් මා අපොහොසත් වනු ඇත. මීට පැය කිහිපයකට පෙර ලංකාවේ කුඩා ගෙයක ජීවත් වූ අංශු මන්තිකා පතිරණ නම් වූ මා, මේ මොහොතේ ලොව දියුණුම රටක, ඓතිහාසික නගරයක හුස්ම ගනිමින් සිටින බව කොහොම විශ්වාස කරන්න ද...?

'රෝමෙ ලස්සන පස්සෙ බලාගන්න බැරියැ. දැං ඉතිං මාත් එක්ක කතා කරලා අඳුනගෙන ඉන්න එපැයි.'

මගේ සවන ළඟින්ම සංජුලගේ පිරිමි හඬ ඇසිණි. මම ඔහු දෙස බලා මඳහසක් නගාගතිමි.

'ඉතාලිය කියන්නෙ ඉස්කෝලෙ යන දවස්වල ඉඳලම මං ආසාවෙං හිටපු රටක්. ඒ රටට මෙහෙම එකපාරටම ආවයි කියන එක... තාමත් මට හීනයක් වගේ.'

මම ඇත්තම ඇත්ත කීවෙමි.

'ඔන්න ඒ හීනෙ සැබෑ කරලා දුන්නෙ මම.'

සංජුල දඟකාර ස්වභාවයකින් කීවේ ය. මා ඔහුව හරියට දුටුවේ එවේලේ විය යුතු ය. පිරුණු මුහුණක් හා බොකුටු කොණ්ඩයක් ඔහුට තිබිණ. කොපුල් පුරාම රැවුල් කොට වැවී තිබුණේ දින තුන හතරකින් රැවුල නොබෑ බව ලෝකයටම ප්‍රකාශ කරමිනි. මඳ රතක් ඔහුගේ දෑසේ දැකිය හැකි විය. ඒ සිනහව මනබඳනා සුළු ය.

'මට නවතින්න තැනක් තියෙනව ද සංජුල...?'

'දැනටනං මගෙ ගෙදර තමයි අංශු. පස්සෙ හෙමිහිට වෙන තැනක් හොයාගමු. මෙහෙ ඉතින් නවතින්න තැං ගන්න එක ලේසි නෑ.'

ඔහුගේ මුවඟ අමුතු සිනහවක් වීය.

'ඇයි ඒ...?'

'අපේ අය ගේ කෑල්ලක් ගත්තහම ඒකෙ කට්ටිය පුරෝගන්නව. කාමර නෙමෙයි කුලියට දෙන්නෙ පොඩි ඇඳවල්. ඒවත් ඉතිං ගිනි ගණං. ලයිට් බිල්වලට වෙනම ගෙවන්න ඕනෙ. එතකොට කෑම වියදම.'

'මට ඉක්මනට ජොබ් එකක් හොයාගන්න පුළුවං වෙයි ද...?'

'හොයමු ඉතිං. ටිකක් හරි භාෂාව ඉගෙනගෙනත් ඉන්න එපැයි.'

'එහෙනං ටිකක් හරි භාෂාව ඉගෙන ගන්න මට සංජුලගෙ ගෙදර නවතින්න හම්බවෙන එක හොඳයි.'

The Reader's Place Novel

සියල්ල සිදුවන්නේ හොඳම විදිහට යැයි මට සිතෙන්නට ඇත. නමුත් ඒ සිතිවිල්ල සිදී බිඳී යන්නට ගත වූයේ තවාතැනට එන තෙක් ගත වූ විනාඩි කිහිපයක කාලය පමණි.

'මේක තමයි මගෙ බංගලාව.'

ගමන් මළු ටික බිම තබා ටැක්සිය නික්ම ගිය ගමන්, සංජුල සාක්කුවෙන් යතුර ගනිමින් කීවේ ය. එය ගෙයක් නොව තනිකාමරයක් බව මට වැටහුණේ දොර හැරි ඉක්බිතියි. මගේ ඇස් විසල් වෙන්නට ඇත.

'එක කාමරේ ද තියෙන්නෙ...?'

සංජුල හඬනගා හිනැහිණ.

'ඔයා හිතනව ද මෙහෙ අපිට ලංකාවෙ වගේ කැලි තුන හතරෙ ගෙවල් තියෙනව කියල...?'

දැං ඉතිං මා වතුරට පැන හමාර ය. ඉන්න බෑ කියා ගෙදර දිවයාමට නුපුළුවන. මම යටිතොල සපා ගතිමි. සංජුල මගේ වෙනස දකින්නට ඇත.

'මේ කෑල්ලෙත් අංශු පස් දෙනෙක් හිටිය. මං උන්ට යන්න කිව්වෙ ඔයා නිසා.'

'මං නිසා...?'

'ඔව්. ඔයාගෙ ඩොකියුමන්ට්ස් හදනකොට මගෙ වයිෆ් විදිහටනෙ හැදුවෙ. එතකොට මෙහෙ නගරසභාවෙං ඇවිත් චෙක් කරනව මේ කාමරේ කී දෙනෙක්ට ඉන්න පුළුවන් ද කියල. අරුන් ටික හිටියනං කීයටවත් ඔයාගෙ ඩොකියුමන්ට්ස් ටික පාස් කරගන්න ලැබෙන්නැ.'

'අනේ, එහෙනං මං නිසා ඔයාට පාඩුවක් වෙලා තියෙන්නෙ.'

'නෑ ඉතිං. අපි මෙහෙට වෙලා නිකංම ඉඳලා හරියන්නෑනෙ අංශු. මොනාහරි කරල කීයක්හරි එකතු කරගෙන ලංකාවට යන දවසක අරං යන්න එපැයි. ඒකයි මං හිතුවෙ බොරු මැරේජ් සර්ටිෆිකේට් එකකිං ගර්ල් කෙනක්ව ගෙන්නගෙන කීයක්හරි

මට ඔහුගේ තත්ත්වය තරමක් පැහැදිලි විය. හැමදේම මෙහිදී මුදල් ය. මුදල් මිස ජීවිතයක් නොමැත. ඔවුන්ට ජීවිතය තිබෙන්නේ ලංකාවේ ය. ලංකාවේ කිසිත් නැති කමට මෙහි පැමිණි එකම කෙනා සමහර විට අංශු මන්තිකා පතිරණ විය යුතු ය.

'මං මෙතනිං අංශුට පාටිෂන් එකක් හදල දෙන්නංකො. එතකොට ඉතිං වෙනම කාමරයක් වගේ තමයි.'

මම මඳහසක් නගාගතිමි.

'අංශු මැරිකරල ද...?'

'අනේ නෑ.'

'ඒකත් හොඳයි.'

'ඇයි...?'

'නෑ ඉතිං. එතකොට නිදහස්නෙ. මැරි කරන්න කලිං මෙහෙම රටකට ඇවිත් ස්ථාවරයක් හදාගන්න එක හොඳයි.'

සංජුල මගේ ඇඳට 'පාටිෂන්' ගැසුවේ ඉටිකොළ වලිනි. ලංකාවේ දිළිඳු ජීවන ක්‍රමය ඔවුන් රෝමයෙත් නිර්මාණය කරනවායි මම හිත යටින් සිනාසුනෙමි. නමුත් කීයක් හෝ හොයාගෙන එය ලංකාවට එවන්නට ශ්‍රී ලාංකිකයන් කොයිතරම් වෙහෙසෙනවා ද කියා මා හරියටම තේරුම් ගත්තේ පසුව ය.

'ඉස්සෙල්ල අපි කොල්ලො හතරපස් දෙනෙක්ම හිටියනෙ. ඉතිං එක එකා මාරුවෙං මාරුවට තමයි උයන්නෙ. සතියකට සැරයක් වගේ තමයි එකෙක්ට ඔය එපා කරපු කෝස් එක එන්නෙ.'

'මං මෙහෙ ඉන්නකල් සංජුලට මං උයල දෙන්නං.'

'ගෑනු අතකිං උයපු බත් ටිකක් කන්නත් ආසයි.'

යාන්තම් හිස කසමින් ඔහු එය කී ආකාරයට මට පව් කියා සිතිණ. මුදල් ගත්තත් මාව ලංකාවෙන් මුදවාගෙන ඉතාලියට ගෙන්වා සංජුල කළේ ලොකු උදව්වකි. මේ කාමරයෙන් ඔහුට ලැබුණ ආදායම ද මා නිසා අහිමි විය. ඉතින් මාත් ඔහුට යමක් කළ යුතුව තිබිණ.

The Reader's Place Novel

'අද ආපු ගමං නිසා ඔයා උයන්න මහන්සි වෙන්න එපා. මං ටාර් ගාලා දුවල ගිහිං බත් එකක් ගේන්නං.'

'බත්...?'

මම පුදුම වුණෙම්.

'ඔව්, ඉතාලියෙ රීසෝ' පාපැදියක නැගුණ සංජුල ඉගිල්ලී ගියේ ය. නත්නාදුනන ඉතාලියේ, කාත් කවුරුත් නැති හුදෙකලාවක අතරමං වූවා සේ මට දැනිණ. නමුත් මට කිසි බියක් දැනුණේ නැත. ඒ තිගැස්ම මට තවමත් මතක ය. ඒ තිගැස්සට මම දැඩි ආදරය කරමි.

සංජුල ලොකු බත් පැකට් එකක් ගෙනාවේ ය. එය අප දෙදෙනාටම සෑහෙන එකකි. පිඟන් දෙකක් ගෙන ඔහු එය දෙකට බෙදුවේ ය. මාළු පිණි කිහිප වර්ගයක්ම එහි විය.

'මෙහෙත් ලංකාවෙ වගේම බත් මාළු තියෙනවද...?' සංජුල හිතැහිණ.

'මෙහෙ සිංහල කඩ තියෙනවා. මේ ළඟ පාත සිංහල කෑම කඩයක් තියෙනව.'

හැමදාම උයන්නට ඔවුන් සිංහල එළවළු, මැල්ලුම් සපයාගන්නේ කෙසේ දැයි සිතින් හිතුවත් මම ප්‍රශ්න නොකළෙමි. අනවශ්‍ය ලෙස ප්‍රශ්න ඇසීම සංජුලට හිසරදයක් වේවි යැයි සිතූ හෙයිනි. අධික සීතල හැරෙන්නට ලංකාව සිහිපත් කරමින් ශෝක වන්නට මට කිසිදු හේතුවක් නොවිණ. ඒ සීතල කොයිතරම් දැඩි ද කියා පහදා කියන්නට මම නොදනිමි. මගේ දෑත් දෙපා ගල් ගැසී, දෙතොල් කට කට ගා වෙව්ලී ය. කතා කරත්දී මුවින් දුමක් පිටවූයේ ය.

'ඔයාට සීතල දරාගන්න අමාරු වෙයි වගේ ද...?'

'නෑ සංජුල. මට පුළුවං පුරුදු වෙන්න. කොහොමටත් මං සීතලට ආසයි.'

මා ලෙහෙසියෙන් පරාජය බාරගන්නට සූදානම් වූයේ නැත.

දැන් ඉතින් ඉදිරියට තැබූ පය ආපසු ගත නොහැකි ය. අනික් අතට රෝමයට එනවා නම් රෝමන්වරයෙක් ලෙස ජීවත් විය යුතුම ය.

මා ගෙනා ඇඳුම් කොහෙත්ම මේ සීතලට ඔරොත්තු දෙන ඒවා නොවේ. එහෙයින් මා ශීත සෘතුව සඳහා ඇඳුම් මිලදී ගත යුතුව තිබිණ. අම්මා මගේ විවාහය හා දෑවැද්ද වශයෙන් වෙත් කළ රුපියල් ලක්ෂ පහළොවෙන් විශාල මුදලක් සංජුලට ගෙවා තිබිණ. ලිපි ලේඛන සකසා ගැනීමට ද මුදල් වැය විණ. තවත් හැත්තෑ දහසක පමණ මුදලක් යූරෝ වලට මාරු කරගෙන එන විට රැගෙන ආවෙමි. ඒ, සුළු රැකියාවක් හෝ සොයා ගන්නා තෙක් කුසගිනි නිවාගනු පිණිස පරිස්සමින් තබා ගැනීමට ය. නමුත් මේ දේශගුණයට සරිලන ඇඳුම් පැළඳුම් නැතිව පිටත නොව කාමරය ඇතුළේවත් සිටිය නොහැකි වූයේ ය.

'මට වින්ට එකට හරියන ඇඳුං ටිකක් ගත්තෝනෙ සංජුල.'

වෙන කියන්නට කෙනෙක් මට එහි නැත. මේ වතාවේ ශිරානි අක්කා එන්නේත් රෝමයට නොව රෝමයෙන් ඈත පිහිටි නාපෝලිවලට යැයි ඇය කීවා ය.

'ඉතිං අපි යං...'

ඔහු උදව් කරන්නට ඉදිරිපත් වීමේ සූදානමින්ම සිටියේ ය.

'අදම...?'

'ඔව්. මං අද නිවාඩුවක් ඉල්ලගත්තා බොහොම අමාරුවෙං. ඔයා එන නිසා. හෙටනං මං වැඩ. ඒක නිසා ගන්න දෙයක් අදම ගන්න වෙයි.'

'කමක් නැද්ද...?'

'මොන පිස්සු ද අංශු...? ඔයාට මෙහෙ වෙන කවුද ඉන්නෙ...?'

සංජුල මට අඳින්නට ඔහුගේ අත් දිග ටී - ෂර්ට් එකකුත් ජර්සියකුත් දුන්නේ ය. ඒ මතින් ඔහු ගුවන් තොටුපළට ද ගෙන ආ ජැකට් එක දමා ගතිමි. නමුත් සීතලෙන් වහන් වෙන්නට ඒ ප්‍රමාණවත් නොවී ය.

The Reader's Place Novel

'මං හිතුවා ඔයාට ශිරානි අක්කා ඔක්කොම විස්තර කියලා ඔයාව හොඳට ලෑස්ති කරලා එවයි කියල.'

'ශිරානි අක්කට අමතක වෙන්න ඇති.'

'මට හරි පුදුමයි.'

දොර වසා කාමරයේ යතුර සාක්කුවේ දමාගනිමින් සංජුල පැවසීමි.

'ඇයි...? මොකට ද...?'

'ඔයා ඉතාලියට ආපු එක ගැන.'

මට දිග සුසුමක් හෙළිණි.

"ඔයා වගේ ගොඩක් ලස්සන - බැඳලත් නැති ගෑනු ළමයෙක්... මෙහෙ කවුරුවත් ඇත්තෙත් නැතුව මේ විදිහට ආව කිව්වහම පුදුමයි.'

'මට කොහොමටත් කවුරුවත් නෑ වගේ තමයි.'

දුක්බර කතාවක් කීවාට මගේ දෙතොල් අතරේ මන්දස්මිතයක් නළියෑවේ ය. සංජුල මදෙස බලා සිටියේ පුදුමයෙනි. නමුත් මම ඊට එහා දෙයක් කියන්නට ඉක්මන් නොවීමි.

'පස්සෙ වෙලාවක... ඔයා කැමතිනං විතරක් අපි ඒ ගැන කතා කරමුකෝ.'

ඔහු හාරාවුස්සන්නේ නැතිව ඒ කතාව කල් දැමීම මට සහනයක්ම විය. රෝමයේ, මා නම නොදන්නා වීදි දිගේ සංජුලත් සමග සාප්පු සවාරියේ ගිය ඒ ගමන සැබැවින්ම තවමත් මට සිහිනයක් සේ ය. ඒ ගමන, ඇලිස් විස්මලන්තයට ගිය ගමන තරම් චමත්කාරජනක ය. කල්ප ලොකුගේගේ දසුන දකින මහත් බලාපොරොත්තුවෙන් පරිගණක පන්ති ගිය අංශු මන්තිකා මේදා කියා මට විශ්වාස කරගත නොහැකි තරම් වූයේ ය. කල්පගේ ද්වේශ සහගත පලා යාම නිසා අන්ත අසරණ වූ අංශු මේ ද කියා මම සිතුවෙමි. ඒ කෙතරම් වෙනසක් ද...? ලංකාවේ දුප්පත් ගෙදරක ඉපි ද බිම් මලක් සේ අහස දෙස බලා උන් අංශු මේ ද...? අද ඇය

ලෝකයේ දියුණුම රටක අග නුවර වීදි දිගේ පීසා කමින් ඇවිදිමින් සාප්පු සවාරියේ යෙදෙනවාය කියා කොහොම අදහා ගන්න ද...?

'මේක අංශුට මගෙ ගානෙ.'

සංජුල මට උණුසුම සඳන බ්ලැන්කට් එකක් මිල දී ගෙන දුන්නේ ය. මම උවමනාවටත් වඩා ස්තුතිවන්ත වීමි. ඔහුගේ ත්‍යාගශීලීභාවය ගැන තනිවම ද කල්පනා කළෙමි. නමුත් මාව ඉතාලියට ගෙන්වාගැනීම සඳහා ලක්ෂ ගණනාවක් ලබාගත් ඔහුට, බ්ලැන්කට් එකකට වියදම් වූ යූරෝ හතර පහ මොකක් ද කියා මා තේරුම් ගත්තේ පසුව ය.

සාප්පු ගොස් යළි කාමරයට එන ගමන් සංජුල පාන් පැකට් දෙකක් මිල දී ගත්තේ ය. ඒ එක පැකට් එකක පාන් ගෙඩි තුනකි. පාන් කීවාට ඒවා අපේ බනිස්වල හැඩයට හා ප්‍රමාණයට සමාන ය. නමුත් ඊට වඩා සැබෑ නැවුම් රසයක් ඒවායේ තිබේ. ලංකාවේ සිට මා සීනි සම්බෝල ගෙනාවා යැයි දැනගත් ගමන් සංජුල පාන් කන යෝජනාව ගෙනාවේ ය.

'නැත්තං මං හිටියෙ රෑට පාස්තා හදන්න.'

'පාස්තා...?'

'ඔව්. පාස්තා කියන්නෙ මෙහෙට අපේ රටේ බත් වගේ තමයි. මං හෙට උදේට ඔයාට කියලා දෙන්නංකෝ හදන විදිහ.'

'හා.'

මම ප්‍රීතියෙන් නිස වැනුවෙමි. සත්තකින්ම මට ලංකාවේ සිටි අංශුව අමතක වූ තරම ය. රෝම නගරය තුළ ජීවිතය දෝතින් පිළිගන්නට මම සැදී පැහැදී සිටියෙමි. මෙහි ජීවත් වීම සඳහා දැන උගත යුතු සියල්ල ඉතා ඉක්මනින් අධ්‍යයනය කිරීම මගේ ලොකුම අපේක්ෂාව විය. මා මෙහි පැමිණියේ ජීවිතය අලුත් තැනකින් - අලුතින් පටන් ගැනීම සඳහා ය. මා මුල දී හිතා හිටියාටත් වඩා ඊට ශක්තියක් හා ආශාවක් මා තුළ ගැබ්ව තිබී ඇති බව දැන් මට වැටහේ. මේ මනස්කාන්ත නගරයට මා ඉක්මනින්ම හුරුපුරුදු වනු ඇත. යාන්තම් උඩින් - පල්ලෙන් නොව මට මුළුමනින්ම

The Reader's Place Novel

මෙහි ජීවත් විය යුතු ය. ඒ සඳහා භාෂාව ඉගෙන ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ, ඉතාලි ජාතිකයන් සේම විජාතිකයන් ද සම්පූර්ණයෙන්ම වගේ භාවිත කළේ ඉතාලියානු භාෂාව වන හෙයිනි. භාෂාවක් නැතිව සන්නිවේදනය පහසු නැත. හදවතේ ගැඹුරුම තැන උපදින හැඟීම් නිවැරදිව ප්‍රකාශ කිරීමටත්, නිවැරදිව තේරුම් ගැනීමටත් භාෂාව නොදැන නුපුළුවන.

'මට ඉක්මනට ලැංවේජ් එක ඉගෙන ගන්න ඕන සංජුල.'

සීනි සම්බෝල හා මාළු ඇඹුල් තියල් සමග පාන්කන ගමත් මම සංජුලට කීවෙමි. මාළු ඇඹුල් තියල් කත්දී, එය පිළියෙල කළ තනූජාව සිතේ ඇදී මැකී යන ලදී.

'මං කියලා දෙන්නං. ප්‍රශ්නෙ මාත් දවල්ට ගෙදර නැති එකනෙ.'

'ඉක්මනට ජොබ් එකක් හොයාගන්නත් ඕනෙ. අනේ තියෙන සල්ලි ටික ඉවර වුණාට පස්සෙ... ඉතාලියෙ බඩගින්නෙ මැරිලා යන්නයි වෙන්නෙ.'

'අපේ කෙල්ලෙක්ට එහෙම බඩගින්නෙ මැරිල යන්න දෙයි ද අංශු අපි.'

සංජුල කතා කළේ සරදම් සරින් නොව සැබවින්ම කිසිසේත් එසේ වන්නට ඉඩ නොදෙන අපේ කමක් - තමන්ගේ කමක් හඟවමිනි. ඒ ජාතික හැඟීම යැයි මම සිතුවෙමි.

'මාව ඉතාලියට ගෙන්න ගත්තා මදිවට කන්න බොන්න දෙන්නත් වුනොත් ඔයාට ෂෝක් එකට තියෙයි.'

ඔහු හිනැහුණා පමණි. ඊළඟ විනාඩි කිහිපය තුළ සංජුල බරපතල කල්පනාවකට එළඹියේ ය. මම ඔහුගේ කල්පනාබර මුහුණ දෙස බලාගෙන සිටියෙමි.

'ජොබ් හොයන එක තමයි දැං ලේසි නැත්තෙ.'

නිහැඬියාවෙන් පසු ඔහු තමාටම සෙමන් කීවේ ය.

'අනේ...'

මට කියැවිණ. සංජුල මදෙස බැලුවේ අනුකම්පාවෙන් ද...? මම නොදනිමි.

'නෑ හොයා ගන්න බැරි වෙන්නෑ අංශු. මං දන්න කියන කීප දෙනෙක්ටම දැනටමත් කියලයි තියෙන්නෙ. ප්‍රශ්නෙ භාෂාව තමයි. මුං ඉංග්‍රීසි වචනයක්වත් දන්නෑනෙ අප්ප.'

ඔවුන් දැනගත්තත් අපත් ඉංග්‍රීසි නොදන්නවා නේදැයි සිතූ මම හිත යටින් සිනාසුණෙමි. වසර දහයක් - දොළහක්ම විෂයක් ලෙස ඉංග්‍රීසි භාෂාව පාසල්වල ඉගැන්නුව ද, පාසල හැර යන ළමයින්ගෙන් වැඩි දෙනෙක් දන්නේ ඉංග්‍රීසි වචන කීය ද...? වරද කාගේ දැයි කවුරුන්වත් දන්නේ නැත.

'ආ... ඔයා නිකං ඉන්න වෙලාවට මේකත් බලාගන්නකො.'

කෑමෙන් පස්සේ සංජුල මට ඉතාලි භාෂාව සිංහලෙන් ඉගැන්වෙන පොතක් දුන්නේ ය.

'මාත් හුඟක් දේවල් ඉගෙන ගත්තෙ ඕකෙන් තමයි.'

මම නිකමට එය පෙරළා බැලීමි. බොහොම පැහැදිලිව මාතෘකා වශයෙන් වෙන් කොට එය සකස් කොට තිබිණ.

'තැන්ක් යූ සංජුල. මං රෑට ටේබල් ලැම්ප් එක ඔන් කරගෙන මේක ටිකක් පාඩං කළොත් ඔයාට නින්ද යන එකක් නැති වෙයි ද...?'

'නෑ... නෑ... එහෙම ප්‍රශ්නයක් නෑ. මෙතන තොරණක් ගහලා තිබුණත් මට නිදිමත වෙච්ච ගමං නින්ද යනව.'

ඔහු සිනහ වෙවී කීවේ ය. සංජුල ප්‍රියමනාප තැනැත්තෙකැයි තීරණය කිරීමට, මට ඒ එක දවස තුළ ඔහුගේ හැසිරීම ප්‍රමාණවත් විය. බොහෝ වෙලාවක් ඉතාලියේ ජීවිතය ගැනත්, රැකීරක්ෂා ගැනත්, මෙහි එන සිංහල ගැහැනු පිරිමි ගැනත් කතා කරමින් සිටි අපි රාත්‍රියට සුභ පතාගෙන ඇඳවල් දෙකට ගියෙමු. ඉටිකොළ බැම්ම, චීන මහා ප්‍රාකාරය සේ අප අතරින් නැගී සිටියේ ය. තනිවම සිනහ වෙමින් මම 'ඉතාලි භාෂාව' පෙරළා ගතිමි.

තරුණයෙක් සමග මේ විදිහට එක කාමරයක නින්දට යාම

The Reader's Place Novel

ගැන මම කොනක සිට සිතන්නට පටන් ගතිමි. ශ්‍රී ලංකාව තුළ නම් මෙය බරපතල සදාචාර විරෝධී ක්‍රියාවකි. ඉතාලිය තුළ එවැනි සදාචාරයක් හෝ සංස්කෘතියක් නොමැති බව, අද ඇඳුම් මිල දී ගන්නට බසයෙන් ගිය ගමනේ දී මම හොඳටම දුටිමි. තරුණ තරුණියන්ගේ සමීප හැසිරීම් මේ රටවල ජනයාට අරුම පුදුම දේවල් නොවේ. ප්‍රේමාලිංගන හෝ සිප වැළඳගැනීම් හෝ මහමගදීත්, බස් රියේදීත්, වෙන ඕනෑම පොදු ස්ථානයකදීත් දකින්නට පුළුවන. ඒ අතින් අපේ රටවල මහා සංස්කෘතියක් තිබේ. මට තනිව සිනහ ගියේ ය. ඒමහා සංස්කෘතික රටෙහි කාන්තාවන් කොයි තරම් ලිංගිකව දූෂණය කෙරෙනවා ද...? දවසකට අවිවාහක යුවතියන් කී දෙනෙකුගේ නීත්‍යානුකූල නොවන ගබ්සාවන් සිදු වෙනවා ද...? නමුත් අපේ රටේ යුවතියක් තරුණයෙක් සමග ඉඟිබිඟියක් පෑවත් එය ලොකුවට ගෙන කතා කරයි. රහසිගතව සිදුවෙන සාපරාධී ක්‍රියා ගැන ප්‍රසිද්ධියේ කතා කිරීමත් පාපයකි.

අංශු ඉතාලියට පැමිණ තරුණයෙක් සමග එක කාමරයක ජීවත් වෙනවායි ගමට ආරංචි වුනොත් මොන වගේ තත්ත්වයක් උදා වෙනු ඇත්දැයි මම සිතුවෙමි. වෙන දෙයක් වුණාවෙයි අනිත් අතට මම සිතා ගතිමි. ඒ මහා සංස්කෘතික භූමිය තුළ දී විවාහක මිනිසෙක් මා රවටා මගේ ප්‍රේමයත් ආත්මයත් දෙකම පිළිණු කළේ ය. ඉතින් තවත් මට ඉතිරි කරගන්නට තිබෙන්නේ කුමක් ද...? මට කිසිදු බියක් දැනුණේ නැත. තිබුණේ ජීවිතය යළි සොයා ගැනීමේ ආශාව පමණකි. ඒ නිසා මම ඉතාලි පොතේ වචන කිහිපයක් පාඩම් කරමින්ම නින්දට වැටුණෙමි. යළි නෙත හැරුණේ උදේ ඇසුණු හට්ටි මුට්ටි එකට ගැටෙන හඬවල් වලිනි. මම දෑස් හොඳින් විවර කරගෙන සවන් පෑවෙමි. සංජුල ආහාර පිසින්නට පටන් ගෙන ඇති බව දැනිණ. වහා නැගිට නානකාමරයට වැදී මම උණු වතුරෙන් මුව හොවා ගතිමි.

'අපරාදෙනෙ අංශු නැගිට්ටෙ... තව ටිකක් නිදාගන්න තිබුණා.'

'ඔයා උයනවා ඇහෙද්දි මං කොහොම ද තව නිදියන්නෙ...?'

'එහෙනං එන්නකො පාස්තා හදන හැටි කියල දෙන්න.'

සංජුල පාස්තා තැම්බෙන්නට ලිප තබා තිබිණ. එයට මිශ්‍ර කරන මිශ්‍රණය සාදන හැටි ඔහු මට කියා දුන්නේ ය.

'මං එනකොට හාල් ටිකක් ගෙනාව. රෑට ඔයා එනකොට මං බත් උයල තියන්නං. පොළොස් මාළුවකුත් මං ගෙනත් ඇති. මට ජොබ් එකක් හොයලා බලන්න සංජුල.'

'බයවෙන්නෙපා. ඉක්මනට මොකක්හරි හම්බවෙයි.'

ඔහු නික්ම ගිය පසු මම කාමරය අස්පස් කොට අතුගෑවෙමි. සංජුලගේ කිළිටි ඇඳුම් කිහිපයක්ම කුඩය තුළ විය. මම ඒවා සෝදා දැමුවෙමි. මුදල් ලබාගෙන හෝ මට මේ තරම් ලොකු උදව්වක් කළ මිනිසෙකුගේ කිළිටි රෙදි ටිකක් සේදීම පවක් නොවේයි මම සිතීමි. දවාලේ වෙන වැඩක් නොවූයෙන් මම ඉතාලි වචන ටිකක් කටපාඩම් කළෙමි. භාෂාව ඉගෙනගැනීම කෙතරම් අභියෝගයක් ද කියාත්, භාෂාව නොදැන මේ රට තුළ ජීවත්වීම කෙතරම් දුෂ්කර ද කියාත් මට හරියටම තේරෙන්නට ගත්තේ ඒ පොත ටිකක් කියවාගෙන යත්දී ය. නමුත් දැන් ඉතින් මා ළඟට පැන හමාර ය.

'ඔයා මගෙ ඇඳුනුත් හේදුව ද...?'

සැඳෑවේ වැඩ නිම වී පැමිණි සංජුලගේ මුල්ම ප්‍රශ්නය වූයේ එයයි. මා ලා සිනහවක් නගාගත්තේ එය ඒ තරම් ලොකු දෙයක් නොවන බව හැඟවීමට ය. නමුත් ඔහුගේ දෑසෙහි අමුතු බැල්මක් විය.

සංජුල උණු දිය නාගෙන එන විට, ලංකාවෙන් ගෙනා තේ කොළවලින් මම උණු තේ දෙකක් පිළියෙල කළෙමි. එම තේ කෝප්පයෙන් ඔහු ප්‍රබෝධමත් වූයේ ය.

'මං බත් උයලා තියෙන්නෙ. සංජුලට බඩගිනිනං කන්න.'

'අද දවසම කාමරේට වෙලා ඉඳලා අංශුට කම්මැලිත් ඇතිනෙ. ඒක නිසා ඔයා කැමතිනං අපි ටිකක් ඇවිදලා එමු.'

Reader's Place Novel

ඔහුගේ යෝජනාව මා උණුසුම් කරවන ලදී. නමුත් මම ඔහුගේ පැත්තෙන් සිතා කතා කළෙමි.

'ඔයා දවසම වැඩ කරලා ඇවිත්... මහන්සි ඇතිනෙ.'

'මහන්සියෙං තමයි ආවෙනං. ඒත් ඔයාගෙ තේ එක බ්ලූ ගමං මහන්සිය වාෂ්ප වෙලා ගියා වගෙයි.'

මම හොඳටම සිනහ වී පිටතට යාමට සූදානම් වුණෙමි. සංජුල කතා කරන්නේත් කල්ප වාගේමයි කියා එවේලේ මට සිහිපත් වූයේ නැත. පොදුවේ ගැහැනුන් මුලා කරවන පොදු පිරිමි භාෂාවක් ඇති වග මට කල්පනා වූයේ මෙට්‍රෝවට පැන දිව්‍ය තොර කරගන්නට ගිය සිදුවීමෙන් ද පසුව ආපසු සිතා බලත්දී ය.

විදුලි පහන් දැල්වුණ පසු රෝම නගරය සුරපුරයක් වාගේ ය. ඒ තරම් ලස්සනට මට රෝමය පෙනුණේ සැබවින්ම එහි වූ ලස්සන නිසා ද එහෙම නැත්නම් හිතේ වූ නිදහස් සාමකාමී බව නිසා ද කියාත් මම සිතමි. කිසිදු බැඳීමකින් තොරව ජීවිතය නිවහල්භාවය අත්විඳින්දී දැනෙන්නේ එම සැහැල්ලුව විය යුතු ය. මට කවුරුන්වත් නොමැත. මා ගැන බලන්නට මව්පිය දෙපළක්, මා ගැන සොයන්නට ස්වාමිපුරුෂයෙක් හෝ ප්‍රේමවන්තයෙක්, මා ගැන කරදර වන්නට කිසිවෙක්ම නොමැත. මා සිටින්නේ මා ගැන දන්නා සෑම සියලු දෙනාගෙන්මත්, මගේ රටෙනුත් ඈත්ව ය. මෙහිදී මා කුමක් කළත් කුමක් කීවත් කිසිවෙකුටත් එහි වගක් ඇත්තේ ද නැත. එසේ බැඳීම්වලින් මිදුණු කල දැනෙන්නේ අපූර්ව නිවහල් හැඟීමකි. නමුත් ඒ නිදහස අරුත්ගන්වන්නේ අසරණකමයැයි පසුව මම මේ හිතෙන්ම තේරුම් ගත්තෙමි.

කෙසේ වෙතත් එම නිදහස හැඟීමත්, ඉතාලිය කෙරේ කාලයක පටන්ම වූ ආශාවත් නිසා මට රෝම නුවර වඩ වඩාත් සුන්දරව පෙනිණ. ශ්‍රී ලංකාවෙන් සැතපුම් ලක්ෂ ගණනක් ඈතක පිහිටි රටක් වී ද, මට කිසිදු ආගන්තුක බවක් නොදැනෙන සෙයින් සංජුල මා පසෙකින් සිටියේ ය. අමතක කර දමන්නට, ජීවිතයෙන් අතු - පතු ගා දමන්නට උවමනා කරන වේදනාත්මක මතකයක් ද මට තිබුණ. වේදනාවක් ... අමතක කරන්නට දැඟලන වේදනාවක්

වෙත්දී අපි පුංචි දේවලිනුත් බොරුවට හෝ සතුට සොයමු. අඬන්නට කාරණා හිතේ වෙත්දීත් බොරුවට සිනහ වෙමු. මා හිටියෙත් එහෙම තැනක ය. මට උවමනා ඒ ඛේදවාචකය අමතක කර දමා අලුත් ජීවිතයක් හොයා ගන්නට ය. අලුත් ජීවිතයක් කියන්නේ අලුත් ප්‍රේමයක් හෝ අලුත් පුරුෂයෙක් නොවේ. අලුත් ජීවිතයකි.

මා ආශා කළ විදිහේ, මා සොය සොයා සිටි විදිහේ දේශයකට පැමිණීමට මට හැකි වී තිබේ. එහි මට අවශ්‍ය නිදහස ද තිබේ. ජීවත්වීමට මුදලක් උපයාගත හැකි විදිහේ රැකියාවක් සොයාගෙන, ජීවිතයේ මට මගහැරුණු තැන් යළි පිළිසකර කරගැනීම් මගේ පිපාසාවයි.

එදා අප මට ඇදුම් මිල දී ගන්නට යත්දී පීසා ගත්තේ සංජුල ය. අද මගේ මුදලින් එවැනි කෑම ගැනීමට මට උවමනා විය. හැමදාමත් සංජුල වගේ පිටස්තර කෙනෙකුට බරක් විය නොහැකි ය. වදයක් විය නොහැකි ය.

'ඉන්න ඉන්න. මං ගන්නං.'

සංජුල මුදල් පසුම්බිය ඇද්දේ ය.

''නෑ. නෑ. අද නං ගෙවන්නෙ මං.'

'හරි හරි. ඔයා සල්ලිකාරි කියල මං දන්නව.'

'සල්ලිකාර කමකට නෙවෙයි, දාගන්නකො ඔය පර්ස් එක.

අලුත් රටේ හැම අංශු මාත්‍රයක්ම සැබවින්ම විඳ බලන්නට මා තුළ සැබෑ ආශාවක් වන්නට ඇත. පීසා කැබලි දෙක ඇනවුම් කළේ සංජුල ය. මම මුදල් ගෙවිවෙමි. පීසා කඩේ යුවතිය සංජුල සමග සිනා සී කතා කළේ මීට පෙර ඔහුව හඳුනනා බවක් පෙන්වමිනි.

'ඒ ගර්ල් ඔයාව අඳුරනව ද...?'

මම මගේ සැකය දුරු කරන්නට හැදුවෙමි.

'ටිකක්. මෙතනින් යන එන ගමං පීසා කෑල්ලක් ගන්න නිසා තමයි. මෙහෙ මිනිස්සු කොහොමටත් හරි ෆ්‍රෙන්ඩ්ලිනෙ.'

The Reader's Place Novel

'එයා මං දිහා බලල මොනා ද කිව්වෙ...?'

'ඔයා කවුද ඇහුව. මං කිව්වා මගෙ වයිෆ් කියල.'

'හානේ...'

'ඉතින් ළමයෝ, ඔයා මේ රටට ඇවිත් ඉන්නෙ මගෙ වයිෆ් විදියට තමයි.'

'ආ... ඒකත් ඇත්තනෙ.'

'එයා කිව්වා ඔයා හරිම ලස්සනයි කියල.'

'ඔන්න ඔන්න ඒකනං බොරුවක්.'

'බොරු නෙවෙයි. දෙයියම්පල්ල.'

අපි ටික දුරක් පීසා කමින් නිහඬව ගමන් කළෙමු. රාත්‍රිය වූවාට දහවල සේම මිනිස්සු පාරේ ගමන් කරති. බස් නැවතුමක තරුණයෙක් හා තරුණියක් සිපවැළඳ ගනිමින් සිටියහ. මම ඉවත බලාගතිමි. ලංකාවේ ඔවැනි සිදුවීමක් වූවා නම් ගල් ගසනු ඇත.

'ඇත්තටම අංශු හරිම ලස්සනයි.'

සංජුලගේ හඬ මට ඇසුණේ අර පෙම් යුවළ ගැන සිතමින් සිටිය දී වෙනමම ග්‍රහ ලෝකයකින් ඇසුණ හඬක් සේ ය. ඇත්තටම ඔහු එහෙම කීවා ද කියා නිශ්චිත කරගනුවස් මා සංජුල දෙස නෙත් විදා බලන්නට ඇත. ඔහු එවැන්නක් පැවසූ බව, ඔහුගේ මුණේ වූ ඉරියව්වලින් හැඳිනිය හැකි විය.

'අනේ... මගෙ මොන ලස්සනක් ද...? බලන්නකො මේ ඉතාලි කෙල්ලො නිකං බෝනික්කියො වගේ. ඇත්තටම එයාලගෙ හමේ පාට ගැන මටනං පුදුමයි. අල්ලලා බලන්න තරං හිතෙන ලස්සන කහ පාටක්.'

'ඒ වුණාට මුං නිතරම කියනව අපේ රටවල මිනිස්සු ගැනු ලස්සනයි කියල.'

'අපි කෝපි බොමු.'

කෝපි අවන්හලක් ළඟ පාරේත් අසුන් පනවා, ඒ අසුන්වල හිඳ ඉතාලියානුවත් කෝපි බොනු දැක මම කීවෙමි. සංජුල සිනාසුණේ ය.

'ඇයි හිනාවෙන්නෙ...?'

'නෑ. ඔයා නිකං පොඩි බබෙක් වගේනෙ. ඒකයි.'

හදවතින්ම ඉතාලියට අනුවර්තනය වීමේ සැබෑ අවශ්‍යතාවයක් මගේ ඇතුලාන්තයෙන්ම පැන නැඟ තිබුණා විය යුතු ය. ඒ කෝපි සුවඳ වුණත්, මට ලංකාවේ කෝපි තරම් රසවත් වූයේ නැත. නමුත් ඒ අත්දැකීම මට මහා දෙයක් විය.

ටික දුරක් පාරවල් ගානේ ඇවිද ගිහින් අපි යළි කාමරයට ආවෙමු.

''දැන්නං යකෙක් කන්න බඩගිනියි.''

සංජුල පොඩි එකෙක් වගේ කීවේ ය. මම පිස තිබූ බතත්, ලංකාවෙන් ගෙනවිත් තිබූ ව්‍යාංජන ටිකත් උණුසුම් කොට ගතිමි.

'කෑම ලෑස්තියි.'

සැබැවින්ම ඔහු බඩපුරා බත් කෑවේ ය. කඩවල්වලින් ටික ටික ඒවා මේවා කා තිබූ නිසා මටනම් එවැනි කුසගින්නක් නොවී ය.

'ගෑනියෙක් මෙහෙම ජීවිතේ ළඟිං ඉන්නකොට කොච්චර පිරිච්චි ගතියක් දැනෙනව ද ඇත්තට...? මීට කලිං කොල්ලො පස්හය දෙනෙක් මේ කාමරේ හිටියට ඒ හැඟීම දැනිලා නෑ.'

'ඉතිං ජීවිතේ ළඟින්ම ඉන්නා කෙනෙක් එක්කගෙන එන්නෙ තියෙන්නෙ.'

'දැන්නං එහෙම හිතෙනව තමයි.'

බියර් කෑන් එකක් බීව නිසා ද මන්දා සංජුල මඳ මත් බවක් පෙන්වූයේ ය. මටත් ඒ කිසිවක බරක් - පතලක් දැනුණේ නැත. අප වෙන් කළ ඉටිකොළ බැම්ම විනාශ වී කුඩා ඇඳන් දෙක එකට යාවෙන්දීත් මා ඔහේ බලා සිටියා පමණකි. සමහර විට ඒ අධික

The Reader's Place Novel

ශීතල දේශගුණයේදී, ආත්මීය උණුහුමක අවශ්‍යතාවයක් මගේ ගැහැනු ගත සිතට ද දැනෙමින් තිබුණා වන්නට ඇත. අනිත් අතට කල්පගේ සිදුවීමේ දී මා ගිනිපෙනෙල්ලෙන් බැට කා තිබුණේ ද නැත.

ව්‍යාජ විවාහ සහතික පත්‍රයට අනුව සංජුලගේ බිරිඳ ලෙස ඉතාලියට පැමිණි මා, නීත්‍යානුකූලව නොවුණත් ඔහුගේ බිරිඳ බවට පත් වූයේ එසේය. එක අතකට මේ රටේ නීතියට අනුව මා ඔහුගේ බිරිඳ ය. මේ රටේදී - කාත්කවුරුවත් නැති මේ රටේ දී මට ඔහුගේ රැකවරණය ලැබීමත් ලොකු දෙයකි. මෙතනින් මෙහේ ජීවිතය අරඹන්නට ලැබීමත් ලොකු දෙයක් කියා මම සිත සකසා ගතිමි.

The Reader's Place Novel

04

කල්ප ලොකුගේට මම බෙහෙවින්ම පෙම් කළෙමි. මගේ මුළු අනාගතයම මා ගොඩනගාගන්නට හැදුවේ ඔහු කේන්ද්‍ර කරගෙන ය. මගේ ආදරය ඔහු විය. විශ්වාසය ඔහු විය. ආත්මය ඔහු විය. මුළු මහත් ජීවිතයම ද ඔහු විය. ඒ හින්දාම, අහම්බයෙන් වුව මා කල්ප හා යහන්ගත වූයේ ප්‍රේමයෙනි. එවැන්නක් නොවිය යුතුව තිබිණැයි පසුතැවීමක් පසුව දැනුණ ද, ප්‍රේමයෙහි වෙනසක් නොවී ය.

නමුත් සංජුල ගැන මා එවැනි හැඟීමකින් හිතන්නට උත්සාහ කර තිබුණේ නැත. සිත්හි වූයේ ඔහු මට කළ උදව්ව පිළිබඳ කෘතඥතාපූර්වක බවකි. බොරු විවාහ සහතිකය සැබෑවක් කරමින් මා ශරීරයෙන් ද සංජුලගේ බිරිඳ වූයේ ප්‍රේමයක් හින්දා නොවේ.

එනමුදු මම කිසිවක් වෙනස් කිරීමේ උත්සාහයක් නොගෙන ඔහේ සිටියෙමි. හිතක් පුරා පෙම් කළ කල්පත් මා රැවටූ එකේ, සංජුල කෙරේ එවන් බලාපොරොත්තුවක් ද මට නොවී ය. මට රැකියාවක් ලැබී තිබුණේ නැත. මා ඉතාලියානු භාෂාව හෝ රට නොට සැරිසරන්නට දැන සිටියේ ද නැත. මටත් එක්කම ආහාරපාන සැපයුවේ සංජුලයි. ඔහු ටික ටික හෝ භාෂාව ඉගෙන ගන්නට මට උදව් කළේ ය. පාරවල් ගැන, කඩසාප්පු ගැන, බස් හා කෝච්චි ගැන මාව දැනුවත් කළේ ය. කොටින්ම කියතොත් ඉතාලියේ ජීවිතයට මාව පුරුදු පුහුණු කරවමින් සිටියේ ය.

මම ඔහුට කෑම පිළියෙල කොට දුන්නෙමි. කිළිටි රෙදි පිළි

සෝදා මැද දුන්නෙමි. යහනේ දී උණුසුම සැපයුවෙමි. වාසනාවෙවා විවාහ සහතිකයක් ද අපට විය.

ලංකාවේ ඕනෑතරම් යෝජිත විවාහයන් සිදු වේ. ලංකාවේ සිටියත් කවදා හෝ මටත් අතවන්නේ එම ඉරණම ම ය. මන්ද යත් කල්ප විසින් විනාශ කොට දමා ගිය සිතෙහි යළි ප්‍රේමයේ බීජ රෝපණය වේවියි මට නොසිතූ හෙයිනි. මේ හේතුව නිසාම ප්‍රේමයක් නොමැතිව පිරිමිකු හා එකට ජීවත් වීම පිළිබඳව මම සන්තාපයෙන් නොසිතුවෙමි.

විවාහය ගනුදෙනුවකි. අපට ලැබෙන දේ වෙනුවෙන් අප යමක් දිය යුතුව තිබේ. ඒ හින්දා මම කනිපින්දම් නොකියා විවාහක ගැහැනියකගේ භූමිකාව රඟපාන්නට පටන් ගතිමි. සංජුල ගතු කීවේ ද නැත. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපේ සබඳතාම 'විවාහයක' ස්වභාවය ගත්තේ එනිසාවෙනි.

ප්‍රේමයෙහි ආටෝප අප අතර නොවී ය. අප කතාබහ කළේ ඉතාලි ජීවිතයෙහි දුෂ්කර පැත්ත පිළිබඳව ය. සංජුල හැම දවසකම වැඩට ගියේ ය. නිවාඩු දිනයක් වෙතොත් අතිරේක රැකියාවක් ද නියුතු වූයේ ය.

'පාට ටයිම් ජොබ් එකක් නැතුව ඉහගහන්න බෑ. කාලා ඇඳලා ජීවත් වෙන්න විතරක්නං ඉතාලි ඇවිත් දුක් විඳල වැඩක් නැනෙ. කියක්තරි එකතු කරගන්නත් ඵපෑ.'

ඔහු හේතු දැක්වූයේ එසේ ය. ලංකාවේ සිටිය දී හිතේ මවාගෙන සිටි ඉතාලිය දකින ආශාව නොයෙක් විට නිස ඔසවාගෙන ඉතළ ආවේ ය. මා මෙහි පැමිණියේ මෙලෙස කාමරයක කොටු වීගෙන පිරිමියෙකුට කෑම උයමින් - රෙදි හෝදමින් සිටින්නට නොවේ. ලංකාවේ සාමාන්‍ය පිරිමියෙකු හා විවාහ වුණත් එසේ ඉන්නට නම් පුළුවන. මට උවමනා වූයේ වෙන දෙයකි. මා කොයිමත් හිටියේ රට වඩා වෙනස් වූ ජීවිතයකි. මේ උවමනාව හද තුළ බුර බුරා නැගෙමින් ආවත් මම ඉදිරියට පයක් තැබීමට පැකිළුණෙමි.

දැන් ඉතින් මා ඉරණම නියම කළ පරිදි සංජුලගේ බිරිඳ වී තිබේ. ඔහු විසිහතර පැයම ගත කරන්නේ මුදල් හරිහම්බ කිරීම වෙනුවෙනි. දවසට තව පැය කිහිපයක් වැඩි කර දෙනවා නම් ඔහු බෙහෙවින් කැමති වනු ඇත. ඒ පැය කිහිපය ද මුදල් කර ගත හැකි නිසාවෙනි. ඒ ගැන ඔහුට දොස් පැවරිය නොහැකි ය. ඒ ඉතාලි ජීවිතයේ හැටි ය. ඔහු පුරුදු වී තිබෙන ආකාරය ය. මා මෙහි කඩා පාත් වූයේ ඉතාම අහම්බෙනි. මා සංජුලගේ බිරිඳ වූයේ ද ඉතාමත්ම අහම්බයෙනි. ඒ හේතුව මත ඔහුට ඔහුගේ ක්‍රමය වෙනස් කර ගත නොහැකි ය. එසේ කරන්නැයි මට ඉල්ලා සිටිය ද නොහැකි ය.

'මට ආසයි ඉතාලිය පුරාම ඇවිදලා බලන්න. ඒවුණාට තාම හරියකට රෝමයවත් බලාගන්න බැරි වුණානෙ.'

දවසක් කෑම කන ගමන් මම සංජුලට කීවෙමි.

'වෙලාවක් හම්බවුණොත් ඔයාව කොලෝසියම බලන්නවත් එක්කං යන්නංකො.'

නොසැලකිලිමත් ලෙස ඔහු එහෙම කීවේ ය. එවැන්නකට කවදාවත්ම ඔහුට වෙලාවක් නොලැබෙන බව මට ඒ මූණේ ඉරියව්වලින්ම දැනිණ.

ලංකාවෙන් එනවිට යුරෝවලට මාරු කරගෙන ගෙන ආ මගේ මුදල් තිම වෙමින් පැවතිණ. ඉන් වැඩි කොටසක් වැය වූයේ ශීත කාලයට ගැලපෙන රෙදි පිළි මිලදීගැනීම සඳහා ය. ඉතාලියේ කෑම බීම සඳහා නම් ඒ තරම් මුදලක් වැය වන්නේ නැත. ඉතාම අඩුත් පිරිසිදු එළවළු හා පලතුරු අඩු මුදලකට සපයා ගන්නට පුළුවන. සංජුලගේ කාමරයේ සිටින නිසා මට නවාතැන් ගාස්තුවක් වැය වන්නේ ද නැත. ඒ වුණත් ඉක්මනින්ම රැකියාවක් සොයා ගත යුතු බව මට දැනුණා සේම සංජුල ද නිතර නිතර ඒ ගැන මතක් කරන්නට පටන් ගත්තේ ය.

'මං කීප දෙනෙක්ටම කියලයි තියෙන්නෙ ඔයාට ඩොමෙස්ටික් ජොබ් එකක් සෙට් කරන්න කියල. ඔය... ගෙදරක වැඩ...'

The Reader's Place Novel

නොහැකි බව මම තේරුම් ගෙන සිටියෙමි. දුක් විඳින්නට වත්තේ ම ය. අනිත් අතට ස්වදේශික ඉතාලියානුවන් පවා ලොකු රැකියාවල් සොයමින් සිටියේ නැත. ඔවුහු අතට අහුවෙන වැඩක් කරති. ලංකාවේ සේ උස් පහත් බේධයක් එහි නොවේ. කොයි රැකියාව කරන පුද්ගලයාට වුණත් ඇත්තේ එකම ගෞරවයකි. දොස්තර මහතුන් පවා කුණු අදින මිනිසාටත් 'මහත්මයා' යන අරුතින් 'සිංඤෝරේ' කියා අමතති. එවන් පසුබිමක් මත මේ වගේ රටක කවර රැකියාවක් කළ ද එය හිතට අවමානයක් සේ නොදැනේ.

ඉතාලියට පැමිණි ශ්‍රී ලාංකිකයන් එහි සිටුවර ජීවිත ගොඩ නගන්නේ හැම තත්පරයකම කුමන හෝ රැකියාවක යෙදෙමින් කාලය මිල කිරීමෙන් බව වටහා ගන්නට මට ඒ තරම් කාලයක් ගත වූයේ නැත.

සංජුල මට සොයා දුන් මුල්ම අර්ධකාලීන රැකියාව අවන්හලක ය. එහි රාත්‍රියේ පැය තුනක් පිඟන් සේදිය යුතුව තිබිණ. සබන් දියරෙහි දැත් ඔබාගෙනම සිටීමෙන් අත්වල සමතුති වී දැවිල්ල ගත්ත ද, එතැනින් ලැබෙන යූරෝ කිහිපය ගැන සිත අමාරුවෙන් වුව මම ඒ වැඩේ දිගටම කරගෙන ගියෙමි.

සංජුලගේ බිරිඳ වූවාට ලංකාවේ සේ සැමියන් උපයන මුදලින් යැපී ඉතාලියේ දී බිරිඳකට ජීවත් විය නොහැකි ය. සංජුල අප සිටින කාමරයට කුලියක් ගෙවිය යුතු ද වූයේ ය. මගේ මුල්ම වැටුපෙන් මම ඔහුට ඒ කුලිය ගෙවන්නට කීවෙමි.

'එපා එපා... ඒක ඉතිං මං ගෙවපු හැටියට ගෙවං යන්නංකෝ.'

ඔහු මුලින්ම කීවේ ය.

'ඒ වුණාට... මෙහේ ඉතිං එක්කෙනෙක් හම්බකරල බෑනේ.'

'එහෙනං අපි දෙන්නා කාමරේ කුලිය බාගෙ බාගෙ දාල ගෙවමු.'

ඔහුගේ යෝජනාවට එකඟ වී නවාතැනට මගේ කුලිය ගෙව්වාට, එය මනිතට පහසුවක් වූයේ නැත. සැමියා හා බිරිඳ

වාගේ මට දැනිණ. දෙදෙනාම වෙනුවෙන් මුළු මුදල මා ගෙව්වානම් එහි වෙනසක් නැත. බිරිඳ තමාටත් සැමියා තමාටත් නවාතැන් කුලිය ගෙවීම ලංකාවේ ගෘහ ජීවිතයට පුරුදු වී සිටින අපට නුහුරක් දනවයි.

නමුත් මම මේ ගැන සංජුලට කිසිත් නොකීවෙමි. මා ඉතාලියට පැමිණ මුල්ම දිනවල හැසිරුණ සැහැල්ලු බවින් පසුවෙත්දී ඔහු හැසිරුණේ ද නැත. සංජුල නිතරම සිටියේ කල්පනාවක ය. වැඩ ඇරී එන ඔහු වැඩිපුර මාත් එක්ක කතා නොකරම නිදන්නට යයි. නිදියහනට සීමා වන අපේ සබඳකමෙහි මහත් වියළි බවක් මට දැනිණ. නමුත් කිසිදු ඉල්ලීමක් සඳහා මගේ හිත එකඟ වූයේ නැත.

යාබද පාපන්දු ක්‍රීඩා පිටියක ක්‍රීඩා කරන තරුණයන් පිරිසකගේ ක්‍රීඩා ඇඳුම් සේදීමේ කාරියක් ද මට පැවරිණ. ඊටත් මග පෑදුනේ සංජුලගේ හිතවත්කමක් නිසා ය. ඒ වැඩේ නිසා නිතරම මගේ අතට යූරෝ කිහිපයක් හෝ ලැබිණ. සංජුලට බරක් නොවී කෑම බීම ටිකක් මිල දී ගන්නටත් මට ඒ නිසා මග පෑදිණි.

එක උදයක තේ පිළියෙල කරමින් සිටිය දී බඩවැල් බොකු කළඹාගෙන ඔක්කාරයක් නැගී ආවේ මා ඉතාලියට ඇවිත් තෙමසකට ආසන්න වෙත්දී ය. මම ඉක්මනට කුඩා නාන කාමරය වෙත දිව ගියෙමි. මා වමනය කරන හඬට සංජුල එහි දිව ආවේ ය. ඔහු දෑස් විසල් කරගෙන බලා සිටියේ බියපත්ව වාගේ ය.

'එකපාරටම වමනෙට ආව.'

මම පපුව පිරිමදිමින් මදහසකින් කීවෙමි. නමුත් අර බියම මිස සංජුල වෙත මදහසක්වත් නොවී ය.

'මේ...ක ඇරිල යයි.'

මා සැහැල්ලුවෙන් එහෙම කීවේ, මා අසනීපවීයැයි ඔහු බිය වී යැයි සිතාගෙන ය. සංජුල සාමාන්‍යයෙන් අසනීපයකටවත් වැඩට නොයා ඉන්නා කෙනෙක් නොවේ.

'මං හිතන්නෙ ඊයෙ රෑ මං හරියකට නොකා නිදාගත්ත

The Reader's Place Novel

ඔහු ඒත් කිසිත් කීවේ නැත. මූණේ වූ හීතිය පහව ගියේත් නැත.

සංජුල රැකියාව සඳහා නික්ම ගිය පසුත් දෙතුන් වරක්ම මට ඔක්කාරය සෑදිණි. පාස්තා ටිකක් කෑමට උත්සාහ කළ ද කටක්වත් කතහැකි වූයේ නොවේ. මහත් අප්‍රාණික බවකින් මම දවසම වැතිර සිටියෙමි. සංජුල එන විට වඩාත් රෑ බෝ වූයේ ය.

'අද පාට් ටයිම් වැඩකුත් සෙට් වුණා. ඒකටත් ගිහිල්ලයි ආවෙ.'

'අනේ සංජුල... මට මුකුත් උයාගන්නවත් බැරි වුණා. ඔව්ව උස්සල ඉන්නම බෑ. බත් එකක් රයිස් කුකර් එකට ගැහුවා. ඔයාට බිත්තරයක් බැදලා දුන්නනං ඇති ද...?'

උදේ මූණේ වූ හීතිය යළිත් වහාම සංජුලගේ මූණ අරක්ගත්තේ ය.

'අංශූ... ඔයාට... ඔයාට මුකුත්... වෙනසක් දැනෙනවද...?'

'වෙනසක් කිව්වෙ...?'

'වෙනසක් කිව්වෙ... බ...බ... බබෙක්වත් ද...?'

මා උඩ ගොස් බිම වැටුණේ එවිටයි. ඔක්කාරයට හේතුව එවැන්නක් යැයි නිකමටවත් මා තුළ සැකයක් ඇති වූයේ නැත. ඊට හේතුව මා තුළ එවන් අත්දැකීමක් හෝ අපේක්ෂාවක් නොවීමයි. සංජුලගේ කතාව දිගේ මට තනූජා සිහි විය: දරුවන් ලැබෙන්නට සිටිත් දී ඇයත් නිතරම ඔක්කාරය කළා ය. හිස කරකැවෙනවායි කලන්තය වාගේයි කියමින් ඔහේ වැතිර සිටියා ය. අප කුඩා කාලයේ දී මාමාගේ බිරිඳ පඩිපෙළ වාගේ දරු පැටවුන් බිහි කරත් දී තිබූ තත්ත්වය ද එසේම ය.

'ඔයා කිව්වහමයි සංජුල මටත් ඒ ගැන කල්පනා වුණේ.'

සිත්හි දෙගිඩියාවක් තිබුණත් මට සතුටක් ද නොදැනුණා නොවේ.

'ඩොක්ට කෙනෙක් ළඟට යන්න වෙයි ද සංජුල...?'

'අනේ මන්දා අප්ප. මගෙ ඔළුවත් අවුල් වුණා වගේ.'

ඔහු අතැඟිලිවලින් නළල පිරිමදිමින් කාමරයෙහි ඒ මේ අත සක්මන් කෙරුවේ හිස මත මහමෙර කඩා වැටුණ ගානට ය. විදේශ රටකදී තනිවම මෙවැනි දේකට මූණ දීම අසීරු බව ඇත්ත ය. නමුත් සංජුලගේ මිතුරන් කිහිප දෙනෙකුගේම දරු පවුල් මෙහි සිටිති. ඒ සමහර බබාලා ඉපදී ඇත්තේ ඉතාලියේ දී බව මට කීවේ සංජුලම ය. ඉතින් අපටත් කෙසේ හෝ මෙයට මුහුණ දිය නැකි වනු ඇත. මුහුණ දිය යුතුම ය.

'ඔයා බයවෙන්න එපා සංජුල. අම්මා කෙනෙක්වත් අපි ළඟ නෑ තමයි. ඒත් මට මේකට මූණදෙන්න හිතේ හයිය තියෙනව.'

මා හිතුවේ මගේ බියනැතිකම ගැන ඔහු සතුටු වනු ඇත කියා ය. නමුත් සංජුල වෙත වූයේ මට හිතන්නටවත් නොතේරෙන තැතිගැන්මකි. එදා රාත්‍රිය පුරා ඔහුට නින්දක් නොවූවා කියා මම සිතමි.

මට මේ අලුත්ම අත්දැකීමකි. අනුන් ගැබ්බර වනු දැක තිබිණි ද තමන්ම ඒ අත්දැකීමට මූණදෙන්නේ ඕනෑම ගැහැනියක තුළ තිගැස්මක් ඇති වෙනවා කියා මම සිතමි. එක අතකට ඒ රසවත් තිගැස්මකි.

මම සිහින ලෝකයක සිටියෙමි. එසේනම් මා අම්මා කෙනෙක් වෙන්නට යයි. අම්මා...! කෙතරම් ආදරණීය වචනයක් ද...? කුඩා කල දීම අපට අම්මාගේ ආදරයත් රැකවරණයත් අහිමි විය. අම්මා නොවෙනස්ව අපේ වියහියදම් එවුව ද, කිසිවෙකුට සපුරා ලිය නොහැකි හිස්තැනක් අම්මා නමින් මගේ හිතේ විය. ආදරණීය පවුලක් අහිමි වීම පිළිබඳ සන්තාපයක් සෑම මොහොතකම මගේ හදවතට වදදෙමින් තිබිණ. මා කල්ප ලොකුගේ වෙත ළංවූයේ ද අහිමි වූ ඒ ස්නේහය සපුරාගනු වස්ය.

දැන් මටත් දරුවෙක් සිටී. ලංකාවේ වලංගු නීතියට අනුව සංජුල මගේ ස්වාමි පුරුෂයා නොවුණ ද, ඉතාලියේ නීතියට අනුව ඔහු මගේ සැමියා ය. ඉතින් මට සැමියෙක් ද සිටී. අපට

The Reader's Place Novel

ජීවත් වන්නට පුංචි කුලී කාමරයක් තිබේ. ලංකාවෙන් ඉතා දූර බැහැර විදේශයක වී ද දැන් මටත් ලස්සන පුංචි පවුලක් තිබේ.

'දරුවෙක්නං හොඳයි සංජුල. එතකොට අපිට පාළුවකුත් නෑ. අනිත් එක දරුවෙක් කියන්නෙ... කොච්චර මෝක් ද...? ඔය ආසයි දුවෙක්ට. අපේ අම්මා මාව දාලා රට ගියා වගේ මත්තා කවදාවත් මගෙ දුවව දාලා යන්නෑ. පුතෙක් වුනත් දාලා යන්නෑ. මං ඉන්න තැනක තියාගන්නව. අපිට මේ දරුවව ලස්සනට හදාගන්න පුළුවං සංජුල. මටත් දැං කියක්හරි හම්බවෙනවනෙ. ඉස්සරහට තව පොඩි ජොබ් එකක්හරි හොයා ගන්න ඕනෙ.'

මම හුගක් වෙලා හුගක් දේවල් කියෙව්වෙමි. සංජුල කිව්වේ එකම දෙයකි.

'ඉස්සෙල්ල හරියටම බලාගෙන ඉමුකො බබෙක් ද කියල.'

මා වාගේ ඔහු දරුවෙකුට කැමති නැති ද කියාත් මට සිතිණ. මා ගැබ් ගෙනෑයි නිවැරදිව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක් සඳහා සංජුල මගේ මුත්‍රා සාම්පලයක් ද ගෙන ගියේ ය. ඇඟට අමාරු ගතියක් දැනුණත් ඒ දවස මගේ හිතටනම් මහත් සතුටක් දනවූ එකකි. අමාරුවෙන් වුව නැගිට මම සංජුලගේ කිළිටි ඇදුම් ටික සෝදා දැමුවෙමි. අසනීපගතිය නිසා පෙරදා රාත්‍රියේ අවන්හලෙහි වැඩට යා නොහැකි විය. සංජුල දුරකථන ඇමතුමක් දී මා අසනීපයෙන් සිටින බව දැනුම් දුන්නේ ය.

'හැබැයි ආයෙ ඔය රස්සාව ඔයාට ලැබෙයි ද කියල මටනං ෂුවර් නෑ.'

මා එනතෙක් ඔවුන්ට ඉඳුල් පිඟන් ගොඩ තබාගෙන සිටිය නොහැකි බව ඇත්ත ය. නමුත් මිනිසුන්ට ලෙඩ දුක් අසනීප ඇතිවන්නේ කලින් දැනුම් දී ද නොවේ. එන හැටියකට මූණ දෙමියි මම සිතාගත්තෙමි. දරුවෙක් කියන්නේ සම්පතකි. මගේ දරුවා වෙනුවෙන් මට කළ නොහැකි දෙයක් නැත. ඔහු සුවෙන් තැබීම වෙනුවෙන් ඕනෑ තරම් වෙහෙසී රැකියා කරන්නට මා සූදානම්ය. මොන දේ කළත් ඔහු මගේ දෑස් මානයේ ඇති දැඩි විය

දැන් මට සංජුල සිටී. ප්‍රේමයක් නිසා අප ළං වූයේ නොවුණත්, දැන් අප අතර කිසියම් බැඳීමක් වන්නේ ය. ඒ, කලක් එක්ව ජීවිතය බෙදාහදා ගැනීම නිසා ඇතිවන බැඳීමකි. බල්ලෙකු බළලෙකු හෝ කාලයක් තිස්සේ ගෙදරක සිටින විට, ඒ ගෙදර ඇත්තන් කෙරේ බැඳීමක් ඇති වන්නේ ය. ප්‍රේමය ඊට වෙනස් ය. ප්‍රේමයට වඩා බැඳීම විශ්වාසවන්තය. හැන්දෑවේ සංජුල ගෙදර ආවේ මූන හොඳටම කළු කරගෙන ය. ආ ගමන් ඇඳුම් පිටින්ම ඔහු ඇඳට වැටිණ.

'ඇයි සංජුල...? ඔයාට මහන්සි ද...?'

ඔහු කතා නොකළේ ය.

'ඔයාට අසනීපයක් ද...?'

'ඔව්. අසනීපයක් තමයි.'

යකෙක් වගේ මාවත් පෙරලාගෙන ඔහු ඇඳෙන් බිමට පැන්නේ ය.

'මට පිස්සු හැදෙන්නයි එන්නෙ. ඒකයි අසනීපෙ.'

ඔහුට කුමක් වෙලා ද කියා මට වැටහුණේ නැත. ඔහුගේ එවන් ස්වභාවයක් මීට පෙර මා දැක තිබුණේ ද නැත. මා තරමක පසුබෑමකට ලක්වෙන්නට ඇත.

'ඔක්කොම ඉවරයි. දැං ඉතිං ඔක්කොම ඉවරයි.'

ඔහු මා දවා හළු කරන බැල්මක් හෙළුවේ ය. මගෙන් ඔහුට වූ වරදක් පිළිබඳව මට නම් සිතාගත නොහැකි විය.

'පොසිටිව්ලු. ඒ කියන්නෙ ළමයෙක්.'

එසේනම් ඔහු මේ යක්ෂාවේෂ වී ඇත්තේ එනිසා ය. නමුත් එය තනිව මා කළ වරදක් ද...? එය වරදක්නම් අප දෙදෙනාම ඊට වැරදිකරුවෝ නොවෙමු ද...? මට ඉබේටම මකුස පිරිමැදිණි. එසේ නම් දැනටමත් මකුස තුළ පැටියෙක් හුස්ම ගනිමින් හිඳී. මහත් ස්නේහයකින් හදවත පිරී ගියේ ය. මා නොදැනුවත්වම මගේ දෙතොල් මත මඳහසක් නළියන්නට ද ඇත.

The Reader's Place Novel

'හිනාවෙන්න නෙවෙයි. අඬන්නයි දැං වෙලා තියෙන්නෙ.'

'අනේ ඇයි සංජුල එහෙම කියන්නෙ...? අපේ දරු පැටියා ගැන එහෙම හිතන්න එපා.'

'අනේ මේ... අංශු...'

ඔහු දත්මිට කමින් යළි ඇඳට වැටිණ. මගේනම් හිත කොහෙකටවත් කේන්තියක් පැමිණියේ නැත. එසේ වූයේ දරු සෙනෙහසින් හිත පිරී තිබූ නිසා විය යුතු ය. බලාපොරොත්තු නොවූ ලෙස අප අතරට පැමිණ සිටින අමුත්තා නිසා සංජුල කලබල වී සිටිනවා විය හැක. හෙමිහිට ඔහුගේ හිත සන්සුන් කරන්නෙමැයි මම සිතාගතිමි.

'සංජුල, ආ මේ කෝපි එක බීල ඉන්න.'

මම ඔහුටත් එක්ක කෝපි පිළියෙල කළෙමි.

'මට තේරෙනවා ඔයා කලබල වෙලා කියල. මේක අවු කොහෙත්ම හිතපු දෙයක් නෙවෙයිනෙ.'

සන්සුන්ව ඔහුගේ හදවතට ඇතුළු වීම මගේ අරමුණ විය මගේ කතාවෙන් පෙළඹුණ සංජුල ඉක්මනටම යහතෙහි හිඳ මවෙතට නැඹුරු වූයේ ය.

'ඒකනෙ අංශු. මේක මෙහෙම දේකට වෙලාව නෙවෙයි.'

'ඉස්ඉස්සෙල්ලම අපිට දෙයියො දීපු පැටියනෙ. අමාරුයි තමයි, ඒත් අපි කොහොමහරි දුක් විඳගෙන මෙයාව හදමු. කිසිම අඩුපාඩුවක් නොකර.'

'කෙහෙල්මලක් කියවනව.'

මා තිගැස්සී ගියේ ය. ඒ තිගැස්මෙන් කුස ඔත් දරුවා ද බිය වේවියි සිතා මෙත් මගේ අත ඉබේටම කුස වෙත ගියේ ය.

'අපිට දරුවෙක් හදාගත්ත පුළුවං කමක් නෑ.'

'එහෙම කියල කොහොම ද සංජුල...? දැං ඉතිං දරුවෙක්

සංජුල අමාරුවෙන් සන්සුන් වෙන්නට උත්සාහ කරමින් මගේ උරහිසට කට්ටු කළේ ය.

'ඔයාට තේරෙන්නෑ අංශු. අපි මේ දරුවව නැති කරමු.'

මුලදීටත් වඩා මා තිගැස්සිණි.

'පව් කතා කියන්නෙපා.'

ඒ තිගැස්මෙන්ම මම වෙව්ලමින් කීවෙමි.

'තමංගෙම දරුවෙක් ගැන කටක් ඇරලා එහෙම දෙයක් කියන්නෙ කොහොම ද...? මේ දරුවා ඔයාගෙයි මගෙයි සංජුල.'

'තේරුංගන්නෑනෙ අප්ප.'

සංජුල දෝතින්ම සිය හිසකේ පිටුපසට කරගත්තේ ය.

'අංශු... ඔයා ඉතාලියට ආවෙ මගෙ වයිෆ් විදියට බොරු කසාද සහතිකයක් හදලා. ඒත් අපි නීතියෙන් කසාද බැඳලා නෑ.'

මේ ප්‍රශ්නයෙහි එවන් බරපතල පැත්තක් ඇති බවක් මට දැනුණේ එවෙලේ ය. මා මඳ කල්පනාවකට වැටෙන්නට ඇත.

'තේරෙනව නේද මං කියන දේ...?'

මගේ සන්සුන් වීමෙන් අනුබල ලද සංජුල වඩාත් උද්‍යෝගීමත් වූයේ ය.

'මං ඔයාට ආදරේ නිසා... මේ දේවල් මෙහෙම වුණා තමයි. ඒත්... නීති පැත්තත් පිළිවෙලක් කරගෙනම අපි පස්සෙ හෙමිහිට දරුවෙක් ගැන හිතමු.'

'සංජුල...'

'මටත් දුකයි තමයි. ඒත්...'

'ඉතිං අපි ලංකාවට ගිහිං කසාද බැඳලා එමු. එතකොට ප්‍රශ්නෙ ඉවරනෙ.'

'බයිලා ගහන්නෙපා අංශු. මේ හදිස්සියෙ ලංකාවට යන්නෙ කොහොම ද...? දෙන්නෙකුට ගිහිං එන්න ටිකට්වලටම පොඩි වියදමක් කියල ද හිතන්නෙ...?'

The Reader's Place Novel

ඔහු හිතන්නේම මුදල් ගැන ය. මුදල් හරිහම්බ කරන්නට අප දුක් විඳින්නේ සතුටින් ජීවත් වන්නට මග හෙළි පෙහෙළි කරගැනීමට කියා කිසිදාක ඔහු නොසිතනු ඇත.

'දැනට අපි ඕක නැති කරගමු. ඉතුරු දේවල් හෙමිහිට පස්සෙ කල්පනා කරමුකෝ. කාලෙ ගත වුණොත් වොෂ් කරන්නත් බැරි වෙයි.'

සංජුල කතා කරන්නේ මේ විෂය සම්බන්ධයෙන් හසල දැනුමක් ඇත්තෙක් පරිද්දෙනි. 'ඔයා ඔයතරං ඕවා ගැන දන්නෙ කොහොම ද?' කියා අසන්නට මට නොසිතුණා නොවේ. නමුත් මම හිතාමතා ඒ සිතිවිල්ල යටපත් කොට දැමුවෙමි. සමහරවිට මීට පෙරත් ඔහු මේ වගේ ව්‍යාජ විවාහ සහතික සකසා තරුණියන් ඉතාලියට ගෙන්වා මුදල් ලබන්නට ඇත. මා සේම ඒ තරුණියන් ද ඔහුගේ සාපිපාසාවන් සංසිඳුවා ගැනීම සඳහා යොදාගෙන මෙසේ ගබසා සිදුකරලන්නට ඇත. ඉමහත් වේදනාවක් හා ඉච්ඡාභංගත්වයක් මා තුළ ඇති වූවත් මට එය තනිව දරාගන්නට සිදු විය. දැන් ඉතින් සංජුල සමග ඔය දේවල් ගැන කතා කොට කිසිම පලක් නැත. මා නොදැනුවත්ව හෝ වළට වැටී හමාර ය. වළට වැටුණ මිනිසා එහි කටින්ම ගොඩ ආ යුතුව තිබේ.

මා සිතිය යුත්තේ මා ගැන නොවේ. කුසට පැමිණ ඇති සිඟිත්තා පිළිබඳව ය. මට වූ දේ වන්නට මගේ දරු පැටියාට ඉඩ තැබිය නොහැකි ය. ඔහුට මවක් සේම පියෙක් ද සිටිය යුතු ය. ඒ නිසා කලබල වී සංජුලව අහිමි කර ගැනීම සේම ඔහුට එකඟව සිඟිත්තා අහිමි කර ගැනීම ද නොකර සිටිය යුතු ය. මම තවත් දුර දිග බලා ඉවසුවෙමි.

'මං මෙහෙම දෙයක් කරන්නං සංජුල.'

ඔහු නෙතු විදා මදෙස බැලුවේ ය.

'දරුවෙක් ගැන අම්මා කෙනෙක්ගෙ හිතේ ඇති වෙන්නෙ පුදුම හැඟීමක් සංජුල. ඒක මට හරියටම දැනෙන්නෙ දැං තමයි.'

ඔහුගේ කට කොතකට සිනහවක් පැමිණියේ ය. මම එහි අරුත් සොයන්නට මහන්සි නොවුණෙමි.

'මං අම්මට කියනවා වෙලා තියෙන දේ.'

'ඔයාට පිස්සු ද අංශු...?'

සංජුල වඩාත් කලබල වූයේ ය. නමුත් මම දිගටම සන්සුන් බව පෙන්වීමි.

''අම්මා මෙ තත්ත්වෙ තේරුම් ගනීවි. මං අම්මගෙං ලඝු දෙකක් විතර ඉල්ලන්නං. අපි ටිකට් අරගෙන ලංකාවට ගිහිං බඳිමු.''

'කිවහම අහන්නව මට කසාද බඳින්න බෑ.'

මා නොසිතුවිරූ අයුරින් ඔහු පරල වූයේ ය. සංජුලගේ මූණ යකෙක් වගේ වී තිබිණ. ඔහු ඒ තරම් කෝපාවිෂ්ටව සිටින්නේ ඇයි කියා මට නම් සිතාගන්නටවත් හැකි වූයේ නැත. මුලින් ඔහු කීවේ ලංකාවට යන්නට සල්ලි නොමැති කතාවකි. මා ඒ ප්‍රශ්නයත් විසඳන්නට හදත්දී ඔහු විවාහ වන්නට බෑ කියන්නේ ඇයි...? මගේ ඉවසීමේ සීමාව ද ඉක්ම යන්නට ඇත.

'ඇයි බැරි...? ඇයි ඔයාට කසාද බඳින්න බෑ කියන්නෙ...?'

මගේ දෑසින් ගිනි පිට වෙමින් තිබිණ.

'බෑ කියන්නෙ බැරි නිසයි යකෝ.'

'කසාද බඳින්න බැරිනං ඒ විදිහට ඉන්න තිබුණා. මොන එහෙකට ද එහෙනං...' මට කියා හමාර කරන්නට ඉඩ ලැබුණේ නැත.

'එක අතකිං අප්පුඩි ගහන්න බැනෙ.'

ඔහු කොහොම මිනිසෙක් ද..? ඇත්තම ඇත්ත නම් මට කිසිදා ඔහුට පෙම් කිරීමේ හෝ ඔහු හා යහන් ගත වීමේ උවමනාවක් නොවූ බවයි. නමුත් සංජුල මඳ මත් ගතියෙන් සිටි දාක ඒ සඳහා මා පොළඹවා ගත්තේ ය. විදේශයක දී දැනෙන නිදහස වැඩි ගතිය

The Reader's Place Novel

නිසා මමත් ඊට විරුද්ධ නොවී සිටියෙමි. මෙහෙම තත්ත්වයක් ගැන බරපතල විදිහට මා සිතා තිබුණේ ද නැත. නමුත් දැන් ඉතිත් සියල්ල සිදුව තිබේ. සංජුලගේ චෝදනා හා අපවාද ඉවසා ගත්තට ද මා හිත හදාගත යුතු ය.

'හරි. ඒකත් එහෙමයි කියමුකෝ. අත් දෙකෙංම අත්පුඩිගහල හරි දැං දරුවෙක් බඩට ඇවිත්නෙ. සල්ලිත් මං හොයාගන්නවනෙ. ඉතිං ඇයි ඔයාට කසාද බඳින්න බැරි...?'

'කසාද බඳින්න බැරි මං කලින් කසාද බැඳපු මිනිහෙක් නිසා. මට දරු පවුලක් ඉන්න නිසා.'

මන්දර පව්ව මතින් බිමට වැටුණා සේ මගේ ලේකය කුඩු වී සුණුවිසුණු වී ගියේ ය. මා වට කර මුළු ලෝකයම භ්‍රමණය වන්නා සේ මට දැනිණ. බිත්තිය අල්වාගත් මම එහෙමම ටික වේලාවක් හිඳ ඇදෙහි හිඳ ගතිමි. ඒ වෙන්නට පුළුවන් දෙයක් ද...? මට විශ්වාස කරගත හැකි වූයේ නැත. තමුන්ටමයි කියා බිරිඳක් ඇති, දරුවන් සිටින මිනිසෙක් ඒ ආකාරයට පිටස්තර ගැහැනියකගේ ජීවිතයට ලංවෙන්නට පුළුවන් කමක් තිබෙනවා ද...? එසේ කරන්නේ කෙසේ ද...? නමුත් මෙය මුසාවක් විය නොහැකි ය. සංජුල බොරුවට එහෙම දෙයක් කියන්න විදියක් නැත.

'ස...ස...සං...ජුල... ඔයා... ඇත්තටම ද එහෙම... කිව්වෙ...?'

මම ගොතගසමින් අසාගතිමි.

'ඔව්.'

ඔහු මළ මිනියක් සේ සුදුමැලි වී ගියේ ය.

'එහෙනං ඇයි මිනිහො... ඇයි තමුසෙ මට මෙහෙම දෙයක් කළේ...?'

මම ඔහුගේ දෙඋරහිසින් අල්වා සොලවාගෙන සොලවාගෙන ගියෙමි. ඔහුගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබුණේ නැත. මා විනාශ වී තිබේ. මගේ දරුවා ද විනාශ වී තිබේ. ක්ෂණික සිතිවිල්ලකට නතුව මම ඇඳ විටිටමෙහි හිඳ ගසාගෙන ගසාගෙන ගියෙමි.

'මැරෙන්න හදනව ද...? මැරෙන්න ඕනතං මාව අමාරුවෙ නොදා මෙතනිං ගිහිං ඒක කර ගනිං.'

සංජුල මාව ඇද පැත්තකට විසි කළේ ය. මම මහ හඬින් කෑගසා හැඬුවෙමි.

'තමුසෙට හෙණ ගහනව. මේ කරපු අපරාදෙටනං හෙන හතම වැදියං.'

'කට වහගෙන හිටපං. මේ ලංකාව නෙවෙයි.'

'මට කොහේ වුණත් එකයි මිනිහො.'

මම නැවතත් ඔහුගේ ඇඟට පැන්නෙමි. සංජුල මාව ඇඳට තල්ලු කර දමා කාමරයෙන් පිටව ගියේ ය.

මම කොට්ටයේ මූණ ඔබාගෙන එය තෙත්බර වනතුරු හැඬුවෙමි. හැඬුවාය කියා ප්‍රශ්න විසඳෙන්නේ නැත. මා හැසිරී තිබෙන්නේ කෙතරම් අනුවණ විලාශයකින් ද..? පිරිමින් දෙදෙනෙකු නිසාම මම ජීවිතය වරද්දා ගතිමි. කල්ප නිසා මා ගැබ් ගත්තේ නැත. මෙවර එයත් සිදුව තිබේ. දෙවතාවක්ම මම විවාහක පුරුෂයන්ට රැවටුණෙමි. වරක් වුණ වරද නිවැරදි කරගෙන අලුතෙන් ජීවිතය පටන් ගැනීමටය මා ඉතාලියට පැමිණියේ. නමුත් එහි ආ විගසින්ම යළිත් බරපතල වරදක් සිදුව තිබේ. මුල් වතාවේ මට තනිව ප්‍රශ්නයෙන් සේම රටින් ද පැන යා හැකි විය. මෙවර එයත් නොකළ හැකි ය. මන්ද යත් දැන් මා පමණක් නොවන හෙයිනි. කුසෙහි දරුවෙකු වැඩේ. මා ඔහුගේ අනාගතය ද සරි කළ යුතු ය. ඉපදෙන්නටත් පෙරම ඔහුට පියෙකු අහිමි වී ඇත. මගේ කුස ඔත් දරුවා වෙනුවෙන් මා පියාගේත් මවගේත් දෙදෙනාගේම වගකීම් දැරිය යුතු ය. මට ඒ වගකීමෙන් මිදෙන්නට නුපුළුවන. මිදෙන්නට උවමනා ද නැත. මොන අභියෝගයකට මූණ දී හෝ මා මගේ දරුවා හදාවඩා ගත යුතු ය. මව් පියන් දෙදෙනාම සිටිය දී මා තනි වූවා සේ මගේ දරුවා තනි නොකරන්නෙමැයි මම තදින් සිතාගතිමි.

එදා සංජුල යළි ගෙදර පැමිණියේ බොහෝ රෑ බෝ වී ය. ඒ

The Reader's Place Novel

ඔහුට කෑම බීම සපයන්නට මා නැගිට්ටේ නැත. ඔහු මට කතා කළේත් නැත. ඇඳ දෙකෙළවරට වී අප දෙදෙනා වැතිර සිටියෙමු.

මහත් කලකිරීමක් මා අඩපන කරවා තිබිණ. මට මෙය දරාගත නොහැකි ය. මේ සමස්ථ හැඟීම් වමනය කර පිට කරන්නට තරම් අපහිරියාවක් මට දැනිණ. සංජුල විවාහක බව මා නම් දැන සිටියේ නැත. නමුත් තමන්ගේ තත්ත්වය ඔහු හොඳටම දනී. එහෙම දැනත් මේ වගේ පව්කාර ඇසුරක් ගොඩනගාගන්නට කෙනෙක් පෙළඹෙන්නේ ඇයි කියා මට සිතාගත නොහැක. කල්පත් සංජුලත් කියන්නේ එකම වල්ලේ පොල් ගෙඩි දෙකකි. ඔවුන් දෙදෙනාම කළේ එකම දෙය ය. හැම පිරිමියෙක් ම එහෙම ද...? තත්ත්වය එසේ නම් මා කිසිදා පිරිමියෙක් විශ්වාස කරන්නේ කෙසේ ද...? අපේ තාත්තා ද අම්මා රට රස්සාවකට ගිය පසු වෙන ගැහැනියකගේ ගෙදර බින්න බැස්සේ ය. ඔහුටත් දැනුම් තේරුම් ඇති දරු දෙදෙනෙකු විය. මගේ ජීව විද්‍යාත්මක පියාත් එසේ වූ එකේ පිටස්තර පිරිමින්ගෙන් ඊට වඩා දෙයක් කොහොම බලාපොරොත්තු වන්න ද...? ඔය දේවල් ගැන මුල දී සිතා නොතිබූ බැවින් මගේ ජීවිතය මෙවැනි තත්ත්වයකට ඇදගෙන වැටිණ. ඊට මගේ මව්පියන් ද වැරදිකරුවන් ය. අපට උවමනා වූ ආදරය හෝ රැකවරණය අපේ ළමා වියේ දී ලැබුණේ නැත. සමාජයෙහි හා පිරිමින්ගේ හැටි කියා දී මාව රැකගන්නට තරුණ වියේදී ද මා ළඟ අම්මා සිටියේ නැත. අත්දැකීම්වලින් වටහා ගන්නා විට නොවිය යුතු සියල්ල සිදු වී හමාර ය.

රාත්‍රිය පුරා හැඬීමෙන් දෙඩීමෙන් හා කල්පනා කිරීමෙන් ද නිදි මැරීමෙන් ද මා කෙඩෙත්තු වී තිබිණ. උදේ යහනෙන් බසින්නට බැරි තරම් විඩාවක් මට දැනිණ. සංජුල වැඩට යාමට සූදානම් වන හඬ ඇසිණ.

'අංශු... මේ කිරි එක බීලා ඉන්න. ඊයෙ රෑටත් ඔයා කෑලා නැනෙ.'

ඔහු මා ඇමතුවේ ය. මම මුණිවතින් සිටියෙමි.

'හොඳ ළමයා වගේ දෑං නැගිටල බොන්නකෝ. ඔයාට තේරෙනවඉනෙ අංශු මං කියන දේ. පුළුවංකමක් තිබුණනං මං

ඔහු තවත් මා රැවටීමට සිතා කතා කරයි. තවදුරටත් මා ඔය සුරංගනා කතා කනකට නොගන්නා බව මම නොකියා සිටියෙමි.

'වෙන කරන්න දෙයක් නෑ. අපි ඇබෝෂන් එකකට යමු. මෙහෙ ඔවා ඒතරං ලොකු දේවල් නෙවෙයි. අනිත් එක... තමං කැමතිනං... නීතියෙං කිසිම ප්‍රශ්නයක් නෑ. ඔයා මේකට හිත හදාගන්න.'

'නෑ. මං කීයටවත් ඒක කරන්නෙ නෑ නෑමයි.'

මම තදින් කීවෙමි. සංජුල කෝප නොගෙන සිටියේ ය.

'එහෙම නොකර බෑ කියල ඔයාට ඉක්මනටම තේරෙයි. ඔය වගේ දේකිං ඔයාගෙ ගමන නතර කරගන්න එක මෝඩ වැඩක් අංශු. මෙහෙ කාලයක් ඉඳල සල්ලි ටිකක් එකතු කරගෙන ලංකාවට යන එකයි තියෙන්නෙ. ඊට පස්සෙ බැරියැ කසාද ගැන හිතන්න.'

ඔහුගේ මූණට සෙරෙප්පුවෙන් ගහන්නට මට පුළුවන. ඒ තරමට ඔහු නින්දිත ය. නමුත් මම ඉවසුවෙමි. මේවාට තනිකරම සංජුලට වැරදි පැටවිය නොහැකි ය. මගේත් වරදය. නාඳුනනා රටකදී නාඳුනන පිරිමියෙකු සමග යහන්ගත වීමට කලින් මටත් හිතන්නට දේවල් තිබිණ. නමුත් ඒ කිසිවක් ගැන හිතන්නට මට කිසිදා උවමනාවක් නොවී ය. උවමනා වූයේ මේ රටේ හැංගී කල්පව අමතක කරන්නට පමණි.

'අපි හොස්පිට්ල් එකට යමු අංශු. මීට පස්සෙ අපි මේවා ගැන මීට වඩා සැලකිලිමත් වෙමු.'

ඔහු අදහස් කළ දේ මට වැටහිණ. නමුත් කිසිම ලෙසකින් යළිත් ඔහුට මගේ ශරීරය පූජා කරන්නට දැන් මා සූදානම් නැත.

'නෑ. මං හොස්පිට්ල් යන්නෙ නෑ. මාත් එක්කම මේ දරුවත් මාරුණොත් මිසක්... මං ඒ අසරණයව මරල දාන්නෑ.'

එය ස්ථිරසාර ප්‍රකාශයකි.

'එහෙනං තමුසෙ ඕන කුදයක් ගහගන්නව. හැබැයි... මේ කාමරෙං යනව.'' කෝපයෙන් එසේ කියා දැමූ සංජුල කාමරයෙන් නික්ම ගියේ ය.

The Reader's Place Novel

රැකියාවක් නොමැත. ඉතාලි භාෂාව හොඳින් කතා කිරීමේ හැකියාවක් ද නැත. දරුවා නැති කරගන්නට සූදානම් නැත්තම් සංජුල මට කාමරයේ නවාතැන් දීමට ද සූදානම් නැත. මේ නොදන්නා රටෙහි ආදායමක් ද නැතිව මා දරුවෙක් හදාගත්තේ කොහොම ද...? තාත්තෙක් නැති දරුවෙක්...?

'කසාද බැඳපු මිනිහෙක්ට ඒ ගෑනිව අතැරල මං ළඟට එන්න කියන්න මට බෑ. දරුවො඀ ඉන්න තාත්තා කෙනෙක්ට මගෙ දරුවා වෙනුවෙං ඒ ළමයි අතඅරින්න කියන්න මට බෑ. එහෙම නොවුණොත් මං සංජුලව ලේසියෙං අතඅරින්නෑ.'

මහිත එසේ කෑගැහුවේ ය.

හිතට දිරිගෙන මම කාමරයෙන් පිට වූයෙමි. අත් බෑගයට දමා ගත්තේ තවත් එක ඇඳුමක් පමණකි. කොහේ යන්න ද මොනවා කරන්න ද කියා මට නිශ්චිත අදහසක් වූයේ නැත. නමුත් දරුවා වෙනුවෙන් මා මෙතැනින් පිට වී යා යුතු ය.

හැන්දෑ වනතුරුත් ඉබාගාතේ යමින් මම කල්පනා කළෙමි. එකම දෙයක් ගැන දිගින් දිගටම සිතත් දී ඔළුව විකාර වෙයි. මුල් පිස්සු හැදේවියි මටම සිතිණ. කොහොම මා දරුවෙක් හදන්න ද...? මට මගේ කියන්නට ඉතාලියේ ඉන්නේ කවුද...? ගැබ්බර ගැහැනියකට රැකියාවක් දෙන්නට කවුරු නම් ඉදිරිපත් වනු ඇත් ද...? මේ නොදන්නා රටේ මා, හිඟාකන්න ද...?

ජීවිතය නැතිකර ගැනීම එකම විසඳුම බව කල්පනා වූයේ එවිට ය. එතකොට මේ ප්‍රශ්නවලින් මාත් නිදහස් ය. මගේ නූපත් දරුවාත් නිදහස් ය. ටර්මිනියේ උමං දුම්රියට යට වූ විට යළි දුක් විඳිමින් ජීවත් වීමට අංශු කෙනෙක් ඉතිරි වන්නේ නැත. මට තිබෙන එකම ගැලවීම එපමණකි. මට ඇති එකම සැනසීම ද එපමණකි.

හිත තිබුණේ නිර්වින්දන එන්නතක් දුන් විට මෙන් හිරි වැටී විය යුතු ය. මට මරණ බියක් නොදනුණේ එනිසායි සිතමි.

'මට මේ නපුරු ලෝකෙට එන්න බෑ අම්මෙ.' කියා මගේ

මනස් තත්ත්වයකි. උමං දුම්රිය මගෙහි ඇවිද යත්දී මගේ හිත මගේ ශරීරයෙන් වෙන්ව වායුගෝලය තුළ පාවෙමින් තිබිණ. මනෝකාය ශරීර කායෙන් වෙන්ව තිබිණ. රෝමයේ උමං දුම්රිය මාර්ගයෙහි සිදු වන මගේ ජීවිතක්ෂය පිළිබඳ පුවත් ශ්‍රී ලංකා ජනමාධ්‍ය ඔස්සේ විකාශය වන අයුරුත් මම දුටුවෙමි.

නමුත් ඇත්තටම මගේ දිවි සුරැකී තිබිණ. කුස ඔත් කලළය ගබ්සා වී තිබිණ. මගේ පවිකඳ වෙනුවෙන් ජීවිතයෙන් වන්දි ගෙවූයේ නූපත් මගේ බිළිදා ය. මම එක දිගට පැය ගණනක් ඉකිබිඳ බිඳ හැඬුවෙමි. කඳුළු උල්පත වියළී යනතෙක් හැඬුවෙමි. උගුර බැරුන්ඩි වී හඬ පිට නොවෙනතෙක් හැඬුවෙමි. හැඬුවත් යළි මගේ දරුවා මා වෙත නොඑන බව මට පසක් විය. අම්මා කාතරම් අවාසනාවන්ත අසරණියක්දැයි බිළිදා වටහා ගත්තට ඇත. ඔහු මේ තරම් ඉක්මනට මා හැර යන්නට සිතන්නට ඇත්තේත් ඒක ය.

මගේ පපුව රිදිණි. මට ඒ බිළිඳු ජීවිතය රැකගත නොහැකි විය. ඔහුට 'පුතේ' කියා කතා කළ නොහැකි විය. ගැබ්ගත් කාලය - දීපය - දේශය සේම මව ද වැරදි බව ඔහුට වැටහෙන්නට ඇත. කුඑණුබර අම්මා කෙනෙකුගේ සුවබර කුස යහනාවක ඔහු යළි පිළිසිඳේවායි මම හඬමින්ම සිතින් පැතුවෙමි.

දැන් මා යළිත් සංජුලගේ කුටියේ ය. වරක් නොව දෙවරක්ම මා රැවටිණ. තවත් නම් ඉතින් නොරැවටෙමියි මහිත කෑගසා කියයි. තමන් රැවටුණායි දැනීම, තමන් පැරදුණායි දැනීම හදවතකට මොන තරම් වේදනාවක් ද...? බරක් ද...? රිදුමක් ද...? ගින්දරක් ද...? එය හරිහැටි තේරුම් ගත හැක්කේ එවන් තත්ත්වයකට මුණ දුන් කෙනෙක්ටම පමණි. තවත් නම් මට එය විඳිත නොහැකි ය. රැවටිය නොහැකි ය.

සංජුල මට දැන් ඉතාලි භාෂා පොත ගත් මම හැල්මේ එය පාඩම් කරන්නට ගතිමි. ළිං කටෙන් ගොඩ ඒම දැන් මගේ අභිලාෂයයි. භාෂාව නොදන මේ රට තුළ කිසිත් කළ නොහැකි ය. සංජුලගේ දැලට හසු නොවී හිඳීමට නම් මා භාෂාව ඉගෙන මුදලක් උපයා ගන්නට මග සලසාගත යුතු ය.

The Reader's Place Novel

පාපන්දු ක්‍රීඩා කරන තරුණයන් ඔවුන්ගේ කිළිටි ඇඳුම් මල්ල ද ගෙනැවිත් තිබිණ. ගතේ වූ අමාරුකම් ද නොතකා මම ජීවා සෝදා දැමුවෙමි. ඔවුහු මට වැඩිපුර යූරෝ දෙකක් ද දී ගියහ.

'මට වැඩක් නොයලා දියන්.'

යැයි මම දන්න ඉතාලියෙන් ඔවුන්ට කීවෙමි. මගේ කැඩුණු ඉතාලියානු භාෂාව ඇහිදගත් ඔවුහු සිනහවෙමින් මට උදව් කරන්නට ද එකඟ වූහ.

සංජුල මත යැපීම සම්පූර්ණයෙන්ම නතර කරන්නට මට මහත් ඕනෑකමක් දැනිණ. මා දුර්වල බව දැනෙත්දී ඔහුට මා තලන්නට පහසු ය. තැලෙන යකඩය දුටු විට උඩ පැන පැන තැලීම මිනිස් ගතියයි.

ශාරීරිකව වඩාත් සුවපත් වී සවිමත් වන තුරු මම සංජුලගේ කාමරයට වී නිහඬව සිටියෙමි. නමුත් තවදුරටත් මා ඔහුට මගේ ශරීරය බිළි දීමේ සූදානමක පසු වූයේ නැත. මගේ කුඩා යහන ඔහුගේ යහන අද්දරින් ඉවතට ඇදගනු දුටු සංජුල කට කොනකට සිනහවක් නගා ගත්තේ ය. ඒ සිනහව ඉවසන්නට බැරි කමක් දැනුණත් මම ඉවසා ගතිමි.

'අපි බොරුවට තරහ වෙන්න ඕන නැනෙ අංශු. ඔයා දන්නවා මං ඔයාට ආදරෙයි කියල. අවාසනාවකට... ඔයාව හම්බවෙන්න කලිං මං කසාද බැඳලා තමයි.'

එක රාත්‍රියක එහෙම කියාගෙන සංජුල මගේ පුංචි ඇඳ කොනක හිඳ ගත්තේ ය. මම ඔහුව පෙරළාගෙන බිමට පැන්නෙමි.

'සංජුල... මගෙ ඇඟට අත තියන්නනං හදන්නෙපා.'

'ළමයෝ... මොකද මේ...? ඔයාට මේ මොන යකෙක් වැහිලා ද...?'

'ඔව්. දැං මං මගෙ ඇඟේ ඉන්න යකාව අදුරගෙන තමයි ඉන්නෙ.'

'මහලොකු දෙයක් වෙලා නැනෙ අංශු. අනිත් එක... ඔයාට බබෙක් හම්බවෙන්න හිටියා කියලා වෙන කවුරුවත් දන්නෙත් නැනෙ. මීට පස්සෙ අපි පරිස්සං වෙමු.'

'මාත් එක්ක සෙල්ලං කරන්න හදන්නෙපා. එහෙම වුණොත්...'

මම මේසය මත වූ උල් පිහිය ගෙන සංජුල වෙත උරුක් තිගැස්සිණි. හිත අන්තිමටම දුර්වල වුණ ද යකඩ ගැහැනියකගේ ශක්තිමත් බවක් සංජුලට පෙන්විය යුතු ය.

'අයියෝ අංශු... හරි හරි. ටික කලක් මෙහෙ ජීවත් වෙනකොට ඔයාම තේරුං ගනියි. ලංකාවෙ ගමේ ගොඩේ ගෑනුංගෙ පිළිවෙලට මේ වගේ රටක ජීවත්වෙන්න බෑ. අනිත් එක මේ කාලෙ ලංකාවෙ ඉන්න ගෑනුත් ඔයිට වඩා ෆෝවර්ඩනෙ.'

සංජුල සිය යහන වෙත පසුබැවේ ය. නමුත් ඔහු දියටම එසේ පසුනොවනා බව මම දැන සිටියෙමි.

ඒ හින්දාම ඉක්මනට මෙතැනින් තික්ම යා යුතු ය. අද නැතත් හෙට අනිද්දා හෝ ඔහු මා යටත් කරගනු නිසැක ය. මම දැඩි මානසික පීඩනයකට බඳුන් වී සිටියෙමි.

'මට ඉක්මනට ගේක වැඩක්හරි නොයල දෙත්තකො ගිහාත්.'

කාමරයට එන්නට පුරුදු වී සිටි සංජුලගේ මිතුරෙකුට මම ආයාචනා කළෙමි.

'රස්සාවක් නැති වුණොත් මට ආයෙ ලංකාවට යන්නයි වෙන්නෙ.'

'කලබල නොවී ඉන්නකො. අපි හිතන තරං ඉක්මනට රස්සාවල් ලැබෙන්නෙ නෑ. අනිත් එක දැං ඉතාලියත් ඉස්සර වගේ නෙවෙයි.'

'ඇයි...?'

'රස්සාවල් හරි අඩුයි. අපිට විතරක් නෙවෙයි ඉතාලිකාරයන්ට වුණත්.'

'ලංකාවෙං එන්න කලිං මං මෙහෙම දෙයක්නං බලංපොරොත්තු වුණෙ නෑ.'

'එහෙම තමයි. අපි කවුරුත් ඉතාලිය ගැන හිතං හිටියෙ සුර

The Reader's Place Novel

පුරයක් වගේනෙ. ඇවිත් කට්ට කනකොට තමයි හිතෙත්තෙ ලංකාවෙ ඉඳලා පොල් සම්බෝලයි බතුයි කෑවත් ඇති කියල.'

මා නම් ලංකාව හැරදමා ආවේ කන්නට අඳින්නට නැති කමකට නොවේ. ඒ කල්ප නිසා ද...? එක අතකට මා හිත හදාගත යුතුව තිබුණේ ලංකාවේ සිට ය. රිය පැදවිය යුත්තේ වාහන නැති පාරවල නොව වාහන බහුල පාරවල ය. භාවනා කර මාර්ගඵල ලැබිය යුත්තේ වනගතව නොව මිනිසුන් අතරේ හිඳ ය. නියමාකාරයේ ජයග්‍රහණය එයයි. නමුත් මා කළේ කුමක් ද...? හිත හදාගන්නට රටින් පැන යාමයි.

එක අතකට මට වූයේ කල්පව අමතක කිරීමේ උවමනාවක්ම නොවිය යුතු ය. ගෙදර ජීවිතය ද මට එපා වී තිබිණ. තනුජාගේ කංකරච්චලයත්, ඇගේ දරුවන් බලාගැනීමත් මට මහ වදයක් විය. සතුටක් හෝ ආදරයක්වත්, බලාපොරොත්තුවත් ජීවිතය අසලකවත් නොවී ය. මම මහත් ඉච්ඡාභංගත්වයක කරවටක් ගිලී සිටියෙමි. මා ලංකාවෙන් පිට වූයේ මට අහිමි වූ ඒ සියල්ල යළි මවෙත ලබා ගැනීමේ සැඟවුණ බලාපොරොත්තුවකිනැයි මම සිතමි.

බලාපොරොත්තු හැම විටම ඉටු වන්නේ නොවේ. ඉතාලියට ආ පසු මට සිදු වූයේ ද එයයි. කබලෙන් ලිපට වැටුණා වැනි දෙයක් දැන් සිදුව තිබේ.

'අංශු එන්නකො මාත් එක්ක එළියට යන්න. මං දන්න ඉතාලිකාරයෙක් ඉන්නව. මාත් කලිං මිනිහ ළඟ පොඩි පොඩි වැඩ කළා. මං ඔයාව එක්කගෙන ගිහිං බලන්නං මොකක් හරි වැඩක් ඉල්ලගන්න.'

'අනේ ලොකු උදව්වක් ගිහාන්.'

'ලංකාවෙ අපේ කෙල්ලෙක්ට අපි උදව් නොකර කොහොමද...?'

'අපේකම' නැත්නම් ජාතිකත්වය කියන දේ වැඩියෙන් දැනෙන්නේ විදේශයකට ගිය විට ය. ශ්‍රී ලාංකිකයෙකු මුණ ගැසුණ විට හදවතට මහත් උනන්දුවක් දැනේ. නාඳුනන රටක අප තනි වී නැති බව දැනේ.

වතාවක් තනිව මග යමින් සිටිය දී මට ලාංකිකයෙකු වන් තරුණයෙක් හමු විය. ඔහු සිටියේ බස් නැවතුමක ය. මමත් එතැන නැවතෙමින් මුව පුරා සිනාසුනෙමි.

'ලංකාවෙ කෙනෙක් හම්බවෙච්ච එක ලොකු දෙයක්. අනේ මල්ලි මෙතනිං කොරනේලියා යන බස් එක ගන්න පුළුවන් ද...?'

ඔහු මදෙස බලා සිටියේ පිළිතුරක් නොදෙමිනි.

'මං ශ්‍රී ලංකාවෙ.'

මම වැඩි හිතවත්කමක් පෙන්වූයෙමි.

'ඕ... අයි තිංක් යුවාර ශ්‍රී ලංකන්. අයිම් ෆ්‍රොම් බංග්ලාදේශ්...'

බංග්ලාදේශ් තරුණයන් ශ්‍රී ලාංකික තරුණයන් වගේම බව මා තේරුම් ගත්තේ එවේලේය. ඔහුට යම් තරමකට ඉංග්‍රීසි කතා කළ හැකි වූ නිසා, කැඩුණු ඉංග්‍රීසියෙන් මා කී කරුණ වටහා ගෙන මාව කොරනේලියා යන බසයකට නංවන්නට හැකි විය.

සංජුලගේ ඇඟේ එල්ලිගෙන ඉන්නේ නැතිව තනිව මේ සයුර තරණය කිරීම සුන්දර අත්දැකීමක් බව මම පසක් කරගනිමින් සිටියෙමි. පීනන්නට නම් වතුරට පැනිය යුතුම ය. ගිලෙනවාට වඩා පිහිනන එක පහසු බව එවිට වැටහේ.

පුළු පුළුවන් විදිහට ඉතාලියානු වචන එකතු කරමින්, පාපන්දු පිටියේ ක්‍රීඩා කරන තරුණයන් සමග ද මම කතා කරන්නට පටන් ගතිමි. එසේ කතා කරන්දී නොයෙක් විට මට වැරදිනි. තරුණයෝ සිනහවෙමින් මා නිවැරදි කළහ. එවන් කරුණක් වඩාත් හොඳින් සිත්හි ධාරණය වූයේ යළි කිසි දිනෙක නොවරදින පරිදි ය.

සංජුල මගෙන් පළිගනිමින් සිටියේ ය. මුල දී මටත් එක්කම කෑම ගෙන ආ ඔහු පසුව වැඩ ඇරී එන්දී ඔහුට විතරක් කෑම ගෙනවිත් කන්නට විය. මම එයින් සිත් රිදුම් නොලැබුවෙමි. මන්ද යත් මා කිසි දිනෙක ඔහුට පෙම් නොකළ සිනාවෙනි. කෑම ටිකකට හා නවාතැන් පහසුකම් වෙනුවෙන් ඔහුගේ අතියම් බිරිඳ වෙනවාට වඩා බඩගින්නේ මිය යන එක ගෞරවනීය ය. නමුත් පාපන්දු

The Reader's Place Novel

ක්‍රීඩකයන්ගේ ඇඳුම් සේදීමෙන් පමණක් මට ජීවිකාව කරගත හැකිකමක් නොවේ. එහෙත් හැම මොහොතකම මම රැකියාවක් ගැන සිතමින් සිටියෙමි. තරමක් ඈතට වන්නට පන්සලක් විය. වැඩක් නැත්නම් මම පයින්ම පන්සලට ගියෙමි. එහිදී හිත තරමක් සැහැල්ලු වේ. පන්සලේ දී ශ්‍රී ලාංකිකයන් මුණගැසීම වඩාත්ම සැනසුමට කරුණකි. මම හමුවෙන හැම කෙනෙක්ටම රැකියාවක් ගැන කීවෙමි. ආරංචියක් ලැබුණ ගමන් දන්වන බව කියා හැම කෙනෙක්ම දුරකථන අංකය ගනිති. නමුත් කිසි කෙනෙක් ඇමතුමක් දී රැකියාවක් පිළිබඳ ඉඟියක් දුන්නේ නැත.

මේ ගැන මහත් වේදනාවක් හිතට නොදැනුණා නොවේ. කවුරුත් කතා කරන්නේ මූනිච්චාවට විතර ය. වෙන්ව ගිය විට අමතක කර දමති. සමහර විට උදව්වක් කිරීමේ හැකියාව තිබුණත් හිතාමතා ම එසේ නොකර සිටිනවා විය හැක. සමහරවිට දවසේ කාර්ය බහුලත්වය අතරේ ඔය වගේ බාහිර දේවල් අමතක ය යනවා වන්නට ද පුළුවන. එහෙම සිතන මම හිතට දැනෙන නොසන්සුන්කම සමනය කරගතිමි.

එක අතකට මේ මගේ අවාසනාව වන්නටත් බැරි නැත. කුඩා කලදීම මට දෙමාපිය රැකවරණය හා ආදරය අහිමි විය. දැඩි භක්තියකින් පෙම් කළ කල්ප මට බොරු කළේ ය. අයියාගේ බිරිඳ නිසා ද මා ලැබුවේ හිරිහැර හා අපවාදයන්ම ය. ඉතාලියේ දී සංජුල නිසා අනපේක්ෂිත ලෙස මා ගැබ් ගත්තේ ය. මගේ පව්කාරකමට ඒ දරු ගැබද කුස තුළදීම විනාශ විය. මේ තරම් අඩු වයසක දී මට කොයිතරම් අවාසනාවන්ත සිදුවීම්වලට මූණ දෙන්නට සිදු වූවා ද...? ඉතින් රැකියාවක් වුණත් පහසුවෙන්ම ලැබේ යැයි කෙසේ සිතන්න ද...?

කුමක් වුණත් මේ ජීවිතය අත්හැර නොදමන්නෙමැයි මම දැඩිව සිතට ගතිමි.

The Reader's Place Novel

05

සංජුලගේ මිතුරෙකු වන ගිහාන් පෙරේරා මට රැකියාවක් සොයා දෙන්නට ඉදිරිපත් වූයේ ශ්‍රී ලාංකිකකම මත සැබෑ අපේ කමකිනැයි මම සිතුවෙමි. දවසක් සංජුල රැකියාවට ගිය අතරේ කාමරය වෙත පැමිණි ඔහු, සිය ඉතාලි ජාතික මිත්‍රයා හමුවීමට යාමට මට ඇරයුම් කළේ ය.

'ගිහාන් අද එනව කිව්වෙ නැති නිසා මං සංජුලට කිව්වෙත් නෑ යනවා කියල.'

'ආ... ඒකට මොකද...? අනික් එක සංජුල ඔයාගෙ ලීගල් හස්බන්ඩ් නෙවෙයිනෙ.'

ඔහු කට කොනකට නගාගත් සිනාවක් ඇතිව කීවේ ය.

'අනිත් එක අර ඉතාලිකාරයා එන්න කිව්වෙ අදයි අංශු. අපිට ඕන දවස්වලට ගිහිං හරියන්නෙ නැනෙ. අපිට මිසක් ඌට නෙවෙයිනෙ ජොබ් එක.'

'ඒක ඇත්ත. ඉන්නකෝ. මං ඉක්මනට ලෑස්තිවෙලා එන්න.'

මා සූදානම් වන තුරු කාමරයේවත් නොරැඳුන ගිහින් පිටතට වී සිටියේ ය. ඔහු මහත්මා ගති ඇති පිරිමියෙකැයි මට සිතිණ.

'අනේ ගිහාන් ඔයා මට ලොකු උදව්වක් කරන්නෙ.'

'හරි හරි. අපිටත් සලකන එකනෙ තියෙන්නෙ.'

'ෂුවර්. පඩි ගත්තහම සලකනවාමයි.'

ගිහාන් අමුතු සිනහවක් පෑවේ ය.

රෝහල්ගතව සිටීමත්, ඉන්පසු දැනුන අසනීපගතියත් නිසා අවන්හලෙහි පිඟන් සෝදන රැකියාව ද මට අහිමි වී තිබිණ. මා එතැන ටික දිනක් වුව හොඳින් වැඩ කළ නිසා, යළි අවශ්‍ය වුවහොත් දැනුම්දෙන ලෙස ඔවුහු පැවසූහ. මා ඒ බව තේරුම් ගත්තේ එහෙන් මෙහෙනි. මා කළ කාරිය සඳහා රුමේනියානු ජාතික පුරුෂයෙකු බඳවාගෙන තිබිණ.

පාපන්දු ක්‍රීඩකයන්ගේ ඇඳුම් සේදීමෙන් පමණක් කෙසේ ජීවිකාව කරගන්නදැයි සිතමින් තැවෙමින් සිටි මට, ගිහාත් ලබාදෙන්නට යන රැකියාව මහමෙරක් සේ දැනිණ.

සැබැවින්ම ඔහු මා ඉතාලි ජාතිකයෙකු වෙත ගෙන ගියේ ය. ඔහුගේ සුපිරි වෙළෙඳ සංකීර්ණයක පිරිසිදු කරන්නියක ලෙස කටයුතු කිරීම මගේ රැකියාව විය. සැලකිය යුතු වැටුපක් ගෙවන්නට ද ඔහු පොරොන්දු වූයේ ය. මගේ ඉතාලියානු භාෂා දැනුම තව දියුණු කරගත යුතු බව ඔහු උදක්ම කියා සිටියේ ය. එදා සෙනසුරාදාවකි. සඳුදා සිට මට රැකියාවට එන ලෙස හෙතෙම දැනුම් දුන්නේ ය.

'අනේ ඔයාට කොහොම පින් දෙන්න ද මන්දන්නෑ ගිහාත්.'

මගේ සතුට දෝරෙ ගලමින් තිබිණ.

'ඒවා යුතුකං. ඒවා යුතුකං.'

ඔහු ඇසක් ඉඟිමැරුවේ ය. ගිහාන් වූ කලී තරමක දඟකාර චරිතයකි. ඔහු නිතරම අනිත් අයට වඩා කතා කරයි. විහිළු කතා කියයි. සිනහවෙන් හා සැහැල්ලුවෙන් දිවි ගෙවයි. ඒනිසා මේ වෙලාවේ ඔහුගේ හැසිරීමත් මම ලොකුවට ගණං නොගත්තෙමි.

'මේ පැත්තෙං නෙවෙයි නේද බස් එක යන්නෙ...? මටනං සමහර වෙලාවට නිකං කරකෝල අතෑරිය වගේ.'

ගිහාන් මා කැටුව ගිය බස් නැවතුම තරමක් වෙනස් වූ නිසාම මම වටපිට බලමින් කීවෙමි.

'නෑ නෑ. මං මේ ඔයාව එක්කගෙන යන්නෙ සංජුලගෙ කාමරේට නෙවෙයි.'

'අම්මෝ බයවෙච්ච හැටි. මං ඔයාව කරවල වාඩියකට විකුණන්නෑ.'

ඔහු මහ හයියෙන් සිනාසුණේ ය. බස් නැවතුමේ වූ අය අප දෙස බැලුවාදැයි මම නෙතඟින් බැලීමි. නැත. ඔවුන්ට අප ගැන වගක්වත් නැත. කොහොමටත් ඉතාලි ජාතිකයන් අනුන්ගේ දේ මෙන් අනුන්ගේ දේවල්ම සොය සොයා ඉන්නට ඔවුන්ට වෙලාවක් නැති තරම්. තමන් සම්බන්ධයෙන් ද ඔවුන් හැසිරෙන්නේ නිදහස්ව ය. අනුන් මොනවා හෝ සිතාවියි ඔවුන් කිසිවිටෙක නොසිතනවායි මම සිතමි. ඒ ඔවුන් හැදුන නිදහස් මානසික තත්ත්වය නිසා විය යුතු ය. ශිෂ්ටාචාරය හා සංස්කෘතිය විසින් ඔවුන්ට සිතන්නට පුරුදු කර ඇති ආකාරය විය යුතු ය.

'නෑ... එහෙම එකකට නෙවෙයි. කොහෙද ඉතින් මේ යන්නෙ...?'

''යංකොං ගියාම බලාගන්න පුළුවන්නෙ.''

'අගේ නොකර ඉතිං කියන්නකෝ.'

'අගේ කරන්න ඕන දේවල් අගේ කරන්න ඕන තමයි ළමයෝ.'

'හරි. හරි. එහෙනං ගිහිල්ලම අගේ බලමුකෝ.'

අපි දෙදෙනාම හඬ නගා හිනැහුණෙමු. ඒ වෙලාවේම ට්‍රෑම් එකක් පැමිණියේ ය. අපි ඊට නැග අසුන් ගතිමු. යොවුන් වියෙහි තරුණ තරුණියන් කිහිප දෙනෙක් බොහොම නිදහසේ එහි හැසිරෙමින් සිටියහ.

'මේක ලංකාව නෙවෙයි අංශු. ඉතාලිය.'

ගිහාන් අමුතු තැනකින් කතාවක් පටන් ගත්තේ ඇයිදැයි මට සිතාගත හැකි වූයේ නැත. මා ඔහු දෙස බලන්නට ඇත්තේ දෑස් වඩාත් කුඩා කරගෙන ය.

'මේක හරි නිදහස් රටක්. අපිටත් තියෙන්නෙ මෙහේ ඉන්න ටිකේ නිදහසේ සැහැල්ලුවෙං ජීවත් වෙලා යන කාලෙක අපේ හිර ගෙවල්වලට යන්න.'

ගිහාන් හිනැහිණ.

The Reader's Place Novel

'හිර ගෙදර කිව්වෙ ලංකාවට ද...?'

'ඔව් ඉතිං. එහෙම කිව්වත් වරදක් නැනෙ. නේද...?'

'අපෝ... ඒ හිර ගෙදර ඉඳගෙනත් ඕගොල්ලංගෙ කට්ටිය කරන දේවල් මදෑ. මේ වගේ නිදහස් රටකට ආවහම ඉතිං ඒගොල්ලො කොහෙං නතර වෙයි ද කියල ඒගොල්ලොම දන්නෑ.'

'ආහාහා... අංශු කතා කරන්නෙ අත්දැකීමෙං වගේ.'

'අපිත් ඉතිං ඇස් කන් පියන් ඉන්නෙ නැනෙ. වෙන දේවල් දකිනව ඇහෙනවනෙ.'

'ඇයි... ලංකාවේදි කවුරුහරි හිත රිද්දුවත්ද...?'

ඔහු එය ඇසුවේ අවුතු තාලයකට ය. මම නොසැලකිලිමත් ලෙස ඉවත බැලුවෙමි.

'නෑ. එහෙම මොකුත් නෑ.'

'ගණං ගන්නෙපා අංශු. මෙන්න මෙහෙට වෙලා සල්ලි ටිකක් හොයාගෙන ජොලියෙ ඉන්න.'

'ජොලියක්නං නැතුවට කමක් නෑ. දෙයියනේ කියල කරදරයක් නැතුව ඉන්න තියෙනවනං.'

'අංශු කතා කරන්නෙ ජීවිතේ ගැන සැහෙන්න කලකිරිලා වගේනෙ.'

'අපෝ නෑ. මොන දේ වුණත් මං කලකිරෙන්න ලෑස්ති නෑ.'

ඒ ධෛර්යය නම් ඒ වෙලාවේ හිතට ආවකි. මම ගිහාන්ට නොදැනෙන සෙයින් ලොකු හුස්මකින් පෙනහළු පුරවා ගතිමි. ආයෙත් නම් මා ජීවිතය මැද නතරගාතෙන් ඇද වැටෙන්නට සුදානම් නැත. කාටවත් මාව වැට්ටවීමට හෝ පාගා දැමීමට ද මම ඉඩ නොතබමි. යළි මා ලංකාවට යන්නේ හිස කෙලින් කරගත හැකි ගැහැනියක ලෙස ය.

'බහිමු අංශු.'

මගේ කල්පනාවලියෙන් මා මුදවාලුයේ ගිහාන් විසින් අතකින් ද අල්වා ය. මම තිගැස්සී අසුනින් නැගිටින ගමන්ම

'ඉතාලියෙද හිටියෙ නැත්තං ලංකාවෙද...?'

ට්‍රෑම් එකෙන් බැසගත් පසු ගිහාන් මනමාල සිනහවකින් යුතුව විමසී ය. මා මඳහසක් පෑවා පමණි.

'කොහෙද අනේ මේ...?'

'එන්නකො එන්නකෝ.'

ගිහාන් මාව කැටුව ගියේ කඩපේළියක් මැදින් වැටුණ කුඩා පෙත්මගක් ඔස්සේ ය. ලස්සන දම් පාට මා නම නොදන්නා දුනුවල් විශේෂයක්, පාර දෙපස බිම පිපී තිබිණ. ඒ කුඩා පැල බදුන්වල සිටුවා පාර අයිනේ තබා ගත්තා නම් ලංකාවේ නම් විනාඩි කිහිපයක දී විකුණාගත හැකි වනු ඇත.

පරණ ගොඩනැගිල්ලක කෙළවර පිහිටි දොරකට, ගිහාන් විසින් යතුර දමා කරකවන ලදී. ඒ දොරත්, පරණ ගොඩනැගිල්ලත්, එහි දැකිය හැකි වූ අනිත් සියලු ලී දොරවලුත් ලා කහපාටින් පිරියම් කොට තිබිණ. වහළ ඒ තරම් උස නැත. ලංකාවේ පේළි ගෙවල්වල සේ ඉතා පරණ සෙවිලි තහඩු සෙවිලි කොට තිබුණා මතක ය. ඒ ඇස්බැස්ටෝස් තහඩුවල බිඳුණු තැන්වලට ඉටිකොළ එළා ගල් තබා තිබිණ.

'මේ තමයි මං ඉන්න මාළිගාව.'

ගිහාන් සිය දැත ද තරමක් දෙපසට විහිදුවමින් ලොකු සිනහවක් මුවෙහි ඇඳ ගත්තේය.

'ඉතිං... මෙහෙ ආවෙ...?'

ඔහුගේ සිනහව ඇසිල්ලකින් මිය ගියේ ය. නමුත් එය යළි කෘතිම ලෙස උපද්දගන්ට ඔහු සමත් විය.

'ආවෙ ද...? ටිකක් කතා බහ කරලා යන්න. දැං ඉතිං අපි යාළුවොනෙ. ඊටත් වඩා ඔයා ඉල්ලපු විදිහට මං ඔන්න ජොබ් එකක් හොයලා දුන්නා. ඒකට කොහොම ස්තුති කරන්න ද කියා කියානෙ ඔයා හිටියෙ.'

මට ඔහු කී කතාව ඒ තරම් හිතට ඇල්ලුවේ නැත. නමුත් ගිහාන් කියන්නේ ඇත්තටම මේ රටේ දී මට උදව් කරන්නට

The Reader's Place Novel

සිටිති. පන්සලේදීත්, උද්‍යානයේදීත් ඔවුන්ව මට හමු වී තිබේ. රැකියාවක් සොයා දෙන පොරොන්දුව මත ඔවුහු සමුගනිති. නමුත් කිසිවෙක්ත් ඉන්පසු දුරකථන ඇමතුමක්වත් දෙන්නේ නැත. එක අතකට ඔවුන්ට අංශු මාත්‍රිකා පතිරණ වූ කලී රෝම අගනුවර දී හමු වූ අංශුවක්ම පමණි. මා මෙන් තව කී දෙනෙක්නම් එක දිනයක් තුළ දී මෙසේ ඔවුන්ට රැකියා සොයා දෙස ලෙස ඉල්ලා සිටිනවා ඇත්ද...? කොහෙන් කියා ඔවුන් එසේ රැකියා සොයන්න ද...?

ඒ තරම් ලාංකිකයන් අතරින් ගිහාන් මට උදව් කළ විශේෂිතයෙකි. ඒ නිසා ඔහුට කෘතඥතා පූර්වක වීම මනුස්සකමකි.

'ගිහාන්ට අද නිවාඩු ද...?'

මා කාමරයට ඇතුළු වූයේ එසේ අසමිනි.

'නිවාඩු දැම්මා. ඔයාව මේ ගමන එක්කගෙන යන්න ඕන නිසා.'

'අනේ තෑන්ක් යූ ගිහාන්.'

මම කාමරය පුරා වටපිට බැලුවෙමි. එහි තට්ටු ඇඳවල් හතරක් බිත්ති හතරට ද, මැදින් තවත් තට්ටු ඇඳවල් දෙකක් ද තබා තිබේ. මට සිහිගැන්වූයේ පාසල් නේවාසිකාගාරයකි.

'මේක බෝඩිමක් ද...?'

'ඔව්. ලංකාවෙ උං තමයි වැඩිය ඉන්නෙ. තව බංග්ලාදේශ් එකෙකුයි ඉන්දියන් එකෙකුයි පර්සියන් එකෙකුයි ඉන්නවා. දැං ඔක්කොමල වැඩට ගිහිං.'

'මේක අයිති කාට ද...?'

'අවුරුදු ගණනක් ඉතාලියෙ හිටපු ලංකාවෙ අංකල් කෙනෙක්ට. ඒ අංකල් මේ කාමරෙයි එහා කාමරෙයි සල්ලිවලට අරගෙන. බිල්ඩින් එකේ අනිත් පැත්ත අයිති වයසක ඉතාලිකාරයෙක්ට. උං ඒකෙ ජිම් එකක් කරනව.'

'එහා කාමරෙත් මේ වගේම බෝඩිමක් ද...?'

'නෑ. නෑ. ඒකෙ ඉන්නෙ අංකලුයි පුතාල දෙන්නයි. අංකල්නං දැං මාස හයෙං හයට වගේ ලංකාවට යනව. මිනිහා දැං හෙණ සල්ලිකාරයා. ලංකාවෙ බිස්නස් වගයක් කරනවලු.'

එවැනි සීත රටක රැකියාවකට යනවා නම් පරිසමාප්ත අර්ථයෙන්ම මුදල් සෙවීම කළ යුතු ය. ලාංකිකයන් සේම වෙනත් දුප්පත් රටවල අය ද වෙහෙසෙන්නේ ඊට ය. ලංකාවේ සිටින පවුලේ අයට සැපවත් ජීවිතයක් උදා කර දීමට නම් ඉතාලිය තුළ වෙහෙසී වැඩ කළ යුතු ය.

'ආ... බොන්න...'

ගිහාන් මවෙත පැවේ බියර් ටින් එකකි. ඔහු අත වූ එක මුව තබාගෙන බීගෙන ගියේ ය.

'ඇයි පුදුම වෙලා බලං ඉන්නෙ...?'

'මේ බියර්නෙ ගිහාන්.'

'ඉතිං...?'

'මං ඕවා බොන්නෑ.'

'අයියෝ අංශු. ඔයා ඉතාලියට ඇවිත් දැං කොච්චර දවස් වෙනව ද...? අඩු ගානෙ සංජුලයවත් මේවා කියල දුන්නෙ නැද්ද...?'

ගිහාන් මගේ උරහිස වටා අත දමා බලෙන්ම වගේ මාව තට්ටු ඇඳක පහළ කොටසේ ඉන්දවූයේය.

'ඉතාලිය වගේ සීතල රටක ඉන්නකොට බියර් එකක් බොන එක මහ පාපයක් නෙවෙයි. ඒක සාමාන්‍ය දෙයක්.'

'කොහේ හිටියත් අපි ලංකාවෙ ගෑනුනෙ.'

සැබැවින්ම මා තුළ නොරිස්සුමක් ඉපදෙමින් ආවේ ය.

'ලංකාවෙ ඉන්න ගෑනුත් දැං ඕවා පහු කරල ඉන්නෙ. අනිත් එක ඉතිං... අපි නොදන්නවයැ අපේ ගෑනුංගෙ හැටි. මුලිං තමයි ඔක්කොම සදාචාර.'

එසේ පවසන ගමන් ගිහාන් මගේ ගෙල පෙදෙසට නැඹුරුව සිප ගත්තේ ය. මම ඔහුව පෙරලාගෙන නැගිටගතිමි.

'ගිහාන් මේ. මං ඒ අනිත් ගෑනු වගේ ගෑනියෙක් කියලනං හිතන්නෙපා හරි ද...? උදව්වක් ඉල්ලුවෙ ලංකාවෙකමට තමුංගෙකමට. උදව්වක් කරල හිලව්වට වලත්තකං කරන්න හදන්නෙපා. ඒක පිරිමිකමටත් ලැජ්ජාවක්.'

The Reader's Place Novel

කෑගසමින්ම මම කාමරයෙන් පිටතට පැමිණ සිටියෙමි.

'අංශු, මොකද මේ...? පිස්සු ද ඔහොම කෑගහන්නෙ...?'

'මදැයි ලංකාවෙ එකෙක්ගෙං උදව්වක් ඉල්ලුවා. තුක් විතරක්.' මම හැරී අතුරු පාර දෙසට ආවෙමි.

'අංශු... අංශු... ඔහොම ඉන්න. කලබල වෙන්න දෙයක් වුණෙ නැනෙ.'

ගිහාන් බැගෑපත් වනවා ඇසිණ.

'මං ඔයාව ගිහිං ඇරලවන්නං.'

'නෑ එපා. ඉතාලිකාරයෙක්ගෙ කකුල් දෙක ළඟ වැටිල උදව්වක් ඉල්ලුවත් මං ආයෙ ලංකාවෙ මිනිහෙක්ගෙංනං උදව් ඉල්ලන්නෙ නෑ.'

හිතේ වූයේ බලවත් ආවේගයකි. එය කඳුළු පනින්නට තරම් වියරු කෝපයකි. මිනිසුන් මේ තරම් තිරිසන් වන්නේ කොහොම ද...? මම වතාවක් නොව දෙවතාවක්ම රැවටුණ ගැහැනියෙක්මි. තවත් මට රැවටිය නොහැකි ය. මුලා විය නොහැකි ය. අසරණකම හේතුවක් කරගෙන මගේ ගැහැනුකම් පාවා දිය නොහැකි ය.

නවාතැනට යන්නේ කෙසේ ද කියා කල්පනා වූයේ පාරට පැමිණි පසුව ය. මේ කොහේ ද කියාවත් මම නොදත්තෙමි. කොරන්ටේලියා බලා යාමට කවර බසයක් ගත යුතු ද කියාත් නොදනිමි. 'කොරන්ටේලියා' යන නාම පුවරුවෙන් යුතුව බසයක් ඒවි ද කියා බලමින් මම මග පමා වෙමින් සිටියෙමි. නමුත් විනාඩි පහළොවක් ගෙවෙන තුරුත් එවැන්නක් ආවේ නැත. වරින් වර මම පසුපස ද හැරී බැලුවෙමි. ඒ ගිහාන් මා සොයාගෙන ඒවි ද කියා ය. ඇවිත් ඔහු සමාව ඉල්ලන්නට බැරි නැත. සිදු වූ දෙය සංජුලට නොපවසන ලෙස ඉල්ලා සිටීමට වුව බැරිනැත. නමුත් ඔහු නොආවේ ය.

මග සොයාගනු වස් මම ඉතාලිකාරයෙකු වෙත සමීප වීමි.

'කොරන්ටේලියාවලට යන්න මොන බස් එක ද ගන්න ඕන...?'

දන්න ඉතාලියෙන් මම ඔහු විමසීමි.

'කොරන්ටේලියාවලට විතරක් යන බස් මෙතනිං එන්නෑ.'

මට ඒ තරම් හොඳට ඉතාලි බස නොතේරෙන බව වැටහීදෝ ඔහු වඩාත් තේරුම්ගත හැකි ලෙස සරල බසින් කතා කළේ ය.

'මං ඒ හරහා යන බස් එකක නග්ගවන්නං. කොරන්ටේලියාවලිං බහින්න. බස් එකේ කාට හරි කියන්න එතනිං බස්සවන්න කියල.'

හෙතෙම කරුණාවන්තව කීවේ ය. මාව බසයකට තංවා එහි වූ මගීන්ට කෝරන්ටේලියාවල දී මට බැසගන්නට මතක් කරන ලෙස ද කීවේ ය.

'ග්‍රාසියෙ... ග්‍රාසියෙ...'

මම මඳක් ඉදිරියට නැවෙමින් ඔහුට ස්තුතිවන්ත වීමි. අසරණ වුණ කෙනෙකුට මනුස්සකමින් පිහිට විය යුතු බව ඒ මිනිස්සු දැන සිටිති. නමුත් තමන්ගේම රටේ අය වීත්, ශ්‍රී ලාංකික පිරිමින් බලන්නේම අසරණ වුණ ගැහැනියකගෙන් අයුතු ප්‍රයෝජන ගන්නට ය. උදව්වක් වෙනුවෙන් ඔවුහු හැමවිටම ලිංගික අල්ලස් බලාපොරොත්තු වෙති. හැමදෙනාම එසේ නොවන්නට පුළුවන. නමුත් බොහෝ දෙනෙක් අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට උත්සාහ කරන බව කල්යාමේ දී මම අත්දැකීමෙන්ම පසක් කර ගතිමි.

වතාවක් මට උද්‍යානයේ දී ශ්‍රී ලාංකික යුවතියක හමු විය. මා කිහිපවරක් ඈ දෙස බැලුවත් උද්‍යාන බංකුවක හිඳ උන් ඇය මා හා සිනාසුණේ නැත. වතාවක් බංග්ලාදේශ තරුණයෙකුට රැවටුණ සේ මේ යුතියත් වෙනත් රටකට අයත් වේදැයි සැකයක් හිතුනත්, ඇය ශ්‍රී ලංකාවේම විය යුතුයැයි සිත මුර ගා කී ය. පිරිමින්ට නැතත් ගැහැනුන්ට ගැහැනියක තේරුම් ගන්නට පුළුවන. එහෙම හිතා මම ඇය වෙත සමීප වීමි.

'ඔයා ලංකාවෙද...?'

මොහොතක් මදෙස බලා උන් ඇය ආඩම්බරකාර බැල්මෙ යුතුව 'ඔව්' කීවා ය. නමුත් ඊට වැඩි ප්‍රතිචාරයක් නැතිව වෙනත බැලුවා ය. අහංකාර ගැහැනුන් ඉදිරියේ බාල්දු වෙන්නේ කුමට සිතුනත්, මම පරාජය බාරගෙන ඇය ඉදිරියේ පින්සෙන්ඩු වු

The Reader's Place Novel

'මමත් ළඟ දී මෙහෙට ආවෙ. තාම හරියට ජොබ් එකක්වත් නෑ. ඉන්නෙත් ගෙන්නගත් එක්කෙනාගෙ කාමරේමයි.'

ඇගේ මූණේ වූයේ 'ඉතිං මට මොකද?' වැනි බැල්මකි.

'ඔයා කොහෙද වැඩ කරන්නෙ...?'

'ටිකක් දුර.'

කියාගෙන ඇය බංකුව මතින් නැගිට යන්නට සූදානම් වූවා ය. මම අසරණ ලෙස පසුබැස්සෙමි. ඇය මට 'යනවා' වත් නොකියා යන්නට ගියේ, පිටරටකදී අපේ මිනිසුන්ට ඔහොම හැසිරිය හැකි ද යන ප්‍රශ්නය මහිතේ ඉතිරි කරමිනි.

රාත්‍රියේ දී මම ගිහාන් පිළිබඳ සම්පූර්ණ විස්තරය සංජුලට කීවෙමි. මා හිතුවේ ඔහු එයින් කෝපයට පත් වනු ඇත කියා ය. නමුත් සංජුල කට කොනකින් හිනැහුණා පමණි.

'පිරිමින්ගෙන් උදව් ඉල්ලන්න ගියහම ඔහොම තමයි. නිකං උදව් කරන්නෑනෙ.'

ඔහු සරල ලෙස කීවේ ය. එතනින් එහාට මට කතා කරන්නට දෙයක් නොවී ය. සංජුලට පෙනෙන්නටම පිහිය කොට්ටය යටින් තබාගත් මම ඇඳට වැටුණෙමි.

අංශු මන්ත්‍රිකා පතිරණ කියන්නේ ලෙහෙසියෙන් නම්මාගත හැකි සීනිබෝල කෙල්ලක නොවේය කියා මේ වෙත්දී සංජුල වටහාගෙන සිටින්නට ඇත. රාත්‍රීන් කිහිපයකදීම ඔහු එම අත්දැකීම ලැබුවේ ය.

'බැල්ලි... තෝ මගෙ කාමරේ ළඟින්න ඕන නෑ. මකබෑවිලා පලයං. මේකට කොල්ලො ටිකක් දාගත්තනං මට කියක්හරි අතට එනව.'

එවන් අවස්ථාවල දී සංජුල කෝපාවිෂ්ඨව ගුගුලේ ය. මෙතන ලැගීම මටත් මහත් අපලකි. මා තවදුරටත් මෙහි රැඳී සිටියේ වෙන යන්නට තැනක් නැතිකමට ය.

වෙන දේකට මූණ දීමට දොට්ට බසින්නට මට සිතුණ වාර ගණන ද බොහෝ ය. දවල් දවසේ තම් කොහේ හෝ ඇවිදිමින් ඉන්නට පුළුවන. නමුත් රාත්‍රියේ කඩපිලක නිදන්න ද...? ගෙතුළවත්

සිටිය නොහැකි තරම් සීතල රටක දී එවැන්නක් කිරීම හිතයක් වාගේ ය.

ආයේ නම් ගිහාන් සංජුල හමුවීම සඳහා කාමරයට නොඑනු ඇතැයි මම සිතුවෙමි. ඇවිත් මිතුරාට කෙසේ මූණ දෙන්න ද...? සිදු වූ දේ මා නොවලහා සංජුලට පවසන බව ගිහාන් නොදන්නවා නොවේ. නමුත් මගේ තර්කය මා තුළම බිඳවමින් ඔහු ඊළඟ ඉරිදා පැමිණියේ ය. කිසි ගාණක් නැතිව සංජුලත් එක්ක විහිලු තහළු කරමින් කතා කළේ ය. සංජුල ද වෙනසක් පෙන්වූයේ නැත. මම නම් ඔහුගේ මූණවත් නොබැලුවෙමි. මොනවාට මූනිච්චාවට කතා කරන්න ද...? එදා ඔහු මා කැටුව ගිය තැන ඉතාලි ජාතිකයා මට රැකියාව දෙන්නට කැමති වූයේ ය. නමුත් ගිහාන් මට දුරකථන ඇමතුමක් දී කීවේ එම වැඩේ හරි නොයන බවයි. ඉතාලි ජාතිකයා නොව ගිහාන් මැදිහත් වී මට ඒ රැකියාව අහිමි කරන්නට ඇත. මා කළ වරද ඔහුට ලිංගික අල්ලස් නොදීම ය. ඔහු කියන දේකට මා එකඟ වූවා නම් මට ඒ රැකියාව ලැබෙන්නේ ය.

නමුත් අප එපමණට අපේ ගැහැනුකම් පාවා දිය යුතු ද...? එපමණට අප අපේ ගැහැනුකම අවතක්සේරු කරගත යුතු ද...?

මේ පිරිමින්ට ලැජ්ජාවක් කියා දෙයක් නැතැයි අන්තිමට මම තීරණය කළෙමි. ඔවුන් මේ සියල්ල කරන්නේ රහසිගතව නොවේ. මිතුරන්ගේ ද අනුදැනුම ඇතුවයැයි සිතන්නට පුළුවන. ඔවුන් විශ්වාස කරන ගැහැනු අප මුලා වනවා පමණකි.

එක හැන්දෑවක මම පල්ලිගොස් එමින් සිටියෙමි. මා පල්ලියට ගියේ ක්‍රිස්තියානිකාරයෙකු හින්දා නොවේ. පන්සලට හෝ පල්ලියට ගොස් බුදුන් දෙවියන් ඉදිරියේ දුක කියා කඳුළු සලන් දී හිත තරමක් සැහැල්ලු වන හින්දා ය. අවංකවම හිතේ වන දෙයක් කියන්නට කෙනෙක් මට මෙහි නැත. ලංකාවේ ද කුඩා කල සිටම එපමණට හිතට සමීප කෙනෙක් සිටියා නොවේ. නමුත් පාසල් ජීවිතය තුළ යෙහෙළියන් ඇසුරේ මම මද සැහැල්ලුවකින් ජීවත් වුණෙමි. අම්මා නැතත් ආච්චි අම්මා ජීවත්ව සිටි කාලය තුළ අපි ගැන සොයා බැලුවා ය. අපට ආදරය කළා ය. ආච්ච අම්මාගේ චිත්ත රෙද්ද තුළ දැවටුණ විට දැනෙන දඬිය මුසු කිළිටි ගඳට මා ආදරය කළ කාලයක් විය.

The Reader's Place Novel

අම්මා නැති මා තනි කරමින් ආච්චි අම්මාත් මරුණෙන් සමය යන්නට ඕයා ය. ඇය තම ජීවත්ව සිටි කාලය තුළ තැබූකෙන් පක්වින්දේම නැති ගැහැනියකි. මාමාගේ බිරිඳ පෝලිමට දරුවන් වැදුවේ ආච්චි අම්මා නිකං සිටින එකේ ළමයින් බලාගන්නකං මොකද කියා සිතන්නාක් මෙනි. එක දරුවෙක් බිම තබාගෙන හිඳ නැන්දා යළි ගැබ්බර වී සිටියා ය. එවිට අත දරුවාගේ ද දෙයින් මෙයින්ගේ ද නැන්දාගේ ද ආවතේට කළ ප්‍රබූ වූයේ ආච්චිම්මා විසිනි. ඇය පුර පුරවත් වේලාවට අපේ ගෙදරට දුව අවා ය. තාත්තා ළමයින් සිටින වැත්දැහුවකගේ ගෙදරට වීමෙන් පස්සේ රට අපව මුර කරන්නට සිදු වූයේද ඇයටමය. මහළු වීත් ඇය දියටම වැඩ කළා ය. දරුවන්ගේ දරුවන්ගේත් බැලමෙහෙවර ද කෙරුවා ය. අන්තිමට විවේකයක් අවශ්‍යම බව දැනීදෝ මරණය තුරුලට ගියා ය.

එක අතකට ගැහැනු අප කවුරුත් අපේ දෙවන්ගේ දුක්විඳින්නමැයි මට සිතේ. අපේ අම්මාත් විදේශගත වූයේ ගෙදර තිබුණ ප්‍රශ්නවලට පිළිතුරක් සොයනුවස්ය. ඇය ද ගෙදර සිටි කාලය තුළ දුක්ම විඳි ගැහැනියකි. අපේ තාත්තා වූ කලී කම්මැලි පිරිමියෙකි. අත්දැවිකාරයෙකු ලෙස කුලී වැඩ කළ ඔහු, වැඩට යනවාට වඩා කළේ ගෙදර නවතින එක ය.

'අදත් වැඩට යන්නෙ නැද්ද ආතන්ද...?'

අම්මා හැමදාමත් ඔහු අවදි කරවත්දී එසේ ඇසුවා ය.

'හරියට ඇඟට අමාරුයි නන්දෝ... ඊයෙත් එක විනාඩි පහක් නිකං හිටියෙ නෑ.'

බොහෝ විට තාත්තා එසේ කීවේ ය.

'අත පය කැඩෙන්න වගේ කැක්කුමයි. මුං මරවත්තෙ ගෝලයාවනෙ අප්ප.'

'එහෙනං මං වෙනිවැල්ගැට ටිකක්වත් තම්බලා දෙන්නං.'

තාත්තාගේ බොරු රඟපෑමට අම්මා නිතර හසු වූවා ය.

'අනේ බං නන්දෝ උඹ තාමත් මිනිහව අඳුනගෙන නැනෙ. ඔහොම මිනිහව ගෙයි තියාගෙන කොහොම ද බං ජීවත්

වෙන්නෙ...? පිරිමියෙක් වුණහම මොහෙ දකුංගෙට යතල තව ගැනිටයි දරුවන්ටයි කන්න දෙයක් දෙන්න ඕනෙ.'

ආච්චි අම්මා ඇවිත් අම්මාට කෑගැහුවා ය. තාත්තාව වැඩට පිටත් නොකිරීම ගැන මා තුළත් අම්මා පිළිබඳව වූයේ කෝපයකි. ඒ බව පිරෙන්නට ඔත් කන්නට තොලැබෙන බැවිනි. තාත්තා වැඩට නොගියොත් ආච්චි අම්මා ඔත් මැටිකෝප්පයක් මාමාගේ ගෙදරින් බෙදාගෙන විත් අම්මා අතට දෙයි. අම්මා එයින් මටත් අයියාටත් කවා, අම්මාත් කටක් දෙකක් කා තාත්තාටත් ටිකක් වසා තබයි. මෙසේ තාත්තා වැඩට නොගියොත් අප වේල් පිටින් ඔඩගින්නේ නොසිටී මුත් කුස පිරුනේ ද අඩ වඟයෙනි. සම්බෝලයක් එක්ක හෝ අම්මා ගෙදර ඔතක් පිසුවොත් අපි ඔඩපුරා ඔත් කෑවෙමු. ඒ අවස්ථාව නොලැබෙන්නේ තාත්තා වැඩට නොයා ගෙදර සිටීමෙනි. ඒ නිසා ඔහු වැඩට නොයනවාට මා කැමති වූයේ නැත.

'ආනන්දගෙ ඔය කම්මැලිකමට උඩගෙඩි දෙන්නෙ උඹ තමයි නන්දොා. ගෑනියෙක් වුණහම දැනගන්න ඕන තමංගෙ මිනිහවත් හදාගෙන ටිකක්හරි ඔළුව උස්සන්න. එහෙම නෑ. කොහෙද... මිනිහටම හරියන ගෑනි. ජාඩියට මූඩිය වගේ.'

ආච්චි අම්මා නම් කොච්චරවත් අම්මට දොස් කීවා ය. ආච්චම්මා වැඩිපුර තාත්තාට මූණ දුන්නේ ද නැත.

'ඉතිං අම්මෙ... මං මොනා කරන්න ද...?'

අම්මා කං කෙදිරි ගෑවා ය. එතකොට ආච්චි අම්මා තවත් සැර වේ.

'මොනා කරන්න ද අහන්නෙ. උදේම නැගිට්ටෝල මිනිහව ගෙදරින් පිට කරහං. හවස එනකොට කීයක්හරි හම්බකරං එන්න කියපං. දරුවො බඩගින්දරේ තියන්න බෑ කියපං.'

ආච්චි අම්මා මැෂින් එකක් වගේ කියවයි.

'එයැයි කියලත් මොනා කරන්න ද...? අනිත් එක ඔය කොන්තරත්කාරයො මරෝ මරෝ වැඩ ගන්නවලුනෙ. ආනන්දගෙ ඇඟත් දුර්වලයි.'

The Reader's Place Novel

'මොකටද ඉතිං මගෙ කට. එහෙනං ඉතිං මිනිහව හුරතල් කරල ගෙයි තියලා උඹ රස්සාවකට පල.'

ආච්චි අම්මා කේන්තියෙන් දොට්ට බැස යයි.

අපේ ගෙදර අගහිඟකම් ඕනෑ තරම් විය. ලුණු ඇටයක්වත් ගෙයි නැති අවස්ථා ද ඕනෑ තරම් විය. නමුත් අපේ අම්මාට හොඳ අත්ගුණයක් තිබිණ. බතක් උයා පරිප්පු හොද්දක් හා කලවම් මැල්ලුමක් මැලෙව්වත් ඇගේ කෑම වල සුවඳ වටේටම ඉහිර ගියේ ය.

'අදනං නන්දා මඟුල් ගෙදරකට වගේ කෑම උයනව වගෙයි.

ඒ සුවඳට අහල පහළ කෙනෙක් නොකියා සිටින්නේ නැත.

'ඇත්තමයි නන්දා පිටරටක වගේ වැඩට ගියානං උං උඹේ අත් ගුණේට වහ වැටෙනවා.' අම්මාට රට යන අදහසක් පහළ වන්නට ඇත්තේ අසල්වැසි කාන්තාවක් එසේ කී නිසායි මම සිතමි.

'අපේ නන්දාගෙ අතිං උයන කෑම කෑවොත් සුද්දො ආයෙ නන්දාව ලංකාවට එවන්නෑ.' තාත්තා ද ආඩම්බරයෙන් කීවේ ය. රසට කෑම පිසින හැකි බිරිඳක සිටීම ඕනෑම පුරුෂයෙකුට ආඩම්බරයට කරුණකි. නමුත් මෙම වර්ණනාවන් නිසාත්, වැඩිවෙමින් පැවති ගෙදර අගහිඟකම් නිසාත් අම්මාට රට යාමේ පිස්සුව සෑදිනි.

'ඔයා රට ගිහිං කොහොම ද නන්දෝ... කව්ද මේ ළමයි බලාගන්නෙ...?'

අම්මා යෝජනාව ඉදිරිපත් කළ මුල තාත්තා එසේ ඇසුවේ ය. අම්මා රට යවන අදහසක් තාත්තාට නොවූ බව මට සහතික ය. නමුත් යම්කිසි උමතුවක් ඇති වූ කල එය තෘප්ත කරගන්නා තුරු අපට ඉවසිල්ලක් නැත. රට පිස්සුව අම්මාට බලපෑවේ ද එසේ ය.

'ෂෝක්... ෂෝක්... මිනිහව ගෙදර නවත්තල එහෙනං උඹ රටෙනුත් එහා රස්සාවකට පලයංකො. අනේ අම්මප අබුද්දස්ස කාලෙ අපිට මෙව දකින්නත් වුණානෙ.'

ආච්චි අම්මා ද විරුද්ධ වූවා ය. නමුත් අම්මාගේ පිස්සුව කාටවත් සුව කළ හැකි නොවී ය. ඒ නිසා ඇය සිය අරමුණ ජයගත්තා ය.

රට ගිහින් ගෘහ සේවිකාවක ලෙස වැඩ කළ අම්මා සැපතක් වින්දායි මම නොසිතමි. අම්මාත්, අම්මාගේ අම්මාත්, අම්මාගේ දුවත්, එක එක විදිහට දුක් විඳි ගැහැනු චරිත වෙති.

මේ දුකෙන් ඉපදිය යුතු ය. මේ දුක මඩ වගුරක් නම් එහි නෙලුමක්ව පිබිදිය යුතු ය. මා තුළ බලපවත්වන්නට වූ සිතිවිල්ල එයයි. පිරිමින් දෙදෙනෙකුට රැවටීමෙන් පස්සේ ද, දරු ගැබක් ගබ්සා වී යාමෙන් පස්සේ ද, තවදුරටත් පිරිමින්ගේ ලිංගික බලපෑම්වලට ලක් වෙන අනාරක්ෂිත ගැහැනියක ලෙස ජීවත් වෙමින් ද මා තුළ බලපවත්වන්නට වූ සිතිවිල්ල ඒ නෙළුමක්ව පිබිදීමේ ආශාවයි.

ඉරිදාවක, පල්ලියක් ළඟ දී මම අපූරු දසුනක් දුටිමි. එහි බෑමක් මත වාඩි වී සිටි වයස්ගත ඉතාලි ජාතික පිරිමියෙකු, කඩදාසි කිහිපයක් රැඳවුමක් මත තබාගෙන එතනට එන ගැහැනු පිරිමින්ගේ රූප අඳිමින් සිටියේ ය. එම දර්ශනය මා තුළ මහත් ආශ්වාදයක් ජනිත කරවන ලදී. සිත්තරාට මඳක් කිට්ටු වී සිමෙන්ති බෑම මත හිඳගෙන, ඔහුගේ පැන්සල් රේඛා දක්ෂ ලෙස කඩදාසිය මත එහෙ මෙහෙ වෙනයුරු මා බලා සිටියේ එක්තරා ආකාරයක විමතියකින් ද යුතුව ය. ඒ කොහොම දක්ෂකමක් ද...? සිත්තරා වියපත් වුණත් පැන්සල් රේඛා හරි ප්‍රබල ය. තුරුණු ය. ජීවී ය. කෙනෙකුට මෙය සාමාන්‍ය දෙයක් සේ පේන්නට පුළුවන. නමුත් මම චිත්‍ර කර්මයට ආශා කළ තානැත්තියක්මි. පාසලේ දී සාමාන්‍ය පෙළ දක්වාම මම චිත්‍ර විෂය හැදෑරුවෙමි. ඒ සඳහා සාමාන්‍ය පෙළ විභාගයේදී මට විශිෂ්ට සමාර්ථයක් ද හිමි විය. මේ දර්ශනය දැකීමෙන්, යටපත් වී තිබූ මගේ චිත්‍රකර්ම ආශාව යළි ඉස්මතු විය. පාපන්දු ක්‍රීඩකයන්ගේ රෙදි සේදීමෙන් අත වූ මුදල් වලින් මම දිය සායම් පෙට්ටියක් හා කඩදාසි කිහිපයක් මිල දී ගතිමි. සංජුලගේ නවාතැනට පැමිණි ගමන් එක් කදාසියක සිතුවමක් ඇඳ, මම එය වර්ණ ගැන්වූයෙමි.

The Reader's Place Novel

ඒ චිත්‍රය අර පල්ලිය ළඟ වූ සිත්තරාගේ සිතුවමක් අසලින්වත් තැබිය නොහැකි තරම් දුර්වල බව මම දනිමි. නමුත් මම ඊළඟ දින කිහිපය තුළ ඉතිරි කඩදාසිවල ද සිතුවම් අඳිමින් වර්ණ ගැන්වූයෙමි. මේ අභ්‍යාසය නිසා යටපත්ව පැවති මගේ හැකියාව හා උනන්දුව යළි අලුත් වූවායි සිතමි.

'ආ... අංශුට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන්නෙ.'

දවසක් පාපන්දු ක්‍රීඩකයෙකු මා චිත්‍රයක් වර්ණ ගන්වනු දැක කීවේ ය. ඔහුගේ ප්‍රකාශයෙන් මම සතුටක් සේම අනුබලයක් ද ලැබුවෙමි.

'එච්චර හොඳට බෑ. ටිකක් විතර පුළුවං.'

'එහෙම හිතන්න එපා. ඔයාට මේ හැකියාව දියුණු කරගත්තොත් හොඳට සල්ලි හොයාගන්න පුළුවං. ඔයාගෙ චිත්‍රවල තියෙන පෙරදිග ඌරුව අපේ චිත්‍රවලට වඩා වෙනස්. ඒ වෙනසට මෙහේ මිනිස්සු හුගක් කැමති වෙයි.'

'මට වඩා හොඳට ඔයා චිත්‍ර ගැන දන්නව වගෙයි.'

'දන්නව. හැබැයි මට අඳින්න බෑ.'

අපි දෙදෙනාම සිනාසුණෙමු. සංජුල දැන් දින කිහිපයක් තිස්සේම මා චිත්‍ර අඳිනු දුටුවේ ය. නමුත් ඔහු නිකමටවත් මා අගය කළේ හෝ මගේ හැකියාව දියුණු කරගන්නා ලෙස වචනයක් කීවේ හෝ නැත. මේ මිනිස්සු ඊට වඩා කෙතරම් වෙනස් ද...? රෝමය වූ කලී කලාගාරයකැයි මම උගෙන ඇත්තෙමි. රෝමවරු සැබෑ කලාකරුවෝ ය. මේ නගරයේ තාප්පවල ඇඳ තිබෙන බලිකුරුටු චිත්‍ර පවා බෙහෙවින් කලාත්මක ය. එහෙම හැකියාවන්ගෙන් පිරිපුන් මිනිසුන් වීත් ඔවුහු මේ අංශුගේ අංශුමය හැකියාව මහ ඉහළින් අගයති. ඒ කෙතරම් නිහතමානී ලක්ෂණයක් ද...? අපේ මිනිසුන් එසේ නොකරන්නේ ඔවුන්ගේ හීනමානය නිසා විය හැක.

'මං අංශුගෙ මේ පේන්ටිං එක ගන්න ද...?'

ඉතාලි ජාතික තරුණයා මා හැඳි සිතුවම් බලා අහවර, පාත්තරයක් අතින් ගෙන පිණ්ඩපාතයේ වඩින භික්ෂුවකගේ සිතුවම අතට ගෙන තිබිණ.

'ගන්න ගන්න. ඔයා මගෙ චිත්‍ර අගය කරපු එකම මට ලොකු හයියක්.'

මම අවංක සතුටින් ඔහුට එය තිළිණ කළෙමි. නමුත් තරුණයා මා බලාපොරොත්තු නොවූ විලසින් යූරෝ පණහක නෝට්ටුවක් මා අත තැබුවේ ය.

'එපා. එපා. සල්ලි එපා. මං ඒක දුන්නෙ තෑග්ගක් විදිහට.'

මම දන්නා ඉතාලිය ගැටගසමින් ඔහු ප්‍රතික්ෂේප කළෙමි. තරුණයාගේ මුවට සිනහවක් ආවේ ය. ඔහු මගේ අතින් අල්වා මුදල් නෝට්ටුව අතමිට මෙලවී ය.

'මේක ඔයාගෙ චිත්‍රෙ හරි වටිනාකම නෙවෙයි. පුංචි ගානක්. ඒත් ඔයාගෙ ගමනට සුභ පැතුමක් විදිහටයි මං මේක දෙන්නෙ. ඉස්සරහට ලොකු ගණංවලට චිත්‍ර විකුණන්න ඔයාට පුළුවං වෙයි.'

'ඔයාගෙ ප්‍රාර්ථනය මට ලොකු හයියක් සිංඤෝරේ.'

මගේ ඇස්වලට කඳුළු ද පුරා ඇවිත් තිබිණ. ඒ බොඳ කඳුළු දැස දුටු තරුණයා මගේ හිස් මුදුන ලෙංගතු හසරැල්ලකින් පිරිමැද්දේ ය.

'ආසියාතික ගෑනු සතුටටත් අඬනවනේ...? ඒකට අපේ ගෑනු.'

කඳුළු අතරින්ම මට සිනහ නැඟිණ. තරුණයා නික්ම ගියේ රෝම අගනුවර ඉහළම තැනකට මාව ඔසවා තබා වාගේය මට දැනුණේ. අලුත් පණක් ඇඟට දැනිණ. අලුත් ශක්තියක් හිතට දැනිණ. රෝම නගරයේ මාවත් පුරා ඇවිද ගිය මට චිත්‍ර කර්මයට අදාල බඩු භාණ්ඩ අලෙවි කරන සාප්පුවක් සොයාගත හැකි විය.

'කඩදාසිවල නෙවෙයි. කැන්වස් එකේ අඳින්න.'

පාපන්දු ක්‍රීඩකයාගේ ඒ උපදේශය මසිත්හි දෝංකාර දෙමින් තිබිණ. මම කැන්වස් රෙදි ගහන ලද රාමු තුනක් ද, වඩා හොඳ සිතුවම් බුරුසු හා වර්ණ තීන්ත ද මිල දී ගතිමි. උපරිම ශක්තිය යොදා වඩා හොඳ මට්ටමේ චිත්‍ර කිහිපයක් නිර්මාණය කරන්නට මට ඕනා වී තිබිණ. කුමක් සිතුවම් කරන්න ද කියා සිතමින් සිටිය දී මගේ චිත්‍රයේ මුල්ම ගැනුම්කාරයා වන පාපන්දු ක්‍රීඩකයාගෙන් මට දුරකථන ඇමතුමක් ආවේ ය.

The Reader's Place Novel

'මගෙ යාළුවෙක් අංශුගෙ පේන්ටිං එක දැකල. එයාටත් ඔයාගෙං චිත්‍ර කීපයක් ගන්න ඕන කියල කියනව. හැබැයි එයාට ඕනත් අර මගෙ එකේ ඉන්න බුඩිස්ට් මන්ක් ඉන්න පේන්ටිංස් කීපයක්වු. එක එක ඇන්ගල්ස්වලින් අංශු පේන්ටින්ස් දෙක තුනක් කරන්නකො.'

ඒ නම් මා කොහෙත්ම නොසිතූ - නොපැතූ යෝජනාවකි. හද ගැස්ම හොඳටම වේගවත් විය. නමුත් එවැනි ගැස්මක් හොඳ නිර්මාණයකට අවශ්‍ය මානසිකත්වය සකසා දෙනවා වත්තට ඇත. කහ කුඩයක් ඉහළාගෙන නග්න දෙපයින් යුතුව කාෂ්යක පරිසරයක ඇවිද යන භික්ෂුවකගේ රුවක් සිතුවම් කරන්නට මම මූලික සටහන හැඳගතිමි.

'මොකද මේ හාමුදුරුවරු ඇඳ ඇඳ ඉන්නෙ...? මහණ වෙන්නවත් හිතිල ද...?'

සංජුල අපහාස මුවින් ඇසුවේ ය. ඔහුගේ දෙතොල් මත ද සමච්චල් සිනහවක් විය. මම මුණිවත රැක්කෙමි. මගේ සිතුවමක් විකුණාගන්නට හැකි වූ බව මා නිකමටවත් ඔහුට කීවේ නැත. ඉතාලි තරුණයා කී ලෙසට තවත් චිත්‍ර තුනක් විකුණාගත හැකි නම් මට ඉක්මන්නට කොහේ හෝ ඉන්නට තැනක් සොයාගන්නට හැකි වනු ඇත. එය පිළිවෙලක් කරගන්නාතුරු සංජුලට කිසිත් කිව යුතු නැත.

'අංශු තවත්නං මට මේක කරන්න බෑ. ඔයා රස්සාවක් හොයාගන්නෙත් නෑ. ඉන්න තැනක් හොයාගන්නෙත් නෑ. කොහොමත් ලබන මාසෙ පළවෙනිදා ඉඳලනං ඔයාට මෙහෙ ඉන්න බෑ.'

ඔහු එසේ කියත්දී මගේ දෙපා ගැහී ගියේ ය.

'ඇයි...?'

'මං කොල්ලො කීපදෙනෙක්ව ආයෙ කාමරේට අරගෙනයි තියෙන්නෙ. උන් ටික පළවෙනිදා ඉඳලා මෙහෙ නතර වෙනව.'

'අනේ සංජුල. මං තව ටික දවසක් මෙහෙ ඉන්නං. මා ඔයාට බෝඩිං ගාස්තුව ගෙවන්නං.'

'නතර පස් දෙනෙක්ගෙං එන ගාන ඔයාට තනියම ගෙවන්න බෑනෙ. මට තවත් පාඩු විඳින්න බෑ. අපි දෙන්නා ඩීල් එකක් කළා. ඔයා මට සල්ලි ගෙව්වා. මං ඔයාව මෙහෙට ගෙන්න ගත්තා. එච්චරයි.'

ඔහු කතා කළේ සිත්පිත් නැති නරුමයෙකු ලෙසට ය. පළවෙනිදාට තව දින පහකට වඩා තිබුණේ නැත. අලුත් තැනක් සොයාගන්නවත් ඒ සඳහා මුදල් හොයාගන්නවත් දින පහක් වගේ කාලයක් කොහෙත්ම ප්‍රමාණවත් නැත. ඒ ගැන හිත හිතා ඉන්නට ගියොත් මට පිස්සු හැදෙන්නට තිබිණ.

දක්ෂ සිත්තරෙකුට සිතුවමක් නිම කරන්නට මාස කිහිපයක් ගත වන බව අසා ඇත්තෙමි. මා දක්ෂ සිත්තරාවක නොවේ. දින දෙකක දී මම ආරම්භ කළ සිතුවම නිම කළෙමි. හිතේ වූ නොඉවසිල්ල නිසාම දෙවන සිතුවමට ද අත තැබීමි. මා එහි ඇන්දේ දිය පහරක් අසල නැවීගෙන දෝතින් දිය ගෙන බොන භික්ෂුවකගේ සේයාවකි. සායම් ගැල්වීමෙන් පසු එය මා සිතුවාට වඩා බෙහෙවින් භාවමය ස්වභාවයක් ගත්තේ ය. චිත්‍රයේ සියුම් තැන් නිම කිරීමට මම වැඩි කාලයක් ගතිමි. ඊළඟට මම භාවනානුයෝගී වයස්ගත භික්ෂු රුවක් සිතුවම් කළෙමි. මෙම කාර්යයෙහි මා නියුතු වූ කාලය තුළ, සංජුල මට ලබා දුන් දින පහක කාල සීමාව එළඹියේ ය.

'අංශු හෙට අර කොල්ලො ටික මෙහෙ නවතින්න එනව. ඔයා තැනක් හොයා ගත්ත ද...?'

සංජුල මගෙන් එහෙම විමසත්දීත් මා සිටියේ භික්ෂුව සිතුවම් කිරීමේ භාවනානුයෝගී සිහිය තුළ කිමිදීගෙන ය.

'අනේ සංජුල. මට මේ පේන්ටින් එක ඉවර කරනකල් විතරක් කල් දෙන්න...'

'මොළේ හොඳ නැද්ද...? මං කියලනෙ තිබුණෙ පළවෙනිදා ඉඳලා කට්ටියකට දුන්නා කියලා.'

'පිං සිද්ධ වෙයි සංජුල. කාමරේ ඇතුළෙ නැති වුණාට කමක් නෑ. මට දවස් දෙකක් එළියෙ ඉන්න දෙන්න.'

The Reader's Place Novel

'එළියෙ...? මේ සීතලේ...?'

'ඒකට කමක් නෑ. මට මේ චිත්‍රෙ ඉවර කරන්නයි ඕනෙ.'

'වි...කාර...'

සංජුලගේ මුහුණේ සුපුරුදු සමච්චල් සිනහව විය.

'හැබැයි දවස් දෙක ඉවර වුණහම තැනක් හොයාගෙන යනව. නැත්නං මෙතනට එන කොල්ලො මොනා හිතයි ද දන්නෑ.'

ඔහු එහෙමවත් ඉඩදීම පිළිබඳව හිතේ කෘතඥතාවයක් විය. කීවා සේම තරුණයෝ කිහිප දෙනෙක් පළවෙනිදා උදෙන්ම රෙදි බෑග් උස්සාගෙන පැමිණියහ. මිදුලට දමා තිබුණ තට්ටු ඇඳත් කාමරය තුළට ගෙන සංජුල තරුණයන් වෙනුවෙන් කාමරය පිළියෙල කළේ ය. මගේ කලමනා සහිත බෑග් දෙක කාමරයෙත් පිටතට තල්ලු විය. ඒත් මට දුකක් නොදැනුනේ ඇයි කියා මමම නොදනිමි. පුංචි ස්ටූල් එකේ ඉඳගෙන, මිදුලේ විදුලි පහන් එළියෙත් මම දිගටම චිත්‍රය ඇන්දෙමි.

'ඉතාලියට ඇවිත් ලංකාවෙ වයසක හාමුදුරුවරු ඇඳ ඇඳ ඉඳලනං හරියන එකක් නෑ.' රාත්‍රියේ දී මා චිත්‍ර අඳින තැනට පැමිණි තරුණයෝ උපදේශයක සරින් කීහ. මා තොල් කොනකින් සිනාසුණා පමණි.

'මාත් ඕක මෙයාට කියලා තියෙන්නෙ. අඩු ගානෙ කාමරේකට ගෙවන්නයි කන්නයිවත් කීයක් හරි හොයාගන්න රස්සාවක් එපැයි.'

සංජුල ද අනුබල දුන්නේ ය. තරුණයෝ රෑබෝවෙත් දී කාමරයේ දොරවල් වසාගත්හ. සීතල හෝ නිදිමත නොතකා මම ඒ රාත්‍රිය පුරාම චිත්‍රයේ සායම් ගැල්වූයෙමි. මගේ අනාගතය පිළිබඳ සිත්හි වූ දෙගිඩියාවම මට ශක්තිය සපයන ඉන්ධනය සේ ක්‍රියා කරන්නට ඇත. කෙසේ හෝ එළිවන විට මට ඒ චිත්‍රය සම්පූර්ණ කරගත හැකි විය.

'ඊයෙ රෑ නිදාගත්තෙ නැද්ද...?'

සංජුල උදේ දොර හරිත්දීත් මා ස්ටූලය මතම හිඳිනු දැක, බිත්තිය අයිනේ තැබුනු හිස් ඩිවානය දෙස බලමින් ඇසී ය.

'මං ඔයාගෙං තව දවස් දෙකයිනෙ ඉල්ලුවෙ. ඔයා ඉතිං දුන්නෙ නැනෙ. ඒක නිසාමද මන්දා හිතේ හයියට මං රෑයෙ රෑම චිත්‍රෙ වැඩ ඉවර කළා.'

'හරි... හරි... එහෙනං අදම මෙහෙං යන්නකො.'

ඔහු ගණනකට නැතිව කීවේ ය. සංජුලත් අනිත් තරුණයනුත් රැකියාවන් වෙත නික්ම ගිය පසු මම පාපන්දු ක්‍රීඩකයාට දුරකථන ඇමතුමක් දුන්නෙමි.

'මං දවල් දොළහ වෙනකල් වැඩ. ඊට පස්සෙ මගෙ යාළුවත් එක්කගෙනම එන්නං. ඔයා පේන්ටිංස්වලට සාධාරණ ගානක් කියන්න. මිනිහා සල්ලිකාරයා. හැබැයි කලාවට හරි කැමතියි. කියක් වුණත් චිත්‍ර ටික ගනියි. ඔයාගෙ ස්ටයිල් එකට එයා කැමතියි.'

ඔහු මට මගේ දෙවන ගැනුම්කරුවා පිළිබඳ හැඳින්වීමක් ද කළේ ය.

'ලොකු ගාණක් නැති වුණාට කමක් නෑ. මට ආයෙ කැන්වසුයි තීන්ත ටිකකුයි ගන්න කීයක් හරි ලැබුණොත් ඇති.'

'එහෙම කියන්න එපා. ඔයාගෙ හැකියාව ඔයාම අගය කරන්න පුරුදු වෙන්න.'

'ඔගොල්ලංගෙ කරුණාවන්තකමට කොහොම ස්තුති කරන්න ද කියලා මට තේරෙන්නෑ.'

මා එය කීවේ අවංකවම ය. හදවතින්ම ය. තරුණයා හඬනගා හිනැහිණ. එය ද අවංක සිනහවක් වග මට වහා දැනිණ.

කීවා සේම ඔහු දවල් දොළහමාර වන විට සිය සගයා ද සමග පැමිණියේ ය.

'මේ අංශු නේද...?'

සගයාගේ ප්‍රශ්නයෙන් මා පමණක් නොව තරුණයා පවා පුදුමයට පත් වූයේ ය. සැබවින් මා තිගැස්සී යන්නට ඇත. ඒ මා ඔහු හැඳින්ගත් නිසාවෙනි.

'ඇයි... අංශුට ටාව මතක නැද්ද...?'

මතකය. මෙට්‍රෝවේ හැපෙන්නට ගිය මගේ ජීවිතය ගලවාගත් ගැලවුම්කාරයා ඔහු ය.

The Reader's Place Novel

'මත...කයි...'

මම ගොත ගැසුවෙමි.

'ඔහෝ... එහෙනං දෙන්නා මීට කලිං දන්නව ද...?'

'ඔව්. අපි මුණගැහිල තියෙනව. ඒත් අංශු මේ තරං දක්ෂ චිත්‍ර ශිල්පිනියක් කියල මං දැනගෙන හිටියෙ නැනෙ.'

ඔහු මාව හැඳිනගත් ආකාරය පිළිබඳ විස්තර තරුණයා ඉදිරියේ හෙළි නොකිරීම මට සහනයක් විය.

'කෝ බලමු. අලුත් පේන්ටිංස්.'

තරුණයා කැන්වස් රාමු තුන තබා තිබූ ඩිවාන් එක වෙත ගියේ ය. මම නෙතු ඔසවා මගේ ගැලවුම්කාරයා දෙස බැලුවෙමි. මගේ දෑස්හි බෑගැපත් බවක් වන්නට ඇත. ඔහුගේ ඉතා කුඩා සිහින් දෑස්වල වූ අදහස කුමක් ද කියානම් මට වැටහුණේ නැත.

'මාරියෝ ඔයානං මේ පේන්ටිංස්වලට වගී වෙයි.'

තරුණයා කී දේ මට වැටහුනේ එසේ ය. එසේනම් ඔහුගේ නම මාරියෝ ය. මාරියෝ වහාම තරුණයා වෙත හැරුනේ ය. ඔවුන් දෙදෙනාම සිතුවම්වලට එබීගෙන උන්හ. මම ඔවුන්ව තරමක් ඈතින්, ඔවුන්ගේ මුහුණුවල සටහන් වන ඉරියව් විනිශ්චය කරමින් බලා සිටියෙමි. දෙදෙනාගේම දෙතොල් මත වූයේ තෘප්තිමත් සිනා රේඛා ය. එය මට සැනසුමක් විය. නිරහංකාර ආඩම්බරයක් ද හිතෙහි එහෙ මෙහ විය. මා නොදැනුවත්වම මගේ දෙතොල් අතරට මඳහසක් පැමිණ තිබෙන්නට ද ඇත.

'ලස්සනයි අංශු. ගොඩක් ලස්සනයි. ඇත්තටම හරිම ලස්සනයි.'

පනහේ දශකයේ ජීවත් වන්නෙකු යැයි මා සිතා සිටි මාරියෝ, බෙහෙවින් ළාබාල තරුණයෙකු සේ උද්‍යෝගීමත් බවක් පෙන්වූයේ ය.

'තැන්ක් යූ සර්.'

'වෙල්කම් වෙල්කම්. යුවා මෝස්ට් වෙල්කම්.'

මා 'තැන්ක් යූ' කියන ඉංග්‍රීසි වැකිය භාවිතා කළේ ලංකාවේ

පුරුද්දට ය. ඉතාලි ජාතිකයන් බොහෝ දෙනෙක් ඉංග්‍රීසි කතා කරන්නට පමණකුදු නොව එවැනි ඉතා කුඩා ඉංග්‍රීසි කියමනකවත් අරුත දන්නේ නැත. ඉතාලිය තුළ ඉංග්‍රීසි භාවිතය ඉතාම අඩු හෙයිනි. ඉංග්‍රීසි දන්නා ඉතාලි ජාතිකයන් ඉතා අල්ප බව සංශුල ද මට කියා තිබේ. මාරියෝ ඒ අතළොස්ස අතරට වැටෙත්තෙක් විය යුතු ය.

'බට් ඩෝන්ට් යූස් දැඩ් වර්ඩ... සර්... ජස්ට් කෝල් මී මාරියෝ.'

එදා රෝහලේ දී මා මේ පුද්ගලයාගේ දොඩමළුව මගහැරියේ ඉතාලි භාෂාව හරිහැටි නොදන්නා බව හඟවමිනි. නමුත් මට යන්තම් හෝ ඉංග්‍රීසි කතා කළ හැකි බව දැන් ඔහු සිතයි. ඒ නිසා ඔහු හා කතා කිරීමෙන් මට ගැලවීගත නොහැකි වනු ඇත.

'අංශුගෙ ගාන කියන්න...?'

තරුණයා මට නැවත මතක් කිරීමක් කළේ ය. මම විළිබර මඳහසක් නගාගතිමි.

'අනේ මන්දා. මං මීට කලිං චිත්‍ර ඇඳලා විකුණලා නැනෙ. ඔගොල්ලො හිතලා කැමති විදිහක් කරන්න.'

මා කතා කළ ඉතාලි වැරදි වුණත් එය ඔවුන්ට තේරුම්ගත හැකි වූවා යැයි සිතමි. මාරියෝ කම්මුල් ඉලිප්පෙන ලෙස සිනහ වී තරුණයා සමග වේගවත් ඉතාලියෙන් මොනවා ද කියාගෙන ගියේය. තරුණයා ද යමක් කියමින් හිනැහිණ. ඔවුන් කතා කළ දේ මට නම් අඩමානයටවත් සිතාගත හැකි වූයේ නැත. මුදල් පසුම්බිය ගත් මාරියෝ යුරෝ සීයේ කොළ දහයක් ගැන මා අත තැබුවේ ය. ඒ කියන්නේ යුරෝ දහසකි. ලංකා රුපියල් වලින් නම් එක්ලක්ෂ පණස් දහයක් ඉක්ම වූ මුදලකි. මා මේ සිතුවම් තුනට ඔහුගෙන් ඒ තරම් මුදලක් ගන්නේ කෙසේ ද...? මා වෘත්තිය චිත්‍ර ශිල්පිනියක ද නොවේ. චිත්‍ර කලාව ගැන ඒ තරම් දෙයක් මා දන්නේ ද නැත. මාරියෝ ධනවතෙකු ලෙස පාපන්දු ක්‍රීඩකයා මට කියා තිබුණත් - ඔහු කලාවට ලැදි කෙනෙක් නිසා මෙහෙම මුදලක් මා අත තැබුවත්, වංචනික ලෙස මා ඒවා ගන්නේ කෙසේ ද...? මුදල් නෝට්ටු අතින් අල්ලන්නේවත් නැතිව මම මාරියෝගේ මූණ දෙස බැලුවෙමි.

The Reader's Piece Yoyo

'මේ තරං ලොකු ගාණක් එපා. මට ඔය මුදලින් ටිකක් විතරක් දෙන්න.'

මගේ කතාවට මාරියෝ උස් හඬින් නිහැනිණ. ඒ සිතාගව පරිසරය දෙදරවමින් පැතිරිණ.

''මට මේ චිත්‍ර මීටත් වඩා වටිනව අංශු. නිකං නෙවෙයි... ඔයාගෙ දක්ෂතාවයටයි මේ ගෙවන්නෙ.'

'ගන්න අංශු. ඔයාට නවතින්න තැනක්වත් නැතුව ඉන්න ඒකේ... ඔය සල්ලිවලිං පුළුවං වෙයිනෙ නවතින්න කාමරයක්හරි අරගන්න.'

පාපන්දු ක්‍රීඩකයා මට අනුබල දුන්නේ ය.

'ඔයාට ඉන්න තැනක් නෑ...? ඇයි මෙතන...?'

මාරියෝ පුදුමයෙන් වගේ මගේ නවාතැන දෙස බැලුවේ ය.

'මේක මාව ගෙන්නගත්ත කෙනාගෙ තමා. ඊයෙ ඌ වෙනකල් විතරයි මට මෙතන ඉන්න පුළුවං. අද මං මෙහෙං පිටවෙන්න ඕනෙ.'

මම මගේ ඇඳුම් බෑග් දෙක දෙස බැලුවෙමි. ඒවා තිබුණේ කාමරයෙන් පිටත නිසාත්, මගේ මූණේ වූ අසරණකම නිසාත් මාරියෝ යමක් වටහාගන්නට ඇත.

'මං ඔයාට ඉන්න තැනක් දෙන්නං. එතන ඉඳල අංශුට ඔයාගෙ වැඩ ටික නිදහසේ කරගන්න පුළුවං.'

ඒ ක්ෂණික පිළිතුරෙන් මම තුෂ්නිම්භූත වූයෙමි. මා වත් නොදන්නා විදේශිකයෙකුට එක්වරම එවන් උපකාරයක් කරන්නට ඔහු වන් පුද්ගලයෙක් ඉදිරිපත් වූයේ ඇයි...? මා ඔහු විශ්වාස කළ යුතු ද...? නොකළ යුතු ද...? නමුත් ඉතාලියේ මිනිසුන් ගැන මේ වන විට මා ඉගෙන ඇති පාඩම නම් ඔවුන් බොරුකාරයන් නොවන බවයි. සිත්හි වංචනික අදහස් ඇතිව වෙනකක් පෙන්වීම ඔවුන්ගේ ස්වභාවය නොවේ.

'සර්... මට... ගෙවන්න පුළුවං තැනක් ද ඒ...?'

'අංශු... එතනට ඔයා සතයක්වත් ගෙවන්න ඕන නෑ. ඒක මගේ ගේ.'

'ස්... සර්...?'

'එතන දැං ඉන්නෙ මගෙ අම්මා විතරයි. අම්මා ටිකක් වයසයි. ෆ්ලැට් එක අතඇරලා මගෙ විල්ලා එකට එන්න අම්මා කැමති නෑ. ඔයාට එතන කිසි කරදරයක් නෑ.'

මෙය කෙසේ විශ්වාස කරන්න ද...? නමුත් අදහාගත නොහැකි දේවල් ඇතැම් අවස්ථාවල ජීවිතවලට උදාවන්නේ ය. මා දැන් සිටින්නේ ඇඳුම් බෑග් ටිකත් අතින් ගෙන කොහේ හෝ යන්නට බලාගෙන ය. එහෙම එකේ ඔහු මුදල් නොගෙනම නවාතැනක් සපයත් දී ආඩම්බර පාන්නේ කුමට ද...?

'මේක ලොකු උදව්වක් සර්...'

මාරියෝ මගේ අතගෙන මුදල් නෝට්ටු ටික එහි තැබුවේ ය. ඔහුට කොහොම කෘතඥ වන්න ද...? සැබවින්ම ඔහු මගේ ජීවිතය වෙත පහළ වූ ගැලවුම්කරුවෙක් නොවන්නේ ද...?

The Reader's Place Novel

06

ඉතාලි ජාතික ධනවතෙකු වන මාරියෝ, ශ්‍රී ලංකාවෙන් පැමිණි අංශු මාත්‍රික ප්‍රාණියෙකු වූ අංශු මන්තිකා පතිරණව සිය මෝටර් රථයෙහිම නංවාගෙන ඔහුගේ මව්ගේ නිවෙස වෙත කැටුව යමින් සිටියේ ය. මා නම් සිටියේ සිහියත් අසිහියත් අතර විය යුතු ය. සැබෑවත් මායාවත් අතර විය යුතු ය. සිහින ලෝකයත් පියවි ලෝකයත් අතර විය යුතු ය.

අතිවිශාල වූ චිත්ත රූප ප්‍රමාණයක් මගේ මනස අභියස මැවෙමින් - බිඳෙමින් තිබිණ. නමුත් මා කිසිම කිසිවක් නොසිතුවා කියා මම සිතමි. ඒ නිසා එය අර්ධ වූ නිද්‍රාවකි. අවදි වූ විට වෙනත් ලෝකයක් වන බව අවිඥානකව වුව මට දැනෙමින් තිබිණ. ඒ හින්දාම මම තව ස්වල්ප මොහොතක් හෝ එම නිද්‍රාවෙහි නිද්‍රෝපගත වෙන උමතු ආශාවක සිටියෙමි.

'අංශු එදා මෙට්‍රෝ එකේ හැප්පෙන්න ගියේ දන්නැතුව නෙවෙයි උවමනාවෙන්මයි කියල මටනං හොඳට තේරුණා.'

මගේ සිහිනය දෙබෑ කරමින් මාරියෝගේ ගැඹුරු පිරිමිකාර හඬ මතුව ආවේ ය. මම වසාදන් නෙතුපිය හැර - තිගැස්සීගෙන වගේ ඔහු දෙස බැලුවෙමි. මැදිවිය ගෙවමින් හිඳින දේහධාරී පිරිමියාගේ මුහුණේ කිරිදරුවෙකුගේ වන් මඳහසක් විය. සැබවින්ම ඊළඟ මොහොතේ මා කල්පනා කළේ මාරියෝ ඇසූ ප්‍රශ්නය හෝ ඊට සැපයිය යුතු පිළිතුර පිළිබඳව නොව ඔහුගේ ඒ නොදරු සිතහව පිළිබඳව ය.

'ප්‍රශ්නවලට උත්තරේ තියෙන්නෙ මරණ ඇතුළෙ තෙවෙයි ළමයෝ. ජීවිතේ ඇතුළෙ.' හෙතෙම ඒ ප්‍රකාශය නිකුත් කළේ කොහෙත්ම අර නොදරු සිතහ පෑ මුවින් නම් නොවේය කියා මට සිතිණ. එසේ කියන වේලේ ඔහුගෙත් විද්‍යමාන වූයේ පනස් වියක් ජවත් වූවාට අසූ - අනූ වියක ජීවිත අත්දැකීම්වලින් ලද පරිවයකි. ඒ පරිනත මිනිසාගේ අත්දැකීම් බහුල වූ මුහුණ දෙස මා බලා සිටියේ ගෞරවපූර්වක වශීයකින් වගේ ය. එය හරියට පාසල් සිසුවියක සිය හදෙහි මහත් ගෞරවයක් ජනිත කළ විදුහල්පතිවරයෙකු ගැන සිතනාකාරයේ හැඟීමකි. වරදක් කර අතට හසු වූ වේලාවක ඒ විදුහල්පතිවරයාගේ අවවාදයකට සවන් දෙන සිසුවිය තුළ ඇතිවෙනාකාරයේ හැඟීමකි.

'මං... ජීවිතේට මූණ දෙන්න බැරිතරමෙ ප්‍රශ්න ගොඩකට මූණ දීපු කෙල්ලෙක් සර්.'

අන්තිමට මම අමාරුවෙන් - උගුරයටින් පවසා ගතිමි. එය තනිකරම නිදහසට කාරණා කීමකි.

'ප්‍රශ්න කියන්නෙ ජීවිතේ ශක්තිමත් කරන පෝරනෙ.'

ඔහුගේ දෙතොල්, ඉතාමත් සැහැල්ලු ලෙස සිතහවකට විවර විය. නමුත් ඒ නිමේෂයේ ඔහුගේ හදවත මත උනුලාගන්නට අමාරු තරම් බරක් පැටවී තිබුණා සේ මට දැනිණ.

'මමනං හැමවෙලේම උත්සාහ කළේ ඒ පොහොරෙත් මගෙ ජීවිතේ සරු කරගන්න.' ඔහු කී දේවලින් මා වටහාගත් සාරය ඒ ය.

අප සාමාන්‍යයෙන් හිතන්නේ ධනවතුන්ගේ හිස්ගෙඩි හිස් බව ය. නිසරු බව ය. නමුත් ඒ පොදු අදහස කෙතරම් සාවද්‍ය ද කියා මොහොතක දී මාරියෝ මට ප්‍රත්‍යක්ෂ කර දුන්නේ ය. ඔහු සමග කතා කරනවාට වඩා කට පරිස්සම් කරගන්නා එක හොඳය කියා ද ඒ මොහොතේම මට කල්පනා විය. මන්දයත් මගේ මුව විවර කළ විට ඔහු ඉදිරියේ මා කෙතරම් නොදරු දැයි හෙළිදරව් වීම සහතික බැවිනි. මාරියෝ මගේ ප්‍රශ්න ගැන හාරා ප්‍රශ්න කළේ

The Reader's Place Novel

ද නැත. ඔහුට ඒ ගැන දැනගන්න කුකුසක් නොමැතිදැයි අතුමාත කරගනුවස් මම ඒ මූණ හොඳින් බැලුවෙමි. ජීවිතයේ කිසිම සිදුවීමක් අරබයා නොසැලෙන - නොතැවෙන උපේක්ෂාසහගත ස්වභාවයක් ඔහු වෙතින් පිළිබිඹු විය. මටත් නොදැනී මගෙන් දිගු සුසුමක් බැහැර විය. ඒ සුසුමෙහි හඬින්වත් මාරියෝ මදෙස බැලුවේ නැත. මමත් වේගයෙන් අප පසු කර යන ගොඩනැගිලි පෙළ දෙස දෙනෙත් යොමාගතිමි. එකම බාහිර පෙනුමකින් යුත්, රතු ගඩොලින් බිත්ති බැඳ සුදු තීන්ත ගෑ ජනේල දොරවල් දැමූ, තද දුඹුරු පැහැති වහළින් යුත් මහල් නිවාස පෙළක් ඉදිරිපිට මාරියෝ සිය රථය නවතන තෙක් යලි අප අතර කතාබහක් සිදු නොවී ය.

'එන්න' කියා මාරියෝ මට කතා කළේ හිසිනි. මහත් පොරුෂයකින් අනූන මේ සද්දන්ත සුදු පිරිමියා පසුපස මා ඇවිද ගියේ සිහිනයකින් සේ ය. මගේ ගමන් මළු දෙකෙහි රෝද කැරකෙන කිරි කිරි හඬ මට ඇසුණේ මහ විශාල ඝෝෂාකාරී ශබ්දයක් ලෙසට ය. අප පසුපසින් ගොන් කරත්තයක් පැමිණෙනවා ද කියාත් වරක් මම හැරී බැලුවෙමි.

ඒ ඇවිද ගිය කෙටි කාලය තුළ දී මට නොසිතූත දෙයක් නැත. මා මේ යන්නේ කොයිබට ද...? මා කොහේ නවතිනු ඇත්ද...? මට මොනවා වනු ඇත් ද...? අඩු තරමින් යළි මගේ මාතෘ භූමියෙහි පය තබන්නටවත් මට වාසනාව තිබෙනු ඇත් ද...?

කෙසේ වෙතත් ඒ සිතුනු හැමදේම නිමේෂයක දී මම සිත් පත්ලටම තල්ලු කොට දැමුවෙමි. බැගේජ් වල රෝද කැරකෙන කිරි කිරි හඬ මැදින්, මගේම හදවත මතින් ඇවිද යනවා වැනිව තට්ටු නිවාසයේ පියගැට පෙළ නැංගෙමි. මාරියෝ එක් නිවසක දොර අභියස නතර වී සීනුව හැඬවී ය. තත්පර කිහිපයකට හෝ විනාඩි කිහිපයකට පසුව දොර විවර විය. විවර දොර අල්වාගෙන එහි සිටගෙන සිටියේ කහ පැහැති සමින් හා සුදුම සුදු කෙටිව කැපූ හිසකෙසින් යුත් වයස්ගත ගැහැනියකි. මට ඇසිල්ලකින් අපේ ආච්චි අම්මා සිහි විය. ඒ වෙනකක් නිසා නොව ඒ සුදෝ සුදු පුළුන් කැටියක් වන් හිසකේ නිසා ය. ආච්චි අම්මාගේ වගේ කොණ්ඩය සුදු වුණාට ඇය නම් ආච්චි කෙනෙක් වගේ පෙනුනේ

නැත. කෙටිව කැපූ කොණ්ඩය මාරියෝගේ මවගේ තරුණ බවට දෙස් දෙන ප්‍රධානම සාධකය වන්නට ඇත. මුතු වගේ දිළිසෙන දත් පෙළ විදහා ඇය සිනාසුණා ය. මහිතේ වූ දෙගිඩියාව, ඒ සිනාව ළඟ දී හිරු දුටු පිනි සේ වියැකී යන්නට ඇත.

'දිස් ඉස් මයි මදර්... සිල්වියා.'

ඉතාලිවලට වඩා මට ඉංග්‍රීසි තේරෙන බව පසක් කරගෙන සිටි නිසාදෝ මාරියෝ සිය මැණියන්ව මට හඳුන්වා දුන්නේ ඉංග්‍රීසියෙනි. නමුත් ඇයට නම් ඔහු කී දෙයකින් අංශුවක්වත් වැටහුණ බව පෙනුනේ නැත.

'මම්මා මේ අංශු. ශ්‍රී ලංකාවෙන් ඉතාලියට ආපු ගෑනු ළමයෙක්.'

ඊළඟට මාරියෝ ඉතාලි භාෂාවෙන් මාව සිය මැණියන්ට හඳුන්වා දුන්නේ ය.

'අංශු මෙහෙ ඇවිත් තියෙන්නෙ රස්සාවක් හොයාගෙන. එයා දක්ෂ චිත්‍ර ශිල්පිනියක්. නවතින්න තැනක් හොය හොය හිටපු නිසා මං මෙහෙ එක්කගෙන ආව.'

'ඒක හොඳයි.'

ඇය අර පුළුල් සිනහව යළිත් පාන ගමන්ම ඉදිරියට නැඹුරු වී මාව වැළඳගත්තා ය.

'මාත් මෙහෙ තනියමනෙ ඉන්න. දැං මට කතා කර කර ඉන්න කෙනෙක් ඉන්නව.'

මාරියෝ සේම ඇගේ මව් වන සිල්වියා ද ආගන්තුකයන්ට උදව් කරන්නට කැමති බව ඒ විනාඩි කිහිපය තුළ දී මට පසක් කරගත හැකි විය.

'හරි ලස්සන කෙලි පොඩිත්තියක්නෙ.'

සිල්වියා මගේ අත්ගොබයක් පිරිමදිමින් කීවේ, මගේ කේෂාන්තයේ සිට පාදාන්තය දක්වාම දැසින් ගවේෂණය කරමිනි. ඒ කතාවට මාරියෝ හඬනගා හිනැහෙන්නට ගත්තේ ය.

The Readers Place Novel

'මම්මා... ඔය ගෑනු ළමයෙක්ට ලස්සනයි කියල කිව්වම ද කොහෙද...?'

'ඇත්තටම ලස්සනයිනං ලස්සනයි කියනව තමයි.'

සිල්වියා බොරු නෝක්කාඩුවක් පෙන්වමින් ඉවත බැලුවා ය. ඊළඟ තත්පරයේ යළිත් අර පෙර සිනහව මූණට ගෙන මගේ අතින් අල්වා ගත්තා ය.

'විස්තර කතා කරන්න බැරියැ. මුලිංම ඉඳගෙන කැෆේ එකක් බොමුකෝ.'

මාව අසුන්ගත කරවූ ඕතොමෝ ආලින්දය කොනකම වත කුඩා පැන්ට්‍රිය වෙත ගියා ය. කැෆේ කියන්නේ ඉතාලියානු කෝපිවලට ය. ලංකාවේ කෝපිවලට වඩා තද කහට තිත්තකින් යුතු ඒ කෝපි බීමට මෙහි පැමිණි මුල් දිනවල නම් මා කැමති වූයේම නැත. නමුත් ලංකාවෙන් ගෙනා තේ හා කෝපි තිම වූ පසු, දැඩි ශීතල සමනය කරගැනීම සඳහා මම අකමැත්තෙන් වුව කැෆේ බීවෙමි. රෝමයට එනවා නම් රෝමන්කාරයෙකු ලෙස ජීවත් විය යුතු යැයි මම ලංකාවේදීත් අසා ඇත්තෙමි. ඉදිරියට තව වසර කීයක් ඉතාලියෙහි සරන්නට වෙත්දැයි මම නොදනිමි. එක අතකට දන්නා කියන මිනිසුන් අතර ලංකාවේ අසරණ වෙනවාට වඩා මෙසේ නොදන්නා රටක නොදන්නා මිනිසුන් අතර මොනවා වුණත් කම් නැත. කොතැනක හෝ එල්ලීගෙන මා මගේ ජීවිතය සොයාගත යුතු ය.

'අංශුට අපේ මම්මා එක්ක කතා කරන ගමන් ඉතාලි භාෂාව ඉගෙනගන්න පුළුවං. මං හිතන්නෙ... ඔයා ඉතාලියට ඇවිත් වැඩි කාලයක් නෑ...?'

'නෑ. මාස හතරක් - පහක් විතර ඇති.'

'ඔයා හොඳට භාෂාව ඉගෙන ගත්තහම අපිට හොඳට කතා කරන්න පුළුවන්නෙ.'

මාරියෝ සිය කුඩා - දීප්තිමත් දෑසින් කෙලින්ම මදෙස බැලුවේ ය. ඔහුගේ මුවඟ යළිත් අර කිරිදරු සිනහවම නැඟිණි.

සිතෙහි ගැස්මක් ඇති වුණත් මමත් සිනහවක් නගා ගතිමි. මාරියෝගේ උවමනාව වන්නට ඇත්තේ මගේ පොද්ගලිකත්වයට එබිකම් කිරීම නොවේ. මට සුහද වීම විය යුතු ය. නමුත් කළලයක් කුස දරාගෙන මෙට්‍රෝවට පනින්නට ගිය සිද්ධිය නිසා ඔහුට මූණ දීමේ දී මසින්හි ලැජ්ජාව මුසු තැතිගැන්මක් ඇති වේ.

අප කැෆේ බීවේ කතා කරමින් සිහ වෙමිනි. කතා කළාය කීවාට මා නම් කළේ කතා කරන උත්සාහයක් ගැනීම පමණි. මාරියෝත් සිල්වියාත් මගේ අදහස් ප්‍රකාශ කරන්නට නැකිතරම් උදව් කළහ. මා වරද්දත් දී ඔවුන් සිනහ වුණේ සරදමට නොවේ. ඇත්තටම ඔවුන්ට මා ප්‍රීතිමත් අමුත්තියක වී සිටි නිසා ය.

'මාරියෝ අද මාත් එක්ක කැෆේ එකක්වත් බිව්වෙ මේ කාලෙකට පස්සෙ. ඒ තරමටම එයාට වැඩතෙ. අංශු නිසා තමයි මට ඒ අවස්ථාව ලැබුණෙ.'

මාරියෝ යා යුතු බව පවසමින් නැගී සිටින කල සිල්වියා මහත් ස්නේහයකින් අප දෙදෙනම දෙස බලමින් මාරියොගේ අතගොබයක් පිරිමැද්දා ය. මහත් වූ මාතෘ ස්නේහයක් ඇය වසින සිර කරාන සිටින ලද බව ඒ නිමේෂයේ දී මට දැනිණ. මට සිහිවූයේ මගේ අම්මා ය. අපට සැපත සදන්නට විදේශගත වූ ඇයට අපේ සතුට ගැන නිනව් නැතිවම ගියේ ය. දරුවන්ට අම්මලාත්, අම්මලාට දරුවනුත් නිතරම උවමනා වේ. එය හදවතට දැනෙන අවශ්‍යතාවයකි. බටහිර ගැහැනියක වුණත් මේ මොහොතේ මා සිල්වියා වෙතින් දකින්නේ ද ඒ මාතෘ ලක්ෂණ ය. මගේ අම්මාට එහෙම උවමනාවක් දැනෙන්නට නැත් ද...? නැත්නම් ඇය අපට සැපත සලසාදීම වෙනුවෙන් හදවතට දොරගුළු ලාගෙන ඉන්නට ඇත් ද...?

නමුත් දැන් අපට දෙයියනේ කියා ජීවත් වන්නට පුළුවන්කමක් තිබේ. නමුත් අම්මාව ලංකාවෙහි නතර කරගත නොහැකි ය.

'ඔය රටරටවල්වල ගියහම හුඟක් ගෑනු මිනිස්සුන්ට වෙන වෙන පවුල් ඇති වෙනවා. ඒකනෙ ඌව අම්මේ මුත්තේ කිව්වත් ආයෙ ලංකාවෙ නතර කරගන්න බැරි.'

The Reader's Place Novels

දවසක් අපේ මාමාගේ බිරිඳ මට ඇහෙන්නට එහෙම කීවා ය.

'නෑ මං මේ අංශුලගෙ අම්මා ගැන හිතල කිව්ව හෙම නෙවෙයි.'

මා වහා ඈ දෙස බලත්දී නැන්දා ඉක්මනට එසේ කීවා ය. ඒ වෙලාවේ හදෙහි සියුම් රිදුමක් ඇති වුණත්, අම්මාට අප ගැන කිසිම හැඟීමක් නැතැයි දැනෙන අවස්ථාවල දී මටත් එසේ සිතී තිබේ. දුවෙක්ට අම්මා පිළිබඳව එවන් සිතිවිල්ලක් පහළ වීම සැබවින්ම වේදනාවකි. නමුත් අප ඇත්ත ඇති සැටියෙන් පිළිගත යුතුව තිබේ.

'අංශු තත්පරෙං කල්පනා ලෝකෙට ගියා.'

මාරියෝ මහත් දයාවකින් මදෙස බලා සිටියේ ය.

'නෑ. මාරියෝ සර්ගෙ මම්මා එහෙම කියනකොට මට මගෙ අම්මව මතක් වුණා.'

එය ඉතා හැඟීම්බර මොහොතකි. ඒ හැඟීම්බර බව මගේ දෑස්වලට කඳුළු ගෙඩි දෙකක්ම පුරවා දැමී ය. ඒ කඳුළු ඔවුන් දකිවි යැයි බියෙන් මම බිම බලාගතිමි. නමුත් එවන් සංවේදී මොහොතක ළඟ සිටින්නන්ගෙන් සඟවා ගැනීම පහසු නැත. සිල්වියා සිය වමත මගේ හිස පිටුපස තබා කතා කළා ය.

'ඉතිං ළමයො... මං ඔයාගෙ මම්මා කියල හිතාගන්න. මං කියන්නෙ මෙහෙ ඉද්දි.'

මගේ දුක පළවාහරිනුවස් ඇය ව්‍යාජ සිනහවක් නැගුවත්, ඒ ප්‍රකාශය මගේ දැවුණු - පිළිස්සුණු හදවත මත ගල්වන ලද දිව්‍ය ඖෂධයක්ම විය.

තවත් එක බැල්මක් මවෙත හෙලූ මාරියෝ පියගැට පෙළ බැස යන්නට ගියේ ය. නමුත් මට දැනුණේ ඔහුගේ බැල්ම මගේ හදවත මත නතර වී ඇති සෙයකි.

'යමුකො එහෙනං අපි ඇතුළට. අද ඉඳලා අංශු මේ ගෙදර කෙනෙක් නිසා ගේ ඇතුළෙ ටිකක් ඇවිදල බලන්න එපැයි.'

ඇවිද බලන්නට එය මහා විශාල ගෙයක් නම් නොවේ. ගෙට තිබුණේ කාමර දෙකකි. ඒවා ද ඉතා කුඩා කාමර ය. මුළුතැන්ගෙය සාලයේම කොටසකි. ගෙදර ඒ තරම් ගෘහ භාණ්ඩ පිරී තිබුණේත් නැත. කාමර දෙකේ බිත්තිවලට අල්ලා තිබූ බිත්ති අල්මාරිපේළි දෙකක් විය. සිල්වියාගේ කාමරයෙහි තට්ටු දෙකේ ඇඳක් වූයේ ය. අනෙක් කාමරයෙහි වූයේ කුඩා මේසයක් හා පුටුවක් ද වෙනත් අත්‍යවශ්‍ය නොවන අඩුම කුඩුම වගයක් ද පමණි.

'මේක මාරියෝ මෙහෙ හිටපු කාලෙ පාවිච්චි කරපු කාමරේ. එහා ගෙදර කට්ටියට ඇඳක් ඕන වෙලා මං මේ කාමරේ තිබුණ ඇඳ දීලා දැම්ම. ඇයි ඉතිං කවුරුත් නැනෙ. අංශුට මේ කාමරේ ඉන්න ඇඳක්නං නෑ.'

සිල්වියා සිය රැළි වැටුණ බොර පැහැති දෙනෙතින් මදෙස බැලුවේ ඒ ගැන සිය කණගාටුව ප්‍රකාශ කරන්නට මෙනි. ඇගේ ඒ කණගාටුව මගේ හිතට මහත් බරක් විය.

'අනේ... ඒකට කමක් නෑ. මට බිම නිදියන්න පුළුවං.'

මා අදහස් කළ දේ ඇය තේරුම් ගන්නට ඇත්තේ වචනවල තිබූ නිරවද්‍යතාවය නිසාම නොව අංග චලනයෙන් මා ඉදිරිපත් කළ රංගනය නිසා ය.

'අනේ... මේ සීතලේ බිම නිදියන්නෙ කොහොම ද...? දැනට අංශු මගෙ කාමරේ තියෙන ඇඳේ උඩ තට්ටුවෙ නිදියමු. ඉඳහිට දවසක මාරියෝ මෙහෙ නැවතුණොත් දැන් නිදියන්නෙ ඒ ඇඳේ තමයි.'

'ග්‍රාසියෙ, ග්‍රාසියෙ මම්මා.'

මා ඒ ස්තුතිය පුද කළේ එපුවට අතක් තබා ඉදිරියට මඳක් නැවී හදවතින්ම ය. ඔවුන්ට කොහොම ස්තුති කළත් මගේ හිතට මදි ය. මේ හදිසියේ මාරියෝ මුණ නොගැසිනි නම් ගමන් මලු දෙකත් ගෙන මා කොහේ කියා යන්න ද...? පිරිමියෙකු වී නම් කඩපිලක හෝ නිදන්නට පුළුවන. සීතල කොහොම විඳදරා ගත්තත් ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ හැදී වැඩුන ගැහැනියකට එහෙම

The Reader's Place Novel

කරන්නට හිතීමත් හීනියකි. සුරක්ෂිත ගෙවල් දොරවල් ඇතුළේදීම අහස පොළොව නුහුලන අපරාධ සිදුවන බව ඇත්තකි. නමුත් අපේ සංස්කෘතිය විසින් අපේ මනස මෙහෙයවා ඇත්තේ අර විදිහට සිතන්නට ය.

'මේ වගේ ලස්සන කෙලි පොඩිත්තියක් මගෙ තනියට ගෙනත් දුන්නට මමයි දෙවියන්ට ස්තුති කරන්න ඕනෙ.'

මට කුසගින්නක් දැනෙමින් තිබිණ. උදේටවත් දවල්ටවත් මා කිසිත් ආහාරයට ගෙන තිබුණේ නැත. නමුත් මේ පිට තැනකට ආ මුල්ම දිනයේ බඩගිනියි කියා ඉල්ලාගෙන කෑ නොහැක. ඒ නිසා හන්දියට ගොස් එන්නෙමියි මම සිල්වියාට කීවෙමි.

'මාත් කම්මැලිකමේ හිටියෙය. එහෙනං දෙන්නම යමු.'

හිතට පහසුවක් දැනිණ. රෝමයත් මාත් අතරේ මාස පහක පමණ ඇසුරක් තිබුණත් තනිව කඩයකට ගොඩවීමේ දී තවමත් මට හුහුරු හිඟැස්මක් දැනේ. ඊට මූලිකම හේතුව මේ භාෂා ප්‍රශ්නයයි. නමුත් තව කවුරුන් හෝ මා අසලින් සිටිය දී මට ඒ බය දැනෙන්නේ නැත.

අද ඔයේ අතේ යහමින් මුදල් තිබේ. ඒ නිසා සිල්වියා සමඟ පාප්පු සවාරියේ යාම සිසිදු ප්‍රශ්නයක් වන්නේ නැත. ඔවුන් මට මේ විදිහට නොමිලයේම නවාතැන් සලසා දීම වෙනුවෙන් ඇයට කොඳු පංක්තියක් කළ යුතුයැයි හදිසියේම මට සිතිණ.

'ඌඹු ඛඩයින්නෙ ද හිටියෙ...? මට ඒ ගැන ඔයාගෙං අහන්න පොඩ්ඩක්වත් මතක් වුණේ නැනෙ.'

අවන්කලේ දී මා පිට්සා කාගෙන කාගෙන යන්දී මදෙස බලා සිටි සිල්වියා පසුතැවීමෙන් වගේ කීවා ය.

'නෑ. නෑ. මං කෑවෙ නැනෙ කියල මට මතක් වුණෙත් මේ රෙස්ටොරන්ට් එක දැක්කාමයි.'

මම ඇගේ හිතසුව පිණිස පුංචි බොරුවක් කීවෙමි. සිල්වියා ඔතවටත් වඩා හඬනගා සිනාසුණා ය. හේතුවක් ඇතුව හෝ නැතිව මමත් ඒ සිනහවට හවුල් වුණෙමි. හිතට දැනුණේ මහත්

සැනසිලිදායක සැහැල්ලුවකි. සිනහව නතර වීමෙත් පසුවත් මගේ සිනා හඬ රෝම අහස පුරා දෝංකාර දෙනවා සේ මට දැනිණ.

අපි 'අවුවාත්' නමැති සුපිරි වෙළෙඳ සංකීර්ණයට අවතීර්ණ වුණෙමු. ඒ මැදින් ඇවිද යන්දී මට දැනුණ හැඟීම කියන්නට නොතේරෙන එකකි. ඉතාලි ජාතික ගැහැනියකගේ සම්පතම හිතවතියක සේ වරද්දමින් වුව ඉතාලි කතා කරමින් මේ ඇවිද යන්නේ අංශු මත්තිකා පතිරණම ද කියන ප්‍රශ්නය ඕය දහස් වතාවකට මසිත්හි නැගිණ. මේ වෙලාවේ කල්ප ලොකුගේ කොහි සිටිනවා ඇත්ද...? ශ්‍රී ලංකාවේ ඇත ගමක, දරු බර උකුලා ගත්නට බැරිව - රැකියාවක් ද නොමැතිව නොවිඳිනා දුක් විඳිනවා ඇත. තමන් පුංචි කෙල්ලක රවටා ඇගේ ජීවිතයම අඳුරු කළ වග ඔනුට මතක් වෙනවා ඇත් ද...? සමහර විට ඉඳහිට එය සිහි වී මන වීරකමක් කළ සෙයින් ඔනු තනිව හිනැහෙනවා වත්නට පුළුවන. නමුත් ඒ පාපයෙහි විපාකය කවදා හෝ දවසක තමන් පසුපස එන වග සමහර විට ඔනු නොදන්නවා ඇත.

'අංශුට මොනවත් ගන්න තියෙනව ද...?'

මගේ කල්පනා දැනැන බිඳිමින් සිල්වියා ප්‍රශ්න කළා ය.

'ආ... ඔව්. මට ඇඳුම් ටිකකුයි තැගි වගේකුයි ගන්න තියෙනව.'

'අන්න අර ෂොප් එකේ ලේඩිස් ඇඳුං කොලිටි. ඔයා බලන්නකො.'

ඇය මට එක් සාප්පුවක් පෙන්වූවා ය. තරමක් මිලාධික වුණත් ඇත්තටම එහි වූ ඇඳුම්වල මනා නිමාවක් විය. මම ඩෙනිම් කලිසම් දෙකකුත්, ලෙගින් කිහිපයකුත්, අත්දිග ටී ෂර්ට් කිපයකුත් මිල දී ගතිමි. ඊළඟට මා ගියේ ඊට යාබදව තිබුණ අත්බෑග් සාප්පුව වෙත ය. 'මම්මා කැමති විදිහෙ එකක් මට තෝරලා දෙන්න.'

මම ඇරයුමක් කළෙමි. ඇගේ වියපත් මුව සිනහකින් විකසිත විය.

'මං තෝරන ඒවට මේ ළමය කැමති වෙයි ද...? මං ඉතිං දැං වයසක...'

The Reader's Place Novel

'අනිවාර්යෙංම මං කැමති වෙයි.'

ඇයත් මමත් දෙදෙනාම අත් බෑග් දෙකක් තේරුවෙමු. මම ඒ දෙකම මිල දී ගතිමි.

'අංශු සල්ලි වියදං කරනවනං වැඩියි වගේ.'

'හැමදාම නෙවෙයි. අද මගෙ පේන්ටිංස් වගේකට මිස්ට මාරියෝ ලොකු ගාණක් ගෙව්වා. ඒකයි.'

සිල්වියා එළවළු මස් ආදිය තෝරා ගත්තා ය. ඒවාට මුදල් ගෙවන්නට මා කොතෙක් උත්සාහ කළ ද ඇය ඉඩ දුන්නේ නැත.

'ඔයා අපේ ගෙදර අමුත්තා. කෑම බීමවලට අංශු සල්ලි ගෙව්වා කියලා දැනගත්තොත් මාරියෝගෙං මට විසුමක් වෙන එකක් නෑ.'

ඒ පැත්ත ගැන මට සිහි වූයේ එවිට ය. මාරියෝ ලොකු ධනවතෙකු බව පාපන්දු ක්‍රීඩක මගේ හිතවතා පැවසී ය. ඉතින් මා කෑම වලට මුදල් ගෙවීම ඔහුට මදිපුංචිකමක් සේ දැනෙන්නට පුළුවන. එහෙයින් ඔවුන්ට ද බරක් නොවී ඔවුන්ට නොදැනෙන සේ මගේ කෑම බීම වියදම් පියවාගත යුතු යැයි මම කල්පනාකාව තීරණය කළෙමි. නොමිලයේම නිවසේ නවාතැන් දුන්නා මදිවාට මා සිල්වියාට හෝ මාරියෝට අනවශ්‍ය බරක් විය යුතු නැත.

'මම්මා කැමති නැද්ද ලංකාවෙ විදිහට කෑම වේලක් කන්න...?'

මා එවැනි ප්‍රශ්නයක් ඇසුවේ ඒ තරම් දුරට දිගට සිතීමෙන් කියා සිල්වියා කොහෙත්ම නොසිතන්නට ඇත.

'ඇයි නැත්තෙ...? මං කාලම නෑ. හැබැයි මං අහල තියෙනව ආසියාවෙ අය කෑම හදන්නෙ කුළුබඩු ගොඩක් දාලා හරිම සැරට කියල.'

එහෙම කියනකොටත් ඇය ලොකු දැවිල්ලක් දැනුණ සෙයින් තොල් උල් කළා ය. මට සිනහ නැගිණ.

'නෑ නෑ. මං එච්චර දැවිල්ල කරන්නෙ නැතුව උයලා දෙන්තංකො.'

'අර මාරියෝ කිව්වා වගේ අංශු මාත් එක්ක ඉන්න අතරෙ අපේ භාෂාව ටිකක් ඉගෙන ගත්තොත් හොඳයි.'

මා කියන දේ ඇයට තේරුම් කරවීමට අතින් පයින් රඟදැක්වමින් මා ලොකු උත්සාහයක් දරන නිසදෝ සිල්වියා නදිසියේම කීවා ය. අයිස්ක්‍රීම් කන්නට ඇයට උවමනා විය.

'මට තව එක තැග්ගක් ගන්න ඕනෙ. ඇත්තටම... ඒකනං මිස්ට මාරියෝට. එයා මට කරපු උදව් මතක් වෙන්න පුංචි සිහිවටනයක් විදිහට. ඒක ගන්න මම්මා මට උදව් කරන්න. ඊට පස්සෙ අපි අයිස්ක්‍රීම් කමු.''

''පිස්සු කෙල්ල.''

සිනහවෙමින් ඇය මාව පිරිමි ආයිත්තම් සාප්පුවක් වෙත කැටිව ගියා ය. එහි නෙක නෙක දෑ විය. නමුත් කුමක් මිල දී ගන්න ද කියා මට වැටහුණේ නැත. මන්ද යත් ඔහු කුමකට රිසි වේදැයි මම නොදනිමි. අනික් අතට ඔහු ධනවතෙකි. මගේ පුංචි තිළිණයක් ඔහුට දුහුවිල්ලක් තරම් වේවිදැයි සිතිය නොහැක. නමුත් ඔහු එතරම් ආඩම්බරකාරයෙක් නම් නොවන වග හොඳටම පැහැදිලි ය. එක අතකට ඔහු චිත්‍රවලට බෙහෙවින් කැමති වග දන්නා සෙයින් චිත්‍රයක්ම ඇඳ තිළිණ කිරීම වඩා හොඳයැයි අත්තිමට මම සිතුවෙමි. ඒ සමග ඔහුට දෙන්නට හිතා ලොකු සුදු ටෙඩි බෙයාර් කෙනෙක් මිල දී ගතිමි. ඒ දැක සිල්වියා හොඳටම සිනහ වූවා ය. ඒ සිනහව නිසා ඇගේ වයසට නොතරම් වන තරමින් ඇය හතිලන්නට ද වූවා ය.

'අංශු හිතන්නෙ මාරියෝ පොඩි ළමයෙක් කියල ද...? ආ...?'

එසේ අසන අතරේ ද ඈ කළේ සිනාසෙන එක ය. මට මද ලැජ්ජාවක් දැනිණ.

'නෑ. මිස්ට මාරියෝ මේක එයාගෙ බබෙක්ට හරි දෙයිනෙ.'

'බබාල...? එයාට බබලා...?'

නැවත ද සිල්වියා හිනැහෙන්නට පටන් ගත්තා ය.

The Reader's Place Novel

'එයාට කොහෙද ටෙඩී බෙයාලගෙං සෙල්ලං කරන බබාල..? එයාගෙ පුතා දැං මැරි කරලත් ඉවරයි.'

'එහෙ...මද... කමක් නෑ. මං මේක ගත්තෙ මගෙ පේත්ති. එකකුත් එක්ක මිස්ට මාරියෝට ප්‍රසන්ට් කරන්න. එහෙනං මං පේන්ටින් එක විතරක් ප්‍රසන්ට් කරනවා.'

අතින් කටින් බඩු මුට්ටු එල්ලාගෙන අපි සුපිරි වෙලෙඳ සංකීර්ණයෙන් පිටමං වූයේ පොඩි දරුවන් සේ ලොකු අයිස්ක්‍රීම් දෙකක් ද කමිනි. අයිස්ක්‍රීම්වලට මුදල් ගෙවන්නට නම් සිල්වියා මට ඉඩ දුන්නා ය.

'මේක ලොකු දෙයක් නෙවෙයි. ඒත් මේ නන්නාඳුනන මට දක්වපු ආදරෙයි කරුණාවයි නිසා මට මම්මට මෙහෙම දෙයක්වත් නොදී බෑ.'

ගෙදර ආ ගමන් සිල්වියා තේරූ අත්බෑගය මම ඇයට තිලිණ කළෙමි. ඇය දෑස් ලොකු කර මදෙස බැලුවා ය.

'ළ...මයෝ... මං මේ හොඳම එකක් තේරුවෙ ඔයාටයි කියල හිතල.'

'මම්මා මේක ගන්නවනං මං ආසයි.'

'ඔයානං පිස්සු කෙල්ලෙක්ම තමයි.'

ඇය ප්‍රීතියෙන් සිටියා ය. කෙතරම් වයස්ගත වුණත්, කෙතරම් මිල මුදල් තිබුණත්, තෑගි ලැබීම කාටත් සතුටකි. මා සිල්වියා වෙතින් දුටුවේ එම සතුටයි. ඒ සතුටෙන් යුතුවම ඇය රාත්‍රී ආහාරය සඳහා පාස්තා පිළියෙල කරන්නට පටන් ගත්තා ය. මා උදව් කරන්නට හැදුවත් සිල්වියා ඊට ඉඩ දුන්නේ ම නැත.

'අදට අංශු මේ ගෙදරට අමුත්තෙක්. ඉතින් මං කෑම හදලා ඔයාට කන්න දෙන්න ඕනෙ.'

'එහෙනං හෙට දවල්ට මං උයන්නෙ. ශ්‍රී ලාංකික කෑම වේලක්.'

'ඒක හොඳ අදහස.'

සිල්වියා හඬනගා හිනැහුණා ය. ඇය පාස්තා පිළියෙල කරන

ආකාරය මම පුටුවකින් හිඳ බලා සිටියෙමි. ඒ ක්‍රමය සංජුල මට කියාදුන් ක්‍රමයට වඩා ටිකක් වෙනස් විය. ඉතාලි ජාතිකයන්ගෙත්ම ඔවුන්ගේ ආහාරයක් පිළියෙල කරන හැටි දැකගන්නට - ඉගෙනගන්නට ලැබීමේ උනන්දුවෙන් යුතුව මම නෙතුපිය නොසලා බලා සිටියෙමි.

'දැන්නං මටත් පුළුවං වෙයි ඔය විදිහටම පාස්තා හදන්න.'

'නෑ. නෑ. ඔයා මට වඩා රසට හදයි.'

'ඇයි...?'

'ඔයා තරුණ කෙල්ලෙක්නෙ. මේ නාකි මං වගේ ද...? අනිත් එක ආටිස්ට් කෙනෙක්නෙ.'

'අනේ මම්මා. මිස්ට මාරියෝ මං ගැන එහෙම හිතුවට... මං ආටිස්ට් කෙනෙක් නෙවෙයි.'

'අපෝ... අපේ මාරියෝ නිකංමනිකං කෙනෙක්ට එහෙම කියන්නෑ.'

සිල්වියා කතා කළේ සිය පුත්‍රයා පිළිබඳ සම්පූර්ණ විශ්වාසය තබා ය. ඇගේ දෑස්හි දරුවෙකු ගැන ඉතසිතින් ආඩම්බර වන අම්මා කෙනෙකුගේ සතුට විය. මගෙන් ලොකු සුසුමක් ගිළිහිණ.

'මම්මා, අපි හෙට මිස්ට මාරියෝටයි එයාගෙ වයිෆ්ටයි එන්න කියමු ද ලන්ච්වලට. ලංකාවෙ කෑම වේලක් කන එක එයාලටත් අලුත් එක්ස්පීරියන්ස් එකක් වෙයිනෙ.'

'කොහෙද අංශු මාරියෝට වයිෆ් කෙනෙක්.'

සිල්වියා සරල ලෙස කීවා ය. ඇය කී දේ මට වැටහුණේ නැත.

'ඒ කිව්වෙ...?'

'මාරියෝ දික්කසාද වුණ කෙනෙක්. දික්කසාද වෙලත් මං හිතන්නෙ දැං අවුරුදු විස්සක් විතර ඇති. ඇයි... මාරියෝ කියල නැද්ද...?'

'ආ... ආ... නෑ... නෑ... මිස්ට මාරියෝ මාත් එක්ක එච්චර දෙයක් කතා කරලා නෑ.''

The Reader's Place Novel

මසිත්හි මහත් පුදුමයක් ඇති විය. ඔහු වන් ධනවතෙකු. ඊටත් වඩා ඒ වගේ කරුණාබර හිතක් තියෙන මිනිසෙකුගේ විවාහ ජීවිතය අසාර්ථක වූයේ කෙසේ ද...? අනිත් අතට වසර විස්සකට ඉහත සිදු වූ දික්කසාදයකින් පස්සේ අදටත් - තවමත් ඔහු වෙනත් විවාහයකට නොපෙළඹී සිටින්නේ ඇයි...? ඒ ගැන දැනගන්නා කුතුහලය පාලනය කරන්නට මම අපොහොසත් වීමි. තමුත් සිල්වියා සමග රාත්‍රී ආහාරය සඳහා කුඩා මේසය දෙපස අසුන් ගන්නා තෙක් මම ඉවසා සිටියෙමි.

'මං මිස්ට මාරියෝව අඳුරගත්තෙ ෆුට්බෝල් ප්ලේයර් කෙනෙක් නිසා. මගෙ යාළුවා කියපු විදිහට මිස්ට මාරියෝ හුගක් පොහොසත් බිස්නස්මන් කෙනෙක්.'

'අපොයි ඔව්. එයාට ඔය වතුපිටිවලිං හොඳ ආදායමක් එනව. තව තව මොනා ද බිස්නස් ගොඩක් කරනව. ටුවරිස්ට් හොටෙල් එකකුත් ඔය වතිකානුව කිට්ටුව තියෙනව.'

'එච්චර පොහොසත් කෙනෙක්... ඩිවෝස් එකෙන් පස්සෙ තව මැරේජ් එකක් ගැන හිතුවෙ නැත්තෙ ඇයි කියල මට හිතාගන්න බෑ.'

'හාපෝ... කතා කරල වැඩක් නෑ. ඒ කසාදෙ කරගන්න එපා කියල මං කොච්චර කිව්ව ද...? ඇහුණෙ නෑ. මාරියෝ ටිකක් වෙනස් මිනිහා. මං දන්නවනෙ එයාගෙ හැටි. අර මීදෙන ආම්බාං කරන්න මෙයාට පුළුවං වුණෙ නෑ. ළමයටත් අවුරුදු හත අටක් වුණාට පස්සෙ ගෑනි මාරියෝගෙම යාළුවෙක් එක්ක පැටළුණා. ඒක කෙළවර වුණේ දික්කසාදෙං.'

'හරි පුදුමයි.'

'පුදුම වෙන්න දෙයක් නෑ අංශු. මේ වගේ රටක ඉපදුනාට මාරියෝ හරි නිවිච්ච ගතිගුණ තියෙන මිනිහෙක්. පොඩි කාලෙ ඉඳලම එයා ඔය ආසියානු සංස්කෘතියට කැමතියි. ඒ ගැන ලියවෙච්ච පොත් හරියට පොත් හරියට කියෙව්වා. ජපානෙට චීනෙට එහෙමත් ගිහිං ඇවිදලා ආවා. ඉන්දියාවටත් යන්න ඕන කිය කියා ඉන්නෙ. බිස්නස් නිසා තමයි වෙලාව නැත්තෙ.''

එසේ නම් ඔහු මගේ චිත්‍රවලට කැමති වන්නට ඇත්තේත් භික්ෂුවකගේ ඉරියව් නිරූපනය කරන, එහි වූ ආසියාතික ලක්ෂණ නිසා වන්නට ඇත.

බටහිර මිනිසෙක් ආසියාතික සංස්කෘතියට ගෞරව කරන බව දැනගැනීම, ආසියානු පුද්ගලයෙකුට ආඩම්බරයට කරුණකි. ඒ හේතුව නිසා පෙර නොපැවති තරම් ලොකු ගෞරවණීය හැඟීමකින්, මාරියෝ අරබයා හදවත පිරී යන වග මට දැනිණ.

'වයින් කෙනෙක් නැතුවට මොකද... අපි මාරියෝට එන්න කියමුකො අංශුගෙ කෑමවල රස බලල යන්න. එයා ඉතිං කොහොමටත් ආසියාවට කැමති කෙනෙක් නිසා හූස් හූස් ගගා හරි කෑමනං කයි.'

ඒ කෑම වේල හිතා හිටියාටත් වඩා ප්‍රණීත ලෙස සකසන්නට මට සිතුණේ ඇයි කියා මම නොදනිමි. සමහරවිට, මගේ ජීවිතය මරණයෙන් ගලවාගත්, මේ නාඳුනන දේශයේ මා අසරණකමින් මුදවාගත් ගැලවුම්කරුවානන් ආසියාවට ආදරය කරන මිනිසෙකු වීම නිසා ද විය හැක.

'අවුචාන්' ගොස් එන ගමන් මම සංජුල කියාදී තිබුණ සිංහල කඩයක් වෙත ගොඩව අවශ්‍ය කරන බඩු මුට්ටු අරගෙන ආවෙමි. සිල්වියා අවුචාන්හි එළවළු වෙළෙඳ සලෙන් මිලදී ගත් එළවළු ද අවශ්‍ය තරම් තිබිණ. ඒ නිසා කෑම වේල පිළියෙල කළ යුතු ආකාරය මම සිතින් සැලසුම් කළෙමි.

'මම්මා ඇයි ඉතිං මිස්ට මාරියෝගෙ විල්ලා එකේ පදිංචි වෙන්න යන්නැත්තෙ...?'

සිල්වියාගේ තට්ටු දෙකේ ඇඳට නැග නිදන්නට සූදානම් වන ගමන් මම හිතේ තිබූ ප්‍රශ්නයක් එළියට දැම්මෙමි. සිල්වියා සන්සුන් ලෙස හිනාවෙනවා මා දුටුවේ උඩ සිට පහළ ඇඳ වෙත එබී බලන්දී ය.

'අනේ මට මේ පුරුදු අපාට්මන්ට් එක හොඳයි ළමයො.'

ඉතාලියානුවන් වැඩිපුර ජීවත් වෙන්නේ මේ මහල් නිවාසවල

The Reader's Place Novel

ය. සියවස් ගණනක් තිස්සේ දැන් ඔවුන්ට ඒ ජීවිතය පුරුදු ය. බහුතරයක් ඉතාලි ජාතික ගැහැනු පිරිමි දෙපක්ෂයම රැකියාවලට යති. ඉතින් ඔවුන් ගෙදර රැඳෙන කාලය අඩු ය. බොහෝ විට ගෙදර සිටින්නේ නිදාගෙන රාත්‍රී කාලයෙහි පමණි. ඉතින් ඔවුන්ට මෙ නාගරික මහල් නිවාස ජීවිතය බෙහෙවින්ම පහසු ය.

'මේවයෙ ඉන්නෙ අවුරුදු ගණන් ඉඳලා දන්න කියන මිනිස්සු හරියට පවුලෙ ඇයො වගේ. විල්ලා එකක ඉතිං තට්ට තනියමනෙ.'

ඉතාලියානුවන් 'විල්ලා' කියා හඳුන්වන්නේ තනි ඉඩමක පිහිටන විශාල නිවාස ය. එවැනි ගෙයක් හදන්නේ විශාල ධනවතෙකි. සාමාන්‍ය ජීවිතයක් ගෙවන හුඟක් අය කරන්නේ මහල් නිවාසයකින් ගෙයක් මිල දී ගැනීමය.

'දැං ඉතිං අපි කොයි වේලේ දකියන්න බෑ. පුරුදු පරිසරේම මැරිලා යන්න තමයි මමනං කැමති.'

'නෑ මං එහෙම ඇහුවෙ... මිස්ට මාරියෝත් තනියම ඉන්න නිසා.'

'එයාට ඒ කාලෙම මං කොච්චර කිව්ව ද ඔය තනිකම නැතිකරගන්න ස්ථිර විසඳුමක් හොයාගන්න කියල. කෝ... ඇහුවයැ...'

සිල්වියා දිග සුසුමක් හෙළනු මට ඇසිණ. ඊළඟට ඇය මාරියෝ පිළිබඳ කල්පනාවකට වැටුණ නිසාදෝ අලුතෙන් යමක් කතා කළේ නැත. මමත් ඒ කල්පනාවට බාධා කරන්නට නොගියෙමි. තවත් ටික වෙලාවක දී ඇයට නින්ද ගිය බව මට දැනුනේ ඈ ගොරවන හඬිනි. සුවසේ නිදන්නට ආරක්ෂිත තැනක යහනක් ලැබුණත් මට නම් ඉක්මනට නින්ද ගියේ නැත. දහසක් දේවල් හිත ළඟට ආවේ ය. ඒවා ගැන දුරට - දිගට කල්පනා කරන්නටත් පෙරම මීදුම් පටලයක් සේ ඒවා බොඳව ගියේ ය. නමුත් ඒ සුවබර කල්පනා දැහැන තුළ මම ඔහේ නිදිවරමින් සිටියෙමි.

07

උදේ එළිවුණ වෙලාවේ සිටම මා ලකලෑස්ති වූයේ මාරියෝත් සිල්වියාත් වෙනුවෙන් දිවා ආහාරය පිළියෙල කිරීම සඳහා ය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එය සිංහල ආරේ කෑම වේලක් විය යුතුයැයි මම කලින්ම තීරණය කර සිටියෙමි. මාළු වලට ගම්මිරිස් දමා හිඳෙන්න තම්බා, අල කිරි හොද්දක් තනා, ගොටුකොළ සම්බෝල සාදා, තිබ්බටු මැලවීම මගේ අදහස විය. තිබ්බටු හා ගොටුකොළ මිටිය අහම්බෙන් වගේ සිංහල කඩයෙන් හමුවූ ඒවා ය. ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන පත්තර තොග සමග ලංකාවේ කොළ වර්ග, පොළොස් හා වෙනත් ආවේනික ආහාර වර්ගද පැමිණෙන බවත්, මාසයේ නියමිත දින වලදී ඒවා මිලදී ගත හැකි බවත් ඒ කඩයේ හිමිකාර තරුණයා මට කීවේ ය. එළවළුවක අඩුව දැනුණෙන් මම සිල්වියාගේ ශීතකරණයෙන් බෝංචි ටිකක් ගෙන කිරි රසට පිසුවෙමි. පපඩම් ටිකක් බැදගත් විට ප්‍රමාණවත් යැයි මට සිතිණ. ලංකාවේදී සේ ගෙඩි වලින් ගාගන්නා පොල් නම් ප්‍රයෝජනයට ගත හැකි නොවිනි. මන්ද යත් මා සතුව හිරමණයක් නොවූ බැවිනි. ඉතාලි ජාතිකයින් පොල්කිරි භාවිතයක් ඇත්තේම නැත. ඔවුන් ඒ වෙනුවට යොදා ගන්නේ එළ කිරි ය. ඒ හින්දා මම පිටිකළ පොල්කිරි පැකට් දෙක තුනක් සිංහල කඩයෙන් ගෙන ආවෙමි.

'අංශුගෙ කෑම නම් සුවඳේ බෑ'

මා කෑම පිසිත්දී එතැනට ආ සිල්වියා සුවඳ ඉව කළා ය.

'සුවඳ තිබුණට රසනං නැතුව ඇති'

The Reader's Place Novel

අපි දෙන්නාම ඕනාවටත් වඩා සිනාසුනෙමු.

'අනේ මන්දා. අංශු අපිට හැමදාම ලංකාවෙ කෑමම ඕන කරයිද කියල'

'ඒවනං කියන්න බෑ'

'එහෙම වුනොත් මායි මාරියෝයි මේ තියෙන දෙයක් විකුණලා දාලා ලංකාවට එන්න තමයි වෙන්නෙ'

'එහෙම ආවොත් මං පුළුවං හැටියකට බලාගත්තව'

'අංශු මාත් එක්ක හිටියෙ පැය කීපයයි වුණාට ඒකනං මං විශ්වාස කරනවා'

මගේ ඇස් වලට කඳුළක තෙත උණා ආ තරම ය. ඇත්තටම මේ සිටින්නේ අංශු මන්තිකා පතිරණ ද කියා මේ උයන අතරේත් මට සිතිණ. ඉතාලි ජාතික නිවසක, බැරි බැරි ගාතේ වුව කතා කරමින්, සිනහ වෙමින් මේ සිටින්නේ සැබවින්ම එහි සිටි අංශු ද?

'මටනං කනකල් ඉවසිල්ලක් නෑ'

'බෑ....බෑ... මිස්ට මාරියෝත් ආවහම තමයි කන්න දෙන්නෙ'

පලතුරු සලාදය සඳහා පලතුරු කපමින් මම හඬනගා සිනැහුණෙමි. දොර ඇරුනේ ඒ වෙලාවේම ය.

'මං ඇතුළට ආවට කමක් නැද්ද?'

මාරියෝ සිනහසෙමින් දොරකඩ සිටියේ ය.

'මාරියෝ ඉක්මනට ආපු එක ලොකු දෙයක්. මං මේ කෙළ ගිල ගිල හිටියෙ. අංශු කිව්වනෙ මාරියෝ එනකල් කන්න දෙන්න බෑ කියලා. වෙනදටනං මාරියෝ එන්නේ කියපු වෙලාවට වඩා පැය දෙකක්වත් පරක්කු වෙලා. ඉතිං මං බයේ හිටියෙ. ඒත් අද පැයකට කලිං ඇවිත්'

සිල්වියා ඉක්මනට ගොස් කුඩා හතරැස් මේසය වටා පුටුවක් ඇද බිඳ ගත්තා ය.

'බලන්නකො මාරියෝ සුවඳ '

ඇය හැසිරුනේ වයස හැත්තෑ ගණන්වල වියපත් ගැහැනියක ලෙස නොව නව යොවුන් දැරියක වාගේ දඟකාරව ය.

'මං උදේටත් කන්නෙ නැතුව ඉඳල මේ ආවෙ. බඩ පැලෙන්නම් කාල යන්න'

මාරියෝගේ කතාවට සිල්වියා නැවතත් කොක් හඬලා සිනාසුණා ය. මම ඉක්මනට උණු උණුවේ තෙමින් වලට දමා බත් මාළු පිණි මේසයේ ගිහින් තැබුවෙමි. වතුරත් හැඳිත් තබා සිල්වියා හා මාරියෝ අතර වූ අසුනේ හිඳගතිමි.

'මම්මල අත්වල කෑම ගාගත්තෙ නැනෙ. ඒත් ලංකාවේ අපිනං බත් කන්නෙ අතිං.'

ඔවුන් දෙදෙනා වෙත හැඳි ගෑරුප්පු ලං කොට මම පිඟන් වලට බත් මාළු පිණි බෙදුවෙමි. ඊළඟට අතින් කන්න පටන් ගතිමි. මාරියෝද හැඳි ගෑරුප්පු පසෙක තබා අතින් කන්නට ගත්තේය.

'කෑමක නියම රස දැනෙන්නේ ඒ කෑම අයිති රටේ සංස්කෘතියට අනුව කනකොට'

ඔහු පිඟානට අත තැබුවේ එසේ කියමිනි.

'මටනං දැං අතින් කන්න පුරුදු වෙන්න බෑ. කමක් නැතේ නේද?'

'කමක් නෑ මංමා, හැබැයි ඉතිං ලංකාවේ කෑම වල ඇත්තම රස දැනෙන්නේ ඇඟිලි වලිං අනාගත්තම තමයි'

'හරිම රසයි... ඒත්... මේ දැවිල්ල තමයි...'

සිල්වියා කන ගමන් නහය සීරුවා ය. ඇගේ දෙතොලත් නහයත් දැවිල්ල නිසා වඩාත් රතු වී තිබිණ. මාරියෝ තම් ආහාර ගත්තේ සැබවින්ම එහි රසය විඳිමින් ඒ රස ගවේෂණය කරමින් කියාය මට සිතුනේ.

'කෑම රසයිද මිස්ට මාරියෝ...?'

මා එහෙම ඇසුවේ මාරියෝ කෑම වල රසය ගැන මෙතෙක් කිසිත් නොකියූ බැවිනි. ඔහු මදෙස බලා තවත් බත් හැන්දක් බෙදාගත්තේ ය.

The Reader's Place Novel

'අඩුගානෙ සතියකට දවසක් දෙකක්වත් මෙහෙම බඩ පැලෙන්න කන්න ඇත්තං කියලා හිතෙනවා අංශු'

සිනහ වෙන්නට ගිය සිල්වියාට හිස්මොළයේ ගියේ ය. මම විගස වතුර විදුරුවක් ඇයට ලං කළෙමි.

'ඇත්තටම මං ඔය රෝමේ තියෙන ෆොරින් රෙස්ටුරන්ට් වලින් ඉඳහිට කෑම කාලා බලනවා. චීන තායි අරාබි වගේ අහත්හල් මෙහෙ ඕනතරං තියෙනවා. ලංකාවෙ කඩෙකිනුත් දවසක් මං ලන්ච් පැකට් එකක් ගත්තා. ඒත් ඒකෙ මෙච්චරම විශේෂ රසක් තිබුණෙ නෑ.'

මම සිනාවකින් බිම බලා ගතිමි. මූණ රතුව යන්නට ඇත. මා රසට කෑම පිසින බව ලංකාවේදීත් කීප දෙනෙකුගෙන්ම කියවී තිබේ. ඊට හේතුව නයක් හතරක් නොතේරෙන දුරියක සත්දිනේ සිටම මා කුස්සියට වැටීම නිසා වන්නට ඇත. අම්මා නැති ගෙදර තුන් වේලටම උයා පිහා තියන්නට සිදු වූයේ මට ය. අම්මා රට ගිය මුලදී ආච්චි අම්මා උදව්වට ආවත්, හැන්දාගේ දරුවන් ගණන වැඩි වත්දී ආච්චි අම්මාට ද අප ගැන බලන්නට ඉඩකඩ අඩු විය. අපේ ගෙදර අයගේ බඩවල් ගැන මටම බලා ගන්නට සිදු විය. නමුත් මෙතෙක් කවුරුන් මගේ කෑම රසයැයි කිව්වාටත් වැඩි සතුටක් මේ වෙලාවේ මම භුක්ති විත්දෙමි. සමහර විට ඒ විදේශිකයන් දෙදෙනෙකු මගේ අත්ගුණය ඇගයූ නිසා වන්නට ඇත.

'අංශුට කරදරයක් නැත්නං... ඇත්තටම මං කැමතියි සතියකට දවසක්වත් මේ විදිහෙ කෑම වේලක් කන්න. මොකද මම්මා කියන්නෙ...?'

'මං හිතුවා මාරියෝ ඕක කියයි කියලා'

මම්මා ප්‍රීතියෙන් සිනාසුණා ය.

'අනේ මට මොන කරදරයක් ද මිස්ට මාරියෝ. මිස්ට මාරියෝ මට මෙහෙ නවාතැන් දීලා කරපු උදව්වෙ හැටියට'

'බලන්න මම්මා. මේ ළමයට මං කිව්වා මට මිස්ට මාරියෝ කියන්න එපා කියලා'

'මාරියෝ වයසින් වැඩි නිසා අංශුට එහෙම කියවෙන්නෙ නැතුව ඇති. ඒක ආසියානු සංස්කෘතියෙ හැටියක්නෙ'

'අනේ එහෙම වයසක් නිසා නෙවෙයි මිස්ටර් මාරියෝ' යළිත් මට ඒ වරදම කරන්නට සිදු විය. පලතුරු සලාදය මුව තුළට ලමින් මාරියෝ මා විනිවිද බැලුවේ ය. මට බිම බැලිණ. සිල්වියා හඬනඟා හිනැහුණා ය.

'මං... මං හෙමිහිට පුරුදු වෙන්නං මිස්ට මාරියෝ'

නැවත වතාවක් සිනහවකි.

'අපේ ගෙදර මේ වගේ හිනාවෙං පිරිලා ගියේ සැනෙන කාලෙකිං මං හිතන්නෙ.'

ඒ සිනාව අතරේම සිල්වියා කීවා ය.

'හ්ම්... බඩ පිරුණා වැඩිද මන්දා. දැන්නං හිතෙනවා මෙහෙමම වැටිලා ටිකක් නිදියන්න'

'මාරියෝට ඉතිං කන්න නිදියන්න විවේකයක් තියෙන එකක්යෑ'

'මම්මා දන්නවනෙ ඉතිං. මං කොච්චර වැඩ කරනවද කියල'

'අංශුගේ කෑම ටිකක් කාලා යන්නවත් මාරියෝ සතියකට දවසක්හරි මෙහෙට ඇවිත් යනවනං කොච්චර දෙයක්ද?'

ඇය ඒ වෙනුවෙන් දෙවියන්ට ස්තුතිවන්ත වූවා ය.

'මං හිතන්නෙ මේ චූටි කෙල්ලව මේ වයසක මගෙ පාළු ගෙදරට එවන්න ඇත්තෙ දේව මෑණියොද කොහෙද. දේව මෑණියන්ට ස්තුතිවන්ත වේවා'

බටහිර රටවල මාපිය දූදරු බැඳීම ආසියාතික රටවල තරම් සමීප නොවන බව මම අසා ඇත්තෙමි. ඉතාලියට පැමිණ ගෙවුණ කෙටි කාලය තුළදී මම එය සියැසින් දුටුවෙමි. යොවුන් වියට එළඹුණ ගමන් දරුවෝ දෙමපියන්ගේ දුරස් වෙති. තමන් ගැන තමන්ම බලාගනිති. බොහෝ විට ඔවුන් සහකරුවෙකු හෝ සහකාරියක සමග එකට ජීවත් වන්නටද පටන් ගනිති. නමුත්

The Reader's Place Novel

දරුවන් හා දෙමාපියන් අතරේ වන ආදරය, දේශසීමා වලට සීමා කළ හැකි දෙයක් නොවේ කියා දැන් මට ප්‍රත්‍යක්ෂය.

'මං...මං... තව ලොකු උදව්වක් ඉල්ලන්නයි හිටියෙ ම්ස්ට මාරියෝ... ස්... සොා...රි... මා...රියොා...'

සිල්වියා මෙසයට ද පහරක් ගසා කොක් හඬලා හිනැහෙන්නට වූවා ය. මාරියෝ සිනාව යටපත් කරගෙන කතා කළේ ය.

'ඔව්... මොකද්ද අංශු?'

'මට..මට... ජොබ් එකක් හොයාගන්න ඕන. ඩොමෙස්ටික් වුනත් කමක් නෑ'

'ඩොමෙස්ටික්...? අංශු වගේ දක්ෂ ළමයෙක් ගෙවල් වල වැඩ කරන්න...?'

'මං ඉතාලියට ආවෙ මොනව හරි වැඩක් කරල ජීවත් වෙන්නනෙ'

මම උවමනාවෙන්ම 'මිස්ට මාරියෝ' කියන වාක්‍ය කණ්ඩය හැළුවෙමි.

'පුළුවන්නං...මිස්ටර්... න් නෑ... මේ... මාරියොගෙ... හොටෙල් එකක හරි වෙන තැනක හරි කමක් නෑ. මට ඉතාලියේ රස්සාවක් නැතුව ඉන්න පුළුවන්කමක් නැනෙ'

මාරියෝ කිසිත් කීවේ නැත. නමුත් ඔහු කල්පනා කරන බවක් පෙනිණ. හෙතෙම යළි නික්ම ගියේද ඒ කල්පනාවෙන්ම බව පෙනෙන්නට තිබිණ.

කෑම පිසූ භාජන ටික සෝදා පිරිසිදු කළ පසු මට වෙන වැඩක් නොවී ය. මා දස අතේ කල්පනා කළේ මේ විදිහට ඉදිරියට කොහොම ජීවත් වෙන්නද කියා ය. නවාතැන නොමිලයේ ලැබුණාට මගේ අනිත් වියදම් පියවා ගන්නටවත් ඉක්මනින්ම මා අර්ධකාලීන රැකියාවක්වත් සොයාගත යුතු ය. සංජුලගේ ගෙදර සිටියදී නම් යාබද ක්‍රීඩා පිටියේ පාපන්දු ගැසූ ක්‍රීකඩයන්ගේ ඇඳුම් සේදීමෙන් හෝ මට සුළු මුදලක් ලැබිණ. දැන් ඉතින් එයත් නැත.

මාරියෝට චිත්‍ර විකිනීමෙන් ඉපයූ මුදල ටික කලකට පිරිමසා ගත හැකි වීද ඒ ක්ෂය වී යන්නේ ම ය.

'මොකද අංශු කල්පනාව...?'

කියාගෙන සිල්වියා මවෙත පැමිණියේ මා 'ඉතාලි භාෂාව උගනිමු' යන පොත අතේ තියාගෙන සඳළුතලයට වී කල්පනා කරන්දී ය.

'සීතලත් ටිකක් වැඩියි වගේ. ඇතුළෙං ඉන්න. ඔයා නොදැට ජැකට් එකක් ඇඳලත් නෑ'

'එච්චර සීතලක් නෑ'

'සීතල ගාණක් නෑ කියලා ඔය තරුණ වයසට ඔයාලා හිතනව තමයි. ඒ වුණාට අපි සීතළෙං අපේ ශරීරෙ පරිස්සං කරගත්ත ඕනෙ. බෙල්ලටයි කකුල් වල යටිපතුල් වලටයි සීතල වදින්න දෙන්න හොඳ නෑ.'

ඇය ආදරණීය අම්මා කෙනෙක්ගේ මාතෘ ස්නේහයෙන් මට අවවාදයක් කළා ය. මම මදහසකින් එකඟතාවය හැඟවීමට හිස සැලුවෙමි. එසේ නොකළේ වී නම් එය ඇගේ කරුණාවන්ත කමට මදිපුංචි කමක් සේ දැනෙනු ඇත.

'අංශු පොතක් බලනවද?'

'මේක අපේ භාෂාවෙන් ඉතාලි භාෂාව කියල දෙන පොතක්'

'ඕ...'

'මං මේ තරමටවත් ඉතාලි වචන ටිකක් කතා කරන්නෙ මේ පොතට පිං සිද්ධ වෙන්න'

'භාෂාව කියන්නෙ කතට ඇහෙනකොට ඉගෙන ගන්න දෙයක්නෙ. දැං ඉතිං මං හැම තිස්සෙම ඉතාලි කියෝන නිසා අංශුට ඉක්මනට ඉතාලි හුරුවෙයි.'

මගෙන් ලොකු සුසුමක් ගිළිහිණි. මේ නම් පළදෙන්නේ පෙර පිනකි, නැත්නම් ලංකාවේ සිට සත් සමුදුරු තරණය කොට පැමිණි කෙල්ලකට මේ විදිහේ මිනිසුන්ගේ ඇසුර හිමිවේවිද?

The Reader's Place Novel

'මමෙ'

'ඔ?'

'ඔය මේරියෝ මට පුංචිකේ පොඩි එකෙක් ගැන කියලා තේද?'

සිල්වියා දෙකරද තැබෙමින් සිහසුවේ්ගෙ ගමන ය. ඒ සිහසුන මට වැටහුණේ කොහොමද. මගෙන් යම්කිසි වැරදී, අඩුපාඩු සිදුවීනද? නොවෙයි නම් මේරියෝ කවදාහරි මට ඒ ගැන කිව්ව ඇය නොදන්න බව දැන ඇය සිහසු වෙනවාද?

'මේරියෝ කොච්චර කිව්වත් අංශුට ඔය මිස්ටර් කැල්ල සියෙස්ටා තේද?'

මගේ අස්වැසිල්ලක් දැනුණේ ඇය ඒ ප්‍රශ්නයෙනි. මම නොසන්සුන්කමින් ඔය පුරවා ගත්තේ.

'මේරියෝ කොළඹින්ම අහුවෙන්න ඒවා ඔක්කොම කියලා තියෙනවා. එක එකාගෙ පුංචි කෙළේ ඇල්ම පිළිබඳ ගැඹුරුයක්. අංශු ඒවා නොකර ඉන්න එකක් නෑ'

'මමත් කියන්න මට උදව් කරන්න කියලා'

'හරි හරි, මං කියන්නංකෝ'

ඇය සිනාසුණා ය. මටම මා ගැන පුදුම ය. එක දවසක් තුළදී, මෙපමණ ඇති වූ මෙ බැඳීමේ අරුත කුමක් ද? පෙර සංස්කාරයේ ලාව ඇතුරු කර පුරුදු, අය ලෝකයේ කොහෙහක සිටියත් එකට හමු වෙනවායි කතාවක් මම අසා ඇත්තෙමි. මාරියෝ පවුල මට හමු වීමෙන් එවැනි ඉතිරුරුද්දක ප්‍රතිඵලයක් වශයෙන් වත්ත ට බැරි නෑ. නැත්නම් මේ තරම් කෙටි කාල වකවානුවක් තුළදී අපට අප ගැන මෙතරම් ඉතුරුරුදු ළෙංගතුකමක් දැනෙන්නට පුළුවන්කමක් නැත.

'අංශුගෙ ෆැමිලි එකේ කවුද ඉත්තෙ?'

මූල්ම වතාවට සිල්වියා මගේ පෞද්ගලිකත්වය ට අත තැබුවා ය. නමුත් මට ඇය ගැන කිසිදු නොරිස්සුමක් දැනුනේ නැත. අපි

අපේ ගැන බොහෝ විශ්වාසවන්ත දැනෙන සිටින බව දැනුත් හැඟුණා සිටීම පහසු ය.

'මට අම්මයි තාත්තයි අයියයි ඉන්නවා මෙහෙ. ඒ ඉන්නෙ මං පුංචි කාලේ ඉඳලම ජීවිතයක් ගත කරපු ලමනක්. අන්තරාල... මගෙ ගැන වීස්තර කරලා මේමට කියන්න තරං මං ඉගැන්නුවෙ නෑ.

මා එසේ කියන විට මගේ හඬෙහි මහත් ප්‍රකම්පන බිඳක් මෙන් දැනිණ. උගුර පිපිරී, ඇස්වලට කඳුළු දැ පිරෙනවා සේ ය. මහ හඬින් හැඬුවා නම් ඒ කම්පන සංවේදනය මදක් ලිහිල් කරගත හැකිවනු ඇත. නමුත් මට එසේම හඬන්නට මිනිසුන් ඉදිරියේ හැඬුවාය කියා සිදුත් මගේ ප්‍රකාශනය කිවාලන්නෙද? ඒ මා උපතින් මට ලබාගත්තා වූ කරුමයකි. ඒ කරුමයෙන් පලා යාම සඳහා අපායී සාවියේ පවත්ම මට අයිති වූ 'පවුලක්' අවශ්‍යතාවය තෘප්ත කරගනු වස් මා ලැදි පිරිමියා වන කල්ප ලෝකයේ ද අනන්ත පොළොව තුළුල්ල වෙන්වත් කොට මගේ ජීවිතයෙන් පලා ගියේ ය. එහෙවි අවාසනාවක්, මේ මිනිසුන් මහිස පිරිමැදී, කෙසේ සමාව කරන්නද?

'අපි ඒවා ගැන පස්සෙ කතා කරමු අංශු. දැං ඉතින් පරණ දෙවල් අමතක කරලා සතුටින් ඉන්නකෝ. මේ'

මිනිත්තෙන් මගේ අම්මාගෙන්වත් මා අතිවීද, තැති අකාරයේ ස්නේහයකින් පුරා මගේ කොපුලක් පිරිමැද්දා ය.

'මට තියෙන්නෙත... මේසියෙං අමතක කරන්න පුළුවං විදිහෙ අතීතයක් නෙවෙයි මම'

'අංශු... ජීවිතේ එහෙම තමයි. ජීවිතේ කියන්නෙ සම්පූර්ණ දුකක්වත් සම්පූර්ණ සතුටක්වත් නොවෙයි'

'ඒක ඇත්ත. ඒත්...'

'එහෙම වුණාතං එක මිනිහෙකුටවත් ජීවත්වෙන්න හිතෙන්නේ නැනෙ රුවෝ'

'ඒත් මම්මා...'

The Reader's Place Novel

'වෙලාවකට දුකයි... වෙලාවකට සතුටයි තියන තොට තමයි ජීවිතේ බැලන්ස්'

'මිස්ට මාරියෝ කතා කළෙත් මම්මා වගේ තමයි'.

'මාරියොත් ජීවිතේ දුක් ගැහැට වලිං හොඳට පදං වෙච්ච මිනිහෙක්, එයාගෙ මම්මා වගේම'

මම සිල්වියාගේ දෑස් දෙස කෙළිං බැලුවෙමි. ඒවා දැල්ලී තිබුනේ මවෙත නොව ඇත දුර අතීතය වෙත ය. ඈ බලා සිටියේ ඒ අතීතයට හිනාවෙනවා වගේ ය. ජීවිතය විසින් පත්තරය ලද, ජවත් විමෙන් අත්දැකීම් ලද ඇය, දැනුවත්ව හෝ නොදැනුවත්ව ජීවිතයට අභියෝග කරවනවා වගේ මට දැනිණ.

'මං නිසා. මම්මාගේ හි රිදෙන අතීත මතකයන් අලුත් වුණාතං මට සමාවෙන්න'

'අනේ නෑ අංශු. ආයෙ මට රිද්දන්න ඒ අතීතයට බෑ. හැබැයි මං මදි නොකියන්න හිත රිදෝගත්ත ගැනියෙක්. මේ දැස් දෙක දියවෙලා යනකල් මං අඬලා ඇති. හැබැයි... අපිට එහෙම වෙන්න අපේ සතුට තියෙන්නෙ අනිත් අය ළඟයි කියලා අපි හිතං ඉන්න නිසා. එහෙම නෑ ළමයෝ. තමංගෙ සතුට තියෙන්නෙ තමං ළඟමයි. අවාසනාවකට අපි ඒ සතුට හොයා ගන්න ප්‍රමාද වෙනවා. සමහර කෙනෙක්ට ප්‍රමාද වෙලාවත් ඒක කරගන්න බැරි වෙනවා ඇති.'

එක හුස්මට දිගටම කතා කරගෙන ගිය ඇය මඳ මහන්සියක් පෙන්වූවා ය. ඒ මහන්සිය ඇගේ ශරීරයට දැනෙන එකක් නොවිය යුතු ය. එය ඇගේ සිතට දැනෙන්නක් විය යුතුය කියා මට සිතිණ. මන්ද යත් ශාරීරික මහන්සියක් නොදැනෙන තරමට, වියපත් වීද සිල්වියා නිරෝගී ය. කතා බහේදී කොහොමත් ඇය තරුණියක වාගේ කෙළිලොල් ය.

'මං හෙමිහිට අංශුට මගෙ කතාව කියන්නංකෝ. මං ආයේ ඒ ගැන මතක් කරන්නෙ ඔයාට ප්‍රයෝජනවත් වෙයි කියලා. එහෙම නැතුව.. ඔය මුල්ලකට කරපු කුණු ගොඩවල් ආයෙ අවුස්සන්න මට නං ඕනෑකමක් ඇත්තෙම නෑ'

ඇගේ කතාව නොඅසාම වුව, ඈ වගේ වත්තට ඇත්තම් කොයිතරම් හොඳද කියා මට සිතිණ. මට දැනෙන විදිහට සිල්වියා ද ජීවිතේ අනේ දුක් විඳි ගැහැනියකි. තමුත් ඇය අලුවම ලත කළ පිඬක් සේ ඒ දුක් ආත්මයෙන් බැහැර කරන්නී ය. දැන් මා කළ යුතුව තිබෙන්නේත් එය නොවේද?

කල්පගෙන් ලද තුවාල රිදුම් වලින් සැඟවෙනු වස් මම රටින් පැන ආවෙමි. ඒ තුවාල සුව වන්නටත් පෙර ම මම යළි සංජුලට ද රැවටුණෙමි. විවාහ නොවීම පිරිමින් දෙදෙනෙකු සමග යහන්ගත වන්නට සිදු වුයේ මගේ ඔනෑකමට නොවේ. ඒ සසර කරුමයක් නිසාවෙනැයි මම සිතමි. ජීවිතයේ නැති කරගත්නට ගොස් මම කුස ඔත් කලලය ගබ්සා කරගතිමි. ඒ අනුව මා මහත් පව්කාරියකි. ආයේ ඉතින් යළි මට කෙදිනකවත් විවාහයක් ගැන සිතිය නොහැකි ය. එහෙම එකේ මගේ දරුවාව රැක ගත්තා නම් මටම කියා දරුවෙකු හෝ සිටිනු ඇත. නමුත් පියෙකු නොමැති දරුවෙකු සමග මා ලෝකයට මූණ දෙන්නේ කෙසේද? ලෝකයා විසින් නගනු ලබන ප්‍රශ්න වලට මා කෙසේ වෙතත් දිනෙක මගේ දරුවා කෙසේ පිළිතුරු සපයන්නද? කිසිදු වරදක් නොකළ දරුවෙකුගේ අනාගතය එසේ අඳුරු නොකොට එක අතකට මෙසේ වූ එක හොඳය.

පහුවදා උදේ මම සිල්වියාට කෑම සකස් කරන්න නොදී කිරිබතක් පිළියෙල කළෙමි. උම්බලකඩ දමා හොඳ කට්ට සම්බෝලයක් ද සැකසුවෙමි.

'අනේ අංශු ඒක නම් හරිම රසයිනෙ'

මා කිරිබත් කෑලි කපත්දීම ඉන් කැබැල්ලක් මුවට ලා ගත් සිල්වියා එහි රසයෙන් පුදුම වූවා ය. කිරිබත් රස හොඳට හුරු පුරුදු ලාංකිකයෝ ද කිරිබත් කන්නට විශේෂ ආසාවක් දක්වන එකේ ජීවිතයේ මුල්ම වතාවට ඒ රස විඳ විදේශිකයෙක් කිරිබත් වල කිරි රසයෙන් අමන්දානන්දයට පත්වීම එක අතකට පුදුම වන්නට කාරණයක් නොවේ.

The Reader's Place Novel

'අපරාදෙ. ඊයේ මාරියෝටත් කිව්වනං ඔයා ලංකාවෙ කෑමක් හදනවා කියලා මිනිහා දුවගෙන ඇවිත් කලා යනවා'

'ඇත්තටම මං හිතං හිටියෙ නෑ මම්මා කිරිබත් උයන්න. උදේ නිකමට හිතුනෙ. ඉතිං අපි මිස්ට මාරියෝට කෝල් එකක් දීලා බලමුකෝ'

'මිස්ට මාරියෝ නොවෙයි නිකං මාරියෝ'

මාරියෝ වෙනුවෙන් සිල්වියා ආදරණීය නෝක්කාඩුවක් කළා ය. අප දෙදෙනාම හඬනඟා සිනහ වීමු. සැබවින්ම මේ සිනහව හදවතට කොතරම් ඔසුවක්ද? සිල්වියා සමග බය සැක නැතුව සිනා වෙන්න පටන් ගත් මේ දෙතුන් දිනයට මට ඒ ඔසුවෙහි ගුණය හොඳහැටි දැනෙන්නට පටන් ගෙන තිබේ. මගේ රටේ මගේ ගෙදරදීත් මා මෙහෙම සිනහ වී නෑ නාවේද? මගේ ගෙදර මගේ මිනිසුන් අතරදීත් මා සිටියේ ප්‍රශ්න වලින් හදවත පුරෝගෙන සිනහ වෙන්නට අමතක වූ එකියක් වාගේ ය. කොහොමත් තනුජා අපේ ගෙදරට ආදා පටන් සිනහ වීමේ අවස්ථාව මට අහිමිව ගියේ ය. මන්දයත් මා සිනහ වුනොත් ඇයට එය නොරුස්නා වූ බැවිනි. දැන් ඉතින් තහංචි දමන්නට කෙනෙක් නැත. අහස සිසාරා යන තරම් උස් හඬින් වුව සිනහ වෙන්නට මට පුළුවන. මගේ නොවන රටක මගේ නොවන මිනිසුන් අතර වුවද මට මා හමු වී තිබෙනවා නොවේද?

'මාරියෝ... මේ අංශු පුදුම රස කෑමක් හඳලා උදේට කන්න. ඔව්. රසම රසයි. ඉතිං මං හිතුවා ඔයත් රස බැලුවොත් මොකද කියලා. පුළුවන්නං පැය බාගයක් වෙන් කරගෙන ඇවිත් යන්න එන්න මාරියෝ. හරි....හරි'

මා කලපනාවේ සිටියදී සිල්වියා මාරියෝට දුරකථන ඇමතුමක් ගෙන හමාර ය.

'හොටෙල් එකේවු ඉන්නෙ. එන්න බලන්නම් කිව්වා. හැබැයි මට නං එයා එනකල් ඉන්න බෑ. අපි කමු.'

මම කිරිබත් තසිමෙත් මුල් කැලී තුන හතර වෙනම පිඟානකට දමුවෙමි.

'ඇයි ඒ...?'

සිල්වියා ප්‍රශ්න කළා ය.

'මිස්ට මාරියොට'

'ඉතිං ළමයො අපි ඔක්කොම කන්නෙ නැනෙ. මේකෙ ඉතුරු වෙයිනෙ'

'ලංකාවෙදි අපි එහෙමයි මම්මා. අපේ අම්මලා බත් මුට්ටියේ මුලිංම තාත්තගේ පංගුව අයින් කරලා තමයි අනිත් අයට බත් බෙදන්නෙ. මුල්ම කොටස ගෙදර ප්‍රධාන පිරිමියාට'

'ආසියාවේ ගෑනු දැං ඔය ෆයිට් කරන්නෙ... පිරිමි තමන්ට නිසි තැන දෙන්නෑ කියලා... ඔය විදිහට මුල වරද්දගෙන තමයි'

සිල්වියා හයියෙන් හිනැහුණා ය.

'එහෙමම නෑ. හස්බන්ඩ් වයිෆ්ටත් වයිෆ් හස්බන්ඩ්ටත් ගරු කරගෙන ලස්සනට ආදරෙං ජීවත් වෙන පවුල් තාමත් ලංකාවේ ඕනතරං තියෙනවා'

'මාත් කාලයක් හොඳ ෆැමිලි ලයිෆ් එකක් වෙනුවෙං ලස්සන හීනයක් දැකපු ගෑනියෙක් තමයි අංශු'

සිල්වියා දිගු සුසුමක් හෙළුවා ය. මගේ ළය මඩලෙහි ගිනි මැලයක් දැල්වුණා වන් ගිනි රස්නයක් ක්ෂණිකව මට දැනිණ. මේ වේලාවේ නම් සිල්වියාගේ දෑස්හි වූයේ ජීවිතයට අභියෝග කළ පෙනුමක් නොවේ. ජීවිතයෙන් ජීවිතය ඉල්ලා සිටි පොදු ස්ත්‍රී දුක්ඛිත බවකි.

'මගේ තරුණ කාලේදි මාරියෝගෙ පප්පව මුණගැහුනම මම හිතුවෙ ජීවිතේම ලැබුණා කියලා තමයි. මාත් ජීවිතේ හොඳම කොටස වෙන් කළේ එයාට තමයි'

'මම්... මා...'

ඇගේ දෑස්හි කිසිදා දකින්නට වේවියි මා නොසිතූ කඳුළත් පිරී තිබිණි.

The Reader's Place Novel

'ඒත්... ඒත්... අංශු එයා වෙනස් වුණේ අහස වගේ... මං කොහෙත්ම හිතුවෙ නැති විදිහට'

'එයාටත් තිබුණ හෝටලයක්. මේ මාරියෝගෙ තරං ලොකු... අලුත් පන්තෙ එකක් නෙවෙයි. කසාද බැන්දට පස්සෙ මමත් ඒකෙ වැඩ කළා. හැබැයි... කසාදෙං පස්සෙ මං දැක්කෙ ඊට කළිං හිටිය ආන්ජලෝව නෙවෙයි. එයා පුදුම විදිහට නපුරු වෙලා හිටියා. වෙලාවකට යකෙක් වගේ. හෝටලේ දී මට සැලකුවෙ එයාගෙ බිරිඳට වගේ නෙවේ. තුට්ටු දෙකේ සේවකයෙකුට වගේ. කස්ටර්මස්ලා ඉස්සරහදීම කැත විදිහට මට බනිනවා. පස්සෙ පස්සෙ ගහන්නත් පටන් ගත්තා'

ඉතාලියේ ඇතැම් පිරිමින්ද ලංකාවේ සමහර පිරිමින්ට වඩා වෙනස් නැතැයි මට සිතිණ.

'එතකොට මාරියෝට අවුරුදු තුන හතරක් ඇති. ආන්ජලෝ ගහත්දිත් මං ඉවසුවා. මොකද... ඉතිලියෙ අනික් හුඟාක් කසාද ගෑනුන්ට වගේ මට දික්කසාදෙ ඕන කරලා තිබුණෙ නෑ. ඒ කාලේ වුනත් මේ ඉතාලියෙ ගෑනු පිරිමංගෙං ගුටි කන්න ලෑස්ති නෑ. හැබැයි මං ගුටිකාගෙන හිටියා'

කිරිබත් කා හමාර කොට හැඳි ගෑරුප්පු පිඟාන තුළම දමා පසෙකට කොට තවදුරටත් සිල්වියා අතීතය මෙනෙහි කරන්නට වූවා ය.

'ආන්ජලෝ මට එහෙම සළකන්නෙ ඇයි කියලා ඇත්තටම මං දනගෙන හිටියේ නෑ. මේ මනුස්සයට මානසික රෝගයක්ද කියලත් මට හිතිලා තියෙනවා. ඇයි ඉතිං ඉස්සර එයා එහෙම නෑනේ. මිනිස්සු ඉස්සරහදී පුදුම විදිහට මට නින්දා අපහාස කළා. සමහර වෙලාවට මට ඉවසන්න බැරි තරං ලැජ්ජාවක් දැනිලා තියෙනවා. ඒත් එයාගෙන් වෙන් වෙන්න මං හිතුවෙ නෑ. ඔහොම කාලයක් යනකොට තමයි මට ආරංචි වුණේ එයාට වෙන සම්බන්ධයක් තියෙනවා කියලා'

දොර හැරුණේ ඒ වෙලාවේ ම ය. චිත්‍රපටියක හොඳම කොටස නරඹත්දී හදිස්සියේම විදුලි බලය ඇන හිටියා වගේ

අපේක්ෂා භංගත්වයක් මට දැනිණ. මාරියෝ දොර වහගෙනම ඇතුළට ආවේ ය.

'මං හිතුවා මං එනකල් දෙන්නා බඩගින්නේ ඉඳියි කියලා. ඒක නිසා ඔක්කොම වැඩ තියලා දුවගෙන ආව. බලනකොට එයාලා කාලත් ඉවරයි'

මාරියෝ එහෙම කියත්දී මට මහත් පසුතැවීමක් දැනිණ.

'මමයි කිව්වේ අපි කමු කියලා. ඇයි ඉතින් ඔයා කිව්වෙ එන්න බලන්නං කියලනෙ. ඒත් මේ අංශු කිරිබත් පිඟානෙ මුල්ම කොටස ඔයාට වෙනස් කරලා තිබ්බා'

මාරියෝ පුටුවක අසුන්ගන්නා ගමන් ඔහුට වෙන් කළ කොටස හැර බැලුවේය. ඔහුගේ මුවඟ නලියමින් තිබී සිනහව සිහින් රේඛාවක්ව ඇඳි ගියේ ය.

'ලංකාවේ ගෑනු එහෙමලු. ගෙදර පිරිමියාගෙ කොටස බෙදලා වෙන් කරලා තියලලු අනිත් අයට කන්නෙ දෙන්නෙ'

'ගෙදරක තාත්තට තියෙන ගෞරවය, කොච්චර ඉෝක්ද? අපේ රටවල මිනිස්සුන්ට ආසියාවෙ ඒ පවුල් බැඳීම කවදාවත් අතිවඳින්න හම්බ වෙන්නෙ නෑ'

'එහෙම කියන්නෙපා මිස්ට මාරියෝ. පවුලක බැඳීමට දේශසීමාව ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. ඇත්තම කියනවානං පවුලක් ඇතුළෙ තියෙන සතුට සැනසීම මටත් මගෙ ගෙදරදි විඳින්න ලැබිලා නෑ. ඒක මං හැබැවින්ම විඳින්න ඇත්තෙ මේ දවස් දෙක තුනේ.....ඔයාලගෙ ගෙදර ආවට පස්සෙ'

එය අතිශය සංවේදී මොහොතකි. මගේ උගුර බිඳී ස්වරය පැටලී - හඬ හැඬුම්බර වූයේ ය. ඇස් වලට කඳුළක තෙතමනය දැනෙන්නට ගත්තේ ය. මාරියෝ හෝ සිල්වියා වචනයක්වත් කතා නොකළහ. සැබවින්ම ඒ තත්පර කීපය තුළ නිවෙස තුළ දරාගන්නට බැරි නිහැඬියාවක් පැතිර ගියේ ය. කවර වචනය කතා කළොත් මගේ සිත රිදේවිද... මා හඬාවිද යන බියෙන් මෙන් ගෙහිමියන් දෙදෙනා කතා කරන්නට බියෙන් පසු වූහ. ඒ නිසා ඒ නිහැඬියාව

The Reader's Place Novel

බිඳිය යුතු වූයේ මවිසින්ම ය. මම කඳුළු අතරින් සිනහ වෙමින් මාරියෝ වෙත හිස් පිඟානක් දිගු කළෙමි.

'උදේට කිරිබත් උයනවා කියලා වේලාසන කියන්න බැරි වුණාට සොරි මිස්ට... මි... මේ... සොරි... මා...රියෝ.'

සියලු මූසල නිහැඬියාවත් පළවා හරිමින් සිනහව පිට පැන්නේ ය.

'අනේ පව් අසරණී, හැම වෙලේම වරදිනවා'

කෙසේ වෙතත් සිල්වියාගේ කොක්හඬලෑමට මාරියෝ එක්වූයේ නැත. ඔහු කල්පනා කරමින් වගේ කිරිබත් කැල්ලක් මුව තුළට ළඟාවේ ය.

'දිව්‍යලෝක රසයි නේද මාරියෝ?'

'හ්ම්. ඇත්තටම මම්මා. ලෝකෙ පුරා මිනිස්සු කියනවා ඉතාලි කෑම රසයි කියලා. ඒත් මේ කෑම ජාති එක්ක බලන කොට අපේ පිට්සාවලයි පාස්තාවලයි ඇති රසේ මොකද්ද කියලා හිතෙනවා'

'මාරියෝ මේ රසට වයි වෙනවා කියල දන්න නිසා තමයි මං කෝල් කළේ'

ඊළඟ නිමේෂයෙහි මාරියෝ කතාවකින් බහකින් තොරව කිරිබත් රස විඳින්දේ ය. සිල්වියා ද ඔහුට බාධා නොකර ඔහු දෙස බලා සිටියා ය. මම ඇඟිලි තුඩින් කුඩා මේසය මත අක්‍රමවත් රේඛා අඳිමින් සිටියෙමි.

'හැබැයි මාරියෝ අංශුගෙ කෑමවලට වයි වෙලා අපි අංශුව ලංකාවට යන්න නොදී මෙහෙම තියාගනීද දන්නෙ නෑ'

ටික වෙලාවකට පස්සේ සිල්වියා නිහැඬියාව බින්දා ය.

'ලංකාවට ගියත්. ඉතාලියෙ හිටියත්. මට මගේ කියලා කවුරුවත් නෑ මම්මා. මගේ අම්මත් අවුරුදු ගණනක ඉඳලා මැදපෙරදිගයි සයිප්‍රස් වලයි තමයි රස්සාව කරන්නෙ. තාත්තා අපි පොඩි කාලෙදිම වෙන ගෑනු කෙනේ එක්ක ගියා. අයියත් බැන්දා. මට ඉන්නෙ මං විතරයි.'

යළිත් නිහැඬියාවකි. ඒ නිහැඬියාව මහත් සංවේගාත්මක එකක්. මම යටිතොල්පට සපා ගතිමි. හඬන්නට මට උවමනා නැත. එය මට නුහුරු නුපුරුදු සත්‍යයක් නොවේ. යුවතියක වන්නටත් පෙර - දරිවියක සන්ධියේ සිටම මා අත්විඳි තිත්ත ඇත්ත එයයි. ඉතින් ඒ හුරුපුරුදු දුක වෙනුවෙන් ආයේ කුමට මම අලුතෙන් හඬම් ද? හැඬුවාය කියා මගේ කඳුළු පිසින්නට සිටියේ කවුද? පෙර පිනකටදෝ මට අනුකම්පා කළ මේ දෙවිවරු වත් මිනිසුන් දෙදෙනාට තවත් වදයක් විය යුතු නැත. ඒ නිසා මම කඳුළු අතරින් සිනහවක් නගාගතිමි.

'දැං ඉතින් ඕව වැඩක් නෑ. මම්මා කිව්වා වගේ ජීවිතේ තියෙන්නේ දුක් වෙවී ඉන්න නෙවෙයිනෙ'

'බොහොම හොඳයි, අන්න එහෙම තමයි හිතන්න ඕනෙ'

'පොඩි හරි රස්සාවක් හොයාගත්තට පස්සෙ... මං අතීතෙ ගැන හිතන එකක් නෑ මම්මා'

'ආ... මං අංශුට කියන්නමයි ආවෙ. අපේ හොටේල් එකේ මං ඔයාව පොඩි ජොබ් එකක් දෙන්න ලෑස්ති කළා'

හදිස්සියේම මාරියෝ කියූ ඒ ආරංචියෙන්, ඉහළට ඇදගත් හුස්ම පහළට හෙලන්නට පවා මට අමතකව ගියේ ය. සිල්වියා මගේ පිටට ගසා සිහි එළඹවූවා ය.

'මොකද දරුවො බය වෙලා වගේ...? ඔයා බල හිටියෙ රස්සාවක් හම්බ වෙනකල්නෙ'

'අනේ... මං කොහොම ස්තුති කරන්නද මිස්ට මාරියෝ... මේ කරන උදව්නං... මැරෙනකල් මට අමතක වෙන්නෑ...'

'මිස්ට මාරියෝ නෙවෙයි... මාරියෝ...'

සිල්වියා ඒ හැඟීම්බර නිමේෂයේ වූ බර, සිනාවකින් තුනී කර දැම්මා ය.

'ඉතිං... අංශු අහන්නැද්ද මොකද්ද ජොබ් එක කියලා?'

'මොකක් වුණත් කමක් නෑ මිස්ට මාරියෝ... මි... මේ... මා...රියෝ...'

The Reader's Place Novel

සිල්වියාට නම් ඒ සිනහ වෙන්නට කදිම කාරණාවකි.

'අතුගාන හරි රෙදි සෝදන හරි වැඩක් වුණත් කමක් නෑ' 'එහෙම දෙයක් නෙවෙයි, මං අංශුට දෙන්න යන්නේ. අපේ හොටෙල් එකේ චිත්‍ර ශිල්පිනී තනතුර'

කොහොම මා එවැන්නක් විශ්වාස කරන්නද? මා මේ සිටින්නේ ඉතාලියේ රෝම අගනුවර ය. මහා චිත්‍ර ශිල්පී මයිකල් ඇන්ජලෝගේ නිජබිමෙහි ය. එවන් භූමියකට පිට රටකින් ආ නිකම්ම නිකං කෙල්ලකට චිත්‍ර ශිල්පිනයකගේ තනතුරක් පිරිනමන්නට තරම් මාරියෝට මා චිත්‍ර ශිල්පිනයක සේ පෙනෙන්නේ කෙසේද? රෝමය වූ කලී කලාත්මක නුවරකි. කලාවට බර මිනිසුන් ජීවත්වන නුවරකි. මෙනුවර තාප්ප වල කුරුටු ගා තිබෙන බලිකුරුටු වල පවා කලාත්මක බවක් වන්නේ ය. එවායේ කුරුටු බලි අඳින පාසල් සිසුන් පවා මනා චිත්‍ර කර්ම හැකියාවකින් පිරිපුන් අය යැයි බලිකුරුටු වූ තාප්ප දකිත්දී මට සිතී තිබේ. ඉතින් එහෙම මිනිසුන් සිටින නගරයක හෝටලයක චිත්‍ර ශිල්පිනිය තනතුරකට මා වැන්නියක් කෙසේ ගැලපෙන්නේද?

'ඇයි අංශු?'

සිල්වියා මගේ උරහිසකට අතක් තබා මූණට එබුණා ය.

'මේ...මේ... මිස්ට මාරියෝ..හොඳට හිතලද මට එහෙම ජොබ් එකක් දෙන්නෙ? මං එහෙම තනතුරකට සුදුසුයි ද?'

මාරියෝ මහ හඬින් හිනැහෙන්නට පටන් ගත්තේ ය. සිල්වියාද ඔහුව අනුකරණය කරන්නට පටන් ගත්තා ය. මම තුෂ්නිම්භූත වී බලා සිටියෙමි. ඇත්තමයි මා රෝම අගනුවර තවත් එක් මූර්තියක් බවට පත්වූවාද කියාත් මට සිතිණ.

'අංශු... ඔයාගෙ චිත්‍ර වල වටිනාකම දන්න නිසානෙ මං ඔයාට එහෙම තනතුරක් දුන්නෙ. දැන් ඔයාට තියෙන්නේ අපේ හොටෙල් එකේ පරණ චිත්‍ර තියෙන තැන්වලට ගැලපෙන විදිහෙ අලුත් චිත්‍ර අඳින්න. හෙමිහිට කරගෙන යමු. ඔයා ආඳින චිත්‍ර වැඩ ඉවර වුණාම පරණ එක ගලවලා ඔයාගෙ පේන්ටිං එක රීප්ලේස් කරනවා. මං ඔයාට බොහොම සාධාරණ පඩියක් ගෙවනවා.'

'ඒත් මිස්ට මාරියෝ... එහෙම ලොකු වැඩක් කරන්න තරං කොඳට... මට චිත්‍ර අඳින්න පුළුවන් කියලා මං හිතන්නෙ නෑ'

'පුළුවං ළමයෝ පුළුවං. ඔයාගෙ ඇඟේ තියෙන කල්චර් එකේ හැටියට ඔයා පේන්ටිං කරන්න. අපේ චිත්‍ර වගේ වෙන්න ඕන කියලා හිතන්න එපා. මගේ හොටෙල් එක පොරිතර්ස්ලා වැඩිපුර එන එකක්නෙ'

මාරියෝ වැඩිපුර විස්තර කළේ ඉංග්‍රීසි භාෂාවෙනි. ඒ නිසා ඉතාලිවලින් කියනවාට වඩා මට තේරුම් ගැනීමට පහසු විය. කෙසේ වෙතත් තවමත් මා සිටියේ පුදුමයෙන් පාෂාණීභූත වී ය. මාරියෝ මා කෙරේ මහත් විශ්වාසයක් තබා තිබේ. මා කල්පනා කළේ එම විශ්වාසය රකින්න මට හැකිවනු ඇත්ද කියා ය.

'මගෙ ළඟ එක එක රටවල චිත්‍ර සම්ප්‍රදායන් ගැන ලියවෙච්ච ඉංග්‍රීසි පොත් වගයක් ඇති. මං ඒ ටිකත් අංශුට දෙන්නංකො රෙෆරන්ස් කරන්න'

මට ඒ තරම් තියුණු ඉංග්‍රීසි දැනීමක් නොමැති බව කියන්නවත් මට අමතකව ගියේ ය.

'අංශුගෙන් මට තවත් උදව්වක් ඕනෙ...? උදව්වක් කිව්වට මං ඒකටත් ඔයාට ගෙවනවා. අංශු මට සිංහල උගන්වන්න ඕනෙ'

'සිං...හ...ල...?'

'ඔව්. මං ආසයි සිංහල ඉගෙන ගන්න. එතකොට අංශුත් එක්ක වුණත් මීට වැඩිය හොඳට අදහස් හුවමාරු කරගන්න පුළුවන්නෙ'

ඇත්තමයි මට ඔහු අදහාගත නොහැකි තරම් විණි. මට වැඩිපුර හමු වී තිබෙන්නේ මිනිස් වෙසින් ජීවත් වන නොමිනිසුන් ය. ඒ අය සමග සසඳා බලන විට මාරියෝලා මිනිස් වෙසින් ජීවත් වන දෙවිවරු වාගේ ය. මේ නන්නාදුනනා දේශය තුළදී, සංජුලගෙන් ද රැවටී පාරට වැටෙත් දී, මට මොනවා වේවිදැයි මමම නොදැන සිටියෙමි. සැබවින් ම මාරියෝ හමුනොවුණා නම් මට මොනවා වේවිදැයි දනුත් මට සිතාගත නොහැකි ය. ඔහු නම්

The Readers Place Novel

ගලවුම්කාරයෙක්ම ය. එතාවක් ඔහු මාව මරණයෙන් ගලවා ගත්තේ ය. දැන් ඔහු මට ජීවත් වීමට මාර්ගයක් පාදා දී තිබේ. ඔහු මා ඉදිරිපිට පහළ වූයේ පෙර සසර පිනකට යැයි ඉතින් මා නොහිතා සිටින්නේ කෙසේද?

'මං අංශුට අපේ හොටේල් එකේ හොඳ රූම් එකක් වෙන් කරනවා. කැමති වෙලාවට එතන වැඩ කරන්න පුළුවං. ඔයා කැමතිනම් ගෙදර ඉඳලම වුනත් පේන්ටිංස් කරන්න පුළුවන්'

'තැන්ක් යූ මාරියෝ. තැන්ක් යූ වෙරිමච්. මං මගේ ජීවිතේටම ණයයි මේ කරන උදව් වලට'

'ඒකට මොකද.....ඉඳහිට හරි අපිට රස කෑම ටිකක් කන්න පුළුවන්නෙ නේද මම්මා?'

ඔහු කෑම මේසයෙන් නැගිටගත්තේ ය. සිල්වියා ද ප්‍රීතිමත් සිනාවකින් යුතුව මාරියෝ අනුව අසුනින් නැගිට්ටා ය. මගේ නම් දෙපා ගල්ගැසී තිබිණ. ඉරණම මාව මේ කරකවා තබා ඇත්තේ කොයිබට ද? මාරියෝ මා පිළිබඳව තැබූ විශ්වාසය දිවි හිමියෙන් සුරකින්නට මට හැකි වේවිද? ඒ තරම් හැකියාවක් මා සතු වේවිද? ඒ මා පිළිබඳව මා නොදැනම සිටි පැතිකඩකි.

08

ඉරිදා උදේ පාන්දරින්ම සිල්වියා වතිකානුවට යාමට සූදානම් වූවාය. ඒ උදෑසන දේව මෙහෙයට සහභාගී වීම සඳහා ය. මා බෞද්ධයෙකු බව දැන සිටි නිසාදෝ ඇය ඒ ගමන සඳහා මට ආරාධනා කෙරුවේ නැත. නමුත් පූජාවත් වතිකානුවත් දැකබලාගැනීමේ ආශාවක් මා තුළ ඇති විය. වතිකානුව වූ කලී මයිකල් ආන්ජලෝ ශිල්පියාගේ අගනා මූර්ති රාශියක් එක්තැන් වූ නලාගාරයක් බව මා අසා තිබිණි.

'මම්මත් එක්ක මාත් වතිකානුවට යන්න ආවෝත් ඔයාට කරදරයක්ද...?'

'මොන කරදරයක්ද ළමයෝ. මං ඔයාට කතා කළේ නැත්තෙ ඔයා රෝමානු කතෝලික ආගමේ කෙනෙක් නෙවෙයි නිසා.'

'මං පල්ලියක පූජාවක් දැකලම නෑ. ඒක නිසා මං ආසයි බලන්න. ඒ ගමං වතිකානුවේ මූර්ති බලන්නත් පුළුවන්නෙ'

'ඔයත් එනවනං මට මේ ගමන ට්‍රිප් එකක් වගේ වෙයි'

ඇය හනි හනික පාන් ටෝස්ට් කරන්නට ගත්තාය. වතුර හා පලතුරු යුෂ බෝතල් කිහිපයක්ද, ඉතාලියානු පැණි රස කෑම වර්ග කිපයක් ද ඇගේ පුංචි මෝටර් රථය තුළට දමා ගත්තා ය. ලංකාවේදී කැළණි පන්සල් ගිය සිද්ධියක් මට සිහිවිය. ඉතාලි ජාතිකයින් රෝමයෙහි අභිමානය පිළිබඳව ආඩම්බර වෙති. මේ ගමනේදී සිල්වියා මහත් වූ උජාරුවකින් මට පැරණි රෝමය පිළිබඳව විස්තර කරන්නට ගත්තා ය. නමුත් එම ඉතාලි වචන වැඩි ප්‍රමාණයක් මට තේරුණේ නැත. ඒ හින්දම වතිකානුව අවට වන වෙළෙඳ සැලකින්,

The Reader's Place Novel

'ඇත්තටම රෝමයේ කෙල්ලෙක් වගෙයි අංශු'

සිල්වියා නැවතද කීවා ය. මම මුදු ලෙස හිනැහුණෙමි. කකුල් වලට හිර වන ලෙගින් එක හා ඉතා කෙටි සාය හැඳ බූට් සපත්තු පැළඳි වෙලාවක සංජුලද මදෙස බලා හිඳ ඔහොම කීවා මතක ය.

'එහෙම තමයි, රෝමෙට ගියහම රෝමන් වරයෙක් වගේ ඉන්න ඕන කියනවනේ' මම එවෙලේ එය විහිළුවකට ගතිමි. නමුත් සිල්වියාව එසේ විහිළුවකට ගත නොහැකි ය.

සිල්වියා පූජාවට සහභාගී වූයේ දැඩි භක්තියකිනි. රෝමානු කතෝලිකයන්ට වතිකානුව කියන්නේ පරම වටිනාකමක් ඇති පුදබිමකි. ඔවුන්ගේ ආගමේ කේන්ද්‍රස්ථානය එයයි. පාප් වහන්සේ වැඩ සිටින එපුදබිම වන්දනා කිරීමෙන් ජීවිතයට ආශීර්වාද ලැබේ කියා ඔවුහු විශ්වාස කරති.

වතිකානුවේ ඉහළම මහළ වෙත පිවිසෙන්නට මාර්ග දෙකක් වේ. එක්කෝ වට පිටගැටපෙළ ය. නැතහොත් විදුලි සෝපානය ය.

'අංශු පළවෙනි වතාවට ආපු නිසා අපි පඩිපෙළ දිගේ යමු. එතකොට තමයි වතිකානුවට ආවා කියලා දැනෙන්නේ'

'හා'

මම එකඟ වීමි. එම පිටගැට පෙළ දිවෙන්නේ කොතක හැඩැති වතිකානු බිත්තිය වටා ය. එය සැතපුම් කිහිපයක දුරකි. පියගැට පෙළ ඉතාම පටු ය. එක් අයෙකුට පමණක් එකවර පියගැට පෙළ නැගිය හැක. එහෙයින් එක්කෙනා පස්සෙ එක්කෙනා ලෙස ගමන් කළ යුතු වේ.

'මම්මාට අමාරුයි නේද පඩිපෙළ නගින එක'

බොහෝ දුරක් නැගීමෙන් පසු මම සිල්වියා වෙත නැඹුරු වී ඇසුවෙමි. ඇගේ වයසේ හැටියට මෙහෙම ගමනක් යන එක හොඳද කියා මා දන්නේ නැත. ඇයට කවර අසනීප තිබෙනවාද කියා මා දන්නේත් නැත. වතිකානුවේ පියස්සට නැගීම සඳහා මෙතරම් දුරකට යා යුතු බව මා දැන සිටියේත් නැත.

මම විදේශීය සංචාරකයන් වෙනුවෙන් මුද්‍රණය වූ, රෝම අගනුවර නමැති ඉංග්‍රීසි පොත මිලදී ගතිමි. රෝමයේ අතීත ශ්‍රී විභූතිය දැක බලා ගන්නට එන විදේශීය සංචාරකයන්ගෙන් අවට ප්‍රදේශය පිරී තිබිණ. ඉරිදා දේව මෙහෙය නිසා දේශීය වන්දනාකරුවන්ද වැඩි බව සිල්වියා පැවසුවා ය. ලංකාවේ පූජනීය ස්ථාන අවට සේම කුඩා වෙළඳසැල් රාශියක් වතිකානුව අවටද විය. ජංගම වෙළෙන්දෝද බොහෝ ය. කැරට්, බීට්, රාබු වැනි අල වර්ග වලින් අලංකාර මූර්ති කපන වයස්ගත නිර්මාණකරුවෙක්ද, ඕනෑම කෙනෙකුගේ රූපය එවෙලේම පැන්සල් රේඛා වලින් ඇඳදෙන චිත්‍ර ශිල්පියෙකු ද එතන සිටියහ. මම ඔවුන් දෙදෙනාගේම දක්ෂතා දෙස මදක් නැවතී බලා සිටියෙමි. සිල්වියා දේව මෙහෙයට සහභාගී විය යුතු බව සිහි වූ සැනෙන් මම ඒ තැන් වලින් නික්මුනෙමි.

'දවසක තනියම එන්න ඕනෙ. හෙමිහිට හැමදේම හොඳට බලා ගන්න'

'මං හිටියට කමක් නෑ. අංශු ඕන තරං වෙලාව අරගෙන බලන්න. අපිට ඔය මග කඩේකිං දවල් කෑම කන්නත් පුළුවන්නේ'

'පූජාව ඉවර වුනාම එහෙනං ඇවිදිමු'

'අංශු පොඩ්ඩක් ඉන්නකෝ'

තොප්පි වෙලෙන්දෙකු වෙත ගිය සිල්වියා අළුපාට ලස්සන රෙදි තොප්පියක් මිලදී ගත්තාය. එය හුරුබුහුටියි කියා මටත් සිතුණි. කුඩා බෝ එකකින් එහි දාරය සරසා තිබිණ.

'බලමු ලස්සනද කියලා'

සිල්වියා එය මගේ හිසෙහි පැළඳුවූවා ය.

'මේ මටද?'

'ඒම, ලස්සනයි. දැන්නං ඉතාලි කෙල්ලෙක් වගේමයි'

සිල්වියා ඒ පුද බිමේදීත් හඬනඟා සිනාසුණා ය. ඒ ඔවුන්ගේ හැටියකි. බොහොමයක් ඉතාලියානුවන් කතා කරන්නේ හඬනගාය. සිනැහෙන්නේද තැන නොතැන නොබලා උස් හඬිනි. ඉතා හෙමිහිට කතා කරන්නට පුරුදු වී සිටින මට සමහර වෙලාවට මෙය තරමක අපහසුතාවයක් දනවයි.

The Reader's Place Novel

'ටිකක් හති, මං ගැන බයවෙන්න එපා අංශු'

'මේක මෙච්චර දුර ගමනක් කියලා මං දැනං හිටියෙ නෑ'

'ලිෆ්ට් එකේ ආවාම ඔයාට මේ අත්දැකීම ලබන්න බෑ. තව ටිකයි. අපි යමු'

සැබවින්ම ඒ නම් මට අමතක නොවෙන අත්දැකීමකි. වතිකානු පියස්සට එළඹී විට මුළු ඉතාලියම එකවර දැකිය හැකි තරම්. මනහර දර්ශන කීපයක්ම මම මගේ ජංගම දුරකතනයේ ඡායාරූප ගතකර ගතිමි. වැඩිහිටි ඉතාලියානුවන්ගේ ආඩම්බරයජ් ය. මම සිල්වියා සමගිනුත් ඡායාරූප කිහිපයක් ගතිමි. අප දෙදෙනාගේ ඡායාරූප ගනිද්දී විදේශිකයෙක් කැමැත්තෙන්ම ඉදිරිපත් වී මගේ දුරකථනය ඉල්ලාගෙන අපේ ඡායාරූප ගෙන දුන්නේ ය. මගේ හදවත සතුටෙන් පිරී තිබිණ. මේ ඇත්තටම අංශුද? ලංකාවේ පොඩි ගෙදරක කුස්සියේ වැඩට හිර වී සිටි අංශු මන්තිකා පතිරණ මේ ද? අද ඇය මේ සිටින්නේ රෝම අගනුවරම එකවර පෙනෙන වතිකානුවේ ඉහළම පියස්සේ වග කෑ ගසා කියන්නට මට සිතිණ. ඇයව රැවටූ ඇයට පිටුපෑ අගේම ජාතිකයන්ට ඇහෙන්නට කෑ ගසා හිනැහෙන්නට අංශුට සිතීම ගැන පුදුම විය යුතුද?

මේ ගමනේදී වඩාත්ම මසිත් ගත්තේ දේව මැණියෝ ජේසු සමිඳුන්ව උකුලේ තබාගෙන හිඳින මයිකල් ආන්ජලෝ සිත්තරාගේ කිරිගරුඬ ප්‍රතිමාවයි. දේශගුණ විපර්යාස හා කැමරා කිරණ වලින් ආරක්ෂා වනු පිණිස එය වීදුරු කුටියක වැඩ හිඳුවා තිබිණ. මම බොහෝ වේලා ඒ මූර්තිය දෙස බලා සිටියෙමි. ජීවමාන රූ මිස මූර්තියක් කියා කෙසේ සිතන්නද? මරිය මවගේ මුහුණේ වන පෙම්බර මාතෘ ගුණය මරියතුමියට මිස මූර්තියකට උසුලාගත හැකි වන්නේද? එසේ නම් ඒ මූර්තිය මයිකල් ආන්ජලෝ ශිල්පියා විසින් ජීවමාන බවට පත්කොට තිබේ. චිත්‍ර ශිල්පියෙක් එසේ විය යුතු ය. මා සිටින්නේ කොතැනද? මට එතැනට ලංවෙන්නට - ගව් ගණනකින්වත් ලං වෙන්නට නොහැක්කේ ම ය. එහෙව් එකේ මරියෝ විසින් මාව ඔහුගේ හෝටලයේ චිත්‍ර ශිල්පිනයක ලෙස තෝරාගනු ලැබුවේ කිම? මා ඔහුට සාධාරණය ඉටු කර දෙන්නේ

කෙසේද? දේව මැණියනි, මට අනුකම්පා කළ මැනව. මට ශක්තිය දුන මැනව. මාරියෝ මවෙත තැබූ විශ්වාසය සුරැකීමට මා සවිමත් කළ මැනව. මම කිරිගරුඬ පිළිමය අභියස හිඳ සිතින් කන්තලව් කළෙමි. සත්තකින්ම මට සැනසීමක් සැහැල්ලුවක් දැනිණ.

වතිකානුව අසළ හෝටලයකින් කෑම කා අප යළි ගෙදර පැමිණියේ හැන්දෑවේ ය. රාත්‍රී ආහාරය පිණිස මම පියස්සේ වැනිස් කියා ඉතාලියානුවන් කියන වැනිස් හන්දියෙන් පිටිසා මිලදී ගතිමි. එළවළු මාළු පිණි ටිකක් මිලදී ගැනීමේ අවශ්‍යතාව දනුනත් ඒ සඳහා තරමක වෙහෙසකර බවක් දැනිණ. ඒ හින්දා මම ඒ කාර්ය පසුවට කල් දැම්මෙමි.

ඇඳට වැටී වෙහෙස නිවමින් සිටියදීත් හිතේ පත්ලෙන් මතුවී රබර් බෝලයක් සේ ඉහළට ආවේ දේව මැණියන් හා ජේසු සමිඳුන්ගේ කිරිගරුඬ පිළිමය ම ය. මෙය මනසට කෙතරම් කරදර කළේද යත් බැරිම තැන මම සිල්වියාගේ තට්ටු ඇඳෙන් බිමට බැස්සෙමි. සිල්වියා ගොරවමින් තද නින්දේ පසුවූවා ය. මගේ චිත්‍ර කාමරය වෙත ගිය මම පිළියෙල කොට තිබූ කැන්වස් එකක් මත එම ප්‍රතිමාවේ අනුරුවක් සටහන් කළෙමි. ඒ මුළුමනින්ම මයිකල් ආන්ජලෝ ශිල්පියාගේ ප්‍රතිමාවේ සිතුවම නොවේ. එය සමිත්හි සනිටුහන්ව තිබූ ආකාරය ය. රෑ මැදියමේ මට සුවසේ නෙතු පියවා ගත හැකි වූයේ එම රේඛා සටහන නිම කිරීමෙන් පසුවයි.

උදෙන්ම සිංහල කඩය වෙත ගිය මම අඩුපාඩුව තිබූ කුළුබඩු වර්ග සියල්ලම මිලදී ගතිමි. මට අවශ්‍ය ආකාරයට උයා - පිහාගෙන කෑමේ ඉඩකඩ හොඳටම ඇති බව ප්‍රත්‍යක්ෂ නිසා කුළුබඩු අපතේ යාදෝයි අනුමානයක්වත් නොවීය. පොළට ගිය මම බංග්ලාදේශ වෙළෙඳුන්ගෙන් බාස්මති සහල් හා පරිප්පුත්, සිංහල ක්‍රමයට පිසගත හැකි වෙනත් ආහාර වර්ග කීපයකුත්, මාළු හා කුකුළු මසුත් මිලදී ගතිමි. මේ ගමනේදී මම විශේෂයෙන් ම වටලප්පමක් සඳහා අවශ්‍ය අඩුම කුඩුම ටික එක්කාසු කරගතිමි. එවැනි රස කැමකට සිල්වියා මෙන්ම මාරියෝ ද කැමති වන වග මට විශ්වාස ය. මා ගෙදර පැමිණියේ අතින් කටින් බඩු මලු එල්ලාගෙන ය. සිල්වියා එයට නොමනාපය පළකළා ය.

The Reader's Place Novel

'අංශු මට කතා කළානං මාත් එනවනෙ. තනියම බඩු උස්සගෙන ආවෙ ඇයි?'

'එච්චර බරක් නෑ මම්මා ඊයෙත් ඇවිද්ද නිසා මම්මට මහන්සිත් ඇතිනෙ?'

මම මදහසක් පෑවෙමි. ඇය නොක්කාඩු බැල්මක් හෙළුවා ය.

'අපි ශ්‍රී ලාංකික නෙවෙයි තමයි. ඒත් ඉතිං දැං එක ගෙදරක එකටනෙ ඉන්නෙ. ඒක නිසා මෙහෙම ඉන්නකන්වත් අපි එක පවුලක අය කියලා අංශු හිතනවනං මං හරි කැමතියි'

මගේ ඇස් වලට කඳුළු පිරීගෙන ආවේ ය. ඒ කඳුළු අමාරුවෙන් පාලනය කරගෙන සිල්වියා වෙතින් සඟවාගන්නට මට උවමනාවක් නොවී ය. කඳුළු දෙපෙළක්ම කම්මුල් දිගේ නිදහසේ ගලාගෙන ගියේ ය. සිල්වියා මහත් දයාවකින් මදෙස බලාගෙන සිටියා ය. මම දෙඋරහිස් වෙතට ලං කොට කම්මුල් වල වූ තෙත පිසදාගතිමි.

'මට මේ කරුණාව දරාගන්න බැරිතරං මම්මා'

නොදනුවත්වම මා එසේ කියා තිබුනේ ඉතාලි භාෂාවෙන් නොව සිංහලයෙනි.

සිල්වියා ඇවිත් මහත් මාතෘ ගුණයකින් යුතුව මගේ හිස් මුදුන පිරිමැද්දා ය. ඇය එක සිංහල වචනයක්වත් දන්නේ නැත. නමුත් අප කවුරුත් මිනිස්සු ය. මිනිස් හැඟීම් අප කාටත් පොදු ය. භාෂාව කවරක් වුනත් අපට ඒවා දැනේ. මා සිංහලෙන් කී දේ ට සිංහල මළපොතේ අකුරක් නොදන්නා සිල්වියා සංවේදී වූයේ එනිසා නොවේයි කොහොම කියන්නද?

සියල්ලට පෙර මම වටලප්පම සාදා ශීතකරණයට දැමුවෙමි. අපේ ගෙදර දී මා කවරදාවත් වටලම්පම් සාදා ඇතිවා නොවේ. එය සාදන පිළිවෙල මා ඉගෙන ගත්තේ උසස් පෙළින් පසු කම්මැලිකම දුරු කරගනු වස් ගිය කේක් හා විශේෂ ආහාර වර්ග සෑදීම පිළිබඳ පන්තියේ දී ය. කරන්නට දෙයක් නැති කමට අනුන් එහිදී ය. කල්පගෙන් සේම ඒ ගිය පරිගණක පන්තියෙන්ද මට වූ යහපතක් නැත. නමුත් කිසි වැඩක් නොවේවියි සිතූ කේක් පන්තිය නිසා මෙහෙම දෙයක්වත් ජීවිතයට එකතු කරගන්නට මට හැකි විය. එක අතකට වරද පන්තියේ හෝ විෂයේ නොවේ. අප තුළ වන ඉලක්කයේ හෝ අරමුණෙහි ය.

සුසුමකින් හදවත නිවාගෙන මම දිවා ආහාරය පිළියෙල කරන්නට පටන් ගතිමි. ගෙදරදී යහමින් මිරිස් කන්නට මගේ දිව පුරුදු වී තිබුණද දැන් මා කෑම වලට මිරිස් දමනුයේ ඉතාම අඩුවෙනි. ඒ සිල්වියා හා මාරියෝ ගැන හිතා ය. මිරිස් ගතිය අඩු වූවා කියා මට දැන් ඒ කෑම කන්නට අප්පිරියා නැත. අනුන් වෙනුවෙන් අපේ ආශාවන් පාලනය කර ගැනීම, එය සතුටෙන් කරත් දී තෘප්තියක් මිස අතෘප්තියක් දනවන්නේ නැත. කැපකිරීම කියන්නේ එයට ය. ආශාවෙන් කැපකිරීම් කිරීම හදවතට උණුහුමකි.

'අද අංශු ඉන්නෙ ලොකු කල්පනාවක, වැඩි කතාබහකුත් නෑ'

නිහඬවම මා කෑම පිළියෙල කරනු බලා සිටි සිල්වියා අන්තිමට හඬ අවදි කළා ය.

'නෑ මම්මා. මට මගේ අතීතේ මතක් වුණා'

මම්මා ක්ෂණිකව පිළිතුරක් දුන්නේ නැත. නමුත් ඇය මගේ කතාව ගැන කල්පනා කරන බව මම වහා වටහාගතිමි. සිතුවා සේම ටික වේලාවකට පස්සේ ඇය ඒ ගැන සිය අදහස් ප්‍රවේශමෙන් පිටතට දැමුවා ය.

'අපි අපේ අතීතෙ මතක තියාගන්න ඕන තමයි අංශු. මොකද අතීතේ කියන්නේ ජීවිතේකට ඉස්කෝලයක් වගේ. ඒ වුනත් අතීතේ කඳුළු වලින් අපි අපේ අද දවසවත් හෙට දවසවත් බොඳ කරගන්න නරකයි'

ඇගේ කතාවෙහි කෙතරම් සත්‍යයක් තිබේද...? තවත් මම ඒ අතීතය නමින් කුමටනම් කඳුළු සලම් ද...? නමුත් සර්පයෙක් සැව හැර යන තරම් පහසුවෙන් කෙනෙකුට සිය අතීතය හැර යා හැකි ද? අතීතයෙහි ඡායා, සෙවනැල්ලක් සේ අප පසුපස නොඑන්නේද?

The Reader's Place Novel

'මං මාරියෝට කියන්නං අංශුව අද හෙටම හොටේල් එකේ වැඩට ගන්න කියන්න කියලා. එතකොට ඔය වැඩත් එක්ක පරණ දේවල් හිත හිතා ඉන්න කාලයක් ඉතුරු වෙන්නෙ නැතෙ.'

'මිස්ට මාරියෝ හිතන තරං හොඳට මං ඒ වැඩේ කරයි ද මන්දා'

'මොකද නැත්තෙ... කාලය තමයි ළමයෝ හැම ලෙඩේටම හොඳම බෙහෙත. කාලයට ඉඩ දීලා ඉවසන මිනිහා ජීවිතේ දිනනවා'

මාරියෝ දිවා ආහාර සඳහා පැමිණෙන බව සිල්වියාට දුරකතනයෙන් පවසා තිබිණ. ඒ නිසා කෑම පිසූ ගමන් අප කෑවේ නැත. උදේ බඩ පිරෙන්නටම කෑ නිසා සිල්වියාටද කුසගිත්තක් නොවීය. ඇය ආගමික පොතක් ගෙන කියවන්නට පටන් ගත්තා ය. ඒ අතරේ මම චිත්‍ර කාමරයට වැදී මරිය තුමියගේ හා ජේසු ස්වාමීන්ගේ සිතුවම තරමක් දුරට වර්ණ ගැන්වූයෙමි.

'මෙන්න මං ආවා'

මාරියෝගේ හඬ ඇසුණේ මා චිත්‍රයට සමවැදීගෙන සිටිය දී ය. මම පින්සල් හා වර්ණ පසෙක තබා ඉස්සරහට ආවෙමි. එවෙලේම සිල්වියා ද පිටතට පැමිණෙමින් සිටියා ය.

'මං ඒත් බැලුවා අද දෙන්නගේ හිනා සද්දෙ නැත්තෙ මොකද කියලා' මාරියෝට ඒ වෙනස දැනුණේ කෙසේද...?

'ආ... මොකද නැත්තෙ...? අංශු උයනකල් අපි හිනාවෙවී කතා කර කර තමයි හිටියෙ. ඔයා එනකල් මං පොතක් බලන්න ගියා. අංශුත් පේන්ටිං එකක වැඩ තියෙනවා කියලා ගියා'

අර්ධ සත්‍යයක් පවසමින් සිල්වියා මා පත් අපහසුතාවයෙන් මුදවා ගත්තා ය.

'එහෙමද...? ආ... ඔන්න මං අංශුගෙ ආට් ගැලරි එක ලස්සනට ඩිසයින් කෙරෙව්වා. තව දවස් දෙක තුනකිං වැඩ ඉවරවෙයි'

මාරියෝ මේසයට ඉඳගත්තේ අලුත් ආරංචියකුත් එක්ක ය. මට හුස්ම ගනන්ට බැරි තරම් විය. චිත්‍රයක් ඇඳීම සඳහා ස්ටෑන්ඩ්

එකක් ස්ටූල් එකක් තබා ගැනීමට තැනක් තිබෙනවා නම් මට ඒ ප්‍රමාණවත් ය. නමුත් මාරියෝ ඊට සුවිශේෂ ස්ථානයක් පිළියෙල කරවයි. ඔහු මා ගැන තබා තිබෙන බලාපොරොත්තු වල උස මට උහුලාගත හැකි වේවිද?

'අනේ... මට එහෙම විශේෂ තැනක් ඕන නෑ. ඔය පොඩි ඉඩක් තිබුණහම හොඳටම ඇති'

'එහෙම බෑ අංශු. හොඳ නිර්මාතයක් බිහිවෙන්න හොඳ පරිසරයකුත් තියෙන්න ඕන' ඔහු එය ඉතාලි භාෂාවෙන් කියා යළි ඉංග්‍රීසියෙන් ද කීවේ මට හොඳ හැටි වැටහෙනු පිණිස විය යුතුය.

'මේ දවස් දෙකතුනට අංශුගේ ඉතාලි දැනීම හොඳටම වැඩි වෙලා කියලා මටත් දැනෙනවා. ඇයි මගෙ වැඩේට ඉතාලියෙන් හවපව ගාන එකනෙ'

මාරියෝ මගේ ඉතාලි දැනීම ගැන සැක කළ නිසාදෝ එම සැකය දුරු කරවනු වස් සිල්වියා කීවා ය.

'ඒක හොඳයි, ආ.... තව එකක්, මං කැමතියි අංශුගෙං සිංහල භාෂාව ටිකක් ඉගෙන ගන්න. නිකමට කතාබහ කරන්න පුළුවං වෙන තරමට'

ඔහු මීට පෙරත් ඔය ගැන කීවාට මම ඒ තරම් ගණන් නොගතිමිග

'මං ඔයාට ඒකටත් සාධාරණ පඩියක් ගෙවනවා'

'අනේ... මං... මං... මං හිතුවෙ පඩියක් ගැන නෙවෙයි'

'මාත් ආසයි අංශුගේ භාෂාවට, ඒත් ඉතිං මේ නහින දෙහින කාලේ මට මොන භාෂා ඉගෙනිල්ලක් ද...?'

සිල්වියා කතාවට අරළු බුරුල් ක් කළා ය.

'අංශු වගේ කෙනෙක් ළඟින්ම ඉන්න ලැබිලා අපි ඒ ප්‍රයෝජනය ගන්න ඕනෙ. අනිත් එක... අංශුට ඉතාලියෙන් නොතේරෙන දෙයක් මට සිංහලෙං හරි එක්ස්ප්ලේන් කරන්න පුළුවං වුණොත් කොච්චර දෙයක්ද...?'

මාරියෝ හා සිල්වියා සතුටෙන් කිවි බිවි ගාමින් කෑම කන්නට

The Reader's Place Novel

වූහා, මා නම් හිටියේ කලබල වූ සිතිවිලි ඇතිවය. මේ කිසිත් මට විශ්වාස කරගන්න නොහැකි තරමට ය. මේ තරම් දේවල් මට දෙන්නට ඉරණම මාව මේ තරම් දුරු රටකට ගෙන ආවේ ඇයි? එසේම මව් බිමේදී බොහෝ දේ මට අහිමි විය. මුලින් ම මව් පිය සෙනෙහස හා රැකවරණය ද කෙළිලොල් ළමා කාලයක් ද මට අහිමි කරන්නට තරම් දෛවය කුරිරු විය. අයියාගේ බිරිඳ තනුජා නිසා ගෙදර ජීවිතය මට එපා වී ගියේ ය. කල්ප විසින් මගේ සියලු සිහින හා බලාපොරොත්තු උදුරාගෙන මාව අපේක්ෂා භංගත්වයට පත් කරවන ලදි.

මා ඉතාලිය බලා පැමිණියේ කීයක් හෝ උපයාගෙන අතීතයෙන් ඈත් වී ජීවත් වෙන්නට ය. සංජුල නිසා අත්විඳින්දා වූ සියලු සිද්ධීන් නිසා මම නැවත වරක් මගේ ජීවිතය ගැන භීතියටත් තැතිගැන්මටත් පත්වීමි. දරුවෙක් කුසට පැමිණීම මිහිමත වසන ඔනෑම ගැහැනියකට අසිරිමත් අත්දැකීමකි. නමුත් කුසට වැඩි දරුවාගේ පියාට තවත් දරු පවුලක් සිටින බව දැනගත් වෙලේ මම මෙලොව සිටින අවාසනාවන්තම ගැහැනුන්ගේ උපකුලකයට වැටුණෙමි. මගේ දරුවාගේ සුජාත පියා වන්නට ඔහු සූදානම් වූයේ නැත. සංජුල කීවේ රෝහල වෙත ගොස් දරුවාව ගබ්සා කරන්නට කියා ය. ඉතාලියේ දී ලංකාවේ මෙන් ඊට නීතියේ තහනමක් නැති බව ය. නමුත් අම්මා කෙනෙක් දරුවෙක් මරන්නේ කොහොමද? මා එහෙම කරන්නේ කොහොමද? මැරෙනවා නම් අප දෙදෙනාම එකට මැරිය යුතු ය. මෙට්‍රෝවට පැන ජීවිතයට සමු දෙන්න මා තීරණය කළේ ඒක ය. නමුත් කොහේදෝ සිට එහි පහළ වූ මාරියෝ නිසා මට ජීවිතයෙන් සමුගන්නට නොහැකි විය.

අද ඔහු මට සිය නිවසක නවාතැන් දී තිබේ. මා බලාපොරොත්තු නොවූ විදිහේ රැකියාවක් හා ගෞරවයක් ද ලබා දී තිබේ. ඒ අනුව අංගු මන්තිකා පතිරණ පුනරුත්පත්තිය ලබන්නේත්, ඇයට ඉරණම විසින් සියලු වරප්‍රසාද ලබා දෙන්නේත් ඉතාලියේ රෝම අගනුවරදී ය.

කෙසේ වෙතත් එම පෞරාණික අගනුවරදීම මගේ දරුවාගේ

ගබ්සා වූ සිද්ධිය මා තුළ මහත් වේදනාත්මක හැඟීමක් ඉතිරිකොට තිබේ.

'අද අංගුගේ කට ලොක් වෙලාද?'

මාරියෝගේ හඬ මට ඇසුණේ වෙනත් ග්‍රහ ලෝකයකින් සේ ය. මම තිගැස්සී පියවි ලෝකයට පිවිසියෙමි.

'අද උදේ ඉඳලම අංගු ඔහොමයි. මං මේ මාරියෝට කියන්න කියලයි හිටියේ. මේ ළමයට ඉක්මනට රස්සාවට එන්න කියන්න. එතකොට ඔය හිතේ තියෙන දුක තුනී වෙලා යයි'

මාරියෝ මා විනිවිද බැලුවා කියා මම සිතමි. ඔහුගේ බැල්ම මා මගේ දෑසින් කෙලින්ම දුටුවා නොවේ. එය මට දැනිණ.

'මට තව දවස් දෙකක් දෙන්න මම්මා. මේක මගේ හොටේල් එකේ මං අලුතෙන් හදපු පෝස්ට් එකක්

ඉතිං ඒකෙ වැඩ පටන් ගන්න ඕන ලස්සනට'

'මං ඔයාලා දෙන්නට හැමදාම ණයගැතියි'

'රටවල් දෙකක ඉපදුනාට අපි එකම ජීවිතයක් උරුම කරගත්ත මිනිස්සුනෙ ළමයෝ'

සිල්වියා සහ මාරියෝ දිවා ආහාරයත් වටලප්පමත් රස වින්දේ හැමතිස්සේම මා අගයමිනි. ඔවුන් වෙනුවෙන් එහෙමවත් දෙයක් කළ හැකි වීම මට සතුට දනවී ය. නමුත් දිගටම හදවතේ බරක් විය. ඒ බර කුමක් නිසා කුමක් අරබයා උපයන්නක්දැයි විටෙක මටම සිතාගත හැකි නොවිනි.

'ඔන්න අංගු මට සිංහල උගන්වන්න ඕනෙ'

යන්නට පෙර මාරියෝ ඉල්ලීමක සරිත් මවෙත නැඹුරු වී කීවේ ය.

'මට පුළුවං උපරිමයෙන් මං ඒක කරන්නං. හැබැයි ඒකට මට සල්ලි ගෙවන්න හදන්න එපා'

'ඇයි... ටීචිං කියන්නෙ ජොබ් එකක්නෙ'

'ඉතිං මම්ම මට ඉතාලි උගන්නන්නෙ සල්ලි අරගෙනද?'

'ඒකත් එහෙමද?'

The Reader's Place Novel

මා සෘජු ලෙස කතා කරද්දී මාරියෝ තරමක් පසුබා ගියාසේ ය. මට සිනහත් නැගිණ. ඔහුත් එක්ක මුහුණට මුහුණ එසේ කතා කරන්නට තරම් අද මා ශක්තිවන්තද?

'හැබැයි හොටේල් එකේදිනං ඔය ක්ලාස් එක කරන්න බෑ. මං මෙහෙට එන්නං අංශුට පහසු වෙලාවක'

'අපෝ... මට පහසු වෙලාවක් මොකද්ද? මිස්ට මාරියෝට ඕනෑම වෙලාවක මට පුළුවං'

ඔහු හිස වසා සිනාසී යන්නට ගියේ ය. සමහර වෙලාවට ඉරණම ක්‍රියා කරන්නේ කොයිතරම් පුදුම සහගත ලෙස ද කියා මම සිතුවෙමි. අද මා මේ සිටින තැන ගැන තවමත් මට සිහිනයක් සේ ය. ඔවුන් මට හමු වූයේ මගේ පෙර පිනකට විය යුතුය. ඔවුන් දෙදෙනා නොවන්නට අද වන විට මගේ දෛවය කොයිබට මා රැගෙන ගොස් තිබෙන්නට පුළුවන්ද? සංජුල මාව ගෙයින් දොට්ට දැමූ දා දෙවියෙක් වාගේ මාරියෝ නොපැමිණියේ නම් මා මේ රෝම අගනුවර ඉබාගාතේ ඇවිද යනු විනා කොහේ කියා යන්ටද?

මුළු හැන්දෑ වරුවත් රාත්‍රියෙන් කොටසකුත් ගත කර මම සිතුවම වර්ණ ගන්වා අවසන් කළෙමි. එය ඉතා උසස් මට්ටමේ සිතුවමක් නොවේ. නමුත් මම ඒ පිළිබඳව සෑහීමට පත් වුණෙමි. උදේ පාන්දරින් ම මා කළේ සිතුවම රාමුවකට ඔබ්බවා සිල්වියා වෙත පිළිගැන්වීම ය.

'මයිකල් ආන්ජලෝගේ ස්ටැච්‍යු එක නේද?'

ඇය දෙබැම රැළි නංවාගෙන මදෙස බැලුවා ය.

'ඒක නෙවෙයි. ඒක මතකෙ තිබුණු හැටියට පේන්ටින් එකක් කළා'

'අංශුට මේක හොඳ ගාණකට විකුණන්න පුළුවං'

'මං ඕක ඇන්දෙ විකුණන්න නෙවෙයි මම්මා'

'විකුණන්න නෙවෙයි? එහෙනං?'

'මම්මට තෑගි කරන්න. මට හිතුනා මම්මා ඕකට කැමති වෙයි කියලා'

'කැමතියි කියන්නෙ අංශු... මට කියන්න වචන නෑ. ඒත් මෙච්චර මහන්සි වෙලා කරපු පේන්ටිං එකක් මට නිකං දීලා කොහොමද?'

'ඔන්න ඔන්න මම්මා. ඔයා ඔච්චර ජීවිතේ ගැන දන්න කෙනා. සල්ලි වලට වඩා වටින කොච්චර දේවල් ජීවිත වල තියෙනවද? සල්ලි කියන්නෙ හැමදේම නෙවෙයිනෙ'

'එහෙනං මේක මගෙ කාමරේ බිත්තියෙ එල්ලන්න. හැමතිස්සෙම මට පේන්න'

මම මඳහසක් පෑවෙමි. සිල්වියා එවෙලේ හැසිරුනේ බෝනික්කෙක් තිළිණ ලැබූ කුඩා දැරියක සේ ප්‍රීතියෙනි.

'නෑ...නෑ... මේක වටින්නේ කාමරේට නෙවෙයි, සාලෙට ඇතුල්වෙන කොටම පේන බිත්තියට. එතකොට මේක අපේ ගෙදරට එන හැම කෙනාටම පේනවනෙ. හැම කෙනෙක්ම මේක ලස්සනයි කියයි. දේක වටිනාකම පේන්නෙ ඒක නියමිත තැන තිබ්බහම'

'අනේ මම්මා මේකට ඒතරං වටිනාකමක් දෙන්නනං එපා. මොකද... ඔයාලගෙ රටේ අයට මයිකල් ආන්ජලෝගේ ඔය ප්‍රතිමාව කටපාඩං තරම්නෙ. ඉතිං මේක පොඩි ළමයෙක්ගෙ උත්සාහයක් වගේ පේන්න බැරි නෑ'

'මාරියෝ කියනවා වගේ අංශු තමන්ගෙ වටිනාකම හරියට තේරුං අරං නෑ'

ඇණයකුත් මිටියකුත් ගෙන ආ සිල්වියා කුඩා මේසයක් මත නැගී මරියතුමියගේ සිතුවම සාලයේ මුහුණත් බිත්තියෙන් එල්ලන්නට සූදානම් වූවා ය. මම ඇය අතින් මිටිය ගෙන එම කාරිය කර දුන්නෙමි. සිතුවම එල්ලූ පසු සිල්වියා සාලයෙහි හැම තැනකටම ගොස් එතැන සිට සිතුවමෙහි හැඩ බැලුවා ය.

ඇත්තටම ඔවුන් දකින මගේ වටිනාකම කුමක්ද කියා මට පවා හරියට වැටහුනේ නැත. පුරා දශක දෙකක් මම මගේ මව්බිමෙහි ජීවත් වුණෙමි. එහිදී කිසිවෙකුත් මට මෙවන් වටිනාකමක් ලබා දෙන්නට ඉදිරිපත් වී නැත. සාමාන්‍ය පෙළ සඳහා චිත්‍ර විෂයට අධි සාමාර්ථයක් ලැබී තිබුණාට මම පවා ඒ ගැන ඒ තරම් නොසිතුවෙමි.

Reader's Place Novel

මට විශේෂ හැකියාවක් ඇතැයි මගේ චිත්‍රකර්ම ගුරුවරු පවා පවසා තැත. ඉතින් කලා පුරවරයක් වන ඉතාලියේ උපත් අය මගේ පින්සල් රේඛාවක දකින විශේෂත්වය කුමක්ද?

'මාරියෝ ඉල්ලයිද දන්නෑ මේ පේන්ටිං එකත්. මං දෙන්නෑ'

හැන්දෑවේ අප දෙදෙනා තට්ටු ඇඳෙහි තට්ටු දෙකේ වැතිරී කතා කරමින් සිටිත්දීත් සිල්වියා චිත්‍රය ගැන මතක් කළාය.

'මටනං මේක හීනයක් වගෙයි මම්මා'

මම එහෙම කෙඳිරුවේ සිතාමතා නම් නොවේ.

'ඒ කිව්වෙ?'

'මං ඉතාලියට ආවෙ ලංකාවෙ හිටියොත් මගේ අතීතෙ මට වද දීලා මාව ලෙඩෙක් කරයි කියන බයට. මං හුඟාක් දුරට ඉගෙන ගත්ත කෙනෙක් නෙවෙයිනෙ. මාව මෙහෙට එවන්න උදව් කරපු අක්කා කියපු විදිහට ගෙදරක වැඩක් හොයාගන්න තමයි මං හිතං හිටියෙ. ඒත් අන්තිමට මට සිද්ධ වුණේ හීනෙකින්වත් නොහිතපු දෙයක්'

'එහෙම තමයි අංශු. ජීවිතේ කියන්නේ අපි නොහිතන වෙලාවක අපි නොහිතන දේවල් දෙන දෙයක්. දුක වුණත් සතුට වුණත් එහෙමයි.'

'ඒකනං එහෙම තමයි. ලංකාවේදී මට මුණ දෙන්න සිද්ධ වුණෙත් මං නොහිතපු දුක් ගොඩකට. පුංචි දරුවෙක් කාලෙ ඉඳලම මං වින්දෙ දුක්මයි මම්මා'

ඇය හාරාවුස්සා කිසිවක් ඇසුවේ නැත. නමුත් මම මේ මොහොතේ මගේ කතාව ඇයට කියා ගැනීමේ සා පිපාසාවකින් පෙළුණෙමි. අම්මා ලංකාවෙන් පිටවී විදේශ රැකියාවකට ගිය දින සිටන් මට මුණ දෙන්නට සිදු වූ සියලු සිද්ධීන්, සංජුල නිසා ඉතාලියේදී අත්දුටු සිදුවීම තෙක් සියල්ල දන්නා ඉතාලියෙන් මම ඇයට විස්තර කළෙමි. පුදුමයකට වාගේ මගේ ඇස්වලට කඳුළු ඇවිත් තිබුනේ නැත.

'එහෙනං ඔයා ඒ පහුකරලා ඇවිත් තියෙන්නෙ දුෂ්කර කාලය අංශු. මේ ජීවිතේ ඔයාට සතුට දෙන්න පටං අරං තියෙන කාලය කියලා අපි හිතමු. මං හිතන්නෙ ඒක එහෙම වෙයි'

'මම්මාගෙයි මාරියෝගෙයි කරුණාවත්තකම මට මහමෙරක් වගේ. ඇත්තටම මට මේ වගේ ජොබ් එකක් හම්බවුනේ තැත්තං ඊළඟට ජොබ් හොයන්නත් මොන වදයක් විඳින්න වෙයිද කියන්න බෑනෙ'

'අපිව හෙම්බත් කරවල කරවලා දෙවියන් වහන්සේ අන්තිමට සැනීම දෙනවා ළමයෝ'

සිල්වියා දිගු සුසුමක් හෙළුවා ය.

'දෙවියන් වහන්සේ ඒ පරීක්ෂා කරලා බලන්නෙ අපි ශක්තිමත් ද කියලා වෙන්නැති. මමත් ඒ පරීක්ෂණයට මුහුණදීපු ගැහැනියක්නෙ'

ඊළඟට ඇති වූයේ දරාගන්නට බැරි නිහැඬියාවකි, දුකකි, බරකි. අපි දෙදෙනාත් වේදනාවෙහි තිත්ත රසය හදවතින්ම විඳිමිනි සිටියෙමු.

'අපි දෙවෙනි ලෝක යුද්ධෙ කටුක අත්දැකීම් ලබපු අය අංශු. අපේ ළමා කාලය යුද්ධෙත් එක්කයි බැඳිලා තිබුණෙ. පොඩි කාලේ ඉඳලම අපිත් ලොකු අය වගේ හරි හරියටම වැඩ කළා. ආයෙමත් රෝමෙ ගොඩ නැගීම තමයි අපි කාගෙත් හීතේ වුනේ. කොහොම හරි මං කසාද බැන්දෙත් හීන ගොඩක් එක්ක. හැබැයි බැන්දට පස්සෙ එයා ඒ හීන ලස්සනට පාට කළේ නැහැ අංශු'

හිත හයිය ගැහැනියක වගේ හැම වෙලේම කතා කළත් මේ වෙලාවේ සිල්වියාගේ උගුර හිර වුණා වගේ මට දැනිණ. ඒ අන්තිම වචන පිට වූයේ ඇගේ උගුර යටින් සේ ය. මම ඉක්මනට ඇඳේ උඩ තට්ටුවෙන් පහළට බැස්සෙමි. ඈ ළඟ වත පුටුවේ හඳගත්නා ගමන්ම සිල්වියාගේ අතකින් අල්වා ගතිමි. ඒ අත සීතලම සීතල වී තිබිණ.

'මම්...මා'

'එයා හරියට මට වෙනස්කම් කළා. කසාද බඳින්න කලිං හිටිය මිනිහා බැන්දට පස්සෙ යක්ෂයෙක් වුණා.'

'මම්මා අමතක කරලා හිටිය අතීතෙනෙ ඔය, හිත රිදෝගන්න වෙන එකේ ඔය ගැන කතා නොකර ඉමු මම්මා'

The Reader's Place Novel

මා එහෙම කිව්වේ අවංකවම ය. කෙතෙකුගේ දුක්බර කතාවකට සවන් දෙන කැමැත්තක් ඕනෑම කෙනෙකු තුළ වත්තේ ය. නමුත් සිල්වියාගේ දුක ඇවිස්සීමට මම සැබවින්ම නොකැමැති වීමි.

'ඇත්තටම මේ මං අයෙ කතා කරන්නෑ කියලා මගෙ පපුව යටම වලදාලා තිබුණ කතාවක් තමයි අංශු. ඒත් ඔයා වගෙ දරුවෙක්ට මං ඒක කියන එක හොඳයි. ඔයාගේ ජීවිතේට වුනත් ඒකෙන් ගන්න දෙයක් තියෙයි'

ජීවිතේට ගන්න දෙයක් තිබුණත් නැතත් ඇය දුකට පත් වෙනවා දකින්න බැරි කමක් මට දැනෙමින් තිබිණ. නමුත් ඇය අතීතාවර්ජනයේ යෙදෙන්නේ ඇගේ යටිහිතෙහි වන ආශාවක් තෘප්ත කර ගැනීමට ද කියාත් යළි මට සිතිණ.

'එයාටත් පොඩි හෝටලයක් තිබුණා. මේ මාරියෝගේ වගේ ලොකු එකක් නොවෙයි. මාත් ඒකෙ වැඩ කළා. ඒක අපේ බිස්නස් එකනෙ කියලා මං ඒක වෙනුවෙන් වගුරපු දාඩිය වල තිමක් නෑ ළමයෝ'

ඇය මොහොතක් නෙතු පියාන ඒ අතීතයට වී සිටියා ය.

'මං එහෙම හිතුවට එයා හිතන්න ඇත්තෙ මං එයාගේ වැඩකාරි කියලා වෙන්නැති'

සිල්වියාගේ අඳුරු බොරපැහැ දෙනෙත් පත්ලේ මම කඳුළක සිතල දුටුවෙමි. මගේ අතින් ඇගේ අතක් මිරිකී ගියේ ලෝකයේ කොතනක හිටියත් පිරිමින්ගේ අඩන්තේට්ටම් වලට රිදුම් ලබන පොදු ගැහැනු ගතිය නිසා වන්නට ඇත.

'එයා මට එහෙම තමයි සැලකුවෙ. හොටෙල් එකට එන කස්ටර්මස්ලා ඉස්සරහදී වුනත් නින්දිත විදිහට මට කෑගහලා බැන්නා'

'පුදුම මනුස්සයෙක්නෙ'

'දවසක් අපේ මම්මයි පප්පයි රෙස්ටොරන්ට් එකට ආවා. එවෙලෙ සෙනග ගොඩක් ඇවිත් හිටයෙ. කොච්චර වුනත් තමංගෙ මම්මයි පප්පයි කාලෙකිං දැක්කහම දුවෙකුට ටිකක් කතා නොකර

ඉන්න බැනේ. මේ මනුස්සයා අර ඔක්කොම මිනිස්සු ඉස්සරහ මට කෑ ගහලා බැන්නනෙ. මම එදා තමයි මගෙ පප්පගේ ඇස් වලට කඳුළු එනවා මුල්ම වතාවට දැක්කෙ'

දිගටම කතා කරගෙන ගිය සිල්වියා මදක් නති අරින්නට වූවා ය. හැත්තෑව දශකය ගෙවමින් සිටියාට ඇය කතා කිරීමෙන් හෝ සිනහවීමෙන් වෙහෙසට පත්වන්නියක නොවන බව මේ දින කිහිපය ට මම අත්දැක ඇත්තෙමි. මේ වෙහෙස, වසර ගණනාවකට පෙර සිදුවීද ඒ සිදුවීමේ වූ වෙහෙසකර මානසිකත්වය නිසා විය යුතු ය.

'කොයි දේට සමාව දුන්නත්, මගෙ පප්පගෙ ඇස් වලට දීපු ඒ කඳුළ මතක් වෙනකොට මට ඒ මිනිහට කවදාවත් සමාව දෙන්න බෑ අංශු'

එවර සුසුමක් හෙළුවේ ඇය නොව මා ය. ගැහැනියකගේ දුක වැඩියෙන් ම දැනෙන්නේ තවත් ගැහැනියකට කියා කතාවක් තියේ. ඒ සත්‍යයකි. ජාතියෙන් වෙනස් වූවාට, රටෙන්, ආගමෙන් වෙනස් වූවාට, භාෂාව වෙනස් වූවාට අපි දෙදෙනාම ගැහැනු වන්නෙමු. පිරිමින් සිතන්නේ ගැහැනුන් වනාහි උන්ගේ කෙළිබඩුයි කියාද? තමන් නිසා උරුම වන සියලු දුක්ඛ වේදනාවන් විඳ දරාගන්නට ගැහැනුන්ගේ හදවත් සූදානමින් තිබිය යුතුයි කියාද? දෙවිදිහකට වූවාට මා සේම සිල්වියා ද පිරිමින් ගේ වියරු - නපුරු මානසිකත්වයන් මත පීඩා විඳියවුන් වන්නෙමු. මෙලෙස ගැහැනුන් පීඩාවට පත්කිරීම පිරිමින්ගේ වියරු ආශාවක්ද? මේ වෙලාවේ මමත් සිල්වියාත් දෙදෙනාම එකම හදවතකින් බිඳී වෙන් වුණු කොටස් දෙකක් බවට පත්ව සිටියෙමු.

'මාරියෝ නිසා මං ඉවසුවා තමයි'

ඒ නම් ලාංකික ගැහැනුන්ගේ කතාවක් කියා මම සිතා සිටියෙමි. දරුවන් වෙනුවෙන් සැමියන්ගේ සියලු නොහොබිනාකම් ඉවසන්නේ ලාංකික හෝ ආසියාතික ගැහැනුන්යැයි මම සිතා සිටියෙමි. බටහිර රටවල එවැන්නක් වන බව මා කොහෙත්ම සිතා සිටියේ නැත. නමුත් මව්වත්කම කියන්නේ ආසියාවට සේම

The Reader's Place Novel

බටහිරට ද පොදු කැක්කුමක් බව මේ වෙලාවේ සිල්වියා මට පසක් කරවමින් සිටියා ය.

'හැබැයි මට ඉවසන්න පුළුවං වුනේ එයාට තවත් ගෑනු ඉන්නවා කියලා ආරංචි වෙනකල් විතරයි'

කකුල් දෙක ළඟම බෝම්බයක් පුපුරා ගියා සේ මම තිගැස්සී ගියෙමි.

'මේ ආරංචිය ලැබුන වෙලාවේ අර අහිංසක මට මොනවා වුනාද මන්දා. මං ඒ මිනිහා එක්ක මරාගන්න ගියා. වෙනදට සිංහයා වගේ කඩං පනින එකා එදා බල්ලෙක් වගේ වල්ගෙ කකුල් දෙක අස්සේ ගහගෙන පස්ස ගැහුවා. මං හිටියෙ ආවේස වෙලා. තමං කසාද බැඳලා ඉන්න මිනිහා ආදරේ කරන්නෙ වෙන ගෑනියෙක්ට කියලා දැනගත්තාම කොයි ගෑනිද කොටි දෙනක් නොවෙන්නෙ?'

ඉතාලියානු භාෂාවෙන් අපේම රටේ ගැහැනියක සිය දුක්බර ජීවිත කතාවේ අද්දෝනාව කියනවා සේය මට ඇසුනේ. මගේ හදවත ඉරිතලා දෙදරා ගිහින් තිබිණි. ඒ ගැහැනියක වෙනුවෙනි. ගැහැනුකම වෙනුවෙනි. මීට වසර දහස් ගණනකට පෙර කුවේණියට විජය නිසා සිදු වූ අසාධාරණය ගැන කියවද්දීත් මේ පීඩනය හදවත හිර කළා මතකය. එසේනම් මේ සියවස් ගණනක් තිස්සේ පිරිමින් විසින් ගැහැනුන්ට කරනු ලබන දේ ය.

කල්පත් මාව රැවටීය, සංජුලත් එය කළේ ය. ඔහුගේ මිතුරා ද එසේ කිරීමට හැදුවේ ය. පිරිමින් අරබයා පුදුම කෝපාග්නියක් මගේ ළය පත්ලේ සිට බුරා නැගී ආවේ ය. එහෙව් මිනිසුන් විසින් හපකොට ඉවත ලන ලද මගේ ජීවිතය මරණීය ඛේදවාචකයෙන් මුදවාගත් ගැලවුම්කරුවා මාරියෝ මට සිහිවූයේ ඊළඟ නිමේෂයේ ය.

ලෝකය වූ කලී සම්මිශ්‍රණය කි. හොඳ මිනිසුන් සේම නරක මිනිසුන්ද මේ මිහිමත වෙසෙති. මම හිත සන්සුං කරගත්නට උත්සාහ කළෙමි.

'අත්තිමට මං හිතුවා දික්කසාද වෙන්න. කංකෙඳිරි ගගා

මිනිහා මාරියෝට නඩත්තු ගෙව්වා. දික්කසාදෙං පස්සෙ මාත් ටැක්සි ඩ්‍රයිවර් කෙනෙක් විදිහට රස්සාවක් කළා. මට දැනුණෙ නිදහසක් ළමයෝ'

ඇය නිදහස් හුස්මක් ගත්තා ය. පිරිමින්ට සේම නිදහස් නිවහල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය හා හැකියාව ගැහැනුන්ටත් තිබෙන්නේ ය. ගැහැනුන් එය වටහා නොගන්නා තාක් කල් පිරිමින්ට ඔවුන්ව තැලිය හැක. පෙළිය හැක.

'මං අංශුටත් කියන්නෙ...ඔයාගෙං මං මගෙ තරුණ කාලෙ දුකපු නිසා.. අපි අපිව හොයාගත්තහම ජීවත් වෙන්න හරි පහසුයි'

'ඒක ඇත්ත මම්මා'

'අපිව පාගලා චප්ප කරන්න හදන මිනිස්සුන්ට පෙන්නන්න ඕනේ අපේ දුර්වලකම නෙමෙයි ළමයො. අපේ ශක්තිය'

'ඈම්'

'අංශුට දැං ඒකට අවස්ථාව ලැබිලා තියෙනවා. ඒක මට ලැබුනට වඩා හොඳ අවස්ථාවක්'

'ඔව් මම්මා'

'දවසක ඔයා ඔයාගෙ රටට යන්න ඕනෙ එහෙං ආපු අංශු විදිහට නෙවෙයි. මැරිලා ඉපදුණු අලුත් අංශු කෙනෙක් විදිහට. ඔයාට ඒකට හොඳටම කාලේ තියෙනවා. අනිත් එක.... මං වගේ ළමයෙක් එක්ක තනිවුන ගැහැනියෙක් නෙවෙයිනෙ ඔයා. ලස්සන පවුල් ජීවිතයක් කියන්නෙ මේ ලෝකේ වටිනාම තැග්ග. ඒක දෙවියන්ගෙ තැග්ගක් අංශු'

සිල්වියා නෙතු පියාගත්තා ය. තවත් මද වේලාවක් නිහඬව අද දෙස බලා සිටි මම හෙමිහිට ඇඳේ උඩ තට්ටුවට නැග ගතිමි. රාත්තල් ගණනක බරක් හදවත මත පැටවී තිබිණ. මමත් සිල්වියා සේම නෙතු පියවා ගතිමි. නමුත් අප දෙදෙනාටම නින්ද ගියා කියා නම් මම නොසිතමි.

The Reader's Place Novel

09

ජීවිතය මන සමහර අසිරිමත් දේවල් සිදුවෙන්දී සිහිනයක් සැබෑ වූවා සේ යැයි අපි කියමු. නමුත් මට නම් මේ සිදුවීම අරබයා එසේ පැවසිය නොහැක. මන්දයත් මා එහෙම හීනයක්වත් නොදුටු නිසා ය.

මා වෙනුවෙන් මාරියෝ තනා තිබුණේ වීදුරු මාළිගාවකි. ඊට එසේ නොකියා වෙන කොහොම හඳුන්වන්නද?

'අංශු එන්න. මේක තමයි ඔයාගෙ ආට් ගැලරි එක'

මාරියෝ මාව එහි කැඳවූයේ එහෙම කියමිනි. තිගැස්මෙන් යුතුව මම වටපිට බැලුවෙමි. මේ ඉතාලියෙහි මගේ මුල්ම රැකියාවයි. පාපන්දු ක්‍රීකඩයන්ගේ ඇඳුම් සේදීමේ හා ආපනශාලාවක සුළු රැකියාවක් කොට පෙර මා මුදල් උපයා ඇති වූවත් එය ස්ථිර රැකියාවක් නොවේ. ඉතාලියට එන විදේශිකයන්ට මෙහිදී ප්‍රධාන ආයතන වල රැකියා ලැබෙන්නේ නැත. මන්දයත් ඔවුන් සියලු කටයුතු කරන්නේ ස්ව භාෂාවෙන් වන හෙයිනි. ඒ නිසා විදේශිකයන් නිතරම වාගේ යෙදෙන්නේ කම්කරු හෝ ගෘහස්ථ සේවයේ ය. නමුත් ලංකාවේදී මෙන් මෙහිදී එය මදිපුංචිකමක් වන්නේ නැත. ඒ ඉතාලිය තුළ තත්ත්වය තරාතිරම ගැන සැලකිලිමත් නොවන හෙයිනි. දොස්තර මහතාත් කම්කරුවාත් සමාන ය. දොස්තර මහතාට රෝගියා මහත්තයා යි කියනවා සේම දොස්තර රෝගියා කවරෙක් වුනත් මහත්මයා හෙවත් 'සිංඥෝරේ' යන වදනින් ඔහු අමතයි. එම සමාජය තුළ කවුරුත් සමාන ය.

සමානාත්මතාවය ප්‍රධාන දේශපාලනයයි. විදේශිකයන්ට ද සේම ස්වදේශිකයන්ට එසේ ය.

ඉතින් එහෙම එකේ අංශු මන්තිකා පතිරණට මේ ලැබුණ අවස්ථාව සුවිශේෂීව් කක් නොවන්නේද...? ඉතාලියෙහි නොව ලංකාවේදීවත් මට මෙහෙම රැකියාවක් කරන්නට ලැබේයැයි මම කොහොත්ම නොසිතුවෙමි.

'ඇයි අංශු... හොඳ මදිද මෙතන...?'

මාරියෝ කරුණාබර මෘදු ස්වරයකින් මා විමසී ය. මම මගේ දෑසින් පුළුවං තරම් කෘතගුණ පූර්වක බව දරාගෙන ඔහු දෙස බැලුවෙමි.

'අනේ, මේක මට ඉහටත් උඩිං'

මා එහෙම කීවේ සිංහලයෙනි.

'මෙච්චර දෙයක් මං බලාපොරොත්තු වුනේම නෑ. මාරියෝට මං කොහොම ස්තුති කරන්නද මන්දා'

ඔහු සිහින්ව සිනාසී මගේ හිස් මුදුන මෘදු ලෙස ස්පර්ශ කළේ ය.

'එහෙමනං මට සතුටුයි'

මම වටේ ඇවිද බැලුවෙමි. ඉතාමත් ලස්සන පරිසරයක ගොඩනංවා තිබුණ දෑවැන්ත හෝටලයේ එක් නිදහස් කොනක, තනිකරම වීදුරු බිත්ති වලින් ඒ ශාලාව ඉදිකොට තිබුණේ ය. හාත්පස දිස් වූයේ මනහර දර්ශනයකි. චිත්‍ර අඳින්නට ඊට වඩා හොඳ තැනක් මේ ලෝකයේ වෙන කොතනකවත් තිබෙන්නට පුළුවන් ද?'

'අංශුට ඕන හැම දෙයක් ම වගේ මට තේරෙන විදිහට මං මෙතනට ගෙනෙල්ලයි තියෙන්නෙ. ඊට අමතරව තව මොනවා හරි ඕනනං මට කියන්න. කිසිම හේතුවක් නිසා නොකියා ඉන්න එපා. තේරුණා ද?'

තාත්තා කෙනෙකු සේ ආදරබර කරුණාවන්තකමින් ඔහු

The Reader's Place Novel

මගේ මූණට එබිණී. මම දෙතොල් තෙරපාගෙන සිතහව මා තුළම සිකට්ගතිමි.

'අංශුට සයින් කරන්න ඩොකියුමන්ට්ස් වගයක් තියෙනවා. මේ ආයතනය ඔයාගෙ අයිතිවාසිකම් ඔක්කොම ලබලා දෙන්න ඒවායෙං එකඟ වෙනවා. අංශුට හොඳ සැලරි එකකුත් අවශ්‍ය කරන නිදහසත් මම ලෑස්ති කරලයි තියෙන්නෙ'

'තෑන්ක් යූ'

'බීසී වුණා කියලා... අපිට රස කෑමක් දෙන්න බැරි වෙන එකක් නෑ නේද?' ඔහු පොඩි දරුවෙකු සේ අවංක බවින් යුතු විහිළුවක් කළේ ය. ඔහු වෙනුවෙන් පිළියෙල කරගෙන ආ කිරිබත් මට සිහිවූයේ එවිටය. මම ඉක්මනට අත් බෑගයෙන් කිරිබත් දැමූ කෑම පෙට්ටිය ගෙන මාරියෝ අත තැබුවෙමි.

'මොනවද?'

'කිරිබත්'

'ඕ... කිරිබත්'

ඔහු ප්‍රීතියෙන් පිනාගොස් 'කිරිබත්' කියන වචනය පැහැදිලි සිංහලෙන් ම කිවේ ය. මට මහත් සතුටක් දැනිණ. විදේශිකයෙක් වරදමින් වුව තමන්ගේ භාෂාවෙන් වචනයක් කියත් දී හදවතට උණුසුමක් දැනෙන්නේ ය. එය වෙන කිසිදු හේතුවක් මත හදකට නොදැනෙන සංවේදනයකි.

'අද උදේට කිරිබත් හැදුවද...?'

'ඔව්, ලංකාවේදී අපි ඕනම විශේෂ සිදුවීමක දී කිරිබත් උයනවා. සුභ කටයුත්තකදී තමයි. ඉස් ඉස්සෙල්ලම ජොබ් එකකට යනකොට අනිවාර්යෙන්ම උයනවා. ඉතිං මම උදේම නැගිටලා ඉව්වා'

'කොච්චර ෂෝක් ද...? එහෙනං... අංශුට නිදහසේ පේන්ටිං එකක් ගැන හිතන්න ඉඩ දීලා මං යන්නං'

මාරියෝ එසේ කුටියෙන් නික්ම ගියේ වචනයෙන් පහදා

කිව නොහැකි බැතිබර බවක් ඔහු වෙතුවෙත් මගේ සිතේ ගොඩ ගසා දමා ය. ඔහු කොයිතරම් දේවල් සිත්‍ය බලාද, මේ කුටිය නිර්මාණය කර තිබෙන්නේ...? ඇතින් පෙනෙන තිල් කඳු යායකි. බැලූ බැලූ අත හරිත වර්ණය තවරාගත් තැරැ ලත්‍ය ය. කුටිය තුළ ගෙදරක තරම් නිදහස් බවක් වේ. සිතුවම් අඳින ස්ටෑන්ඩ් එක හා ස්ටූල් එකට අමතරව කුඩා ලියන මේසයක් හා කැරකෙන පුටුවක් ද, පසෙක සුවබර සෝපාවක් ද තබා තිබේ. යාබද තවත් තාත්ත කාමරයක් ද කෑම කන්නට වෙනම කුඩා කොටසක් ද වේ. ඒ කොතනත් හරි නිස්කලංක ය. චිත්‍ර අඳින්නට නොව කවියක් ලියන්නට මට සිතිණ.

හදවත කොතරම් බරව තිබිණි ද යත් මම සෝපාව මත හිඳ ගතිමි. ඇස් දෙකෙන් හෝ කඳුළු ගලන්නට පටන් ගත්තේ ය. මම කොහොම ඒ කඳුළු පාලනය කරන්නෙමිද? කුමට මම ඒ කඳුළු හිරකරන්නෙමිද? ඇස් දෙකට ඕනා වී තිබුණේ නිදහසේ ඇති තරම් හඬන්නට ය. ඉතින් මම ඒ කඳුළට ඉඩ දුන්නෙමි. නමුත් මා හඬන්නේ කිමදැයි මටම තේරුනේද නැත. මම කඳුළු වල අරුත් සොයන්නටද නොගියෙමි.

ඇස් වලට ඇති තරම් හැඬුවාට පස්සේ මම නාත කාමරයට ගොස් මූණ සෝදාගෙන ආවෙමි. කුඳුළුත් එක්ක හිතේ බරද බොහෝ දුරට දියවී ගොස් තිබුණාසේ ය. මම චිත්‍ර පුවරුව මත හිඳ ගතිමි. කදිමට සැකසූ කැන්වස් එකක් ඒ මත විය. ඒ අස්සෙන් මට මැවී පෙනුනේ මගේ ගෙදර ය. පරණ චිත්ත ගවුමක් ඇඳගත් අංශු දැරිවියක කාලයේ දී දූලි කුණු පෙරාගෙන කුස්සියේ දර ලිපේ උයනවා මට මැවී පෙනිණ. ඊළඟට ක්ෂණිකව තනුජා මසිතට පිවිසියා ය. දරුවන් හතර දෙනෙකුත් එක්ක ඇය දැන් තනිවම ගෙදර කටයුතු බලා කියා ගන්නවා ඇත්තේ කෙසේද...? ඒ දවස් වල නම් මම ළමයින්වත් බැලුවෙමි. තනුජා කරන්නේ වැඩ කරනවාට වඩා කරන්න ඇති වැඩේ ගැන කන්කෙඳිරිගාමිනි - පැමිණිලි කරමින් සිටින එක ය. රෙදි සෝදන්නට ඇති වෙලාවට නිතර රෙදි කිළිටි කිරීම ගැන ඇය නොවරදවාම දරුවන්ට බැණ වැදුනාය.

The Reader's Place Novel

'ඉන්නවනෙ මං මෙතන රදා ගැනි වගේ හෝද හෝද ඉත්ත. ඇඳ ඇඳ දාපල්ල. මෙයාකාර ඇන්දෙ මොකාගේ මඟුල් ගෙදරට ද දන්නෑ. පරණ පවක් ගෙවනව මං' ඇගේ මුවින් ඔය වදන් පෙළ පිට නොවී තියෙන්නේ නැත.

මගේ මුවගට සිනාවක් ඇවිත් නැවතිණි. ඉස්සර තම් ඇය බැන්නේ මට ඇහෙන්නටය. මට වදින්නටත් එක්ක ය. දැන් එහෙම කරන්නවත් කෙනෙක් නැත. එහෙමය කියා ඇය තනියම හෝ ඔය බැණ අඬගෑම කරගෙන යන බවටද සැකයක් නැත. ඒ ඇගේ පුරුද්ද වන නිසා ය.

සමහර විට දරුවන් හතර දෙනා දැන් පස් දෙනෙක් වී සිටින්නට ද බැරි නැත. තනූජා බඩදරු වී සිටිනවා මගේ මනස ඉදිරියේ ඇඳී මැකී ගියේ ය. ඇයත් අපේ මාමාගේ බිරිඳත් අතර වෙනසක් නැත. මොන අඩුපාඩු තිබුණත් ළමයින්ගෙන්නං කිසිදු අඩුපාඩුවක් නැත. එකෙක් බිම තියන්නත් කලින් තව එකෙක් බඩට ගෙන තිබේ.

අයියාගේ පැටවුන් ටික මේ වේලාවේ මොනවා කරනවා ඇත්ද? දැන් ඔවුන්ට ඔවුන්ගේ නැන්දාව අමතකව ගොස් ඇතුවා වන්නටද පුළුවන.

'රට ගියහම නැන්දට අපිව අමතක වෙයිද දන්නෙත් නෑ පුතේ'

මා ශ්‍රී ලංකාවෙන් නික්මෙන්නට පෙර තනූජා දරුවන්ට එසේ කීවා මට මතක ය. සැබවින්ම ඉතාලි ආවාය කියා මට ඔවුන් අමතක වූවා නොවේ. නමුත් මෙහිදී මුහුණ දෙන්නට වූ සිදුවීම් අතරේ මට ඔවුන් ගැන සිතන්නට කාල වේලාවක් වූයේත් නැත. මා ලංකාවට දුරකථනයෙන් කතා කළේත් දෙවතාවක් පමණකි. මුලින්ම ආ බව කියන්නට ය. ඊට පසු රෙදි සෝදා ලැබුණ මුදලකින් බංග්ලාදේශ ජාතිකයෙකුගේ කම්යුනිකේෂන් සෙන්ටර් එකකට ගොස් විනාඩියක් කතා කළෙමි. මට තිබුණ ආර්ථික හා අනෙකුත් ප්‍රශ්න දන්නේ මා පමණකි. නමුත් ඔවුන් සිතනවා ඇත්තේ මා ඔවුන්ව අමතක කළා කියා ය. පඩිගත් පසු

අයියාගේ බැංකු ගිණුමට මුදල් ටිකක් යැවිය යුතුයැයි මම සිතා ගනිමි. පුංචි එවුන්ට වටිනා දෙයක් අරගෙන දෙන්න කියා පැවසිය යුතු ය.

පෙනහළු වල පිරුණු සුසුමක් වීදුරු කුටිය උණුසුම් කරමින් බැහැර විනි. මගේ අතේ වූ පැන්සල කැන්වස් එක මත කඩිසර ලෙස රේඛා කීපයක් සනිටුහන් කරන ලදි. වැලි මිදුලක බිම ඉදගෙන පොල්කටු වලින් සෙල්ලම් කරන පඩිපෙළ වගේ පැටවුන් හතර දෙනෙකු කැන්වස් එකෙන් මතු වී ආවේ ය. ඔවුන්ගේ මූණු වල නාවර ය. ඇඳ සිටියේ ජංගි කොට පමණකි. ඒද වැඩිමල් දරුවන් තිදෙනා ය. බාලයා නිරුවතින්ම සිටියේ ය. ඔවුන්ගේ ශරීරයන් හඬ ගා කීවේ වැඩෙන්නට අවශ්‍ය පෝෂණය තමන්ට නොලැබෙන බව ය.

අඳුරු දුඹුරු පැහැති සායමෙන් ඒ ශරීර කුඩු වලට පණ දෙන්නට මම සටනක් කරමින් සිටියෙමි. අත් සේම හිතද වේගවත්ව ක්‍රියා කළේ ය. මට කාලයත් වෙලාවත් යනවා නිතව්වත් නොවී ය.

'ෂා, ෂා, ෂා... නියමයි... නියමයි'

මා පිටුපසින් මාරියෝගේ හඬ සවන ළඟින්ම ඇසිණ. මම වහා පින්සල් පහර නවතා ඔහු දෙස හැරී බැලුවෙමි.

'අංශු ලන්ච් ගන්න නැතුව ඇති නේද...?'

'ආ... නෑ. එච්චර වෙලා ගියා ද? මට දැනුනෙවත් නෑ'

'එහෙනං අංශුත් මං වගේ තමයි. වැඩකට බැස්සාම වැඩේ ගැන මිසක් වෙන දෙයක් ගැන මෙලෝ සිහියක් නෑ. මාත් මේ දැනුයි බඩගින්නක් දැනිලා වෙලාව බැලුවෙ. දෙකහමාරත් පහු වෙලා ළමයෝ'

'ඇත්තද...?'

'අපි කෑම ටිකක් කාලා ඉමු අංශු. සමහර දවස් වලට මං එළියට ගිහිං තමයි කන්නෙ. ඒත් අද ඔයා මුලිංම ආපු දවසනෙ. ඒකනිසා මං කිව්වා අපි දෙන්නට ලන්ච් රෙඩි කරන්න කියලා'

The Reader's Place Novel

'අනේ මං නිසා තවත් කරදර වෙන්න එපා'

'හෝටලේක අයිතිකාරයෙක්ට කියන කතාවක් ද ඔක?'

මාරියෝ හඬනගා හිනැහිණ. සිල්වියා තරම් දොඩමළු නොවුනත් ඇගේ සිනහව ඔහුටත් පිහිටා තිබෙන බව මම සිතයටින් සිතුවෙමි.

'අංශුව කට්ටියට අඳුන්නලා දුන්නෙත් නැනෙ. මං කියලා තියෙන්නෙ ඔයා ලංකාවෙන් ආපු මගෙ විශේෂ අමුත්තෙක් කියලා'

'මගේ පේන්ටිංස් දැක්කහම ඒගොල්ලෝ මාරියෝට හිනාවෙයිද දන්නෑ'

'ඒගොල්ලෝ ඔයාගේ පේන්ටිංස් දැකලනෙ තියෙන්නෙ. චිත්‍ර ශිල්පිනිය පුංචි කෙල්ලක් කිව්වහම ඒගොල්ලො පුදුම වුණා. දැක්කහම තවත් පුදුම වෙයි.

එය එසේම සිදු විය.

'අපි හිතං හිටියෙ මේ වගේ චිත්‍ර අඳින කෙනෙක් මැදි වයස පහුකරලා ඉන්න ඕනි කියලයා'

මාව හඳුන්වා දෙත්දී කෙට්ටු උස තරුණ පාට පිරිමියෙකු එසේ පැවසී ය. අනික් අය හිස සලමින් සිනහ වූහ.

'ඔයානං ලස්සනයි, ඇත්තටම ඇත්තටම ලස්සනයි'

යුවතියක එසේ පැවසූ විට නැවතත් පිරිස සිනහ වෙන්නට ගත්ත. මාරියෝ හඬනගා හිනැහුණි.

'අංශු කාම ඉතාලි භාෂාව හොඳටම දන්නේ නෑ. ඒක නිසා ඕගොල්ලො කවුරුත් එයාට සහයෝගය දෙන්න ඕනෙ.'

ඔහු සිය සහෝදර සේවකයන්ගෙන් ඉල්ලීමක් ද කළේ ය. ඔවුන් නැම කෙනෙක්ම සතුටින් එම ඉල්ලීම පිළිගත් බව පෙනිණ.

මාරියෝ මා වෙනුවෙන් විශේෂ ඉතාලියානු ආහාර වේලක් මේසයට ඇනවුම් කර තිබිණි. ඔහු මට සංග්‍රහ කළේ ඉතාමත් සතුටෙනි.

'හැමදාම මං අංශුගේ කෑම රසවිඳලා එන එකේ.....ඔයාට හොඳ ඉතාලි කෑම වේලක් දෙන එක මගෙ යුතුකමනෙ'

මා නිසා ඔහු කරදරවී වැඩී යැයි පැවසූ විට මාරියෝ කීවේ ය.

'තව මේ හරියෙ හොඳ රෙස්ටොරන්ට් කීපයක්ම තියෙනවා. චීන, ජපන්, අරාබි අවන්හල් එහෙමත් කීපයක් තියෙනවා. මං අංශුව ඒවට එක්කගෙන යන්නංකො'

'මට මම්මා කිව්වා මාරියෝ එක එක රටවල කෑම රස විඳින්න හරි කැමතියි කියලා'

'අපොයි ඔව්. අවස්ථාවක් ලැබුණොත් මං කාලා බලනවාමයි. මේ රෝමෙ ඉතිං හුගාක් රටවල්වල අවන්හල් තියෙනවනෙ. හැබැයි ඒ කිසිම රටක කෑම වලට වඩා මං කැමති අංශුගෙ ශ්‍රී ලාංකික කෑම වලට'

'මාරියෝ එහෙම කියන එක මට ආඩම්බරයක්'

'අංශු දැන් ඉන්නෙ සතුටෙං නේද?'

ඔහු උන්හිටි ගමන් ඇසූ මා කොහෙත්ම බලාපොරොත්තු නොවූ ප්‍රශ්නය නිසා ක්ෂණිකව මා කැළඹී ගිය බව සහතික ය.

'නෑ මං ඇහුවෙ. මං ඔයාව මුලිං දැකපු දෙතුං වතාවෙදිම ඔයාගෙ මූණෙ තිබුණ දුක්බර ගතිය දැං නැති නිසයි.'

'ඇත්තටම ඒ දවස් වලනං... මං ජීවිතේ එපා වෙච්ච ගාණට හිටියෙ'

'මං ඇහුවෙ මේ දවස් ගැන'

'ඔයයි... මම්මයි නිසා මට ආයෙත් ජීවත් වෙන්න බලාපොරොත්තුවක් ඇති වෙලා. පහුගිය දවස් ටිකේ ම මම්මා මට කිය කියා හිටියෙ එයාට මූණ දෙන්න වෙච්ච ප්‍රශ්න ගැන. ඒවගෙං මාත් හිත හයිය කරගන්න ඕන කියලා එයා කිව්වෙ'

'අපි කාටත් වටිනාකමක් තියෙනවා අංශු. අවාසනාවකට අපි ඒ වටිනාකම තේරුං ගන්නෙ නෑ'

The Reader's Place Novel

'මට වටිනාකමක් දුන්න නං ඒ ඔයා. ඒක මට මගෙ රටේදිවත් ලැබුලා තිබුණෙ නැති වටිනාකමක්'

මාරියෝ හඬ නගා හිනැහිණ. මා කීවේ නොගැලපෙන කතාවක්දැයි මම නැතිගතිමි.

'ඒක මට ආඩම්බරයක්'

ඉහළට ඇදගෙන උන් හුස්ම මා සිරුවට පහළ හෙළුවේ එවිට ය.

'කොහේ හරි කොතනකිං හරි ජීවිතේ ආයේ පටං ගත්ත එකයි වැදගත් අංශු. දැං ඒකට ඔයාට අවස්ථාවක් ලැබිලා තියෙනවා'

'ඔව්'

'මට කරන්න පුළුවං ඕනම දෙයක්....අංශු වෙනුවෙං මං කරනවා'

ඒ නම් සංසාරගත නෑකමක බැඳීමක් විය යුතු ය. කෙසේ වෙතත් මගේ හදවත සංවේදනා රාශියකින් බර වීගෙන ආවේ ය. එහි දුක ද සතුට ද කැළතී තිබිණ. ඇත්තටම අනුකම්පාවද හුදෙකලා නොවීමේ සැනසීම ද තිබිණ. අසරණකමද සරණක් ලැබීමේ හයියද විය. ඔහුට ස්තුති කරන්නටවත් බැරි තරමට මගේ උගුර ගොලු ගැසී ගියේ ය.

නමුත් සමහර වෙලාවට නිශ්ශබ්දතාවය මහා හඬක් නංවන්නේ ය. මේ වෙලාවේ මගේ නිහැඬියාවේ කුළුගැන්වී තිබුණ දහසකුත් එකක් හඬගා කීම් ද ඔහු මැනවින් කියවාගන්නට ඇත.

ප්‍රමාද වී ඒ එළඹියේ මගේ ජීවිතයට එතෙක් පැමිණ නොතිබූ වසන්තයදැයි මම නොදනිමි. මාරියෝ මට හැම සැප පහසුකමක්ම කාර්යාලය තුළදී සළස්වා දුන්නේ ය. ඔහු දිනපතා මා එහි පැමිණිය යුතුයැයි බලාපොරොත්තු නොවුනේ ය. මා කැමති නම් සිල්වියාගේ නිවසේ සිට වුව මට සිතුවම්කරණයේ නිරත විය හැකි විය. මා කැමති වෙලාවක හෝටලය වෙත යන්නට ද මා රිසි වෙලාවක ඔෆිස් එකින් නිකම ගෙදර යන්නට ද ඔහුගෙන් කහනමක් නොවී ය.

'හොඳ නිර්මාණ බිහිවෙන්නනං නිර්මාණකාරයාට හොඳ මානසික නිදහසක් ඕනෙ'

ඒ පිළිබඳව මාරියෝ කීවේ එහෙම කතාවකි. සැබවින්ම මානසික නිදහස නම් මට අපමණව ලැබිණ. වෙලාවකට මට සිතුණේ මා වෙනත් ආයතනයක රැකියාවක් කරනවා කිය නොව ස්වයං රැකියාවක යෙදෙනවා වාගේ ය. ඒ මානසික නිදහස තුළ මා වැඩි වැඩියෙන් මගේ රටට සම්බන්ධ සිදුවීම් මැවී පෙනෙන්නට ගත්තේ ය. ආයාසයකින් තොරව ඒවා මගේ සිතුවම් වලට වස්තු බීජද සපයා දුන්නේ ය. වතාවක් මම ගැබ්බර තනූජා අමාරුවෙන් දර පලන දර්ශනයක් චිත්‍රයට නැගුවෙමි. එක් අවස්ථාවකදී, අම්මාගෙන් ලියුමක් එන තෙක් ගෙයි පඩිය උඩ මග බලා සිටින මගේම ළමා විය මගේ අතින් චිත්‍රයට නැගිණි.

'අංශුගේ චිත්‍ර වල තත්වෙ එන්න එන්නම උසස් වෙනවා. ඒ ගැන මට හරි සතුටුයි අංශු'

දවසක් මාරියෝ එහෙම කීවේ ය. ඔහුගේ මූණේ අවංක සතුටක් විය. අන්තර්ජාතික ජයග්‍රහණයක් අත්පත් කරගත් ශිෂ්‍යාවක් වෙනුවෙන් ගුරුවරයෙකු තුළ ඇති විය හැකි චිත්ත ප්‍රීතිය එය විය යුතු ය. මම සන්සුන්ව ඒ උතුම් මිනිසා දෙස බලා සිටියෙමි.

'ඇයි.. ඔයාට සතුටු නැත්ද?'

'මං අද කොතනක හරි තැනක ඉන්නවනං..... ඒකෙ අයිතිකාරයා මං නෙවෙයි මාරියො, ඔයා. ඒක නිසා මගෙ සතුටත් අයිති ඔයාටම තමයි'

'එහෙම කියන්නෙපා. මේක ඔයාගේ ටැලන්ට් එක'

'මගේ ඇඟ ඇතුළෙ එහෙම හැකියාවක් තිබුණයි කියලා මං වුනත් දැනගෙන හිටියෙ නෑ. ඔයා ඒක දකිනකල්'

'අංශු මට එච්චර ගෞරවයක් දෙන්න හදන්නෙපා'

ඔහු එහෙම කීවාට ඒ ගෞරවය මා ඔහුට නොදී වෙන කාට නම් දෙන්නද? 'දෙයක් වේනම් යම් සුදුස්සාටම අයිති විය යුතු' කියා සිංහල කියමනක් වන්නේ ය. ඒ අනුව මේ ගෞරවය අත්පත් විය යුත්තේ ඔහුටම ය.

The Reader's Place Novel

ඒ දවස්ටික, කණස්සල්ලෙන් බරව තිබූ මගේ ජීවිතයට අලුත් සතුටක් ද රැගෙන ආවේ ය. අපේ 'සිංහල පන්තිය' මා බෙහෙවින් ම ප්‍රීතිමත් අවස්ථාව ය. මාරියෝ මා හිතුවාට වඩා වේගවත් ව හා දක්ෂ ලෙස සිංහල වචන අල්වා ගත්තේ ය. නිතර කතාබහ කිරීමේ දී අවශ්‍ය වන සිංහල වචන ටික මුලින්ම මම ඔහුට කියාදෙන්නට පටන් ගතිමි. මා ඉතාලි භාෂාව ඉගෙනගත් සිංහල - ඉතාලි පොත, ඉගැන්විය යුතු මාර්ගය අවබෝධ කරගන්නට මට අත්පොතක්ම විය.

'සිංහල භාෂාව හරි ලස්සනයි. අංශු සිංහල කතා කරනකොට හරි හුරුබුහුටියි'

මා මාරියෝට සිංහල උගන්වත්දී බලාගෙන සිටින සිල්වියා කියන්නී ය.

'මං කතාකරද්දී නෙවෙයි..... සිංහල කියන්නේ කොහොමත් ලස්සන උච්චාරනයක් තියෙන භාෂාවක්. සිංහල භාෂාවත් සිංහල අකුරුත් ලෝකයේ හුගාක් භාෂා වලට වඩා පොහොසත් කියලා භාෂා විශාරදවරු කියනවා මං අහලා තියෙනවා'

'ඒකනං ඇත්ත, අංශු කියලා දෙනකොටත් මට ඒක තේරෙනවා. සිංහල භාෂාව ඉගෙන ගන්නකොට වුණත් හරි පැහැදිලියි. එක එක ස්වරයට වෙන වෙනම අකුරු තියෙනවනෙ. ඒක පොහොසත් භාෂාවක ලක්ෂණයක්.'

මාරියෝට බොහෝ විෂයන් පිළිබඳව ඇසූ පිරූ තැන් තිබුණේ ය.

'හරි වැඩේ තමයි, දැන් ඔය දෙන්නා සිංහලෙන් කතා කරනකොට මට කට ඇරගෙන බලා ඉන්නයි වෙන්නේ'

සිල්වියාගේ කතාවට අපි සියලු දෙනාම එක්ව සිනහවුණෙමු.

මට කිසි අඩුපාඩුවක් තිබුණේ නැත. කිසිදු තනිකමක් දැනුනේ ද නැත. සිල්වියා හා මාරියෝ නිසා එහෙම පිටින් ම ජීවිතය පරිපූර්ණ වූවා සේ දැනිණ. කෙසේ වෙතත් මම ඉඳහිට අම්මාට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

'අංශු ඔහොම සතුටෙන් ඉන්න එක මට සැනසීමක්'

මා සතුටෙන් වග කටහඬින් ම හැඳිනගෙන දෝ අම්මා කීවා ය. මම කිසිවක් කියන්නට නොගියෙමි. අම්මා ගැන හිතේ කේන්තියක් වූවා නොවේ. නමුත් අම්මා කෙනෙක් වශයෙන් ඇය දරුවන් ගැන සැලකිලිමත් වූවා මදිය කියා මම සිතමි. ගෙදර තිබුණු ආර්ථික ප්‍රශ්න නිසාවෙන් විදේශගත වන්නට ඇය ගත් තීරණය සාධාරණ බව මමද පිළිගනිමි. නමුත් ඒ ප්‍රශ්න මදක් ලිහිල්ව ගිය ඉනික්බිතිවත් ලංකාවේ නතර වෙන්න ඇයට උවමනා වූයේ නැත. තාත්තා වෙන අඹුවක සොයා ගැනීමත්, අයියා අඩු වයසින් විවාහ වීමත්, මා කල්පට මුලා වීමත් කියන ඛේදවාචකයන් තුනම සිදු වූයේ අම්මා අප අසළ නොවූ නිසා ය. මවකගේ ඇස් - බැල්ම - රැකවරණය ගෙදර බිත්ති අතරේ නොවූ නිසා ය.

මා මේ උත්සාහ කරන්නේ අපට වැරදුනේ අම්මා නිසා කියා ඇයට චෝදනා කරන්නට නොවේ. නමුත් අපට මෙහෙම නොවිය යුතුව තිබුණයි වේදනාවක් හදවතේ කොතනක හෝ තිබී ඉඳහිට මට හමු වේ.

'අර ළමයව දැං ඉතිං අමතක කරලා දාන්න. ඔහොම තමයි සම්බන්ධකං ඇති වෙනවා නැති වෙනවා. ඔයාට ගැලපෙන කෙනෙක් ආයෙ හම්බවේවි' අම්මා ඒ අනාගත වාක්‍යයද නිතරම කීවා ය.

'මං දැන් ඕවා ගැන හිතන්නෑ'

මට ඒ කතාව වදයක් වූ නිසාම මම දවසක් කීවෙමි.

'එහෙම කියලා කොහොමද ළමයෝ. කාලෙත් එක්ක ඕවා අමතක වෙලා යයි. එහෙම කෙනෙක් හම්බ වුන දවසට ඔයා මට කියන්නකෝ. අපි ඔයාගෙ කටයුතු ටික ලස්සනට කරමු'

ගිය වතාවේ අම්මා ලංකාවට ආවේත් මගේ කටයුතු ලස්සනට පිළිවෙලක් කර යන්නට ය. මොන අඩුපාඩුව තිබුණත් අම්මා කෙනෙක් වශයෙන් ඇගේ හිත තුළ එහෙම හීනයක් තිබීම ගැන කිසිත් කිව නොහැකි ය. අම්මා දැන් වෙනත් පිරිමියෙකු සමග ජීවත් වෙනවායි කොයාගෙන් හරි කියනි මම එහි

The Reader's Place Novel

ඇත්ත නැත්ත ගැන සොයන්නට තබා සිතන්නටවත් නොවෙහෙසෙමි. ඒ, එවන් අත්දැකීම් වලට ළමා වියේ සිටම මුහුණ දී ඇති බැවිනි. එහෙම අත්දැකීම් නිසා පමණටත් වඩා මගේ ළපටි හිත රිදවාගෙන ඇති බැවිනි. අම්මාගේ පෞද්ගලික ජීවිතය කෙබඳු වී ද ඇයට සිටින එකම දරුවන් දෙදෙනා අයියා හා මා ය. අයියාගේ විවාහයක් දකින්නට ඇයට නොහැකි විය. ඉතින් අම්මා මාව මනාලියක් කිරීමට සිහින දකීම අහිංසක ආශාවකි. කෙසේ වෙතත් ඇගේ ආශාවට පන දෙන්නට මේ දුවණිය අවාසනාවන්ත වූවා වැඩි ය.

මම පුළුවන් තරම් ඔය දේවල් ගැන නොසිතා ජීවත් වන්නට උත්සාහ කළෙමි. එසේ නම් මගේ මේ සතුට ද මතුපිටින් පමණක් දකිය හැකි පැලැස්තරයක් ද කියා මට නොසිතුණා නොවේ. නමුත් මට ඒ මතුපිට පැලැස්තරයට රිසිවිමි. එය ගලවා දමා නිරිඳරාදේ හදවත දුකට පත් කරන්නේ කුමට ද...? ඇතුළාන්තයෙන් දුක්වෙවී හිඳිනු වෙනුවට එසේ නොකොට මතුපිටින් හෝ සතුටු විමේ ඇති වරද කුමක් ද...?

මාරියෝට සිංහල ඉගැන්වීමෙනුත්, ඔහු හා සිල්වියා වෙනුවෙන් ශ්‍රී ලාංකික කෑම වර්ග පිළියෙල කර දීමෙනුත් හදවතේ කොතනක හෝ කොනක් තෘප්තිමත්ව තිබිණ. ඒ ගෙදරදී නිරායාසයෙන්ම මා ගෘහනියක බවට පත් වූවා සේ ය. ටික දවසක් යන විට ශ්‍රී ලාංකික සේම ඉතාලි කෑම පිසීම ද මටම පවරා ගතිමි. මා එයින් බලාපොරොත්තු වූයේ ඉතා දිගු ජීවිත කාලයක් වෙහෙසට පත්ව සිටි සිල්වියාට මද හෝ විවේකයක් ලබා දීමයි. ආහාර පිසීම පමණකුදු නොව ගේ දොර අස්පස් කිරීම හා නාන කාමර සේදීම, පිරිසිදු කිරීමද සිදු වූයේ මගේ අතිනි.

'මේ ළමයා වැඩ කරන්නෙ හරියට අපේ ගෙදරට ආපු මේඩ් කෙනෙක් වගෙයි මාරියෝ. ඒක මගේ හිතට ටිකක් හොඳ නෑ'

මා ගෙදර වැඩපල කිරීම ගැන මට කනිපින්දන් කියා පලක් නොවුණ විට සිල්වියා මාරියෝට පැමිණිලි කළා ය. ඒ අප රාත්‍රී කෑම මේසයෙහි හිඳ කරවල තෙල් දමා, පරිප්පු හොදි හා පොල් සම්බෝල සමග බත් කමින් සිටියදී ය. මාරියෝ ක්ෂණිකව නෙතු විදහා මදෙස බැලුවේ ය.

'මේ ගෙදර වැඩ ටික මට මහලොකු දෙයක් නෙවෙයි. මම්මා දැං විවේකෙං ඉන්න ඕන කාලේ. ඒකයි මං මම්මාට වැඩිය වැඩපල කරන්න දෙන්නෙ නැත්තෙ'

මම ඉක්මන් කොට නිදහසට කාරණා කීවෙමි.

'එහෙනං මං ගෙදර වැඩට කවුරු හරි ගන්න ලෑස්ති කරන්නං'

'අනේ එපා මාරියෝ'

'ඔව් ඒක නොඳයි මාරියෝ'

මාත් සිල්වියාත් දෙදෙනාම අපේ අදහස් ප්‍රකාශ කළේ එකටම ය. ඊළඟට අප දෙදෙනාම මුහුණට මුහුණ බලාගෙන හිනාවුණෙමු.

'අංශුත් චිතු ඇඳලා මහන්සි වෙලානෙ එන්නෙ. ඒ ඇවිත් උයනවයි ගේ මොප් කරනවායි, බාත් රූම් හෝදනවායි.'

'ඔවා ඉතිං ඕනම ගෑනු කෙනෙක් ගෙදරක කරන වැඩනෙ මම්මා. මේක එහෙ ගෙයක් නෙවෙයි තමයි. ඒත් මං ඉන්නකල්... මට ඒවා කරන්න පුළුවං'

'මම්මා කියන එක ඇත්ත. අංශු දැං මහන්සි වෙනවා වැඩියි. අපේ ගෙදර වැඩට ගෑනු කෙනෙක්ව හොයා ගමුකෝ'

'කිව්වහම අහන්නකෝ... මට මහන්සියක් නෑ. මං මේව කරන්නේ ආසාවෙං. හැබැයි ඔන්න ගෙදර වැඩට කෙනෙක්ව ගන්නවනං මං වෙන තැනක් හොයාගන්නවා නවතින්න'

'පේනවා නේද... මේ කෙල්ල හරි මුරණ්ඩුයි'

සිල්වියා මගේ කණ මිරිකා ආදරණීය තරවටුවක් කළා ය. ලංකාවේ ගෙදරදී මා කළ වැඩ වල හැටියට මේවාත් වැඩ ද කියා මම තනිව හිතුවෙමි. යුවතියක වන්නටත් පෙර දැරියක සන්දියේ සිටම මම මහ ගෑනියක් සේ මුළු ගෙදරම වැඩ කළෙමි. අපේ ගෙවල් මෙම ගෙවල් මෙන් සුවපහසු ඒවාද නොවේ. ඉව්වේ දර ලිපේ ය. දර පලාගත යුතු විය. ඊටත් වඩා අප්‍රසන්න දෙය නම් දැලි

The Reader's Place Novel

ඇත්ත නැත්ත ගැන සොයන්නට තබා සිතන්නටවත් නොවෙහෙසෙමි. ඒ, එවන් අත්දැකීම් වලට ළමා වියේ සිටම මුහුණ දී ඇති බැවිනි. එහෙම අත්දැකීම් නිසා පමණටත් වඩා මගේ ළපටි හිත රිදවාගෙන ඇති බැවිනි. අම්මාගේ පෞද්ගලික ජීවිතය කෙබඳු වී ද ඇයට සිටින එකම දරුවන් දෙදෙනා අයියා හා මා ය. අයියාගේ විවාහයක් දකින්නට ඇයට නොහැකි විය. ඉතින් අම්මා මාව මනාලියක් කිරීමට සිහින දැකීම අහිංසක ආශාවකි. කෙසේ වෙතත් ඇගේ ආශාවට පන දෙන්නට මේ දුවණිය අවාසනාවන්ත වූවා වැඩි ය.

මම පුළුවන් තරම් ඔය දේවල් ගැන නොසිතා ජීවත් වන්නට උත්සාහ කළෙමි. එසේ නම් මගේ මේ සතුට ද මතුපිටින් පමණක් දකිය හැකි පැලැස්තරයක් ද කියා මට නොසිතුණා නොවේ. නමුත් මට ඒ මතුපිට පැලැස්තරයට රිසිවීමි. එය ගලවා දමා නිරපරාදේ හදවත දුකට පත් කරන්නේ කුමට ද...? ඇතුළාන්තයෙන් දුක්වෙවී හිඳිනු වෙනුවට එසේ නොකොට මතුපිටින් හෝ සතුටු වීමේ ඇති වරද කුමක් ද...?

මාරියෝට සිංහල ඉගැන්වීමෙනුත්, ඔහු හා සිල්වියා වෙනුවෙන් ශ්‍රී ලාංකික කෑම වර්ග පිළියෙල කර දීමෙනුත් හදවතේ කොතනක හෝ කොනක් තෘප්තිමත්ව තිබිණ. ඒ ගෙදරදී නිරායාසයෙන්ම මා ගෘහනියක බවට පත් වූවා සේ ය. ටික දවසක් යන විට ශ්‍රී ලාංකික සේම ඉතාලි කෑම පිසීම ද මටම පවරා ගතිමි. මා එයින් බලාපොරොත්තු වූයේ ඉතා දිගු ජීවිත කාලයක් වෙහෙසට පත්ව සිටි සිල්වියාට මද හෝ විවේකයක් ලබා දීමයි. ආහාර පිසීම පමණකුදු නොව ගේ දොර අස්පස් කිරීම හා නාන කාමර සේදීම, පිරිසිදු කිරීමද සිදු වූයේ මගේ අතිනි.

'මේ ළමයා වැඩ කරන්නෙ හරියට අපේ ගෙදරට ආපු මේඩ් කෙනෙක් වගෙයි මාරියෝ. ඒක මගේ හිතට ටිකක් හොඳ මදි'

මා ගෙදර වැඩපල කිරීම ගැන මට කනිපින්දන් කියා පලක් නොවුණ විට සිල්වියා මාරියෝට පැමිණිලි කළා ය. ඒ අප රාත්‍රී

සම්බෝල සමග බත් කමින් සිටියදී ය. මාරියෝ ක්ෂණිකව මෙතු විදහා මදෙස බැලුවේ ය.

'මේ ගෙදර වැඩ ටික මට මහලොකු දෙයක් නෙවෙයි. මම්මා දැං විවේකෙං ඉන්න ඕන කාලේ. ඒකයි මං මම්මාට වැඩිය වැඩපල කරන්න දෙන්නෙ නැත්තෙ'

මම ඉක්මන් කොට නිදහසට කාරණා කීවෙමි.

'එහෙනං මං ගෙදර වැඩට කවුරු හරි ගත්ත ලෑස්ති කරන්නං'

'අනේ එපා මාරියෝ'

'ඔව් ඒක හොඳයි මාරියෝ'

මාත් සිල්වියාත් දෙදෙනාම අපේ අදහස් ප්‍රකාශ කළේ එකටම ය. ඊළඟට අප දෙදෙනාම මුහුණට මුහුණ බලාගෙන හිනාවුණෙමු.

'අංශුත් චිත්‍ර ඇඳලා මහන්සි වෙලාතෙ එත්තෙ. ඒ ඇවිත් උයනවයි ගේ මොප් කරනවායි, බාත් රූම් හෝදනවායි.'

'ඕවා ඉතිං ඕනම ගෑනු කෙනෙක් ගෙදරක කරන වැඩතෙ මම්මා. මේක එහෙ ගෙයක් නෙවෙයි තමයි. ඒත් මං ඉන්නකල්... මට ඒවා කරන්න පුළුවං'

'මම්මා කියන එක ඇත්ත. අංශු දැං මහන්සි වෙනවා වැඩියි. අපේ ගෙදර වැඩට ගෑනු කෙනෙක්ව හොයා ගමුකො'

'කිව්වහම අහන්නකෝ... මට මහන්සියක් නෑ. මං මේව කරන්නේ ආසාවෙං. හැබැයි ඔන්න ගෙදර වැඩට කෙනෙක්ව ගන්නවනං මං වෙන තැනක් හොයාගන්නවා නවතින්න'

'ජේනවා නේද... මේ කෙල්ල හරි මුරණ්ඩුයි'

සිල්වියා මගේ කණ මිරිකා ආදරණීය තරවටුවක් කළා ය. ලංකාවේ ගෙදරදී මා කළ වැඩ වල හැටියට මේවාත් වැඩ ද කියා මම තනිව හිතුවෙමි. යුවතියක වන්නටත් පෙර දැරියක සත්දියේ සිටම මම මහ ගෑනියක් සේ මුළු ගෙදරම වැඩ කළෙමි. අපේ ගෙවල් මෙම ගෙවල් මෙන් සුවපහසු ඒවාද නොවේ. ඉව්වේ දර

The Reader's Place Novel

කුණු හැම තැනම ගෑවීම ය. අපේ ගෙයි බිම සිමෙන්ති දමා තිබුණත් නමට විතර ය. බිම පුරා පදාස පිටින් සිමෙන්තිය ගැලවී පොළොව පෑදී තිබේ. ඉතින් කොයි වෙලාවේත් ගෙයි දූවිලි ය. ගෙදරට තිබුණේ පරණ වී කැඩී බිඳී ගිය ලී බඩු කිහිපයකි. අම්මා රට ගිය පසු අපට අලුත් බඩු කිහිපයක් ලැබුණත්, මේ ගෙවල් වාගේ ලස්සනට ටයිල් කොට, පැන්ට්‍රි කබඩ් ගසා, අලුත් පන්නයේ විද්‍යුත් මෙවලම් සහිත නිවසක මේ මා සිටියා ම ය. මෙහෙම ගෙදරක වැඩ කිරීම අපහසු නැත. කම්මැලිත් නැත. ඊටත් වඩා මේ අය මට තමන්ගේ කෙනෙකුට සේ සළකත්දී මා ගෙදර වැඩක් පලක් කරන එක පවක්ද?

'අංශු කවදාහරි ඉතිං ලංකාවට යනවා නේද කියලා හිතෙනකොටත් මගෙ හිතට වාවන්නෑ. කවදාහරි මං මැරිච්ච කාලෙක අංශු එහෙ ගියොත් තමයි හොඳ'

සිල්වියා පැවසුවේ කවදාකවත් මා ඇගේ බලාපොරොත්තු නොවූ කතාවකි. කොහොම බලාපොරොත්තු වන්නද? මගේ අම්මාටවත් ඒ විදිහට මාව ළඟ තබාගන්න උවමනා නොවී ය. ඇය මුලින්ම රට රස්සාවට ගොස් ලංකාවට ආ වේලේ 'ආයේ යන්න එපා' කියමින් අම්මාගේ ඇගේ එල්ලීගෙන මම හැඬුවෙමි.

'නොගිහිං බැනෙ අංශු. ඕගොල්ලන්ට ලස්සනට ඉන්න පිළිවෙලක් කරලා දෙන්න එපැයි'

අම්මා එහෙම කියා මා සැනසුවා ය. ඇගේ දෑස් දිළිසෙනවා මම දුටුවෙමි. සමහර විට ඒ ඇස් වලට කඳුළක් පුරා වන්නට ඇත. නමුත් අම්මා එය අපෙන් සඟවා ගත්තා ය. හඬා දොඩා දුක පෙන්වූවා නම් සමහර විට අම්මාට යන්නට බැරි වෙන්න තිබිණ. එය එසේ වේවියි මුල සිටම දැනගෙන අම්මා එලෙස සිත දැඩි කරගෙන උන්නා වන්නට පුළුවන.

නමුත් මා වෙනුවෙන් සිල්වියා මගේ අම්මාටත් වඩා හදවත විවෘත කළා ය. ඒ හින්දාම මට දරාගත නොහැකි වන්නට ඇත. මම එහෙමම මේසයෙහි හිස හොවා ගතිමි. වක්කඩ කැඩුවා සේ

උත්සාහයක්වත් නොගැනීමි. එහෙම කරන්නේ කුමකටද? මා නැඹිය යුතු ය. මේ වාවගන්නට බැරි දුක කඳුලක් කොට දියකර හැරිය යුතුම ය.

'අංශු'

විනාඩි කීයකට පස්සෙද මන්දා මට සිල්වියාගේ වෙව්ලුම් ස්වරය ඇසිණි. මගේ හිස් මුදුනේ රැඳුණු අත ඇගේ බව උණුහුමින් ම මට සිතාගත හැකි විය.

'අංශ-ව අඬවන්න නෙවෙයි මං එහෙම කිව්වෙ. මට අමතක වුණා... ආසියාවේ ගෑනුංගෙ හිත් බටහිර අපේ හිත් වලට වඩා ළාමකයි කියලා'

මම හිමිහිට හිස එසෙව්වෙමි. මගේ දෙකොපුල් කඳුළින් තෙත්බරව තිබෙන්නට ඇත. මාරියෝ මගේ වත දුටු සැනෙන් නිගැස්සී ඉවත බලා ගත්තේ ය.

'දෙවියන් වහන්සේ මට සමාව දෙන්න ඕනෙ. මේ කෙල්ලව මේ තරං ඇඬෙව්වට'

මම සිනාවක් නගා ගතිමි. ඒ, ඔවුන් කිසියම් පසුතැවිල්ලකට පත්ව තිබෙනවා නම් එයින් ඒ අය නිදහස් කරගනු වස් ය.

'මෙන්න ඒ ගමන අඬ අඬා හිතාවෙනවා'

සිල්වියා හඬනගා හිනැහෙන්නට ගත්තා ය. ඒ සිනාවටත් මාරියෝ තොල් කොනක් සොලවා සිනහ වූයේ නැත. දිගටම ඔහු කෑම කෑවේ ලොකු කල්පනාවක ය. කල්පනා කළේ කුමක් ගැනදැයි මට සිතාගත නොහැකි වූයේ ඔහු දිගටම මුණිවත රක්ෂා කළ හෙයිනි.

පසුවදා හෝටලයේදිත් මාරියෝ පසුවූයේ එම කල්පනාවේ ම ය. හැන්දෑවේ සිංහල පාඩමේදී ඔහු බුදුන් වහන්සේ හා බුද්ධ ධර්මය පිළිබඳව මගෙන් ප්‍රශ්න ගණනාවක් අසාගෙන ගියේ ය. මම හැකි පමණින් ඒවාට සරල පිළිතුරු ලබා දුනිමි.

'බුද්ධ ධර්මය හරි සංකීර්ණ දෙයක්. අපි උපතින්ම බෞද්ධ වුණත් බුද්ධ ධර්මය ගැන දන්නෙ කොච්චර වුට්ටයිද කියලා

The Reader's Place Novel

මා මුලින්ම මාරියෝට එහෙම කීවේ ඔහු ඕනෑම දෙයක පත්ලටම හාරාවුස්සා දැනගැනීමේ පිපාසයකින් පෙළෙන බව මේ වෙත්දිත් දැන සිටි හෙයිනි.

'මාත් අහලා තියෙනවා. මට වතාවක් මුණගැහුනා ජපන් භික්ෂුවක්'

'ජපාන බුද්ධ ධර්මයයි අපේ රටේ බුද්ධ ධර්මයයි ටිකක් වෙනස්ලු'

'ඒ භික්ෂුවත් එහෙම කිව්වා. එයාලා ලංකාවේ ථේරවාදී බුද්ධ ධර්මය ඉගෙන ගන්න ලංකාවට යන බලාපොරොත්තුවකිං ඉන්නවා කියලත් කිව්වා'

'මං දවසක මාරියෝව මෙහෙ පන්සලේ ඉන්න අපේ හාමුදුරුවොා මුණගස්සන්නං. ඔයාට දැන ගන්න ඕන ධර්ම කාරණා ගැන මට වඩා හොඳට උන්නාන්සේ පැහැදිලි කරලා දෙයි.

'හා... දවසක යමු'

මාරියෝ බෞද්ධ දර්ශනය ගැන උනන්දු වන්නේ ඔහුගේ ගිහි ජීවිතය පිළිබඳ කළකිරීමකින් කියාත් මට සිතිණ. එහෙම වන්නට විදිහක් නැත. ඔහු රෝමයේ ඉහළ පෙළේ ව්‍යාපාරිකයෙකි. ගිහි ජීවිතය කළ කිරවන සිදුවීම් අනන්තයකට ඔහු අතීතයේ දී මුහුණ දී ඇති වග සිල්වියා මට කියා තිබේ. මාරියෝ සාර්ථකත්වයට පත් වූයේත් එම අත්දැකීම් වලින් ලද පන්නරය නිසා බව ඇය කීවා ය. ඉතිං එහෙම එකේ ඔහු දැන් ගිහි ජීවිතය ගැන කලකිරෙන්න පුළුවන් ද?

ස්වාමීන් වහන්සේ මුණ ගැහෙන්න මාරියෝ වඩාත් උනන්දු වූයෙන් ඉක්මනින් දවසක මට ඔහුව පන්සලය කැඳවාගෙන යන්නට සිදු විය. පාවහන් ගලවා එහි ඇතුළු වූ ගමන් මාරියෝ මහත් සමාධි සුවයකින් වටපිට බැලුවේ ය.

'මං මේ පන්සලකට ආවමයි. හරිම සන්සුන් පරිසරයක්'

'ඉතාලියේ පරිසරේක හදපු පන්සලක්නෙ මේ. ලංකාවේ පන්සලක් මීටත් වඩා සන්සුන්. පන්සලක් ඇතුළෙදී දැනෙන්නෙ

මට එකඟව මාරියෝ හිස සැලුවේ ය. මේ වෙත්දී හදවතේ වඩාත් ම ගැඹුරට දැනෙන හැඟීම් වුව අපට ඉස්සර තරම් අපහසුවක් නැතිව හුවමාරු කරගන්නට පුලුවන්කම තිබිණ. ඒ දවස්වල අප කතා කළ යුතු වූවේ ඉතාලි භාෂාවෙන් පමණ ය. එදා මට තේරුණේ වචන ස්වල්පයක් පමණි. ඒත් දැන් එහෙම නොවේ. සිල්වියා සමග නිතර දෙවේලේ ඉතාලියේ කතා කිරීම නිසා මගේ ඉතාලි දැනුම වඩා හොඳින් වර්ධනය වී තිබේ. දැන් මාරියෝ ද සිංහල ඉගෙන ගනී. ඔහුටත් මාත් දෙදෙනාටම සැලකිය යුතු මට්ටමේ ඉංග්‍රීසි දැනීමක්ද තිබේ. එහෙයින් අප දෙදෙනා කතා කරන විට මේ භාෂා තුනම යොදා ගත්තෙමු. එහෙයින් කවර භාෂාවකින් හෝ, කියන්නට අවශ්‍ය දේ අනෙක් තැනැත්තාට ප්‍රකාශ කරගන්නට පුළුවන් වී තිබේ.

ඒ සන්නිවේදන ක්‍රමය වඩා පහසු ය. අප මේ භාෂා තුනම වරද්දාගන්නට ඇත. නමුත් අප අදහස් කරන්නට යෙදුණ දේ තේරුම් ගන්නට අපට හැකි විය.

මේ වේලාවේත් අප සිංහල හා ඉතාලි මිශ්‍ර කරගත් භාෂාවකිනි කතා කළේ. මාරියෝගේ සිංහල හා බෞද්ධ ධර්මය පිළිබඳ උනන්දුව ගැන පන්සලේ භික්ෂූන් වහන්සේද සතුට ප්‍රකාශ කළහ. උන් වහන්සේ ළඟ තිබී ඉංග්‍රීසියෙන් ලියවුණු බෞද්ධ පොත් හා අත්පත්‍රිකා වගයක් ද මාරියෝට තිලිණ කළ සේක.

'සිඤ්ඤෝරේ නිදහස් වෙලාවට පන්සලට එන්නකෝ. අපිට බැරියැ තව දේවල් කතාබහ කරන්න. බුද්ධාගම කියන්නෙ මෙහෙම වචනෙකිං දෙකකිං විස්තර කරන්න පුලුවන් දෙයක් නෙවේ'

'මට අංශුත් ඒක කිව්වා හාමුදුරුවනේ'

මාරියෝ ඒ වාක්‍ය කීවේ තනිකරම සිංහලෙනි. ස්වාමීන් වහන්සේගේ මුවඟට මදහසක් නැගිණි.

'මේ ළමයා සිඤ්ඤෝරෙව සිංහලයෙක්ම කරයි වගේ'

මාරියෝ හඬනගා හිනැහිණි. පන්සලේදී අපි එහෙම උස් හඬින් සිනහ නොවන බව ඔහුට කලින් කියා සිටින්නට නොහැකි

The Reader's Place Novel

මා තේරුම්ගෙන වගේ භික්ෂූන් වහන්සේ මදහසක් තගා ගත්තේ ය.

'සිඤ්ඤෝරේ..... බෞද්ධ ගිහි විනයත් හරි වටින දෙයක්. නිකං ඉන්න වෙලාවට මේ අංශු ළමයගෙන් ඒ ගැන අහගත්ත එක හොඳයි'

මාරියෝ මදෙස බැලුවේ තමන්ගෙන් කිසියම් විරුදක් සිදුවීදැයි අසන බැල්මෙනි. මම සිනහව ගිල ගනිමින් ඉවත බැලුවෙමි.

'මං පන්සලට ආසයි අංශු'

ආපසු එන ගමනේදී මාරියෝ කීවේ ය.

'පන්සලට යන්න එන්න කිසි කෙනෙකුට තහනමක් නෑ. බුද්ධ ධර්මය කිසි කෙනෙක්ව බලෙං තමං දිහාවට නම්ම ගන්නෙ නෑ. ඔයාට යන්න හිතෙන වෙලාවට පන්සලට ගිහින් එන්න'

'හාමුදුරුවෝ අඳුරගන්න ලැබුණ එක ලොකු දෙයක්'

ඉනික්බිති කිහිප වතාවකදීම, බෞද්ධයෙකු නොවුනත් මාරියෝ පන්සලට ආධාර උපකාර කළේ ය. දානමාන පිළිගැන්වී ය.

'අංශු මාරියෝට පැවිදි වෙන්න එහෙම දෙන්න එපා'

සිල්වියා සිනහවෙමින් වුණත් දවසක් කීවේ ඇගේ හිතට වද දෙන හැඟීමක් වන්නට ඇත. ඇගේ ස්වරයේ කිසියම් අවධාරාත්මක බවක් ද විය.

'මම්මා.බුද්ධ ශාසනයේ පැවිදි වෙන්නම ඕන නෑ බුදු දහම පිළිපදින්න. විශාඛා , අනේපිඬු වගේ දායකයෝ ගිහිගෙයි ඉඳගෙනම මාර්ග ඵල අවබෝධ කරගෙන හිටියයි කියලා පොත පතේ තියෙන්නෙ'

'අනේ මන්දා. මට ඕව තේරෙන්නෑ'

'බුද්ධාගම කියන්නේ ගිහි ජීවිතය එපා කරවන ධර්මයක් නෙවෙයි. ගිහි ජීවිතය සාර්ථක කරන්න පුළුවන් උපදෙස් ඕන තෙවෙයි. ගිහි ජීවිතය සාර්ථක කරන්න පුළුවන් උපදෙස්

මාරියෝ කියන්නේ එක ජාතියකට හෝ එක ආගමකට අයිති මිනිසෙකු නොවන බව මම තේරුම් ගෙන සිටියෙමි. ඔහු විශ්වීය මිනිසෙකි. ඔහු සත්‍යය සොයන මිනිසෙකි. බුදුන් වහන්සේත් කළේ සත්‍ය ගවේෂණය කිරීම ය. ක්‍රිස්තුස් වහන්සේත් සත්‍ය සොයා ගියේ ය. එසේනම් සත්‍ය ගවේෂණය වූ කලී බුද්ධිමතුන්ගේ ක්‍රියාවකි.

අන්තර්ජාලය පිරික්සමින්ද, ඉංග්‍රීසියෙන් ලියවුණු පොත් පත් මිලදී ගෙන කියවමින් ද මාරියෝ බුද්ධ ධර්මය පිළිබඳ ස්වයං අධ්‍යයනයක යෙදෙන අයුරු මම දුටිමි. මේ වෙත්දී ඔහු සිංහල අකුරු ලියන්නට ඉගෙන ගනිමින් සිටියේ ය. ඔහුගේ ව්‍යායාමයේ අගය වැටහෙත්දී, මට මා ගැනද වටිනාකමක් අභිමානයක් දැනෙන්නට ඇත. ඉගෙන ගන්නට කොයි තරම් දේවල් ලෝකයෙහි තිබෙනවාද? කරන්නට කොයි තරම් දේවල් අප අවට තිබෙනවාද?

මේ කාලයේදී මාරියෝ තවත් අලුත් අදහසක් මගේ ඔළුවට දැම්මේ ය. ඒ මගේ සිතුවම් එකතු කොට ප්‍රදර්ශනයක් පැවැත්විය යුතුයි යන්නයි. හෝටලයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයෝ මගේ චිත්‍ර අගය කරන අයුරු සියැසින් දැක තිබෙන නිසා, ඒ ගැන මගේ පසුබෑමක් නොවී ය. මෙතෙක් හෝටලයට අඳින්නු ලැබූ සිතුවම් වලින් හොඳම ඒවාද ඇතුලුව තව අලුතෙනුත් චිත්‍ර කිහිපයක් අඳින්නට මාරියෝ යෝජනා කළේ ය.

'වැඩේ සක්සස් වෙනවාමයි, ඊට පස්සෙ අවුරුද්දකට සැරයක් වගේ අංශුට පුළුවං එක්සිබිෂන් එකක් කරන්න. ඒකෙං ඔයාට ලොකු ආදායමක් උපයන්න පුළුවං' මම ලොකු හුස්මකින් ළය පුරවා ගතිමි.

The Reader's Place Novel

10

මාරියෝ කීවා සේම චිත්‍ර ප්‍රදර්ශනය අතිශයින් සාර්ථක විය. එහිදී මා කෙසේවත් බලාපොරොත්තු නොවූ මුදලකට චිත්‍ර අලෙවි විය. එයින් මා ලද ආදායම රුපියල් ලක්ෂ පනහ ඉක්මවිය. ප්‍රදර්ශනය සම්බන්ධයෙන් වඩාත් උද්දාමයට පත්ව සිටියේ මාරියෝ ය. ප්‍රදර්ශනයක අදහසත්, ඒ සඳහා සියලු අනුග්‍රාහකත්වයනුත් ඔහුගේ වූ නිසා, ඔහුට ඒ ආඩම්බරය අයිති ය.

'අංශු ඔය සල්ලි නාස්ති කරගන්න එපා. වැදගත් වැඩකට යොදවන්න තියාගන්න' මාරියෝ මට කීවේ ය. මා ඒ මුදලින් කාටසක් ඔහුට දුන්නත් එය භාර ගැනීම ඔහු විසින් එකහෙළාම ප්‍රතික්ෂේප කෙරෙන ලදි. ඒ වගේ ධනවතෙකුට මගේ මුදලින් ඇති වැඩක් නැති බව මම දනිමි. නමුත් එය මගේ යුතුකමක් වාගේය මට දැනුනේ. මේ වෙත්දීත් මගේ ළඟ ඉතිරි කරගත් ලොකු මුදලක් විය. මගේ මාසික වැටුප ලොකු එකකි. කෑම බීම සඳහා වියදම් වූයේ ඉන් ඉතාම සුළු ගණනකි. දැන් දැන් ගොඩක් වෙලාවට මා සමග සාප්පු සවාරියේ යාමට මාරියෝද පැමිණෙයි. ආහාර පාන සඳහා වැඩිපුරම මුදල් ගෙවන්නේ ඔහු ය.

'ඔන්න එහෙනං මීට පස්සෙ මං තනියම ඇවිත් බඩු ගන්නවා'

මම තරවටුවක සරින් කියමි. මාරියෝ සන්සුන්ව සිනාසෙයි.

'එහෙම කරන්න එපා. එක සිංහල වචනයක්වත් ඉගෙන ගන්න තියෙන අවස්ථාවනෙ ඔයා නැති කරලා දාන්න හදන්නෙ'

මැදිවිය ඉක්මවමින් සිටින තැනැත්තෙකු වීද දැන් දැන් මාරියෝ වඩාත් තරුණ පාටයි කියා කිහිප විටෙකම මට සිතී ඇත්තේ ය.

'නම්බ කරන සල්ලි වලිං මට කරන්න දේකුත් තියෙන්න එපායෑ'

'කවබොන එකනං කොහොම කරගන්න බැරිද? ඔයාගෙ සල්ලි වලින් කරන්න ඊට වඩා වැදගත් දෙයක් ගැන හිතලා බලන්නකො'

චිත්‍ර ප්‍රදර්ශනයෙන් ලද මුදලින් ළමා නාවිසයකට උදව් කිරීමේ අදහස මගේ සිතට පිවිසියෙන් මාරියෝගේ ඒ ප්‍රකාශය නිරන්තර සිතේ රැව් පිළිරැව් දෙමින් තිබි නිසාම ය.

ළමා නිවාසයක්... අසරණ වූ දරුවන්ට පිළිසරණක් සඳහා සෙවනක්. කෙතරම් කුළුණුබර අදහසක් ද? ළමා කාලයේ දී ළමයෙකුට ළමා විය අහිමි වීම පාපයකි. මම එකී පව ගෙවූ කෙල්ලක වෙමි. මා අසරණ වූයේ දෙමාපිය දෙදෙනාම සිටිය දීය. අම්මා විදෙස් රැකියාවකට ගියා ය. තාත්තා වෙන බිරිඳක වෙත ගියේය. ඉතින් ගෙදරක කාර්යභාරය කුඩා දැරියක වූ මගේ උර මත පැටවිණ. අම්මා තාත්තා නොමැති දරුවන් ලෝකයෙහි කොතරම් වන්නේ ද? අපේ රටේ අසරණ දරුවන් වෙනුවෙන් විවර වූ ළමා නිවාස අප්‍රමාණව වන්නේ ය. වතාවක් මම ගමේ ළමයෙකුගේ උපන් දිනයක් දා ළමා නිවාසය ට දානයක් දීමට ගියෙමි. එහි වූ ළමයිනුත් මා වගේමයි කියා මට සිතිණ. නමුත් අම්මා රට සිටි නිසා මේ කාලයේ දී අපට කන්නට අඳින්නට අඩුවක් නොවී ය. තුන් වේලම දානය ලැබුණත්, ඒ දානයත් නොලැබෙන වේල් ගණන් ඇති බව එහි පාලිකාව අපේ නඩයේ වැඩිහිටියන් සමග පවසනු මම බලා සිටියෙමි. වඩාත් අවාසනාවන්ත තත්ත්වය වූයේ ඒ දරියන්ට, ඇඳුම් අඩුවීම ය. විශේෂයෙන් ම ඔවුන්ට යට ඇඳුම් ගා සනීපාරක්ෂක තුවා වැනි දෑ ඇත්තේම නැති බව පාලිකාව කීවා ය. මේ නිසා දරියන් සේම පාලිකාව වශයෙන් ඇයද අසරණ වන බව ඇය කීවාය.

ආහාර ඇඳුම් නිවාස මිනිසාගේ මූලික අවශ්‍යතා බව සත්‍ය

ය. නමුත් මූලික වූ තවත් අවශ්‍යතා බොහොමයක් වන්නේ ය. මේවා බොහෝ විට ප්‍රසිද්ධියේ පැවසිය නොහැකි ය. දායකයෝ ඇත්ත වශයෙන්ම වැඩිපුර ලබා දෙන්නේ කන බොන දෑ විතරය. මේ වගේ අසරණ දරියන් වෙනුවෙන්, කටින් ඉල්ලන්නට ඔවුන්ට බැරි ඔවුන්ගේ අවශ්‍යතා ටිකක් සපුරා දෙන්නට හැකි නම් කෙතරම් ලොකු පුන්‍ය කර්මයක් ද?

මා ලංකාවෙන් ඇවිත් වසර දෙකහමාරක් පමණ කාලයක් ගෙවී ගොස් තිබිණ. ඒ වසර දෙක හමාර තුළදී ආර්ථික හා සමාජයීය වශයෙන් මම කිසියම් ස්ථාවරත්වයකට පත්ව සිටියෙමි. ඉඳහිට මගතොට දී මට කිහිප විටක් සංජුල හමු විණි. මා හමුවේ ඔහු කිසියම් තැතිගැන්මකට ලක් වූවේ ය.

'මට සමාවෙන්න අංශු. මගෙං ඔයාට වැරදි වුණා'

ඔහුගේ පසුතැවීමත් වංචනිකය කියා මට සිතිණ.

'නෑ. එහෙම දෙයක් නෑ'

'ගෑණු ළමයෙක් විදිහට.... ඔයාටත් ඔයිට වඩා ටිකක් පරිස්සං වෙන්න තිබුණා.' ඔහු පිරිමින්ට පොදු නිදහසට කාරණාව හා චෝදනාව එකවර ඉදිරිපත් කළේ ය. මම කට කොනකට සිනහවක් නගා ගතිමි. එවේලේ මා ඊට වඩා කොහොම පරිස්සම් වෙන්නද? මා හිටියේ මගේය කියා කාත් කවුරුවත් නොවන රටක තට්ට තනියමය. මගේ විවාහක පුරුෂයා වශයෙන් පෙනී සිටියේ මාව එහි ගෙන්වාගත් ඔහු ය. ඔහුගේ නවාතැන් කාමරය තුළම නවතින්න මට සිදුවිය. මම මේ රටෙහි මගක් තොටක් නොදන සිටියෙමි. භාෂාවක් - පුද්ගලයෙක් නොදන සිටියෙමි. ඉතින් මා කොහොම ප්‍රවේශම් වන්නද? ඒ යුතුකම පැවරී තිබුණේ ඔහු වෙත ය. තමාගේ රටේම මුදල් ගෙවා ගෙන්වාගත් යුවතියකට අකටයුතුකම් නොකොට සහෝදරත්වයෙන් සලකන වගකීම තිබුණේ ඔහු වෙතය. නමුත් ඔවුන්වත් පිරිමින්ගෙන් සහෝදරත්වයක් හෝ යුතුකම් බලාපොරොත්තු වීම විහිළුවක් වග මම දැන් තේරුම් ගෙන සිටිමි. මා ආදරය කළ කල්පගෙන් නොලද විශ්වාසයක් මා සංජුලගෙන් කුමට නම් බලාපොරොත්තු වන්නෙම්ද...?

'අංශු ඉතාලියේ මෙච්චර තත්ත්වෙකට එයි කියලා කිමටවත් මට හිතුනෙ නෑ'

ඔහු තවත් මෝඩ කතාවක් කීවේ ය.

'එහෙම තමයි. මිනිස්සුංගෙ ඉරණම කොයි විදිහට විසඳෙන්න නියමිතද කියලා කාටද කියන්න පුළුවනං?'

'ඒකනං ඇත්ත. මගෙත් ජොබ් එක නැති වුණා අංශු'

ඔහු හිස කසමින් කීවේ ය. මම සංජුල දෙස නොදින් බැලුවෙමි. ඔහු සිටියේ පෙරදී සේ ජේත්තුවට නොවේ. හිසකේ වැවී තිබිණ. දින ගණනකින් නොකැපූ රැවුල මහත් අපිලිවෙලක් ඔහුට ගෙන දී තිබිණ. පරණ ජැකට් එක නිසා සංජුලගේ පෙනුම තවත් අසරණ වී තිබුනේ ය.

'ඇයි ඒ?'

'මං ලංකාවට ගියා. අතේ තිබුණු සල්ලි ටිකකිං බිස්නස් එකක් පටන් ගත්තා. එකපාරටම මට ඒක දාලා එන්න පුළුවන්කමක් තිබුණෙ නෑ. බිස්නස් එක හිතපු විදිහට අල්ලලා ගියෙත් නෑ. අන්තිමට මං එනකොට මගෙ ජොබ් එකට ලංකාවේ අපේ එකෙක්ම විඳලා. රෙන්ට් එකට අරං තිබුණු ගේ කැල්ලත් නැති වුණා. දැං කොල්ලෝ කීප දෙනක් ඉන්න තැනක ඇඳක් කුළියට අරං ඉන්නවා. පාට් ටයිම් පොඩි පොඩි ජොබ් කෑලි වලට තමයි සෙට් වෙන්නෙ. බිස්නස් එකත් නත්නත්තාර වෙලා අපරාදෙ යට කරපු සල්ලි ටික'

සමහර අකුසල කර්ම වල විපාක මෙලොවදීම ඵලදෙන බව මට උගෙන ඇත්තෙමි. දිට්ටධම්මවේදනීය කර්ම කියන්නේ ඒවාට ය. සංජුල මට කළේ කොහොම වරදක් ද? ඔහු මගේ කුසට දරුවෙකු එන තැනට වැඩ කළේ ය. ඊළඟට ඒ දරුවා නැති කර ගන්නා ලෙස මට බල කළේය. අන්තිමට දඩාවතේ යන බැල්ලියක සේ මාව ගෙයිනුත් දොට්ට දැම්මේ ය.

අද ඔහුත් පාරට වැටී සිටී. නමුත් 'හොඳ වැඩේ' කියා කියන්නට මගේ දිව නැමුනේ නැත. මම මුදල් පසුම්බිය හැර නෝට්ටු කීපයක් ගෙන ඔහු වෙත පෑවෙමි.

The Reader's Place Novel

'නෑන්ක් යූ අංශු. මං මේ උදව්වනං අමතක කරන්නෑ. මේ වෙලාවේ ලොකු දෙයක්. ගෙදරටත් කියක් වත් යවන්න විදිහක් නැතුව හිටියෙ'

මම ඔහුගේ ස්තුතිය භාරගන්නට පමා නොවී හැරී ආවෙමි.

වසර දෙකහමාරකට පසු ලංකාවට ගොස් එන දොළකින් මගේ සර්ටාංගයම පෙළෙන්නට ගත්තේ ය. මම දෙතුන් දිනක් ඒ දොළඳුක තනිව විඳවා ගනිමි.

'මං ලංකාවට ගිහින් එන්න හිතුවා'

ඒ ආශාව මාරියෝ හා සිල්වියා හමුවේ පිටතට දැමුවේ ඉන් අනතුරුව ය. සිල්වියා හුස්ම අල්වාගෙන බලා සිටියා ය. මම අපහසුවෙන් මුත් මදහසක් නගා ගනිමි.

'හැමදාටම නෙමේ මම්මා. වැකේෂන් එකකට'

සිල්වියා වතුර වීදුරුවක් ගෙන බීගෙන බීගෙන ගියා ය. මාරියෝ කිසිත් කතා කළේ නැත.

'අනිත් එක, දැං මට මෙහෙ තරම්වත් මගේ දෑයෝ එහෙ නෑ. මෙහෙ එන්න එපා කියලා අඬන්න දොඩන්න අය එහෙ නෑ.'

'මාත් එන්නං අංශු එක්ක ලංකාවට ගිහිං එන්න'

එක්වරම මාරියෝ කීවේ කොහෙත්ම මා අපේක්ෂා නොකළ දෙයකි.

'මං ආවට කමක් නැද්ද අංශු'

'කමක්.නෑ.....'

එක්වරම මට පිළිතුරු දීගත නොහැකි තරම් වූවේ ය.

'ලංකාවයි, ලංකාවේ මිනිස්සුයි පන්සල් ටිකයි බලා කියාගෙන එන්න මාත් ආසාවෙං හිටියෙ. අංශුත් ඉන්නකොට ඒකට පහසුයිනෙ'

'ඒක හොඳයි'

සිල්වියාගේ මූණට සිනාවක් ඇඳිණි. ලංකාවේ මා නතර වෙන්නට යනවා නම් මාරියෝ නිසා එය වැලෙකනවායි සැනසීමක්

ද යන්නෙ?'

'මී... තාම එහෙමනං හිතුවෙ නෑ'

'එහෙනං මං ඕපන් වීසා ගත්තංකෝ'

හැමදෙයක්ම සිදුවූයේ හරි ඉක්මනට ය. අයියාටත් තනුජාටත් පොඩි එවුන්ටත් මාමාගේ පවුලේ අයටත් දෙන්නට මම තෑගි බෝග ටිකක් මිලදී ගතිමි. කාලෙකින් ලංකාවට යන්දි ගිස් අතින් යා නොහැකි ය. රට ගිහින් කවුරුන් හෝ ලංකාවට ආවොත් එහි නෑ හිතවත් අසල්වැසි සෑම සියලු දෙනාම බලා ඉන්නේ තෑගි අරං එනකල් ය. ඉතින් වැඩිපුර ටොෆි චොකලට් ටිකකුත්, අතට අනුවෙන මොන මොනවා හෝ දේවලුත් ගෙන මම ගමන් මලු පුරවා ගනිමි. ලංකාවට සාපේක්ෂව ඉතාලියේ බඩු වල මිල ඉතා ඉහලය. තමුත් ලංකාවේ අප බලාපොරොත්තුවෙන්නේ රටින් ගෙනෙන තෑගි ය.

'වැඩිය ඇදුම් පුරෝගන්න එපා. ලංකාවේ දේශගුනයට ගැලපෙන ඇඳුං ටිකක් අපි එහෙං ගමු. මෙහෙ එකක් ගන්න සල්ලි වලිං එහෙ තුන හතරක්ම ගන්න පුළුවං'

මම මාරියෝට ද අවවාදයක් දුන්නෙමි. මේ ගමන සඳහා අප සිල්වියාට ද කතා කළත් ඇය එකඟ වූයේ නැත. මේ දිනවල ඇයට වදදෙන කොන්දෙ වේදනාවත්, සෙම අමාරුවත් ඇය ඊට හේතු ලෙස ඉදිරිපත් කළා ය.

'ඕගොල්ලො, එනකල් මට බලා ඉන්න පුළුවං. ස්කයිප් එකෙං දකිනවනෙ' දැන් දැන් සිල්වියා වඩාත් ප්‍රිය කළේ ගෙදරටම වී සිටීමට නිසා අපි දෙදෙනාම ඇයට බල නොකළෙමු.

'මං ලංකාවෙ තේයි රස කැවිලි ටිකකුයි අරං එන්නං. මං හදන්න දන්නෙ නැති රසකැවිලි ගොඩක් තියෙනවා.'

සමුගනිත්දි, පොඩි දැරියක සේ සිල්වියාව සතසමින් මම එහෙම කීවෙමි. ඇය මගේ දෑතම ගෙන සිපගත්තා ය.

'දේව මෑනියන්ගෙ පිහිටෙං ගිහිං එන්න අංශු. අංශුව බලාගන්න මාරියෝ.'

The Reader's Place Novel

'අංශුගේ රටටනේ මම්මා යන්නෙ. එයාට කියන්න මාව බලාගන්න කියලා' මාරියෝ හඬනඟා හිනැහුණි. ඔහු බෙහෙවින් සැහැල්ලුවට පත්ව සිටියා කියා මම සිතමි.

'මං ලංකාවෙදී භාවනාව ඉගෙන ගන්න ඕනෙ'

අප ගුවන්තොටුපළ වෙත යත්දී මාරියෝ කිවේ ය.

'මං හොයලා බලන්නංකෝ. ලංකාවෙ ඉන්නව භාවනාව උගන්නන ගිහි උගත්තු. ලංකාවෙත් දැන් භාවනා කරන එක ෆැෂන් එකක් වෙලා. හැබැයි ඉතිං ඕක අපේ රටේ තිබුණෙ අපිට බුද්ධාගම ලැබුණ දවසෙ ඉඳලමයි.'

මම මහදැනමුත්තියක සේ කියෙව්වෙමි.

අපට වෙන්වී තිබුණේ ගුවන් යානයේ අයිතෙම වන යුගල අසුනය. මාරියෝ මට ජනේලය අයිනේ අසුන ලබා දුන්නේ ය.

'මට හීනයක් වගේ මේක. මේ ආපහු යන්නෙ ලංකාවෙං ආපු අංශු ද?'

මම කෙඳිරුවෙමි. මාරියෝ මදෙස තත්පර කීපයක් බලා සිට කතා කළේ ය.

'ඔව් අංශු. ඔයා එයා තමයි. ඔයාගෙ එක අංශුවක්වත් වෙනස් වෙලා නෑ. තාම ඉන්නෙ එදා හිටපු හිත හොඳ කෙල්ලමයි.'

ඔහු මට එහෙම තක්සේරුවක් ලබා දෙන්නේ කොහොමද? මම නොදනිමි. නමුත් මාරියෝ වෙත වූයේ කටට ආවාට වචනයක් කියූ ස්වභාවයක් නොවේ. එසේනම් මේ වසර දෙක පුරාම ඔහු මා ගැන අධ්‍යයනයක පසුවීද?

'අංශු...'

ගුවන් යානය ඉහළ උඩු ගුවනට එළඹී පසු මාරියෝ මහත් වූ මෘදු - යෞවන හඬකින් මගේ සවනට මිමිනී ය. මා 'ඇයි' කියා අසන්න ඇත්තේ දෑසින් ය.

'ඔයා කැමතියි නං... මං ඔයාව බඳින්න කැමතියි.'

ඒ උඩු ගුවනේදී මාව ගුවන් යානයෙන් පිටතට විසි වූවාද

සැබවින්ම එහෙම කීවාද? මට ඒ ගැන පැහැදිලි අදහසක් නොවී ය. ඒ නිසාම පිළිතුරක් දෙනු තබා ඔහු දෙස බලන්නටවත් දෙගිඩියාවකින් මා පෙළෙන්නට ගත්තේය. ඔහුගේ ලෝකය ඉදිරිපිට අංශු මාත්‍රයක්වත් නොවූ අංශු මන්ත්‍රිකා පතිරණට එහෙම යෝනාවක් කරන්නට මාරියෝ පෙළඹෙවිද? මේ, වායු පීඩනයෙහි වූ ක්ෂණික වෙනස නිසා මගේ සවන් ළඟ ඇසුණ මායාවී හඬක් විය නොහැකි ද? එය එසේ විය යුතු ය. මම එහෙමම හිස ආසනයට බර කොට නෙතු පියවාගතිමි. මගේ දෑත් හා දෙපා රෙදි පටකින් ආවරණය විය. මාරියෝ පොරෝණය ගෙන මා පොරවන්නට ඇත.

බොහෝ වේලාවක් මා සිටියේ ඒ ඉරියව්වේ නින්දත් - නොනින්දත් අතරේ ය.

ගුවන් සේවිකාවක් කෑම ගෙනවිත් කතා කරන විට මාරියෝ 'මිස්ට බීන්' විනෝදාත්මක වැඩසටහනක් නරඹමින් සිටියේ ය. එහි ඇතැම් තැනකදී ඔහු පොඩි ළමයෙක් වගේ තනිවම සිනාසුණේය.

'අංශු මොනවද බොන්නෙ?'

'ඇපල් ජූස්'

'මං බියර් එකක් බිව්වට කමක් නැතේ?'

මා කුමක් කියන්නද? 'එපා' කියන්නට තරම් අයිතියක් ඔහු ගැන මට තිබේද? එසේනම් ඔහු මගෙන් ඊට අවසර බලාපොරොත්තු වන්නේ කුමට ද? මම යන්තම් මදහසක් පමණක් හෙළුවෙමි. ඒ වේලාවේ ඔහුගේ ඇස් බැල්මේ වූ කාන්තිය දරාගන්නට මට නොහැකි වූයේ ඇයි කියා මමම නොදනිමි. ඊට පෙර කිසිදාක මට එසේ දැනී නොමැත. අපි කෙතරම් සමීපව ආශ්‍රය කළෙමුද? නමුත් කිසිදාක බැල්මකින්, ස්පර්ශයකින් පමණකුදු නොව ඉඟියකිනිදු මාරියෝ මට වෙනසක් අඟවා නොමැත. ඉතින් මා ඔහු එහෙම යෝජනාවක් කළා කියා සිතන්නේ ඇයි? ඔහුගේ දෑස් අභියස සැලී යන්නේ ඇයි?

මා ලංකාවට එන බව දන්වා තිබුණෙන් තනූජා හා අය්යා එක්ව බෙහෙවින් මහන්සි වී තිබිණ. මාරියෝගේ පැමිණීමක් ගැන

The Reader's Place Novels

මා ඔවුනට කියා නොතිබුණෙත් ඔහු දිටු ඔවුහු පුදුම වූහ. ඒත් සෘජුව මගෙන් ඒ ගැන විමසන්නට තරම් හයියක් ඔවුන්ට ද නොවූ සේ ය.

'අයියෙ මේ මාරියෝ, එහෙ මං වැඩ කරන හොටෙල් එක අයිති මෙයාට. මං නතර වෙලා ඉන්නෙත් මාරියෝගේ මම්මත් එක්ක.'

'අංශු නිතරම වමලුයි තනුජයි ගැන තියනවා.'

මාරියෝ සිංහලෙන් කතා කළ විට අයියලාගෙ පුදුමය දෙගුණ තෙගුණ වන්නට ඇත. මම මඳහසකින් ඔවුන්ගේ ගැටළුව නිරාකරණය කළෙමි.

'මාරියෝ මගෙං සිංහල ඉගෙන ගන්නවා. දැං එයාට හුගාක් දුරට පුළුවං'

'අනේ ඔව්. අංශු මගේ ටීචර්'

කවුරුත් සිනාසුණහ. ඒ තම් හැබෑවටම ප්‍රීතිමත් මොහොතකි. තනූජාගේ විශේෂ සංග්‍රහයද බෙහෙවින් රසවත් වූවකි. සිංහල කෑම හුරු වුණත් මා ඉතාලියේ දී එතරම් මිරිස් පාවිච්චි නොකරන නිසා මාරියෝ කෑවේ හාස් හූස් ගාමිනි.

'නංගි අපිට කියලා තිබුණෙ නැනේ සුදු මහත්තයෙකුත් එනවය කියලා. ඉතිං මං පුරුදු විදිහටම මිරිස් දාලයි හැදුවෙ'

'ඒකට කමක් නෑ. රසයි'

යළිත් සිනහවකි. අයියා හා තනූජාත් ළමයිනුත් වඩාත් කුල්මත් වූයේ මාරියෝ සිංහල කතා කිරීම ගැන ය. සුද්දෙක් සමග මා ගෙදර ආ පුවත සැල වී අහල පහල අය ගේ ළඟින් කොකම් පාමින් ගියහ.

'ඔය ඉතිං... මෙකෙ එවුන්ට දැං ඇස් වල කටු අනිනවා වගේ ඇති. නැති පද හදලා ඇති මෙලහකටත්, අංශු සුද්දෙක්ව බැඳලා කියලා'

තනූජා මගේ කණට කර කේන්තියෙන් කීවා ය. මම සිනාවක් නගා ගතිමි. මේ ගම්වල මිනිසුන්ගේ හැටි එහෙම ය. කාලය

කොතරම් ඉදිරියට ගියත්, ලෝකය කොතරම් දියුණු වුනත් ඔවුන් එහෙම ය. ඒ ගැන කේන්ති අරගෙන ඇති වැඩක් නැත. මම මිදුලට ගිහිං දකින අය සමග සිතහසුනෙමි.

'අංශු ලස්සන වෙලානෙ'

ඇත්තටමද නැත්තනම් මූනිච්චාවටද මන්දා ඇතැමෙක් කීහ. මාරියෝ දෙස බැලුවා විනා ඔවුහු ඔහු ගැන ප්‍රශ්න කරන්නට එක්වර ඉදිරිපත් වූයේ නැත.

'මේ ටොෆි චොකලට් ටික අහළ පහළ අයට බෙදලා දෙන්න තනූජා. මේ බෑග්වල තියෙන ඔක්කොම දේවල් ඔයාලට. අන්න අර බෑග් එක විතරක් තියන්න මාමලගේ ගෙදරට ගෙනියන්න' ඔවුහු කලබලකාරී උද්‍යෝගයකින් තෑගි බෝග බලන්නට වූහ. මම මාරියෝට විවේක ගැනීම සඳහා කාමරයක් පිළියෙල කර දුන්නෙමි. අපේ ගේ වෙනදාට වඩා පිළිවෙල ය. අලුතෙන්ද කොටස් කිහිපයක් එකතු කොට තීන්ත ආලේප කර තිබිණ. කිහිප විටක්ම මම අයියාගේ ගිණුමට මුදල් එව්වෙමි. අම්මාත් ඔහුට උදව් කරන්නට ඇත.

හැන්දෑවේ මම මාරියෝ සමග මාමලාගේ ගෙදරටත් ගියෙමි. ඔවුන්ද මාරියෝට සැලකීමට විශේෂ උත්සාහයක් ගත්හ.

'කරදර වෙන්න එපා මාමෙ. අපි වෙනුවෙං විශේෂ මුකුත් හදන්නෙපා'

'එහෙම කොහොමද? මේ මහත්තයත් ලංකාවට ආව එකේ..... අපි මතක හිටින්න සලකල යවන්න එපැයි. අද රෑට අපේ ගෙදරිං කෑම කාලයි යන්නෙ'

'හැබැයි මිරිස් අඩුවෙං. මාරියෝට වැඩිය දැවිල්ල කන්න බෑ'

මම හිනැහෙමින් කීවෙමි. මාරියෝ ලැජ්ජාශීලි වූයේය.

'ඒකට කමක් නෑ'

'අපේ අංශු සුද්දන්ටත් සිංහල උගන්නයි කියලා අපි නිකමටවත් හිතලා තිබුණයෑ'

රට ඉඳන් පැමිණෙන අයෙකුට කවුරුත් විශේෂ සැලකිලි දක්වීම සාමාන්‍ය දෙයකි. මාරියෝ නිසා මට ඒ සැලකිලි

The Reader's Place Novel

පිළිබඳව සොයා බැලිය යුතු යයි මම සිතා ගතිමි. නිවාස කිහිපයකට වුව එකවර ඇදුම් සපයා දෙන්නට පුළුවන. දිගුකාලීනව උදව් කිරීම සඳහා එක් නිවාසයක් තෝරා ගන්නට මම තීරණය කළෙමි. එහි අනෙකුත් අඩුපාඩු හා සනීපාරක්ෂක පහසුකම් පිළියල කරදීම අත්‍යාවශ්‍ය අංගයකි.

රාත්‍රියේ මාමලාගේ ගෙදර සිට විත් අප සතුටු සාමිචියේ යෙදෙමින් සිටියදී වැන් එකක්විත් අපේ ගෙමිදුලේ නතර විය. අයියා අසුනෙන් නැගිට දොරකඩට ගියේ ය. රියේ දොර ඇරිණ.

'අම්....මා'

අයියාට කියැවිණි. නැගිට්ටා නොව මට නැගිටෙන්නට ඇත. මම මිදුලට පැන සිටියෙමි. අම්මා මා වැළඳ ගත්තා ය. විනාඩි ගණනාවක් අප ඒ ඉරියව්වේ සිටින්නට ඇත.

'අම්මා අද එනවා කියලා කිව්වෙ නෑනෙ'

'අංශු එනව කිව්වහම මටත් එන්නම හිතුනා. ආයෙ ඉතිං මට කවදා ඔයාව දකින්න ලැබෙයි ද කියන්න බෑනේ'

'ඉතිං අම්මා අපිටවත් කිව්වෙ නෑනෙ එනවා කියලා'

'අංශුව පුදුම කරන්නයි මං නොකියම ආවෙ'

මට හැඬුම නවතාගත්තට නොහැකි විය. එක අතකට මා අම්මා ගැන හිතනවා වැරදි ය. යම් යම් අඩුපාඩු සිදු වුනත් ඇය අපට ඇති ආදරයේ අඩුවක් නැත. අම්මා කෙනෙකුගේ හද ගැබ තුළ කැකෑරෙන දරු දුකෙහි කෙළවරක් නැත. ටික දිනකට හෝ මමත් දරු ගැබක් කුසේ දරාගෙන සිටියෙමි. අම්මලා ඒ ගැන දන්නේ නොවේ. සංජුල ඒ කලලය ගබ්සා කර දමන්නටයයි කෙතරම් කීවත් මට ඊට හිත හදාගත හැකි වූයේ නැත. කිසිදා මගේ දරුවාට ඔහුගේ පීතෘත්තවය නොලැබෙන බව දැන දැනත් මා එසේ නොකළේ වාවාගත නොහැකි දරු කැක්කුම නිසා නොවේද?

'මාරියෝ වෙන්නැති නේද මේ?'

අම්මා ඔහුව හඳුනාගත්තාය. ඔවුන් දෙදෙනා එතුන් වැළඳගෙන සතුට ප්‍රකාශ කරගත්ත.

'එහෙනං මාව අඳුරගත්තනේ?'

ඔහු සිංහලෙන් ඇසුවේ ය.

'නැතුව... අංශු ෆෝන් එකෙන් වචන දහයක් කතා කළොත් පහක්ම මාරියෝනේ' ඒ කතාවට තම් මට ලැජ්ජා සිතිණ. මූණට ලේ පුරා මා රතුව යන්නට ඇත. කවුරුත් නිනාසුණහ. මාරියෝ මදෙස බැලූ බැල්මේ උහුලාගත නොහැකි මොකක්දෝ නැගීමක් තියෙනවා මට දැණින. එතකොට ඔහු මට විවාහ යෝජනාවක් ගෙනාවේ සැබැවින්මද...? එය මගේ මායා ලොවෙහි සිදු වූ මායාවක් නොවන්නේද...?

අම්මාත් සමග ආගිය තොරතුරු කතා කරමින් හිඳ අප නින්දට ගියේ එළිවෙන ජාමයේ ය. ඒ හින්දා දහවල් වනතුරු නින්ද දිගු විය. මා නින්දෙන් පිබිදී එන විට තනූජා තේ පිළියෙල කරමින් සිටියා ය.

'අනිත් අයට..... මං හැදුවා. අනේ අංශු මාරියෝ අයියගෙ තේ එක ඔයා හදන්න. මං හදලා ඕක බොන්න පුළුවං වෙයිද දන්නෑ'

ඇය තේ කහට බඳුනත් සීනි හා පිටිත් මවෙත පෑවා ය. මම යහමින් කහට දමා තේ එකක් පිළියෙල කළෙමි. මගේ තේ එක බොමින් එයත් ගෙන මාරියෝ හිඳින කාමරය වෙත ගියෙමි.

'දොර ඇරලා තියෙන්නෙ අංශු.'

මා දොරට තට්ටු කරත්දී ඔහු කීවේ ය. මාරියෝ තේ එක බිව්වේ රස විඳිමිනි. මම ඔහු දෙසම බලා සිටියෙමි. ඉතාලියේ දී දුටුවාටත් වඩා මෙහිදී ඔහු කෙළිලෝල් ය. ආදරණීය ය. එක්වරම ඔහු මදෙස බැලුවේ ය. මම වහා ඉවත බලා ගතිමි.

'අංශු මට කිව්වෙ නැනෙ'

'මොකද්ද...?'

'මාව මැරිකරන්න කැමතිද නැද්ද කියලා'

The Reader's Place Novel

මට බීම බැලිණ. එසේ නම් ඔහු ඒ ප්‍රශ්නය අසා තිබෙන බව ප්‍රත්‍යක්ෂය. දැන් මා ඔහු වෙත ලබා දෙන්නේ කවර පිළිතුරක් ද? මේ වසර දෙක හමාර තුළ කිසිම කිසි දවසක ඔහු ගැන මම එවැන්නක් නොසිතා ඇත්තෙමි. හදපිරි ගෞරවයකින් මිස කෙළෙස් සහගත දෑසකින් මම ඔහු දෙස බලා නොමැත්තෙමි. ඔහුද කිසිදා මා වරදකට පොළඹවාගන්නට උත්සාහ ගෙන නැත. මට හමු වූ අනෙක් ශ්‍රී ලාංකික පිරිමින් සමග සසඳන විට ඔහුව මට පෙනුනේ මිනිසෙකු නොව දෙවියෙකු වාගේ ය.

'අංශු'

මුළුතැන්ගෙයි සිට තනූජා හඬනඟන හඬ ඇසිණ. එහෙයින්ම මට පිළිතුරක් නොදී එතැනින් පැනගත හැකි විය. කාමරයේ දොර වසාගෙන යන්දී මම මාරියෝ දෙස යටැසින් බැලීමි. ඔහුගේ දෙතොලතර වූයේ ජයග්‍රාහී තෘප්තිමත් සිනහවක් වාගේ ය මා දුටුවේ.

'උදේ කෑමට මොනාද හදන්නෙ අංශු'

'දැන් දවල් වෙලානෙ තනූජා. මොනවත් හදන්න වෙලා නැනෙ'

'එහෙනං කඩෙන් ඉඳිආප්ප ගෙන්නන්නං. කිරිහොද්දක් හදලා පොල් සම්බෝල හදලා ගමු. මාළු තම්බපුවා තියෙනවනෙ'

'හ්ම්'

අද ඇය මට සලකන්න කෙතරම් වෙහෙසෙනවාද? ඒත් එදා ඇය මා එක්ක කෙතරම් තරහවකින් පසුවූවාද? එක අතකට ඕවා හිතේ කියාගෙන හිඳ කුමකට ද? කෑම ගන්න ගමන් මාරියෝ සමග බෙල්ලන්විල පන්සලට යන්නට මම සිතුවෙමි. ළමා නිවාසයක් ගැන සොයා බලා තොරතුරු ලබා දෙන්නැයි මම අයියාට කීවෙමි.

'නිවාසයක් මොකටද? මේ ගෙදර ඉන්න ළමයි ටිකට උදව් පදව් කළානං පිං තමයි.' තනූජාගේ ලෝභී සිතිවිලි මේ මොහොතේ ඉස්සර විය. අයියා ඇය දෙස රවා බැලුවේ ය.

'නෑ මං විහිළුවක් කළේ'

'මාරියෝ ආවෙ ලංකාවේ පත්සල් බලා කියාගෙන යන්න. මං දැං එයත් එක්ක බෙල්ලංවිල යනවා. අපි ඔක්කොමලා කැලණියටයි නුවර දළදා මාලිගාවටයි යන්න ලෑස්ති කරන්න. වෑන් එකක් කතා කරගන්න අයියාට පුළුවන්නෙ'

'අපෝ ඔව්. කැබ් සර්විස් එකකට කතා කරගමු'

'මට දැන් යන්නත් කැබ් එකක් කෝල් කරන්න ඕනෙ.'

'අංශු මාරියෝ එක්ක තනියම ගියාට කමක් නැද්ද?'

'අනේ මේ තනූජා කට වහගෙන ඉන්නවා'

අයියා තනූජාට සැර වූයේය. මම සිනාවක් නගා ගතිමි.

'මට ඉතාලියෙ ඉඳලා ලංකාවටම මාරියෝ එක්ක තනියම එන්න පුළුවන්නං. මේ බෙල්ලං විලට ගිහිං එන්න බැරිද?'

'ඒකත් ඇත්ත නේන්නං. ට්‍රිප් එක යනකොට කත බොත දේවල් ටිකක් ලෑස්ති කරගමුකො එහෙනං'

තනූජා දෙස බලා සිටි අම්මාගේ කට කොනකට ද සිනහවක් ඇවිත් තිබිණ. මේ වතාවේ අම්මා අමුතුයි කියා මට සිතිණ. ඇය වැඩි කතාබහක් නොකළා ය. කල්පනාවකින් පසු වූවාය. නමුත් අම්මා දුකකින් සිටින බවක් ද නොපෙනිණ.

'අම්මත් යමු බෙල්ලංවිල. නිකං ඉන්න එකේ'

මා ඇයට ඒ යෝජනාව ගෙනාවේ හදිස්සියේ ම ය. අම්මා තනි නොකිරීම මගේ වගකීමක් කියා උන්හිටිගමන් සිතුන නිසාවෙනි.

'මං ආවට කමක් නැද් අංශු?'

'හරි වැඩක්නෙ. මොකද වෙන්නෙ. යමු යමු. බෝධි පූජාවක් එහෙම තියලා එන්න බැරියෑ''

අම්මා අපත් සමග ඒ ගමනට එක් වූයේ සතුටෙනි. මම පන්සල ලඟින් සුදු හා රතු නෙළුම් මල් මිටි දෙකක්ම මිලදී ගතිමි ලා නිල් ඩෙනිම් කලිසමක් හා සුදු කපු කමිසයක් ඇඳ සිටි මාරියෝ වෙතින් සුදු නෙළුමක ශාන්ත බව දිස් විය.

The Reader's Place Novel

මල් පහන් පූජාකොට අම්මා බෝධි පූජාවට ලක ලැහැස්ති වූවාය.

'අංශු මාරියෝට බුදු ගෙයි චිත්‍ර පෙන්නලා එන්න. මං මේ වැඩේ කරන්නං'

'හා එහෙනං. එයා බුදු ගේ ඇතුළට ගියාම ලේසියෙං එළියට ගන්න පුළුවන් වෙන එකක් නෑ'

මම සුදුවැලි බිමෙහි දෙපා රුවමින් බිම බලාගෙන ටික දුරක් ආවෙමි. ගල් පියගැට පෙළ නැග බුදු මැදුර ඉදිරිපිට වැලි මළුවේ නතර වී චෛත්‍යය දෙස බැලුවෙමි. නිල් අහස් කුසෙහි පරෙවි ජෝඩුවක් පියාසර කරමින් සිටියහ.

'මාරියෝ...'

මගෙ ස්වරයෙහි වෙනසක් වූ නිසාද මන්දා ඔහු 'ඇයි' කියා නොඅසා මගේ මූණට එබුණේය.

'මං කැමතියි'

යටිතොල සපා ගෙන මම බිම බැලුවෙමි. ඔහුගේ තොල් අඩ සිනාවකින් හැඩ වෙන්නට ඇත.

'මොනවටද?'

ඒ වචනය තුළ ද මද සිනහව තැවරී තිබිණ. මම නෝක්කාඩු දෙනෙත් ඔසවා බැලුවෙමි.

'ඔයාට. වෙන මොනවටද ඉතින්'

කොක් හඬලා ඔහුගේ සිනහව පිපිරිණි. අහල පහල වූ සැදැහැවතුන් කිහිප දෙනාම අපදෙස බලන්නට ඇත. ඒ සිනහවත් සමගම ඔහු මගේ අතක් තදකොට අල්වා ගත්තේ ය. මම හෙමිහිට - රහසේම ඒ අත මුදවා ගතිමි.

'මේ පන්සල'

මගේ හඬ මට පවා නොඇසෙන තරමට පහළ ස්වරයක විය. ඒ සමගම මම බුදු මැදුර වෙත නගින පිටගැට පෙළ නගින්නට සැදකඩ පහණ වෙත දෙපා තැබීමි.

'අනිත් එක මේ ලංකාව. ඉතාලිය තෙවෙයි'

අපි බුදු මැදුරේ මහා ද්වාරයෙත් ඇතුළු වීමු. බුදු සමිඳුන්ගේ දෑවැන්ත හිටි පිළිමයෙහි වන මත මගේ දැස් තැවතිණ. එදා මෙන්ම අදත් ඒ දෙතොල් මත කරුණාබර මදහස රැඳී තිබිණ. බුදු තෙතු මත වූයේ සමස්ත ලෝක ධාතුව කෙරේ වත අපරිමිත කරුණාවකි. මාරියෝ එදෙස බලා සිටියේ විශ්මයෙනි. මම නිසොල්මනේ ඔහු දෙස බලා සිටියෙමි. මේ බුදු රුව පාමුල ඔහුගේ හිත පහත් නොවී නොතිබෙන බව මම ඉඳුරා දනිමි. ඔහු දොහොත් මුදුන් තබා බුදු හිමි වැන්දේ ය.

'මේ විහාරගෙට ආවහම පුදුම විදිහට මගෙ හිත සන්සුන් වෙනවා මාරියෝ. මං ඉස්සෙල්ලම ඔයාව බෙල්ලංවිල එක්කගෙන ආවෙ ඒකයි'

'මං ඔයාව මගෙ මුළු ජීවිත කාලෙදිම ඇස් දෙක වගේ බලාගන්න කියලා මේ බුද්ධ ප්‍රතිමාව ඉස්සරහ මං දිවුරලා කියනවා අංශු. මේක අද ඊයේ කියන්න හිතුණ කතාවක් නෙවෙයි'

'එහෙනං කිව්වෙ නැත්තෙ?'

'ඔයා පිරිමි ගැන විශ්වාසයකිං හිටියෙ නැති නිසා. ඔයාගේ හිතේ මං ගැන විශ්වාසයක් ඇති වෙනකල් මං කල් ගත්තා'

'දැන් විශ්වාසයක් ඇති වෙලා කියලා හිතෙනවද?'

මම සිනහව ගිල ගතිමි.

'විශ්වාසයක් නැත්තං ඔයා මාව ඔයාගෙ ගෙදර එක්කගෙන එයිද?'

'මම්මා කැමති වේවිද මෙහෙම දේකට?'

'මටත් ඉස්සෙල්ලා මම්මාටයි ඕන වුනේ ඔයාව අපේ කරගන්න'

ඔහු ආයේම මගේ අත ඇල්වූවේය. පෙර ලෙසටම මම එම අත මුදා හලෙමි.

'බුදුහාමුදුරුවෝ ආදරේ ප්‍රතික්ෂේප කරපු කෙනෙක් නෙවෙයි ළමයෝ'

The Reader's Place Novel

'ඒක හරි. ඒ වුනාට අපේ සංස්කෘතිය ටිකක් වෙනස්'

'ඒ වෙනසට මං කැමතියි'

'ඇයි?'

'ඉතාලි කෙලෙක්ගෙං මට මේ ලැජ්ජාව දකින්න හම්බ වෙන්නෙ නෑනෙ?'

මාරියෝට විහාරයෙහි චිත්‍ර පෙන්වූවාට මේ වෙලාවෙ තම් මගේ හිතෙහි සන්සුන් බවක් නොවී ය. එය සුන්දර වූ කැළඹීමකි. මාව තේරුම් ගෙන වාගේ මාරියෝ තනිව සිතුවම් නැරඹුවේය.

'ආයේ දවසක එමු. පැහැදිලි මනසකිං චිත්‍ර බලන්න'

ඔහු මට සරදම් කරන සිනහවක් ඇතිව කීවේ ය. මම ඔහුගේ අත්බාහුවක් කෙනිත්තුවෙමි. මාරියෝ දයාන්විතව මගේ හිස් මුදුන පිරිමැද්දේ ය. ඊළඟට වටපිට බලා කවුරුවත් නොවන බව දැන හදිස්සියෙන් වාගේ කොපුලක් සිප ගත්තේ ය. ඉන් පෙර කිසි දාක කිසි පිරිමියෙකුගේ ස්පර්ශයක් විඳ නැති කිරිකෝඩු පෙම්වතියක සෙයින් මා වෙව්ලා යන්නට ඇත.

බුදුගෙයින් පිටවන්ට බෝ මළුව වෙත එත්දී මගේ ඇස් බර වී තිබිණ. අම්මා බෝධිය නහවා අහවර වී අප එන පෙර මග බලා සිටියා ය.

'බැලුව ද?'

ඕ තොමෝ විමසුවේ මාරියෝගෙනි.

'ඔව්'

ඔහු සන්සුන්ව හිනැහිණි.

'මට අම්මට දෙයක් කියන්න තියෙනවා'

මා තිගැස්සී යන්නට ඇත.

'මං අංශුව මැරි කරනවා. ඒ ගැන අම්මගෙ අකමැත්තක් නැනෙ?'

මා අම්මා දෙස බැලුවේ බලවත් අපහසුතාවයකිනි. අම්මාගේ

'මගෙ කෙල්ල පොඩි කාලේ ඉඳලම දුක් විත්දා. මං දන්නවා. පුතා එයාව සතුටෙං තියයි. මේ අවුරුදු දෙකේ වුනත් මට කරන්න බැරි වුන දේ කළේ පුතයි පුතාගෙ අම්මයි'

'අපි ලංකාවෙදිම වෙඩින් එක අරගෙන යමු. එතකොට ඔයාගෙ නෑදෑයොත් ඔයා බ්‍රයිඩ් කෙනෙක් වෙනවා දකිනවනේ'

අම්මාගේ කඳුළක් බෙල්ලන්විල විහාරයේ බෝධි මළුවෙහි වැලි මත වැටී සැඟව ගියේ ය. හදවත බරව තිබුණත් මම හඬන්න, දොඩන්න ට නොගියෙමි. ඔහු රිසි පරිදි ඕනෑම දෙයක් වෙන්නට හරිනවා මිස කිසිත් වෙනස් කරන උවමනාවක් මට නොවී ය. ඒත් මට හදිසියේම සිල්වියා සිහි විය.

'ඒත් එතකොට මම්මා?'

ඔහු කිරි දරුවෙක් සේ සිනාසුණේ ය.

'මම්මට එන්න කියමු'

'එයා අසනීපයි කිව්වනෙ'

'ඔයා ලේලි වෙනව කිව්වහම මොන අසනීපයක්වත් නැතුව ගසල බසලා දාලා එයි'

මම එහෙම්මම වැලි මළුවේ බිම හිඳ ගතිමි.

'පන්සලක වෙඩින් එක ලැහැස්ති කරන්න පුළුවන් නෙ අම්මා?' මාරියෝ ඇසුවේ ය.

'අපොයි ඔව්'

'මං ආසයි එදාට හාමුදුරුවරු ගොඩක් එකතු වෙලා පිරිත් කියනවනං'

'මොනතරං පිංවන්තයිද එහෙනං'

'අපේ මම්මත් තවදාවත් එහෙම වෙඩින් එකක් දකලා නැනෙ'

'හොඳ වෙලාවට මාත් ලංකාවට ආවෙ'

'මම්මලගෙ නෑදෑයො යාළුවො ඔක්කොටම පාටි එකක් දෙමු'

The Reader's Place Novel

'අංශුව උඩරට මනමාලියෙක් වගේ අන්දන්න ඕනෙ. පුතා නිලමෙ ඇඳුම අඳින්න කැමතියි ද?'

'අනේ ඔව්. ඒක හරිම අභිමානවත් ඇඳුමක්නෙ'

'ගොයින්නවේ එකට අංශුට ලස්සන ලොකු ගවුමක් අන්දවමු'

'අංශු එතකොට බාබිඩෝල් වගේ ඉඳියි'

'චර්ච් වෙඩින් එකක් පුතා...?'

'ඕනෙනං ඒකකුත් ලෑස්ති කරන්න බැරියෑ'

'අපෝ ඔව්, නැතුව බෑනේ. අඩුපාඩුවක් නෙ එහෙම වුනොත්'

'වෙඩින් එකෙන් පස්සෙ අම්මත් ටික දවසකට හරි අපිත් එක්ක ඉතාලි යමු. ඕනනං අම්මටත් පුළුවන්නෙ දිගටම එහෙ ඉන්න'

'පස්සෙ බලමුකො. ඒවා හෙමිහිට තීරණේ කරන්න බැරියෑ. මටනං මහා සැනසීමක් දැනෙනවා අංශුගේ ජීවිතේ මේ වගේ ලස්සනට පිළිවෙලක් වුණ එක ගැන'

'මං හිතුවා අංශු මට වඩා අවුරුදු විස්සක් විතර බාල වුණ එක අම්මලට ප්‍රශ්නයක් වෙයිද කියලත්'

'ඉෑනිටයි මිනිහටයි ආදරෙං සමගියෙන් ඉන්න පුළුවන්නං ඕව මොනවද ළමයො. අංශුගෙ තාත්තටත් අපි මංගල්ලෙට එන්න කියමු. මොනවා වුනත් එයා මේ දරුවගේ තාත්තනෙ'

අම්මාත් මාරියෝත් කතා කරන හැම දෙයක්ම මට ඇසෙමින් තිබිණ. නමුත් මා සිටියේ ඔවුන්ගෙන් බොහෝ දුර වෙනමම ලෝකයක සේ ය. සැබවින්ම මේ වෙනමම ලෝකයක් නොවන්නේද? වෙනමම ජීවිතයක් නොවන්නේද? මහත් වූ ආදරයකින් හා තෘෂ්ණාවකින් යුතුව මම ඒ ජීවිතයේ ආදර සුවඳ විඳගන්නට හදවත සූදානම් කරගතිමි.

The Reader's Place Novel

අවිවාහිත අදහස්



ගංගා ඇයිනි ගමගේ

මං ඒ මිනිහා එක්ක
මරාගන්න ගියා.
වෙනදට සිංහයා වගේ කඩං පනින එකා
එදා බල්ලෙක් වගේ
වල්ගෙ කකුල් දෙක අස්සේ ගහගෙන පස්ස ගැහුවා.
මං හිටියෙ ආවේස වෙලා.
තමං කසාද බැඳලා ඉන්න මිනිහා
ආදරේ කරන්නෙ
වෙන ගෑනියෙක්ට කියලා දැනගත්තාම
කොයි ගෑනිද
කොටි දෙනක් නොවෙන්නෙ?

The Reader's Place Novel



Novel | Rs. 400/-
ISBN 978-955-4788-06-0